

# හිතොපදෙශ සන්නය.

PUBLIC INSTRUCTION DEPARTMENT.

# SIṄHALESE VERSION

OF THE

# HITÓPADÉSA.

BY

WẸLIGAMA SRÍ SUMANGALA GAṆÁÇÁRYA.

# හිතොපදෙශ සන්නය.

කළුතර පුලිනතලාරාමවාසි

වැලිගම ශ්‍රීසුමංගලාභිධාන ගණාචාර්‍ය්‍යයානන්

විසින් ලියනලදි.

COLOMBO:

GEORGE. J. A. SKEEN, GOVERNMENT PRINTER, CEYLON.

1884.

# සංක්‍ෂෙපනය.

**හිතොපදෙශය** යන නාමයෙහි අර්ථයනම් වැඩසිද්ධවීමට අයිතිවූ ගුරූපදෙශයයි කියනලද අනුමැතිකම් උගන්වා තිබෙන ග්‍රන්ථය යනුයි.

මෙනම් පොත—විෂ්ණු ශර්මන්—යන නම්ඇති බ්‍රාහ්මණ පණ්ඩිතයා විසින් ජම්බුද්වීපයෙහිවූ මගධරට පාටලිපුත්‍රනම් නුවරදී පුරාණ කාලයෙ සංස්කෘත භාෂාවෙන් ලියනලදී. මෙම පොත සඞ්ග්‍රහ කිරී [illegible] කල කාරණයද මෙහිම පහලවේ. මෙහි කියනලද පාටලිපුත්‍රනුවර උදයභද්‍ර රජුගේ පුත්‍රවූ උදයාශ්ව රජු රජපැමිණි සතරවෙනි වර්ෂයෙහි පිහිටුවූබව වායුපුරාණයෙහි කියණලදී. ඒ මෙසේය.

සවෛ පුරවරං රාජා පෘථිව්‍යං කුසුමාහ්වයම්,
ගඞ්ගායා දක්ෂිණෙ කොණෙ චතුර්ථෙ බ්දෙ කරිෂ්‍යති.

පුරාණ කාලයෙහි මගධදෙශයෙහි ප්‍රධානව පැවතුනේ මේ නුවරයි. මේ නුවර පිහිටුවනලදැයි මෙහිකියනලද කාලය වර්ත්තමාන කාලය කොරෙන් අවුරුදු දෙදහස් තුන්සිය ගණනකට පළමුයි. කියනලද මේ කාලයෙන් අවුරුදු පණහකට පළමු මෙම උදයාශ්ව රජහට මුත්තනුවූ අජාතසත්තුරජුගේ කාලයෙහි මේනුවර කරණලද බව දික්සඟියේ මහාපරිනිර්වාණසූත්‍රයෙහි කියාතිබේ. වර්ත්තමානකාලයෙහිද මේ නුවර ජනගහනාදියෙන් සමෘද්ධවතිබේ.

හිතොපදෙශය ඉගෙණීමෙන් ලැබියහැකි ප්‍රයොජනද "ශ්‍රැතො හිතොපදෙශොයං" යනාදි ශ්ලොක්යෙන් මෙහිම පහලවේ. මෙපොත නීතිශාස්ත්‍රයට අන්තර්ගතවූ එකකි. මෙම පණ්ඩිතයා විසින් කරණලද පඤ්චතන්ත්‍රනම්වූ ප්‍රකරණයෙන්ද වෙනත් නීතිශාස්ත්‍ර පොත්වලින්ද කාරණයන් උපුටාරැගෙණ මෙහි ලියනබවද සටහන් කරතිබේ. නීතිශාස්ත්‍රය ප්‍රකාශකරතිබෙන පොත්නම්, ගුරු, ශුක්‍ර, කාමන්දකී, මහාභාරත, පඤ්චතන්ත්‍ර, නීතිසාර, නීතිමාලා, නීතිමයූඛ, චාණක්‍ය, සාරසඞ්ග්‍රහ, හිතොපදෙශ යන මේ ආදියයි. මෙහි කිසිතැනෙක ශුක්‍රනීති මහාභාරත පඤ්චතන්ත්‍ර මනුසංහිතා යනාදියෙහි පෙණීතිබෙන ශ්ලොකාදිය දක්නාලැබේ. මේ පොතෙන් උගන්වනු ලබන්නාවූ නීතිශාස්ත්‍රයනම් අෂ්ටාදශවිද්‍යාස්ථානයන් අතුරෙන් එකකි. ප්‍රධානවූ ශාස්ත්‍රවශයෙන් පවත්නා ඒ අෂ්ටාදශවිද්‍යාස්ථානයද මෙහි කියයුතුය. ඒ මෙසේයි.

"අඞ්ගානි චතුරො වෙදා මීමාංසා න්‍යායවිස්තරඃ
පුරාණං ධර්මශාස්ත්‍රඤ්ච විද්‍යාහ්‍යෙතාශ්චතුර්දශ
ආයුර්වේදො ධනුර්වේදො ගාන්ධර්වශ්චෛව තෙ ත්‍රයඃ
අර්ථශාස්ත්‍රං චතුර්ථන්තු විද්‍යාදෂ්ටාදශෛව තු."

යනුහෙයින් (මනාකොට අක්ෂරයන්ගේ කීම උගන්වන්නාවූ ශාස්ත්‍රය නම්වූ ශික්ෂාවය, සාමවෙදගත යාගහොමාදි ක්‍රියා විධායකවූ ආශ්වලායන, ආපස්තම්බ, කාත්‍යා යනාදීන් විසින් කරණලද සූත්‍රාන්තගීතවූ ශාස්ත්‍රයයි කියනලද ක්‍රියා කල්ප විකල්පය, මනාවූ පරිද්දෙන් ශබ්දයන්ගේ ඉපදීම අවබොධකරන්නාවූ ව්‍යාකරණ ශාස්ත්‍රය, ග්‍රහ නකත් ආදීන්ගේ ගමන් ස්වරූපාදිය නිශ්චයකරන්නාවූ පඤ්චවිධවූ ජ්‍යොතිශ්ශාස්ත්‍රය, වර්ණාගම වර්ණවිපර්‍ය්‍යාසාදීන් කියනලද ප්‍රකෘති ප්‍රත්‍යයාදි ශබ්දාවයව වෙන්කරන්නාවූ නිරුක්ති ශාස්ත්‍රය, අක්ෂරයන්ගේ නියමයයි කියනලද පිංගලාදීන්විසින් ප්‍රකාසිත ඡන්දශ්ශාස්ත්‍රය යනමෙ) වෙදාඞ්ගභූතවූ ශාස්ත්‍ර හයද, (දශමණ්ඩලයෙහි සූක්ති එක්දහස් එක්සිය එකානුවක් ඇත්තාවූ ඍග්වෙදය, දෙවෙනිවූ යජුර්වේදය, තුන්වෙනිවූ සාමවෙදය, සතරවෙනිවූ අථර්වණවෙදය) යි යනමෙ වෙදසතරද, ජෛමිනි විසින් කරණලද කර්මවිෂයවූද— බ්‍රහ්මවිෂයවූදයි දෙයාකාරවූ පරීක්ෂාව මුල්කොට තත්ත්වාවබොධය කරන්නාවූ මීමාංසා ශාස්ත්‍රයද, ද්‍රව්‍යගුණාදි සප්තපදාර්ථයන්ගේ අවබොධය පිණිස ගොතමාදීන් විසින් කරණලද්දාවූ තර්කශාස්ත්‍රනම්වූ න්‍යායවිස්තරයද, ධන්වන්තරීන් විසින් කියනලද්දාවූ අෂ්ටාඞ්ගයෙකින් යුක්තවූ වෛද්‍යශාස්ත්‍රයයි කියනලද ආයුර්වේදය, භෘගු විසින් කියනලද චතුර්විධවූ ආයුධයන්ගෙන් මිදීම්ආදිය ප්‍රකාශකරන්නාවූ ධනුර්වේදය, භරතමුනි විසින් කියනලද නැටීම් ගී ආදිය විෂයකොට පවත්නා ගාන්ධර්වශාස්ත්‍රය, යථොක්ත නීතිශාස්ත්‍රය, යනමෙ සතර මූලකී චතුර්දශවිද්‍යාවන්හා සමඟ අෂ්ටාදශවිද්‍යාවෝ වෙත්.

මේ පොතෙහි දක්වනලද ගුරුකම් එකින් එකටම ඥානය දියුනුවීම පිණිසද, නානාප්‍රකාරවූ උපාය අවබොධය පිණිසද, අනුන්ගේ කපටි උපායවලින් නොරැවටී ජයගැණීමපිණිසද, නොයෙක් කාරණ පිළිබඳවූ කථාවෙන් සභා රඤ්ජනයපිණිසද, ලොකයාගේ හික්මීම ගෙණදීම පිණිසද විශෙෂ ප්‍රයොජනවත්වූ අතිමනොහර කරුණුයි. වෙන ප්‍රසිද්ධ වැදගත් පොත් බොහෝ රාශිගණනකින් ලබන ප්‍රයොජනවලටවඩා මේ එකම පොත ඉගණීමෙන් මහත් ප්‍රයොජන අත්වෙයි යන කීමෙහි කිසි වරදක්නැත. ඒනිසා මේ පොත ලොකයා විසින් භාවිතාකටයුතුවූ වැදගත් උතුම් ප්‍රකරණයෙක්වෙයි. එහෙයින් බොහෝ කාලයක පටන් සංස්කෘත භාෂාව

උගන්වන්නාවූ ගුරුවරයන් විසින් බොම්බාය, බෙඞ්ගාලය, බාරාණසී ආදී ඉන්දියාදෙශයෙහි නොයෙක්තැන ආණ්ඩුවගණනේ පවත්නා පාඨශාලාවල භාවිතාකරවමින් එනවත්ඇර එරෝපයෙහි පූර්වදිග භාෂාශාස්ත්‍ර පුහුණුකරවන්නාවූ පාඨශාලාවල අවුරුදු හැත්තෑගණනක පටන් ඉගැන්වීම පිණිස නියමකරතිබෙනබව පෙණේ. එහෙයින් ලඞ්කාවීපයෙහි ආණ්ඩුවනමින් පවත්නා පාඨශාලාවල ශිෂ්‍යයන්ටද මෙම පොත ඉගැන්වීම සුදුසුයයි කල්පණාකර ඒ සඳහා නියොගකරණුලැබූ ප්‍රසිද්ධ ඉගැන්වීමෙ ප්‍රධානත්‍වයට පත්වූ උගත් චාර්ලිස් බෲස් නමැති මහතාගේ මෙම නියොගයට ප්‍රශංසා කටයුතුවපෙණේ.

තවද සංස්කෘත ඉගණගන්නවුන් විසින් මෙපමණ බහුලවශයෙන් පුහුණුකරණ වෙන පොත් ඇත්නම් ස්වල්පයෙක මේපොත ඉන්දියාදෙශවාසීන් විසින් ඔවුන්ගේ භාෂාවලටද එරොපරටවාසීන් විසින් ඔවුන්ගේ භාෂාවලටද නඟනලද්දේය. ඉංග්‍රිසි භාෂාවට බොහෝදෙනෙක් විසින් නඟා වෙන් වෙන් වශයෙන් පොත්කරණලද්දෑහුය. නොයෙක්දෙනා විසින් මුද්‍රාඞ්කිතකරවනලද හිතොපදෙශ පොත්වල ශ්ලොකයන්ගේ අඩුවැඩිකම් හා එක පිළිවෙළකට නැති බවද පෙණෙයි. ඒ පොත් අතුරෙන් කලිකතානුවර—ශ්‍රී තාරානාථතර්කවාචස්පති පණ්ඩිතයා විසින් මුද්‍රාඞ්කිතකරවනලද හිතොපදෙශයෙහිවූ ශ්ලොකයන් ඒ පිළිවෙළින් ඉරෙන්පාත ලියමින් ශ්ලොකයන්ගේ අභිප්‍රායද ඒ ඒ පිටුවලම ලකුණු පිළිවෙළින් ඉරෙන්උඩ ලියන්නෙමු. ඒ ලකුණු පිළිවෙළින් ශ්ලොකයන්ද එහි අභිප්‍රායද සංසන්දයකරබලාගත හැකිවෙයි. ඉතිරි සංස්කෘත පාඨයන්ගේ අභිප්‍රාය පමණක් ලියන්නෙමු.

පදගතාර්ථ සන්නය නොලියා මෙපරිද්දෙන් අභිප්‍රාය පමණක් ලියන්ටයෙදුනේ ආන්ඩුවේ ප්‍රසිද්ධ ඉගැන්වීමෙ ප්‍රධානතැනාගේ ඉල්ලීමලෙසටයි.

පාඨශාලාවල ඉගැන්වීමට නුසුදුසුයයි ඉන්දියා ආන්ඩුවේ පාඨශාලාවල ඉගැන්වීමට නියමකරතිබෙන හිතොපදෙශ පොතට පිළිනොගන්නාලද කථා කීපයක් හා ඒ කථාවලට අන්තර්ගතවූ ශ්ලොකයන්ද මේ පොතටද පිළිනොගෙණ හැරියෙමු. මෙහි යම් යම් තැනෙක්හි දෝෂවශයෙන් හැඟියේනම් ඒද ලොකාර්ථකාමී පණ්ඩිත[illegible]න් විසින් කරුණාවෙන් ශුද්ධකර පුහුණුකරවණුලැබේවා.

# ශුද්ධිපත්‍රය.

| පිටේ. | පෙළේ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 1 | 12 | ආදීන් විසිණ් | ආදීන්විසින් |
| ,, | 24 | ගෘහිත | ගෘහීත |
| 2 | 26 | පාත්‍රාඪාද් | පාත්‍රඪාද් |
| ,, | 28 | විතීයාද්‍රියතෙ | විතීයාප්‍රියතෙ |
| ,, | 31 | සූඝෘදෙහදෙ | සුඝෘදෙහදෙ |
| 3 | 18 | තැනත්තේ | තැනැත්තේ |
| ,, | 32 | චරමපි | වරමපි |
| 5 | 3 | වසඟ | වශග |
| ,, | 14 | තිරිසනුන්ගේ | මිනිසුන්ගේ |
| 6 | 21 | අලසනුවූ | අලසනුවූ |
| ,, | 27 | යදභාවී | යදභාවි |
| 7 | 27 | යදිච්ඡති | යදිච්ඡතී |
| 8 | 16 | මරම්ණීයකගේ | මරම්ණීයෙහි |
| 9 | 2 | ඇත්තේ | ඇත්තී |
| ,, | 30 | අශමාපී | අශමාපි |
| 10 | 11 | සනොතාශය | සනොතාෂය |
| 11 | 30 | මශනඃ | මගනඃ |
| 13 | 12 | අතීශයින් | අතිශයින් |
| 14 | 30 | නිරුපස්‍ය | නිරුපස්‍ය |
| 15 | 17 | රන්වළල්ට | රන්වළල්ලට |
| ,, | 25 | වීසම | විසම |
| ,, | 37 | සුචීනත්‍ය | සුචිනත්‍ය |
| 16 | 27 | ඝෘණීඪකිතව | ඝෘණීතව |
| ,, | 28 | පරභාගෙශ | පාරභාගෙශ |
| ,, | 30 | කලිශ්‍ය | ක්ලිශ්‍ය |
| ,, | ,, | ශඞ්කීතඃ | ශඞ්කිතඃ |
| 17 | 19 | කලී | කලි |
| ,, | 33 | වස්තුපාලම්හ | වස්තුපාලම්හ |
| 18 | 28 | වස්තුනාං | වැතුනාං |
| 19 | 29 | කරණලද | කරණලද |

| පිටේ. | පෙළේ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 21 | 25 | ජීවිතඤෙඤුවච | ජීවිතඤ්චෙව |
| ,, | 29 | වත්තීන | වත්තින |
| 23 | 18 | මීත්‍රු | මිත්‍රු |
| ,, | 33 | රක්ෂීතඃ | රක්ෂිතඃ |
| 24 | 4 | එක්තරා | එක්තරා |
| 25 | 16 | විශ්වාස | විශ්වාස |
| 26 | 25 | ජයාං | ජායාං |
| ,, | 26 | භූමි | භූමි |
| 28 | 7 | විශ්වාස | විශ්වාස |
| 30 | 2 | ශූර | ශූර |
| ,, | 12 | ඉදීන් | ඉදින් |
| ,, | 29 | ශෘ ෙණාති | ශෘණෝති |
| 31 | 10 | ව්‍යාකරය | ව්‍යාකාරය |
| ,, | 22 | දිපනිර්වාන | දීපනිර්වාන |
| ,, | 29 | භගවතී | භගවති |
| 32 | 1 | ප්‍රිතිය | ප්‍රීතිය |
| ,, | 30 | කිමපී | කිමපි |
| 34 | 22 | ඝී | ඝි |
| ,, | 25 | භූෂිතඃ | භූෂිතඃ |
| ,, | 29 | ජීවනම් | ජීවනම් |
| 35 | 31 | සූශිතල | සුශීතල |
| 36 | 29 | දූෂණම් | දූෂණම් |
| 37 | 31 | යංෂද්‍ට්‍රා | යද්දංෂ්ට්‍රා |
| ,, | 32 | ජිනත්තක | ජිනත්තක |
| 38 | 1 | විලෙක | විලෙක් |
| 39 | 32 | උත්තමසත්‍යපී | උත්තමසත්‍යපි |
| 40 | 1 | කංණ | කරණ |
| ,, | 29 | ලක්ෂම | ලක්ෂ්ම |
| 42 | 31 | කාපීණ්ණීං | කාපීණ්‍යං |
| 43 | 28 | නිවෛද | නිවේද |
| ,, | 32 | අදිනිර්වාණ | අපිනිර්වාණ |
| 44 | 26 | ශුන්‍ය | ශූන්‍ය |
| ,, | 28 | රණේය | රණේයන |
| ,, | 31 | මප්‍යර්පීතා | මප්‍යර්පිතා |
| 45 | 30 | ගුල්පාදස්‍ය | ගුල්ඵපාදස්‍ය |

| පිටේ. | පෙලේ. | අශුඩ. | ශුඩ. |
|---|---|---|---|
| 46 | 22 | වීරහව්‍යථම් | විරහව්‍යථම් |
| 48 | 4 | චක්‍ෂවල | චක්‍ෂුවල |
| ,, | 23 | රනත්‍රාදී | රත්නාදී |
| 49 | 27 | රිපූන් | රිපූන් |
| 50 | 20 | දීඝිරව | දීඝිරාව |
| 52 | 16 | උතසාහ | උත්සාහ |
| ,, | 29 | මණ්ඩූකඃ | මණ්ඩූකාඃ |
| 53 | 13 | වැසිවලා | වලා |
| ,, | 24 | විනාප්‍යවෛදීධිරඃ | විනාප්‍යවෛර්ධීරඃ |
| ,, | 28 | දශෙන | දගෙනා |
| ,, | 30 | අහච්ඡායා | අභ්‍රච්ඡායා |
| 54 | 7 | එසෙමැයි | එසෙමැයි |
| 55 | 14 | නොඇලිම් | නොඇලිම් |
| ,, | 32 | මශනා | මගනා |
| 56 | 2 | නොහොත් | නොහොත් |
| ,, | 8 | චිත්‍රාඞගදනම් | චිත්‍රාඞගනම් |
| ,, | 14 | පින්වන් | පින්වත් |
| 57 | 5 | ශිතකාල | ශීතකාල |
| ,, | 19 | පරික්‍ෂා | පරීක්‍ෂා |
| 58 | 11 | කවරක්ද | කවරෙක්ද |
| ,, | 26 | ජීවන්වනු | ජීවත්වනු |
| ,, | 32 | භුතා | භූතා |
| 59 | 28 | මඩනා | දක්නා |
| 60 | 17 | සැපදූක් | සැපදුක් |
| ,, | 27 | ජීද්‍රෙෂව | ජිද්‍රෙෂව |
| ,, | 36 | සනාති | සනාති |
| 61 | 12 | පිණි | පිණිස |
| 62 | 6 | රජතෙම | වැදීතෙම |
| ,, | 25 | ණීවො | නීවො |
| 65 | 27 | උපයඝීපරි | උපයඝූපරි |
| ,, | ,, | සවි | සවී |
| ,, | 29 | භුය | භූය |
| ,, | 30 | ගුහි | ගුහී |
| ,, | 31 | ලක්‍ෂමීඃ | ලක්‍ෂ්මීඃ |
| 66 | 32 | දවෙක්‍ෂ | දපෙක්‍ෂ |

| පිටේ. | පෙළේ. | අශුඬ. | ශුඬ. |
|---|---|---|---|
| 67 | 34 | සිඕිජ්ධි | සිඛිවිධී |
| 68 | 9 | උත්සා | උත්සාහ |
| 69 | 27 | මෙඬාවී | මෙධාවී |
| ,, | ,, | සූබි | සුඛී |
| 70 | 27 | ජීජිවි | ජජීවි |
| ,, | 28 | දුඃඛි | දුඃඛී |
| 72 | 33 | චචචා | චර්චා |
| 73 | 18 | පසුවශී | පශුවශී |
| 74 | 22 | ජීචති | ජීවති |
| ,, | 33 | ගතෙ | ගතො |
| 75 | 7 | ආගාරදුත්ත | ආගාරදුත්තහුගේ |
| 76 | 31 | ණීරඃ | නීරඃ |
| 77 | 29 | භූපා | භූපා |
| 78 | 35 | පාශඑතො | පාංශවිතො |
| 81 | 30 | භවතීශවරාණාම් | භවතීශවරාණාම් |
| 82 | 12 | ත්‍රිවිධ | ත්‍රිවිධ |
| ,, | 32 | මනි | මණි |
| ,, | ,, | භූෂණ | භූෂණ |
| ,, | ,, | ප්‍රිණිධි | ප්‍රණිධි |
| 83 | 10 | අශව | අශව |
| ,, | 11 | විණය | විණය |
| ,, | 19 | කොටණෙ | කොටගෙණ |
| 85 | 33 | භූමි | භූමි |
| 86 | 22 | ගුහාවෙසි | ගුහාවෙහි |
| 87 | 19 | සඤ්ජීවක | සඤ්ජීවක |
| ,, | 25 | නින්දුකරණුලබන්නාවූ | නින්දුකරන්නාවූ |
| ,, | 28 | සබ්දයටපසුවසබ්ද | ශබ්දයටපසුවශබ්ද |
| ,, | 32 | කරිණෙ | කරිණෙ |
| 88 | 29 | සවීතඃ | සවීතඃ |
| ,, | 33 | ශුනාක | ශුනාක |
| 89 | 12 | ඕතොමොවදුරන්ට | වදුරන්ට |
| 90 | 27 | කිඩගුණිමුකේඛා | කිංකුණෙණමුකේඛා |
| ,, | 29 | වතඃප්‍රාණං | වතඃප්‍රාණඃ |
| ,, | ,, | භූපතෙඃ | භූපතෙඃ |
| ,, | 30 | නෙණී | නෙනී |

| පිටේ | පෙළේ. | අශුද්ධ. | ශුද්ධ, |
| --- | --- | --- | --- |
| 91 | 15 | එකාන්ත | එකාන්ත |
| ,, | 16 | සියලූ | සියලු |
| ,, | 18 | නියුංක්ත | නියුක්ත |
| ,, | 22 | [illegible]වාමියාහට | සවාමියාහට |
| ,, | 25 | බන්ධුණී | බන්ධුනී |
| ,, | 26 | බ්‍රහ්මණඃ | බ්‍රාහ්මණඃ |
| ,, | 29 | අපරාධෙපි | අපරාධෙපි |
| 92 | 19 | වස්තූන් | වස්තූන් |
| 93 | 5 | පැවැතවිය | පැවැත්විය |
| ,, | 10 | පුත්‍රයාට | පුත්‍රයන්ට |
| 94 | 1 | බඳුව | බඳව |
| 98 | 32 | වීනා | වීනා |
| ,, | 34 | කාඞ්ක්ෂාං | කාඞ්ක්ෂං |
| 99 | 26 | කුච්වා | කුචා |
| 100 | 33 | ශ්‍රියසී | ශ්‍රීසී |
| 101 | 3 | ඓශ්වයසී | ඓශ්වයසී |
| 102 | 27 | තද භින්නං | තද් භින්නං |
| 103 | 28 | අඩගාඩකී | අඩගාඩගී |
| ,, | 32 | සපඞී | ස්පඞී |
| 104 | 32 | පරාධිනා | පරාධීනා |
| 105 | 25 | වැසිසිදු | වැඩසිදු |
| ,, | 32 | ලබඩවා | ලබ්ධවා |
| 106 | 32 | මලීමසම්වා | මලීමසම්වා |
| 107 | 11 | පැමිණේ | පෑමිණේ |
| ,, | 27 | කශචිත් | කශ්චිත් |
| 108 | 28 | ප්‍රොඝකාරි | ප්‍රොත්සාරි |
| ,, | 30 | අනන්තර්ගුණ | අනන්තර්ගුණ |
| ,, | 31 | සම්පූව | සමපූව |
| ,, | ,, | විධියසීඃ | විධිසීඃ |
| ,, | 32 | දිපොඝ | දීපොඝ |
| ,, | 35 | හගෙනා | හගෙනා |
| 109 | 2 | වෙද | වෙම්ද |
| ,, | 14 | එක්තැනෙක්හි | එක්තැනෙක්හි |
| ,, | 28 | විවාදෙ | විවාදෙ |
| 110 | 28 | ධිතාමතම නඃ | ධීතමාතම නඃ |

| පිටේ. | පෙළේ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 111 | 32 | හුමෞක | භූමෞක |
| ,, | 35 | හුමි | භූමි |
| 112 | 2 | පරික්ෂාව | පරීක්ෂාව |
| ,, | 4 | සොහොවූරු | සොහොවුරු |
| ,, | 26 | හුති | භූති |
| ,, | 29 | හුෂණ | භූෂණ |
| 113 | 3 | සවභාදව | සවභාවද |
| 118 | 9 | ලද්දේ | ලද්දෙමි |
| ,, | 10 | ලද්දේදවෙයි | ලද්දේදවෙමි |
| 119 | 31 | චඤුචූ | චඤ්චූ |
| ,, | 33 | හුෂණ | භූෂණ |
| 120 | 31 | සමික්ෂෟ | සමීක්ෂෟ |
| 121 | 1 | කෙරීම | කිරීම |
| ,, | 27 | වාරුණි | වාරුණී |
| 122 | 11 | වවූ | වෙවූ |
| ,, | 31 | ජිෂ්ණු | ජීෂ්ණු |
| 123 | 24 | ගාධුනම් | ගෘධුනම් |
| 124 | 31 | ගර්විතඃ | ගර් විතඃ |
| ,, | 33 | ක්ෂමීක්ෂමී | ක්ෂමී |
| 125 | 22 | ග්‍රිෂම | ග්‍රීෂම |
| 127 | 33 | ණෙත්‍ර | නෙත්‍ර |
| ,, | 34 | මනොධිරා | මනොධීරා |
| 128 | 17 | තැනත්තා | තැනැත්තා |
| ,, | 23 | දීයෙහි | දීයෙහි |
| 129 | 34 | සවභුතාඝගං | සවභූතාඝගං |
| 130 | 1 | තවත්කාරණයෙක් යන්නඅධිකයි. | |
| 132 | 15 | සම්පනාතිඥු | සම්පතාතිඥු |
| 133 | 2 | එසේද | එසේද |
| ,, | 26 | මලඑක්ඥු | මලඑකක්ඥු |
| 134 | 14 | පිරීවර | පිරිවර |
| ,, | ,, | සිඳුකරණ | සිදුකරණ |
| 135 | 13 | එහෙයින් | එහෙයින් |
| ,, | 31 | ශෛවව | ශෛවව |
| 136 | 6 | එහෙයින් | එහෙයින් |
| '137 | 1 | දුර | දූර |

| පිටේ. | පෙළේ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 139 | 22 | හසන්තිනාං | හසන්තීනාං |
| ,, | 30 | හූපතෙ | භූපතෙ |
| 143 | 4 | ශුද්‍රකස්‍ය | ශූද්‍රකස්‍ය |
| 155 | 30 | ණාගෙන්‍යඃ | නාගෙන්‍යඃ |
| ,, | ,, | ණරඃ | නරඃ |
| 157 | 23 | යුද්ධය | යුද්ධය |
| 158 | 21 | අලුනාවූ | ඇලූනාවූ |
| 159 | 31 | ගතාසුෂි | ගතායුෂි |
| 160 | 19 | පැමිණී | පැමිණි |
| 164 | 30 | පණ්ඩිත | පණ්ඩිතඃ |
| 165 | 9 | කරණය | කාරණය |
| 166 | 15 | මූගටිත්විසින් | මූගටියාවිසින් |
| 167 | 29 | වෘක්ෂාග්‍රත් | වෘක්ෂාග්‍රාත් |
| 168 | 8 | සෘෂියා | ඍෂියා |

ඒපිටේම කීපතැනක සෘෂියයි පේණතැන් ඍෂියයයිගතයුතු.

| | | | |
|---|---|---|---|
| 169 | 10, 24 | මස්‍යයෝ | මත්ස්‍යයෝ |
| ,, | ,, | ජිවත් | ජීවත් |
| ,, | 23 | ලකුණූ | ලකුණු |
| 170 | 3 | හූමිය | භූමිය |
| 171 | 25 | හාවය | භාවය |
| 173 | 3 | මූලාවූ | මූලාවූ |
| ,, | 7 | එක්තරා | එක්තරා |
| 174 | 17 | තැනත්තා | තැනැත්තා |
| 176 | 14 | පරදවනුලැබෙ | පරදවනුලැබෙත් |
| ,, | 26 | කුවිත | කුවීත |
| 178 | 17 | වශග | වශග |
| 184 | 19 | අඩුවූ | අඩුවූ |
| 185 | 7 | නගත්නිද | නගත්නේද |
| 186 | 18 | උත්පත්තියතොමෝ | උත්පත්තිය |
| ,, | 24 | තවඅද්භුත | තවඅද්භූත |
| 187 | 19 | මනුෂ්‍ය | මනුෂ්‍ය |
| ,, | 22 | පරිනාමෙං | පරිණාමෙං |
| ,, | 31 | මෘත්‍යු | මෘත්‍යුං |
| 188 | 4 | මූලාවෙති | මූලාවෙති |
| ,, | 6 | ඉදීත් | ඉදිත් |

| පිටේ. | පෙළේ. | අශුඩ. | ශුඩ. |
| --- | --- | --- | --- |
| 189 | 7 | නදියත් | නදියක් |
| 190 | 10 | මඩූණ්ක | මණ්ඩූක |
| ,, | 35 | සක්‍යතෙ | ශක්‍යතෙ |
| 191 | 10 | සඛතෙමේ | සපීතෙමේ |
| 193 | 2 | මිත්‍රගාව | මිත්‍රභාව |
| ,, | 17 | කලනොගෙයි | නොකෙරෙයි |
| 196 | 23 | සඣ | සඣ |
| ,, | 24 | විඥෙයං | විඥෙයඃ |
| ,, | 33 | රූපනාතස | රූපනාතස |
| 198 | 28 | ප්‍රතිසකාණ්ඩිත | ප්‍රතිසකාණ්ඩත |

# HITOPADESAYA.

# හි තො ප දෙ ශ ය.

1. අවබොධ කරණලද මේ හිතොපදෙශය සංස්කෘත භාෂාව පිළිබඳවූ කථාවෙහි දක්ෂබවද, නානාවිධවූ සියලු කාරණයෙහි වචනයන් යෙදීමෙහි විසිතුරු බවද, රාජ නීතිශාස්ත්‍රය දැනීමද දුනය කෙරේ.

2. නුවණැති පුරුෂතෙම ජර මරණ දෙකින් මිදුනුඑකක්හු මෙන් තර්ක ව්‍යාකරණාදි ශාස්ත්‍ර දැන්මද, මුතු මැණික් ආදී ධනය රැස්කිරීමද උතුම්කොට සිතන්නේය, මරහු විසින් කෙශයෙන් තරකොට ගන්නාලද එකක්හු මෙන් අනවරතයෙන් සුචරිතයෙහි හැසිරෙන්නේය.

3. සොරසතුරු ආදීන්විසින් පැහැරගත නොහැකි බැවින්ද, අගය නියමකළ නොහෙන බැවින්ද, හැමකල්හි ගෙවී හීන නොවන බැවින්ද, සකල ද්‍රව්‍යයන් අතුරෙන් ශාස්ත්‍ර නම්වූ ද්‍රව්‍යයම අතිශයින් උතුම්යයි පණ්ඩිතයෝ කියත්.

4. පාත්වූ භූමියකරා බැසයන නදිය සාගරයට පැමිණෙන්නා මෙන් උගත් ශාස්ත්‍රයම ලංවිය නොහැකිවූ රජ්ජුරුවන් කරාද ඉන්පසු ඓශ්වර්‍ය්‍යයට හිතවූ භාග්‍යය කරාද හීන කුලයෙහි උපන්නාවූද මනුෂ්‍යයා පමුණුවයි.

---

1. ශ්‍රැතො හිතොපදෙශො'යං පාටවං සංස්කෘතොක්තිෂු,
   වාචාං සර්‍වත්‍ර වෛචිත්‍ර්‍යං නීතිවිද්‍යාං දදාති ච.
2. අජරාමරවත් ප්‍රාඥො විද්‍යාමර්‍ථඤ්ච චින්තයෙත්,
   ගෘහීත ඉව කෙශෙෂු මෘත්‍යුනා ධර්‍මමාචරෙත්.
3. සර්‍වද්‍රව්‍යෙෂු විද්‍යෛව ද්‍රව්‍යමාහුර නුත්තමම්,
   අහාර්‍ය්‍යත්වා දනර්ඝත්වා දක්ෂයත්වාච්ච සර්‍වදා.
4. සඞ්ගමයති විද්‍යෛව නීචගාපි නරං සරිත්,
   සමුද්‍රමිව දුර්ධර්ෂං නෘපං භාග්‍යමතඃ පරම්.

1. ශාස්ත්‍රඥනය තෙමේ ජනයාට හික්මීම ගෙණ දෙයි, හික්මීම හෙතුකොටගෙණ ගුණයෙන් යුක්ත බවට පැමිණේ, ඒ සුදුසුබව හෙතුකොටගෙණ ධනයට පැමිණේ, ධනය හෙතුකොටගෙණ සුචරිතයටද, ඒ සුචරිතය හෙතුකොටගෙණ සැපතටද පැමිණේ.

2. කඩුආදිවූ ආයුධ විද්‍යාවද, තර්ක ව්‍යාකරණාදි ශාස්ත්‍ර විද්‍යාවද විද්‍යායි, මේ විද්‍යා දෙක කීර්ත්ති ලාභය පිණිස වෙත්, මහලු වයසට පැමිණිකල මුලකී ආයුධ විද්‍යාව සිනාවට කාරණ වන්නීය, පසුවකී ශාස්ත්‍ර විද්‍යාව වනාහි හැමකල්හි ලොකයා විසින් ආදරකරණු ලබා.

3. නූපුලුස්සනලද තෙත්වූ මැටි බදනෙහි කුඹලා විසින් ඔබ්බනලද සැරසීම තෙම කල් ඉක්මගිය නමුදු අන්‍ය ප්‍රකාරයකින් වෙනසක් යම්හෙයකින් නොවන්නේද, එහෙයින් කව්ඩු ඉදිබු ආදීන්ගේ කථා උපායෙන් සිතියමකින් මෙන් වැසීමකොට මේ පොතෙහි බාලයන්ට නීතිශාස්ත්‍රය කියනුලැබේ.

4. මිත්‍ර ලාභනම් පරිච්ඡේදය, මිත්‍ර භෙදනම් පරිච්ඡේදය, විග්‍රහනම් පරිච්ඡෙදය, සන්ධිනම් පරිච්ඡේදයදැයි යනමේ පරිච්ඡේද සතරකට බෙදූ පඤ්චතන්ත්‍රනම් ප්‍රකරණයෙන්ද එසේම අනිකුදු මහාභාරත කාමන්දකාදි ප්‍රකරණයන් ගෙන්ද කරුණු උපුටා රැගෙණ ලියනු ලැබේ.

ගඞ්ගා නදියගේ ඉවුරෙහි පාටලිපුත්‍රනම් නුවරෙක් ඇත, ඒ නගරයෙහි සියලු රාජගුණයෙන් යුක්තාවූ සුදර්ශන නම් රජෙක් විය. ඒ රජතෙම එක් දිනෙක කිසිවෙක්හු විසින් කියනුලබන්නාවූ සොලෝ දෙකක් ඇසූයේය.

---

1. විද්‍යා දදාති විනයං විනයාද් යාති පාත්‍රතාම්,
පාත්‍රත්වාද් ධනමාප්නොති ධනාද් ධර්මං තතඃ සුඛම්.

2. විද්‍යා ශස්ත්‍රඤ්ච ශාස්ත්‍රඤ්ච ද්වෙ විද්‍යෙ ප්‍රතිපත්තයෙ,
ආද්‍යා හාස්‍යාය වෘද්ධත්වෙ ද්විතීයාද්‍රියතෙ සදා.

3. යන්නවෙ භාජනෙ ලග්නඃ සංස්කාරො නාන්‍යථා භවෙත්,
කථාච්ඡලෙන බාලානාං නීතිස්තදිහ කථ්‍යතෙ.

4. මිත්‍රලාභඃ සුහෘද්භෙදො විග්‍රහඃ සන්ධිරෙව ච,
පඤ්චතන්ත්‍රාත්තථාන්‍යස්මාද් ග්‍රන්ථාදාකෘෂ්‍ය ලිඛ්‍යතෙ.

1. (එනම්) නොයෙක් කාරණයෙහි සැක නසන සුලුවූ චක්ෂු පථයෙහි නුවූ කරුණුදක්වීම කරවන්නාවූ සකල ලොකයාගේ ඇසක්වූ ශාස්ත්‍රය යම් පුරුෂයක්හට නැත්තේනම් හෙතෙම අන්ධයෙක්මය.

2. තරුණවයසය, ධනසම්පත්තිය, අධිපතිභාවය, නුවණින් පරීක්ෂා නොකරණබවය, (යන මොවුන් අතුරෙහි) එක එක කාරණයකුදු හානිය පිණිස වෙයි, එහි අඞ්ග සතරම එක්වූකල කියනු කිම? (යනුයි.)

මේ සොලෝ දෙක අසා, දැනගන්නාලද ශාස්ත්‍රයක් නැත්තාවූ ක්‍රීඩාද්‍යූතාදියෙන් නිතර නොමග පවත්නාවූ ස්වකීය පුත්‍රයන්ගේ ශාස්ත්‍ර ඥානය ලැබියයුතු ඉගණීමෙහි ප්‍රමාදභාවය නිසා සිත් කලකිරුණාවූ ඒ රජතෙම මෙසේ සිතී.

3. නොපෙණෙන්නාවූ ඇසින් ප්‍රයොජන නැත, ඇසට එකම දුක පමණක්මය, එසේම යම් පුත්‍රයෙක් අඥානද සුචරිතයෙහි නොපිහිටියේද උපන්නාවූ ඒ පුත්‍රයාගෙන් ප්‍රයොජන නොවේ.

4. නූපන් එකෙක්ද, මළාවූ එකෙක්ද, අඥානයෙක්ද යන මේ තුන්දෙනා අතුරෙන් පළමුකොට කී දෙදෙන උතුම්වෙත්; පසුව කියනලද තැනත්තේ උතුම් නොවේ. පළමුකී දෙදෙන එකම වරක් දුක් දෙති, අඥානයාවූකලී පියවරක් පියවරක් පාසා දුක්දෙයි.

5. තවත් කාරණයෙක්—වදනකාලයට පළමු දරුවාගේ වැටීම උතුම්වන්නේය, නැවතද ඔසප් ස්ත්‍රියහා සම්භොග නොකිරී

---

1. අනෙකසංශයොච්ඡෙදි පරොක්ෂාර්ථස්‍ය දර්ශකම්,
සර්වස්‍ය ලොචනං ශාස්ත්‍රං යස්‍ය නාස්ත්‍යන්ධ එව සඃ.

2. යෞවනං ධනසම්පත්තිඃ ප්‍රභුත්වමවිවෙකිතා,
එකෛකමප්‍යනර්ථාය කිමු යත්‍ර චතුෂ්ටයම්.

3. කො'ර්ථඃ පුත්‍රෙණ ජාතෙන යො න විද්වාන් න ධාර්මිකඃ,
කාණෙන චක්ෂුෂා කිං වා චක්ෂුඃ පීඩෛව කෙවලම්.

4. අජාතමෘතමූර්ඛාණාං වරමාද්‍යෞ න චාන්තිමඃ,
සකෘද්දුඃඛකරාවාද්‍යා වන්තිමස්තු පදෙ පදෙ.

5. කිඤ්ච:—වරං ගර්භස්‍රාවො වරමපි ච නෛවාභිගමනං
වරං ජාතඃ ප්‍රෙතො වරමපි ච කන්‍යාවජනිතා,
වරං වන්ධ්‍යා භාර්‍ය්‍යා වරමපි ච ගර්භෙෂු වසතිඃ
න වා 'විද්වාන් රූපද්‍රවිණගුණයුක්තො'පි තනය''ඃ.

මද උතුම, උපන් පුරුෂයෙක් මරණයට පැමිණියේද හෙද උතුම්වේ, නැවතද මව්තොමෝ කන්‍යාවක්ම වීද උතුම් වන්නිය, වඳවූ අඹුවද උතුම් වීය, නැවතද මවගේ කුසෙහිම විද්‍රූවේද උතුම්වෙයි, රූපශොභාවෙන් හා ධනයෙන්ද අධිකවූ පුත්‍රයෙක් නමුදු අඥාන වූයේනම් උතුම් නොවේ.

1. උපන්නාවූ යම් පුත්‍රයක්හු කරණකොටගෙණ එම ගොත්‍රය උසස්බවට යේද හෙතෙම උපන්නේ වේ, උපදිමින් නසිමින් සංසාරයෙහි ගමන්කරණ කල්හි මළාවූ කවරෙක්නම් නූපදනේද, එ හෙයින් උපන් පමණකින් උතුම් නොවෙයි.

2. අනිකුදු කාරණයෙක්—නුවණැති පුරුෂයෝ මේ මේයයි ඔවුන්ගේ ගණන ලකුණුකිරීමට පටන්ගන්නා කල්හි යම් පුරුෂයක්හුගේ ලකුණෙහි ගෞරවයෙන් ලකුණුකරණ ද්‍රව්‍යය නොවැටෙන්නේද ඔහු කරණකොටගෙණ මව් වැදූ එකියක් වීනම් වඳගැහැනියක් කෙබඳුද යනු පින්වත කියව?

3. නැවතද—යොග්‍යස්ථානයෙහි ද්‍රව්‍යදීමය, තපස්රැකීමය, යුද්ධභූමියෙහි ජයග්‍රහණයපිණිස කරණ වික්‍රමය, ශාස්ත්‍රය, ධනය රැස්කිරීමය, යනමේ කාරණ විෂයෙහි යමක්හුගේ සිත නොපිහිටියේද ඒ පුත්‍රතෙම මවගේ මලමූත්‍රමය.

4. අනිකුදු කරුණු—චතුරගුණඇති එක් පුත්‍රයෙක් උතුම, අඥානපුතුන් සියගණනකින්ද ප්‍රයොජන නොවේ, (මීට කාරණයෙක්නම්) එකම චන්ද්‍රයා අඳුරු නසා, තාරකා සමූහයක් විසිනුදු අඳුරු දුරුකරණු නොලැබේ.

---

1. ස ජාතො යෙන ජාතෙන යාති වංශඃ සමුන්නතිම්,
පරිවර්තිනි සංසාරෙ මෘතඃ කො වා න ජායතෙ.

2. අන්‍යච්ච :—ගුණිගණගණනාරම්භෙ න පතති කඨිනී සසම්භ්‍රමාද් යස්‍ය,
තෙනාම්බා යදි සුතිනී වද වන්ධ්‍යා කීදෘශී භවති.?

3. අපි ච :—දානෙ තපසි ශෞර්‍යෙ ච යස්‍ය න ප්‍රථිතං මනඃ,
විද්‍යායාමර්ථලාභෙ ච මාතුරුච්චාර එව සඃ.

4. අපරඤ්ච :-වරමෙකො ගුණී පුත්‍රො න ච මූර්ඛශතෛරපි,
එකශ්චන්ද්‍රස්තමො හන්ති න ච තාරාගණෛරපි.

1. යමෙක්හුවිසින් යම්කිසි පිරිසිදුවූ තීර්ථයෙක්හි අතිශයින් දුෂ්කරවූ තපසෙක් කරණලදද ඕහට ධනයෙන් වැඩුනාවූද සුචරිතයෙහි පිහිටියාවූද නුවණැති වසඟවූ පුත්‍රයෙක් ඇතිවන්නේය.

2. එයින්ද කියනලදී—එම්බා මහරජ! නිතර ධනලාභය, නිරොගීබවය, ප්‍රිය භාර්‍ය්‍යාවය, ප්‍රිය වචනකියනසුලු භාර්‍ය්‍යාවය, තමා අණ පිළිගන්නා පුතුය, ධනලාභයට හෙතුවූ ශාස්ත්‍රය යන මේ සය සත්වලොකයෙහි සැපයෝයි.

3. බොල්පිරූ කුරුණී සමානවූ ශාස්ත්‍රඥතාදියෙන් තොරවූ බොහෝ පුතුන්ගෙන් කවර පිණෙක්ද? යම් පුත්‍රයෙක්හු උපන්කල්හි පියතෙම මහජනයා විසින් ප්‍රශංසාකරණු ලැබේද කුලය උසුලන්නාවූ එබඳු එකම පුත්‍රයා උතුම්වේ.

දැන් මේ මාගේ පුත්‍රයෝ ගුණඇත්තහු කරණුලැබෙත්වා.

4. යම්කාරණයකින්—ආහාර අනුභවකිරීමය, සැතපීමය, භයය, මෛථුනය යන මේ සතර තිරිසන්නුහා තිරිසනුන්ගේද සමානයහ, සුචරිත ක්‍රියාවවූකලී ඒ මිනිසුන්ගේ අධිකවූ වෙනසනම, සුචරිත ක්‍රියාවෙන් තොරවූ ඒමනුෂ්‍යයෝ තිරිසනුන්හා සමයෝය.

5. යම් කාරණයෙකින්—සුචරිත ක්‍රියාවය, ධනය, කාමසැපඅනුභවය, නිර්වාණය යන මොවුන් අතුරෙන් එකකුදු යම් පුරුෂයක්හට නැත්තේද ඔහුගේ ඉපදීම ප්‍රයොජන නොවේ, (කුමක්මෙන්ද) එළුදෙනගේ බෙල්ලෙහිවූ තනයෙහි හටගැන්ම ප්‍රයොජන නොවන්නා මෙනි.

---

1. පුණ්‍යතීර්ථේ කෘතං යෙන තපඃ ක්වාප්‍යතිදුෂ්කරම්,
තස්‍ය පුත්‍රො භවෙද්වශ්‍යඃ සමෘද්ධො ධාර්මිකඃ සුධීඃ.

2. තථා චොක්තම්:—අර්ථාගමො නිත්‍යමරොගිතා ච
ප්‍රියා ච භාර්‍ය්‍යා ප්‍රියවාදිනී ච,
වශ්‍යශ්ච පුත්‍රො'ර්ථකරී ච විද්‍යා
ෂඩ් ජීවලොකෙෂු සුඛානි රාජන්.

3. කො ධන්‍යො බහුභිඃ පුත්‍රෛඃ කුශූලා පූරණාඪකෛඃ,
වරමෙකඃ කුලාලම්බී යත්‍ර විශ්‍රූයතෙ පිතා.

4. යතඃ :—ආහාරනිද්‍රා භයමෛථුනංච සාමාන්‍යමෙතත් පශුභිර්නරාණාම්,
ධර්මො හි තෙෂා මධිකො විශෙෂො ධර්මේණ හීනාඃ පශුභිඃ සමානාඃ.

5. යතඃ :——ධර්මාර්ථකාමමොක්ෂාණාං යස්‍යෛකො'පි න විද්‍යතෙ,
අජාගලස්තනස්‍යෙව තස්‍ය ජන්ම නිරර්ථකම්.

1. යමක්වනාහි කියනුලැබේද—ජීවත්වන කාලය, ජීවත් වන කල්හි ක්‍රියාවය, ධනය, ශාස්ත්‍රය, මරණය යනමේ පස මව් කුස වසන්නාවූ ජනයාහටම නියමකරණු ලැබෙත්.

2. අනිකකුදු දක්නාලැබෙයි—ඒකාන්තයෙන් වන්නාවූ ක්‍රියාවෝ මහොත්තම දෙවියන්ටපවා වන්නාහ, ඊශ්වරයාගේ වස්ත්‍ර රහිතභාවයද, විෂ්ණුහුගේ අනන්ත නම් නාරජු කෙරෙහි සැතපීමද, (මීට කරුණුයි).

3. අනිකුදු කාරණයෙක්—යමක් ඒකාන්තයෙන් නොවිය යුතුද ඒ ක්‍රියාව නොවන්නේමය, යමක් ඒකාන්තයෙන් විය යුතුද ඒ තෙම අන්පරිද්දකින් වෙනස් නොවේ, මෙබඳු සිතිවිලි නැමති විෂ නසන මේ බෙහෙත කුමක් හෙයින් පානය කරණු නොලැබේද?

මේ තෙම කටයුතුවූ ක්‍රියා සම්පාදනය පිණිස අපොහොසත් ඇතම් අලසයන්ගේ කීමෙක් වෙයි.

4. ඒ එසේමැයි—එක් රථචක්‍රයක් කරණකොටගෙණ රථයාගේ ගමන යම්සේ නොවේද, එසේම පුරුෂයාගේ උත්සාහවත් ක්‍රියාවෙන් වෙන්ව භාග්‍යයයි කියනලද ඓශ්වර්‍ය්‍යය ලැබීමට හිතවූ කාරණය සිදුනොවේ.

5. එසේද කියනලදී—පෙර ජාතියෙහි සම්පාදනය කරණලද යම් කර්‍මයෙක් ඇද්ද ඒ තෙම භාග්‍යයයි කියනුලැබේ, එහෙයින් අලසනුවූ තැනැත්තේ පුරුෂත්වය වැළඳගෙණ කාර්‍ය්‍ය සිද්ධිය පිණිස උත්සාහ කරන්නේය.

---

1. යච්චොච්‍යතෙ:—ආයුඃ කර්‍ම ච විත්තඤ්ච විද්‍යා නිධනමෙව ච,
පඤ්චෛතාන්‍යපි සෘජ්‍යන්තෙ ගර්‍භස්ථස්‍යෛව දෙහිනඃ.

2. කිඤ්ච:—අවශ්‍යම්භාවිනො භාවා භවන්ති මහතාමපි,
නග්නත්වං නීලකණ්ඨස්‍ය මහාහි ශයනං හරෙඃ.

3. අන්‍යච්ච:—යදභාවී න තද්භාවී භාවී චෙන්න තදන්‍යථා,
ඉති චින්තාවිෂඝ්නො'යමගදඃ කින්න පීයතෙ.

4. යථා හ්‍යෙකෙන චක්‍රෙණ න රථස්‍ය ගතිර්භවෙත්,
එවං පුරුෂකාරෙණ විනා දෛවං න සිධ්‍යති.

5. තථාච:—පූර්‍වජන්මකෘතං කර්‍ම තද්දෛවමිති කථ්‍යතෙ,
තස්මාත් පුරුෂකාරෙණ යත්නං කුර්‍ය්‍යාදතන්ද්‍රිතඃ.

1. අනිකුදු කාරණයෙක්—උත්සාහවත්වූ ශ්‍රෙෂ්ඨ පුරුෂයා කරා සම්පත්තියෙහි අධිගෘහිත දෙවි තොමෝ ලන්වන්නීය, භාග්‍යයවිසින් ඓශ්වර්ය්‍යය දියයුතුයයි අලස පුරුෂයෝ කියති, එහෙයින් භාග්‍යය ඉවතලා තමාගේ ශක්තියෙන් පුරුෂයා පිළිබඳවූ උත්සාහය කරව, උත්සාහකළ කල්හි ඉදින් සිදු නොවේද, මේ කීමෙහි දෙෂය කිම.?

2. කුඹලෙක් තමාට යම් කල සැලි ආදියක් කැමතිද ඒ කැමති දෙය මැටිපිඩකින් යම්සේ කරන්නේද එසේම පුරුෂ තෙම තමාවිසින් කරණලද ක්‍රියාවගේ ඵලයට පැමිණේ.

3. අනිකුදු කාරණයෙක්—කව්ඩකු ගමන්කරණ කල තල් ගෙඩියක් වැටුනේයයි කරුණක් නැතිව සිතීමමෙන් ඉදිරියට පැමිණි නිධානයක් දැක පවා භාග්‍යය තමාම නොගන්නේය, පුරුෂයාගේ ක්‍රියාව කැමතිවෙයි.

4. ඒ එසේමැයි, කටයුතු ක්‍රියාවෝ උත්සාහය කාරණකොට ගෙණ සඵලවෙත්, ආශාවෙන්යුත් කල්පනාවන් කාරණකොට ගෙණ සිදුනොවෙත්, සැතපීඋන් සිංහයක්හුගේ මුඛයෙහි සිව්පාවෝ නොවදිති.

5. එසේද කියනලදී—යම්හෙයකින් ලදරුවූ පුත්‍රතෙම මව් පිය දෙදෙන විසින් ශාස්ත්‍රයක් නොම උගන්වන ලද්දේද එබඳු මව සැතිරියක් වන්නීය, පියාද සතුරෙක් වන්නේය, ඒ පුත්‍රයා හංස සමූහයාගේ මැදදී කොකකු මෙන් සභා මධ්‍යයෙහිදී නොහොබී.

---

1. අන්‍යච්ච:—උද්‍යොගිනං පුරුෂසිංහ" මුපෛති ලක්ෂ්මී-
දෛවෙන දෙයමිති කාපුරුෂා වදන්ති,
දෛවං නිහත්‍ය කුරු පෞරුෂමාත්මශක්ත්‍යා
යත්නෙ කෘතෙ යදි න සිධ්‍යති කො'ත්‍ර දොෂඃ.

2. යථා මෘත්පිණ්ඩතඃ කර්තා කුරුතෙ යද් යදිච්ඡති,
එවමාත්මකෘතං කර්ම මානවඃ ප්‍රතිපද්‍යතෙ.

3. අපරඤ්ච:—කාකතාලීයවත් ප්‍රාප්තං දෘෂ්ටවාපි නිධිමග්‍රතඃ,
න ස්වයං දෛවමාදත්තෙ පුරුෂාර්ථම පෙක්ෂතෙ.

4. උද්‍යමෙන හි සිධ්‍යන්ති කාර්‍ය්‍යාණි න මනොරථෛඃ
න හි සුප්තස්‍ය සිංහස්‍ය ප්‍රවිශන්ති මුඛෙ මෘගාඃ.

5. තථාචොක්තම්:—මාතා ශත්‍රුඃ පිතා වෛරී යෙන බාලො න පාඨිතඃ,
න ශොභතෙ සභාමධ්‍යෙ හංසමධ්‍යෙ වකොයථා.

1. දක්මට ප්‍රියවූ රූපශොභාවෙන් හා තරුණ අවස්ථාවෙන්ද යුක්තවූ ප්‍රසිඬ ගොත්‍රයෙහි උපන්නෝද ශාස්ත්‍ර නොදන්නාහු නම් නොහොබනාහු වෙති, සුවඳනැති කැලමල් නොහොබනා මෙනි.

2. අතිකතුදු—යමෙක් පොත්වල ප්‍රකාසිත කරුණු පුහුණු නොකරණ ලදද, එසේම ගුරුන් සමීපයෙහි නොම හදුරණ ලදද ඒ මනුෂ්‍යයා සොර පුරුෂයන් නිසා දැරිඇති ස්ත්‍රියක්මෙන් සභාමධ්‍යයෙහිදී නොහොබනේය.

කියනලද මේ කරුණුසිතාපියා ඒ රජතෙම පණ්ඩිත ජනයාගේ සභාවක් රැස්කරවූයේය. ඉන්පසු රජතෙම "පින්වත් පින්වත් පණ්ඩිත වරුණි! මාගේ වචනය අසනුලැබේවා, ශාස්ත්‍ර නූගත්තාවූද නිතර නොමග යන්නාවූද මාගේ පුත්‍රයන්ට දැන් නීති ශාස්ත්‍රය පුහුණුකරවීමෙන් නැවත උත්පත්තිය කරවීමට යමෙක් පොහොසත්ද එබඳුවූ කිසි පණ්ඩිතයෙක් ඇද්ද?සි කීයේය.

3. යම්හෙයකින්, වීදුරුව රන්හා ගැළපීම හෙතුකොටගෙණ මරග මිණියකගේ ශොභාව උසුලා, එසේම පණ්ඩිතයන් හා එක්වීමෙන් අඥනයාද දක්‍ෂබවට පැමිණේ.

4. කියනලද්දේද වෙයි, එම්බා පුත්‍රය! අඥන ජනයන් හා එක්වීම හෙතුකොටගෙණ ප්‍රඥව පිරිහෙන්නීමය, සමානවූ නුවණැත්තවුන් හා එක්වීම හෙතුකොටගෙණ සමානබවටද පැමිණේ, අධික ප්‍රඥවන්තයන් හා එක්වීම හෙතුකොටගෙණ අධිකවූ ප්‍රඥවට පැමිණෙයි.

මේ පණ්ඩිතයන් මැද උන් සියලු නීතිශාස්ත්‍ර තත්වය දත් විෂ්ණුශර්මන් නම් පණ්ඩිත තෙම "මහරජ!" මේ රාජපුත්‍රයෝ පූජ්‍යවූ වංශයෙහි උපන්නෝය, එහෙයින් මාවිසින් නීතිශාස්ත්‍රය උගන්වන්ට හැකිවනු ලැබෙත්.

---

1. රූපයෞවන "සම්පන්නා විශාලකුල" සම්භවාඃ,
විද්‍යාහීනා න ශොභන්තෙ නිර්ගන්ධා ඉව කිංශුකාඃ.

2. අපරඤ්ච:—පුස්තකෙෂු ච නාධීතං නාධීතං ගුරුසන්නිධෞ,
න ශොභතෙ සභාමධ්‍යෙ ජාරගර්භ ඉව ස්ත්‍රියඃ.

3. යතඃ:——කාචඃ කාඤ්චනසංසර්ගාද්ධත්තෙ මාරකතීර්ද්‍යුතීඃ,
තථා සත්සන්නිධානෙන මූර්ඛො යාති ප්‍රවීණතාම්,

4. උක්තඤ්ච:—හීයතෙ හි මතිස්තාත හීනෛඃ සහ සමාගමාත්,
සමෛශ්ච සමතාමෙති විශිෂ්ටෛශ්ච විශිෂ්ටතාම්.

1. යම් හෙයකින්, නුසුදුසු වස්තුයෙහි පිහිටුවනලද කිසිම ක්‍රියාවක් ඵලඇත්තේ නොවේ, ක්‍රියා සියයකිනුත් කොකෙක් ගිරවකුමෙන් කථාකරණු නොලැබේ.

2. අනිකකුදු වෙයි—මේ රජ “කුලයෙහි ගුණනැති පුතෙක් නොම උපදී, පද්මරාගයන් අටගන්නා ස්ථානයෙහි කාච මාණික්‍යයාගේ ඉපදීමෙක් කෙසේනම් වන්නේද?

එහෙයින් මම සමසක් ඇතුළත නුඹවහන්සේගේ පුත්‍රයන් නීතිශාස්ත්‍රය දන්නවුන් කරන්නෙමි”යි බෘහස්පති මෙන් කීය.

3. රජ තෙම ගෞරව සහිතව නැවත කියේය—“සමන් මලෙහි ඇලීම හෙතුකොටගෙණ පණුවාපවා පූජ්‍යජනයන්ගේ ඉසටනගී, උත්තමයන් විසින් මනාකොට පුදනලද ගලෙක් පවා දෙව්බවට යේ.

4. අනිකකුදු වෙයි—සූර්‍ය්‍ය රශ්මියගේ වැදීම කරණකොට ගෙණ යම්සේ ද්‍රව්‍ය ප්‍රකාශවේද, එසේම උතුමන් හා ගැළපීම කරණකොටගෙණ අක්ෂර නොදත් පුරුෂයාද බබලා.

එහෙයින් මාගේ මේ පුත්‍රයන්ට නීති ශාස්ත්‍රය ඉගැන්වීම පිණිස පිණැත්තනු සුදුසුය”යනු කියා, ඒ විෂ්ණුශර්මන්හට මහත් සත්කාර මුල්කොට පුත්‍රයන් පාවාදීන. ඉන්පසු ප්‍රාසාදයාගේ මතුමාලේ සැපසේ උන් රාජපුත්‍රයන්ගේ ඉදිරියේ කාලානුරූප පරිද්දෙන් ඒ පණ්ඩිත තෙම මෙසේ කීය.

5. “කාව්‍ය ශාස්ත්‍රය පිළිබඳවූ සතුටින් යුක්තව නුවණැති ජනයාගේ කාලය ඉක්මේ, අඥානයන්ගේ කාලය දූ කෙළි මත් පැන් පීම් ආදි විපත්තිවලින් හෝ සැතපීමෙන් හෝ ඩබරතිරී මෙන්දැයි මේ එකකින් යුක්තව ඉක්මේ.

---

1. යතඃ :——නාද්‍රව්‍යෙ නිහිතා කාචිත් ක්‍රියා ඵලවතී භවෙත්,
න ව්‍යාපාරශතෙනාපි ශුකවත් පාඨ්‍යතෙ වකඃ.

2. අන්‍යච්ච:—අස්මිංස්තු නිර්ගුණං ගොත්‍රෙ නාපත්‍යමුපජායතෙ,
ආකරෙ පද්මරාගාණං ජන්ම කාචමණෙඃ කුතඃ.

3. “කීටො'පි සුමනඃ සඞ්ගාදාරොහති සතාං ශිරඃ,
අශ්මාපි යාති දෙවත්වං මහද්භිඃ සුප්‍රතිෂ්ඨිතඃ.

4. අන්‍යච්ච:—යථොදයගිරෙර්ද්‍රව්‍යං සන්නිකර්ෂෙණ දීප්‍යතෙ,
තථා සත්සන්නිධානෙන හීනවර්ණො'පි දීප්‍යතෙ.

5. “කාව්‍යශාස්ත්‍රවිනොදෙන කාලො ගච්ඡති ධීමතාම්,
ව්‍යසනෙන ච මූර්ඛාණං නිද්‍රයා කලහෙන වා.

එහෙයින් පින්වත් කුමාරවරුන්ගේ සන්තෝෂය සඳහා කවුඩු ඉදිබු ආදීන්ගේ විසිතුරු කථා කියමි”යි මෙසේ කීකල, කියනු ලැබේවයි රාජපුත්‍රයන් විසින් කියන ලද්දේය. විෂ්ණුශර්මන්තෙම යම් මිත්‍රලාභයෙක් ඇද්ද, ඒකථාවෙහි මේමුල් ශ්ලොකය දැන් කියනුලැබේ, තොපි අසව්යයි කීය.

1. උතුම් මිත්‍රයන්ගෙන් යුක්තවූ ආයුධ ශාස්ත්‍රාදී උපාය රහිත වූ ධනයක් නැති නුවණැති ජනයෝ කවුඩු, ඉදිබු, මුව, මී යන මොවුන් මෙන් වහා කටයුතු සිදුකරවාපියති යනුයි.

ඒ කෙසේදැයි? රාජපුත්‍රයන් විචාළබස් අසා විෂ්ණුශර්මන් කීයේය--ගොදාවරී නදී ඉවුරෙහි මහත් ඉඹුල් රුකෙක් ඇත. නොයෙක් දිශාභාගයෙන් අවුත් පක්ෂීහු රෑ ඒ ගසෙහි ලගිත්. ඉක්බිති එක් දිනක් රාත්‍රිය ඉක්මයනකල හෙළඋපුලට නායකවූ පිණැති සඳමඬල අස්තපර්වතයෙහි තෝඩුවක් මෙන් එල්විසිටියදී නින්දෙන් පිබිදුනාවූ ලඝුපතනකනම් කව්ඩෙක් දෙවෙනි මරු වකුමෙන් එන වැද්දකු දිටී. ඒ වැද්දා දැක “අද උදෑසන්හිම අවමඞ්ගල්‍යවූ දැක්මෙක් වූයේය, කවර අප්‍රියයෙක් යෙදෙන්නේ වේදැයි නොදනිමි?” සිතීය, මෙසේ කියා සිත් කැලඹුනාවූ කව්ඩු තෙම ඒ වැද්දා පසුපස්සෙහි ක්‍රමයෙන් ගියේය.

2. යම් හෙයකින්—ශොකයෙන් තැවියයුතු කරුණු දහස් ගණනක්ද, භයවියයුතු කරුණු සියගණනක්ද, අඥානපුරුෂයා කරා හැමදවස්හිම පැමිණෙති, නුවණැත්තා කරා ශොක භය දෙකට කරුණු නොපැමිණෙත්.

අනිකකුදුවේ—ලොව ජනයා විසින් මේ තෙම එකාන්ත යෙන් කටයුතුවේ, කුමක්ද?

3. මරණය, රොගය, ශොකය යන මොවුන් අතුරෙන් අද දවස්හි කුමක්නම් පැමිණෙන්නේදැයි නින්දෙන් නැගිට නැගිට එළඹසිටි මහත් භය සැලකිය යුතු.”

---

1. අසාධනා විත්තහීනා බුද්ධිමන්තඃ සුහෘත්තමාඃ,
සාධයන්ත්‍යාශු කාර්‍ය්‍යාණි කාකකූර්ම” මෘගාඛුවත්.

2. යතඃ:—ශෝකස්ථානං සහස්‍රාණි භයස්ථානං ශතානි ච,
දිවසෙ දිවසෙ මූඪං “මාවිශන්ති න පණ්ඩිතම්.

3. උත්ථායොත්ථාය බොද්ධව්‍යං මහද්භයමුපස්ථිතම්,
මරණ” ව්‍යාධි ශොකානාං කිමද්‍ය නිපතිෂ්‍යති?

1. එකල්හි ඒ වැද්දා විසින් සුත්සගල් විසුරුවාපියා දැල එළන ලද්දේය. හෙතෙමේද ඊට හුදුරුව එහි සැඟවී සිටියේය. මේ කාලයෙහිම චිත්‍රග්‍රීවනම් පරවිරජෙක් පිරිවර හා සමග අහස්හි ගමන්කරණුයේ ඒ සුත්සගල් දුටුයේය. ඉන්පසු පරවිරජ “මිනිසුන්ගේ රැස්වීමක් නැති මේ වනයෙහි සගල් කැබලි ලැබීම කෙසේවේද? එහෙයින් පළමුකොට ඒ කාරණය පරීක්‍ෂා කරණු ලැබේවා. මේ කාරණය ශුභයයි නොසිතමි. මේ සගල් කැබලි පිළිබඳවූ මහත් ලොභය කරණකොටගෙණ, රන් වළල්ල ගැණීම පිණිස කරණලද ලොභයෙන් ගොඩනැගිගත නොහෙන මඩෙහි ගිළුනු ඒ මගියා මහලු ව්‍යාඝ්‍රයා විසින් අල්වා ගන්නාලද්දේ යම්සේ මැරුණේද?

අපවිසිනුදු බොහෝසෙයින් එසේ වියයුතුය”යි සුත්සගලට ගිජුවූ පරවියන්ට කියයි. ඒ අසා පරවියෝ ඒ කෙසේදැයි විචාළෝය. පරවිරජ තෙම මෙපවත් කිය.

“මම එක් කලෙක දකුණුදිග වනයෙහි ඇවිදිනෙමි දුටිමි, එක් මහලු දිවියෙක් ජලස්නානය කොට විල්ඉවුරෙක සිට මග යන්නවුන් දැක” “පින්වත් පින්වත් මගිය! මේ රන්වළල්ල අතෙහි කුශතණඇති මාකෙරෙන් ගන්නාලැබේව”යි කියයි. ඉන්පසු ලොභයෙන් අඳනාලද සිතින් යුත් එක්තරා මගියෙක්හු විසින් මෙසේ සිතනලදී. “මේ වළල්ල භාග්‍යය කරණකොට ගෙණ ලැබෙයි, එසේද මේ ජීවිත හානියකරණ කාරණය පිළිබඳවූ සැකය කෝතරහි පැවැත්ම නොකටයුතුය.

2. යම්හෙයකින්—ප්‍රිය නොවන එකෙක්හු කෙරෙන් මනා ලාභයක් ඇතිකල්හිද මඞ්ගල්‍යවූ පැවැත්මක් හටනොගණී, යම් අමෘතයෙක්හි විෂ මිශ්‍රබවක් ඇත්තේද, ඒ අමෘතය නමුදු මරණය පිණිස කාරණයෙක් වේ.

නැවතද ධන රැස්කිරීම පිණිස පැවතිකල්හි සියලු කාරණයෙහි සැක ඇත්තේමය, ඒ කාරණයද පණ්ඩිතයන් විසින් කියනලදී.

---

1. කඞ්කණස්‍ය තු ලොභෙන මග්නඃ පඞ්කෙ සුදුස්තරෙ,
වෘද්ධව්‍යාඝ්‍රෙණ සංප්‍රාප්තඃ පථිකඃ ස මෘතො යථා.

2. යතඃ:—— අනිෂ්ටා දිෂ්ට ලාභෙ'පි න ගතිර්ජ්ජායතෙ ශුභා,
යත්‍රාස්තෙ විෂසංසර්ගෝ 'මෘතං තදපි මෘත්‍යවෙ.

1. කිමෙක්ද මේ කාරණය ශුභද නොහොත් අශුභදැයි පළමු කොට පරීක්‍ෂාකරණ සැකයට නොනැගී මිනිසෙක් මනා කාරණයන් නොලබන්නේය, සැකයට නැගී ඉදින් නැවත ජීවත් වේද, මනාකාරණයන් දක්නේය.

එහෙයින් පළමුකොට මම සොයා බලමි,'' සිතා "තාගේ වළල්ල කොතැන්හිද?"යි ශබ්ද පවත්වා මගියා කියයි. දිවියා අත දිගහැර දක්වයි, එකල්හි මගියා "මරුවක්හුගේ දෙහය වැනි සිරුර ඇති තා කෙරෙහි විශ්වාසය කෙසේ වන්නේද"යි කීය, එකල්හි දිවියා "බොල මගිය! අසව පළමුකොට මමම තරුණකාලයෙහි අතිශයින් පව්වුවූයෙමි. බොහෝ ගවයන් හා මිනිසුන් මැරීම හෙතුකොටගෙණ මාගේ පුත්‍රයන් හා අඹුවෝ මළෝය, මම පරම්පරාවෙන්ද පිරිහුනෙමි. ඉන්පසු එක් සත්පුරුෂයෙක්හු විසින් "පින්වත දන්දීමය සුචරිතය යන මේ ආදියෙහි හැසිරෙව"යි අනුශාසනා කරණලැබුවෙමි. ඒ අනුශාසනාවෙන් දැන් නිතර ජලස්නානය කරන්නාවූ දන්දීමෙහි රුචිවූ මහලුවූ දත්හා නිය වැටුනාවූ මම කෙසේනම් විශ්වාස කටයුතු නොවෙම්ද?

(දිවියා දන් දෙන්නෙකැයි ඇඟවීම පිණිස කළ ක්‍රියාව වඤ්චාවක්බව ප්‍රකාශවන සොලෝ දෙකක්,)

2. යාගකිරීමය, වේද ශාස්ත්‍රයන්ගේ හැදෑරීමය, සුදුස්සන්ට දීමය, තපස්කිරීමය, සත්‍ය වචනය, නොපෙරළෙන ස්ථිරවූ හිතය, ඉවසීමය, ලෝභයෙන් වෙන්වීමය යන මේ අෂ්ටවිධවූ ක්‍රමය සුචරිතයයි කියනලද්දේය.

3. මේ අෂ්ටවිධ ධර්මයන් අතුරෙන් පළමුකොට දක්වනලද යාග, හැදෑරීම්, දාන, තපස් යන මේ සතර කොටස අහඞ්කාර භාවය සඳහාද ලොකයා විසින් සෙවනය කරණලැබේ, පසුවකී සත්‍යය, ස්ථිරවූ සිතය, ඉවසීමය, අලොභය යන සතර කොටස එබඳු නොවෙයි, උතුමන් කෙරෙහිම පවතී.

---

1. තථාචොක්තම්:—න සංශය" මනාරුහ්‍ය නරො භද්‍රාණි පශ්‍යති,
සංශයං පුනරාරුහ්‍ය යදි ජීවති පශ්‍යති.

2. යතඃ:——ඉජ්‍යාධ්‍යයනදානානි තපඃ සත්‍යං ධෘතිඃ ක්ෂමා,
අලොභ ඉති මාර්ගො'යං ධර්මස්‍යාෂ්ටවිධඃ ස්මෘතඃ,

3. තත්‍ර පූර්වශ්චතුර්වර්ගො දම්භාර්ථමපි සෙව්‍යතෙ,
උත්තරස්තු චතුර්වර්ගො මහාත්මන්‍යෙව තිෂ්ඨති.

යම් කරුණෙකින් තමා අතෙහිවූ රන් වළල්ලද යම් කිසිවක් හට දෙනු කැමැත්තෙම්ද, මෙපමණක්ම මාගේ ලොභ රහිත බවට කාරණයවෙයි. එසේදවූවත් "දිවියා මිනිසුන් කන්නේය" යන ලොකයාගේ දොෂකීම වැළැක්විය නොහෙයි.

1. යම්හෙයකින් – ලෝවැසිතෙම පෙරසිටියවුන්ගේ පිළිගැණීමහා සමානව පවති, අන්‍යපුරුෂයන්හා ස්ත්‍රීන් යොදවන කුට්ටිනීනම් ස්ත්‍රිය සුචරිත ක්‍රියාවගේ නියමය සඳහා අනුශාසනාකටයුතු තැනැත්තියක්කොටද පණ්ඩිතයන් හීනකොටද ප්‍රමාණකෙරේ, යම් ප්‍රකාරයෙකින් ගවයන් මරණඑකක්හු ප්‍රමාණකෙරේද, බ්‍රාහ්මණයා එතරම්කොටද නොතකයි.

මාවිසින්ද ධර්මශාස්ත්‍රයෝ හදූරණලද්දෝය, ඒ අසව.

2. තමාගේ ප්‍රාණයෝ තමහට යම් පමණ අතිශයින් ප්‍රියයෝද රක්ෂාකටයුත්තෝද අන්‍යසත්වයන්ගේ ඒ ප්‍රාණයෝද ඔවුන්ට එසේම ප්‍රියවෙත්, රැක්කයුතුදවෙත්, (මේසුත්‍රිය සලකා) පණ්ඩිතවරයෝ තමාහා සමග උපමා කිරීමෙන් සත්වයන්ට අනුකම්පා කෙරෙති.

3. අනික්කාරණයෙන්ද—යාචකයන්ට පරුෂවූබස් කීමෙහිද, දීමෙහිද, සැපදුක්දෙකෙහිද, ශුභා ශුභදෙක්හිද, පුරුෂතෙම තමාහා සමාන කිරීමෙන් සුදුසුවූ ආචාරයට පැමිණේ.

4. වෙනත් කාරණයෙක්—අනුන්ගේ අඹුවන් තමන් මවමෙන්ද, අනුන් සන්තක ද්‍රව්‍යයන් මැටිකැටිමෙන්ද, සියලු සත්වයන් කෙරේ තමාමෙන්ද යමෙක් සිතාද හෙතෙම පණ්ඩිතවේ.

තෝද ඉතා දිළිඳුය, එහෙයින් ඒ වළල්ල තටදීමට මම උත්සාහසහිත වෙමි.

---

1. යතඃ:—ගතානුගතිකො ලොකඃ කුට්ටිනීමුපදෙශිනීම්,
ප්‍රමාණයති නො ධර්මේ යථා ගොඝනමපි විප්‍රම්.

2. ප්‍රාණා යථාත්මනො'භීෂ්ටා භූතානාමපි තෙ තථා,
ආත්මෞපම්‍යෙන භූතානාං දයාං කුර්වන්ති සාධවඃ.

3. අපරඤ්ච:—ප්‍රත්‍යාඛ්‍යානෙ ච දානෙ ච සුඛදුඃඛෙ ප්‍රියාප්‍රියෙ,
ආත්මෞපම්‍යෙන පුරුෂඃ ප්‍රමාණමධිගච්ඡති.

4. අන්‍යච්ච:—මාතෘවත් පරදාරෙෂු පරද්‍රව්‍යෙෂු ලොෂ්ටවත්,
ආත්මවත් සර්වභූතෙෂු යඃ පශ්‍යති ස පණ්ඩිතඃ.

1. හෙද කියනලදී—යුධිෂ්ඨිර මහරජ! ආහාරවස්ත්‍රාදියෙන් දිළිඳුන් රක්කමැනව, ධනවනතයාට දන නුදුනමැනව, කුමක්හෙයින්ද, රෝගියාට බෙහෙත හිතවේ, නිරෝගියාට ඖෂධයෙන් ප්‍රයොජන නොවේ.

2. අතිසකතුදුවෙයි—දානඵලය කැමැත්තෝ දියයුතුයයිකියනලද යම් දානයෙක් සතුරාටද දෙනුලැබේ, තීර්‍ථාදි පිරිසිදු ස්ථානයෙහිය, පසළොස්වක ආදී කාලයෙහිය, දීමට සුදුසු භාජනයෙහිය යන සියලුතැන්හි ඒ දානය මනායයි කියති.

එහෙයින් මේ විලෙහි ස්නානයකොට රන්වළල්ල ගණුව" සි කීය. ඉන්පසු ලොභය හෙතුකොටගෙණ දිවියාගේ ඒ වචනය පිළිගන්නාලද ඒ මගියා නැහැම පිණිස විලට බස්නාහා සමගම මහමඩෙහි ගිලුනේ නැගී පලායන්ට නොහැකිවූයේය. මඩෙහිවැටිගිය මිනිසාදැක දිවියා "බෙදයෙක! මහමඩෙහි වැටුනෙහිද? එසේවීනම් මම තා නගා සිටුවමි" කිව. මෙසේ කියා සෙමින්සෙමින් ලන්ව ඒ ව්‍යාඝ්‍රයා විසින් අල්වාගන්නාලද ඒ මගියා,

3. මේ ව්‍යාඝ්‍රතෙම ධර්‍මශාස්ත්‍රය හදාරසියනුද කාරණයෙක් නොවේ; ස්වභාවයෙන් කෲරවූ පැවතුම් ඇත්තාහුගේ වෙදහැදෑරීමද කාරණයෙක්නොවේ; ගවදෙනුන්ගේ කිරි යම්සේ ස්වභාවයෙන් මිහිරිද එසේම මේ ලොකයෙහි රළුතැනැත්තා කෙරෙහි ස්වභාවම නොනැසී ඉතිරිවේ.

4. තවද—අයිනිනුවූ ඉන්ද්‍රියහා සිත් ඇත්තුවුන්ගේ ක්‍රියාව ඇතාගේ නැහැමමෙන් ප්‍රයොජනනොවේ. (ඇතා නැපසුද පස් ආදියරැගෙණ ශරීරයෙහි විසුරුවාගණී. එසේම ඉන්ද්‍රියාදිය වසගයට නොගිය පුරුෂයාගේ ක්‍රියාවල පිරිසිදුබව නොපවතී යනු අභිප්‍රායයි,) වඳස්ත්‍රිය ආහාර වස්ත්‍රාදියෙන් පොෂණයකිරීම මෙන් ඥනයට අයිතිවූ කර්‍මකිරීමෙන් තොරවූ ඥනය නිෂ්ඵලවේ.

හිංසාකරණ ස්වභාවයෙන්යුත් මොහුකෙරේ මාවිසින් යම් විශ්වාසයෙක් කරණලදද ඒ ක්‍රියාව යුතුනොවෙයි.

---

1. තථාචොක්තම්:—දරිද්‍රාන් භර කෞන්තෙය මා ප්‍රයච්ඡෙශ්වරෙ ධනම්,
ව්‍යාධිතස්‍යෞෂධං පථ්‍යං නීරුජස්‍ය කිමෞෂධෛඃ?.

2. අන්‍යච්ච :—දාතව්‍යමිති යද්දානං දීයතෙ ’නුපකාරිණෙ,
දෙශෙ කාලෙ ච පාත්‍රෙ ච තද්දානං සාත්විකං විදුඃ.

3. "න ධර්‍මශාස්ත්‍රං පඨතීති කාරණං න චාපි වෙදාධ්‍යයනං දුරාත්මනඃ,
ස්වභාව එවාත්‍ර තථාතිරිච්‍යතෙ යථා ප්‍රකෘත්‍යා මධුරං ගවාං පයඃ.

4. කිඤ්ච:—අවශෙන්ද්‍රියචිත්තානාං හස්තිස්නානමිව ක්‍රියා,
දුර්භගාභරණප්‍රායො ඥානං භාරඃ ක්‍රියාං විනා.

1. ඒ කාරණයද මෙසේ කියනලදී—අංඇති සිව්පාවෝය, නදීයය, නිය ආයුධකොට ඇති තිරිසන්නුය, අතෙහි ආයුධ ඇත්තෝය, ස්ත්‍රීහුය, රාජකුලයයන මොවුන්කෙරේ විශ්වාසය නොකටයුතුමය.

2. අනිකුදු කාරණයෙක්—සියල්ලවුන්ගේම ස්වභාවයෝ අති ශයින් පරීක්ෂාකරණු ලැබෙත්. අනික් ශාස්ත්‍රඥනීම්ආදී ගුණයෝ පරීක්ෂාකරණු නොලැබෙත්, ඒ එසේමැයි, සියලුගුණ ඉක්මවා ස්වභාවය මුදුනෙහි පවතී. (එහෙයින් ස්වභාවයම පරීක්ෂාක ටයුතු.)

3. අනිකක්දවෙයි—අහසෙහි හැසිරෙන්නාවූ පව්නසන්නාවූ රැස්දහසක් දරන්නාවූ තාරකාවන්ගේ මධ්‍යයෙහි බබලන් නාවූ මේ චන්ද්‍රමණ්ඩලයද ක්‍රමයෙදීම හෙතුකොටගෙණ රාහු විසින් සපඝීකරණුලැබේ. නියමයෙන් බ්‍රහ්මයාවිසින් භාග්‍ය යෙහි ලියනලද්දක් කඩකිරීමටහෝ වෙනස්කිරීමට කවරෙක් නම් පොහොසද්ද?" යි සිතී.

මෙසේ සිතන්නාවූම මේ මිගියා දිවියාවිසින් මරණලදුව කනලද්දේය. "රංචලල්ට ලොභයෙන්," යනමේ ආදිය එබැවින් මම කියමි. එහෙයින් සර්වප්‍රකාරයෙන් පරීක්ෂා නොකරණ ලද ක්‍රියාව නොකටයුතුය.

4. යම්හෙයකින්—මනාකොට දිරූ අහරය, නුවණැති පුත්‍රය, මනාකොට වසඟයට පැමිණි ගෑහැනිය, සියලු උත්සාහයෙන් ආශ්‍රයකරණලද රජය, මනාකොටසිතා නියමකොට කියනලද වචනය, විමසා කළක්‍රියාවය, යනමේසය දීර්ඝකාලයෙහිද වෙනස කට නොයෙත්.

මේ වාක්‍යයඅසා එක්තරා පරවියෙක් අහංකාරසහිතවූයේ "වීසමයෙක ! කුමට මෙසේ කියනුලැබේද?

---

1. තථාචොක්තම්:—ශෘඞ්ගිණාඤ්ච නදීනාඤ්ච නඛිනාං ශස්ත්‍රපාණිනාම්,
විශ්වාසො නෛව කර්තව්‍යඃ ස්ත්‍රීෂු රාජකුලෙෂු ච.

2. අපරඤ්ච:—සර්වස්‍ය හි පරීක්ෂ්‍යන්තෙ ස්වභාවා නෙතරෙ ගුණාඃ,
අතීත්‍ය හි ගුණාන් සර්වාන් ස්වභාවො මූර්ධ්නි වර්තතෙ.

3. අන්‍යච්ච:—ස හි ගගනවිහාරී කල්මෂධ්වංසකාරී
දශශතකරධාරී ජ්‍යොතිෂාං මධ්‍යචාරී,
විධුරපිවිධියොගාත් ග්‍රස්‍යතෙ රාහුණාසෞ
ලිඛිතමපි ලලාටෙ ප්‍රොඥ්ඣිතුං කඃ සමර්ථඃ.

4. යතඃ:—සුජීර්ණමන්නං සුවිචක්ෂණඃ සුතඃ
සුශාසිතා ස්ත්‍රී නෘපතිඃ සුසෙවිතඃ,
සුචින්ත්‍ය චොක්තං සුවිචාර්‍ය්‍ය යත් කෘතං
සුදීර්ඝකාලෙ'පි න යාති වික්‍රියාම්,

1. විපත්තිය එළඹසිටිකල්හි පමණක් පණ්ඩිතයාගේ ගුරූපදෙශය ගතයුතුය, සියලුකාරණයෙහි මෙසේ විමසීම කටයුතු කල ආහාරයාගේද පැවැත්මනොවේ.

2. යම්හෙයකින්,—අහරද ජලයද යන පොළෝතලයෙහි සියල්ල ශඩකාවන් විසින් මඩනාලද්දේය, එකල්හි ආහාරපාන දෙදෙනාගේ කැමැත්ත කොතැන්හිදී කටයුතුද? ජීන්වත කෙසේනම් ජීවත්විය යුතුද?

3. එසේද කියනලදී—ඊෂ්‍ර්‍යාවන්තයාය, අතිශයින්දයා බහුලයාය, ලදදෙයකින් සතුටුනොවන්නාය, කිපෙන සුලුතැනැත්තාය, නිතරම සැකයෙන් යුක්තයාය, අනුන්ගේ සම්පත්තියෙන් ජීවත්වන්නාය යනමේ සදෙන ශොකයට හිමිහූවෙත්යයි කියයි.

මෙපවත් අසා සියලු පරවියෝ එතැන්හි උන්හ.

4. යම්හෙයකින්—ඉතා මහත් ශාස්ත්‍රදරණ අනුන්ගේ සැක සිඳින සුලුබහුශ්‍රැතයෝපවා ලොභයවිසින් මුළාකරණලද්දාහු තැවෙත්.

5. අනිකකුදු—ලොභය හෙතුකොටගෙණ ක්‍රොධයහටගණී, ලොභයෙන් විෂය රසවිඳීමට ආශාව උපදී, ලොභයහෙතුකොටගෙණ පරීක්‍ෂාරහිතවූ මුළාවද මරණයද හටගණී; මෙසේ ලොභය පාපයට මුල්වේ.

නැවත ඒ සියලු පරවියෝ දැලෙන් බැඳුනෝය. ඉක්බිත්තෙන් යම් පරවියක්හුගේ වචනයෙන් ඒ ස්ථානයට බැස්සෝද ඒ පරවියාට සියල්ලෝ නින්දාකෙරෙත්.

---

1. වෘද්ධස්‍ය වචනං ග්‍රාහ්‍යමාපත්කාලෙ හ්‍යුපස්ථිතෙ,
සර්වත්‍රෛවං විචාරෙණ භොජනෙ'පි ප්‍රවර්තතෙ.

2. යතඃ:—ශඩකාභිඃ සර්වමාක්‍රාන්තමන්නං පානඤ්ච භූතලෙ,
ප්‍රවෘත්තිඃ කුත්‍ර කර්තව්‍යා ජීවිතව්‍යං කථං නු වා.

3. තථාචොක්තම්:—ඊර්ෂ්‍යී ඝෘණී-ත්ව සන්තුෂ්ටඃ ක්‍රොධනො නිත්‍යශඞ්කිතඃ,
පරභාග්‍යොපජීවී ච ෂඩෙතෙ දුඃඛභාගිනඃ.

4. යතඃ:—සුමහාන්ත්‍යපි ශාස්ත්‍රාණි ධාරයන්තො බහුශ්‍රැතාඃ,
ඡෙත්තාරඃ සංශයානාඤ්ච ක්ලිශ්‍යන්තෙ ලොභමොහිතාඃ.

5. අන්‍යච්ච:—ලොභාත් ක්‍රොධඃ ප්‍රභවති ලොභාත් කාමඃ ප්‍රජායතෙ,
ලොභාන්මොහශ්ච නාශශ්ච ලොභඃ පාපස්‍ය කාරණම්.

1. යම්හෙයකින්—සමූහයාවිසින් සිදුකළයුතු කටයුත්ත සඳහා සමූහයක්හුගේඉදිරියෙහි නොයන්නේය,(කුමක්නිසාද?) කටයුත්ත සිදුවූකල ලාභය සියල්ලටම සමවේ, ඉදින්කටයුත්ත හානිවීද එසේකල අනුශාසනාකළ තැනැත්තේ පීඩාකරණු ලැබේ.

2. එසේදකියනලදී—වචනය, හිතය, ඇසය යනමේආදී ඉන්ද්‍රියයන් හික්මවීම පිණිස නිග්‍රහ නොකිරීම විපත්තිවලට මග යයි කියනලදී, ඒ ඉන්ද්‍රියයන් ජයගැණීමහෝ දමනය සැපතට මගයි, (මේ ක්‍රමදෙකින්) යම් ක්‍රමයෙකින් සැපයලැබේද ඒ ක්‍රම යෙන් පවත්නා ලැබේවා.

ඒ පරවියාගේ ගර්හාව අසා චිත්‍රග්‍රීව පරවිරජ "මේ තෙම මොහුගේ දොෂයෙක්නොවේ.

3. යම්හෙයකින්—විපත්තියක් ලත්වූවන්ට හිතවූ වස්තුවද ඒ විපත්තියෙහි හෙතුබවට පැමිණේ. ඒ එසේමැයි, ගවදෙනගේ දනෙන්යට භාගයෙහිවූ පාදය වස්සාගේ බැඳීම පිණිස කණුවක්මෙන්වේ.

4. අනිකක්ද—යමෙක් විපත්තියට පැමිණියවුන්ගේ ඒ විපත් දුරලීමට හැකිවේද ඒතෙම නෑයෙක්වෙයි, භයදුරුකරණකල ඒ භය එළවූවක්හට ගර්හාකරණ පණ්ඩිතයාවූ කලී නෑයෙක් නොවේ.

විපත්තිය එළඹසිටිකල විස්මයටපැමිණීම නින්දිත පුරුෂ යන්ගේ ලකුණෙක, එහෙයින් මේ විපත්තියෙහිදී ධෛර්‍ය්‍ය වැළඳගෙණ භයදුරුකරණ උපාය සිතනුලැබේවා.

5. යම්හෙයකින්—විපත්තිය එළඹසිටිකල නොකැලඹෙන ධෛර්‍ය්‍ය, මහත්වූ වැඩීමඇතිකල උඩඟුනොව ඉවසීමය, සභා

---

1. යතඃ:—න ගණස්‍යාග්‍රතො ගච්ඡෙත් සිද්ධෙ කාර්‍ය්‍යෙ සමං ඵලම්,
යදි කාර්‍ය්‍යවිපත්තිඃ ස්‍යාත් මුඛරස්තත්‍ර හන්‍යතෙ.

2. තථාචොක්තම්:—ආපදාං කථිතඃ පන්ථා ඉන්ද්‍රියාණාමසංයමඃ,
තජ්ජයඃ සම්පදාං මාර්ගො යෙනෙෂ්ටං තෙන ගම්‍යතාම්.

3. යතඃ:—ආපදාමාපතන්තීනාං හිතො'ප්‍යායාති හෙතුතාම්,
මාතෘජඞ්ඝා හි වත්සස්‍ය ස්තම්භීභවති බන්ධනෙ.

4. අන්‍යච්ච:—ස බන්ධුර්‍යො විපන්නානාමාපදුද්ධරණක්ෂමඃ,
න තු භීතපරිත්‍රාණවස්තූපාලම්භපණ්ඩිතඃ.

5. යතඃ:—විපදි ධෛර්‍ය්‍යමථාභ්‍යුදයෙ ක්ෂමා
සදසි වාක්පටුතා යුධි වික්‍රමඃ,
යශසි චාභිරුචිර්ව්‍යසනං ශ්‍රුතෞ
ප්‍රකෘතිසිද්ධමිදං හි මහාත්මනාම්.

මධ්‍යයෙහිදී කීමෙහි බිණීමෙහි දක්‍ෂබවය, යුඬයක් පැමිණිකල වික්‍රමය, කීර්තිය ඇතිකල කැමතිවීමය, ශාස්ත්‍රවිෂයෙහි අතිශයින් ඇළීමය යනමේගුණ උත්තමයන්ට ස්වභාවයෙන් ඇතිවේමය.

1. යමෙක් සම්පත් ඇතිකල්හි සතුටුනොවේද, විපත්තිකාලයෙහි කලනොකිරේද, සටන්කාලයෙහි චඤ්චලනුවූ ධෛර්‍ය්‍යයෙන් යුක්තද, තුන්ලොවට තිලකයක්මෙන් ශ්‍රේෂ්ඨවූඑබඳු පුත්‍රයක්හු මවක්තොමෝ මඳතැනෙක උපදවන්නීය.

2. අනික්තුදු—අධිකවූ නිදිඇතිබවය, මැලිබවය, භයය, ක්‍රොධය, අලසබවය, පටන්ගත් ක්‍රියාවන් නොනිමවාපියා කල් ගෙවනබවය යනමේ දෝෂසය මෙලොව වැඩිදියුණුව කැමැති පුරුෂයාවිසින් දුරුකටයුතුවෙත්.

දැනුදු මෙසේ සියලු පරවියන්විසින් එක්සිත්ව දැලරැගෙණ ඉගිලෙනු ලැබේවා.

3. යම්හෙයකින්—මහත්නුවූ ද්‍රව්‍යයන්ගේද එකාබඬවූ සමූහයා කටයුතු සිදුකරයි. මීට උපමාවනම් රැහැන්බවට පැමිණි තණවලින් මත්ත හස්තිහු බඳනා ලැබෙත්.

4. ස්වල්පගණනක්වූද තමන් ගොත්‍රයෙහි ජනයා හා සමගගැළපුනාවූ පුරුෂයන්ගේ සමූහය අතිශයින් ප්‍රශංසා කටයුතුය, දහවෙසියාවෙන්ද හරණලද සහල් පැලනොවෙති"යි කීය.

මෙසේ සිතා සියලු පක්ෂීහු දැලරැගෙණ ඉගිලුනෝ. ඉන්පසු ඒ වැද්දා දැලගෙණ යන්නාවූ ඔවුන් දුරදිදැක පසුපස්සේ දුවමින් මෙසේ සිතී.

---

1. සම්පදි යස්‍ය න හර්ෂෝ විපදි විෂාදෝ න රණෙ ච ධීරත්වම්,
තං භුවනත්‍රයතිලකං ජනයති ජනනී සුතං විරලම්.

2. අන්‍යච්ච:—ෂඩ්දොෂාඃ පුරුෂෙණෙහ හාතව්‍යා භූතිමිච්ඡතා,
නිද්‍රා තන්ද්‍රා භයං ක්‍රොධ ආලස්‍යං දීර්ඝසූත්‍රතා.

3. යතඃ:——අල්පානාම්පි වස්තූනාං සංහතිඃ කාර්‍ය්‍යසාධිකා,
තෘණෛර්ගුණත්වමාපන්නෛර්බධ්‍යන්තෙ මත්තදන්තිනඃ.

4. සංහතිඃ ශ්‍රෙයසී පුංසාං ස්වකුලෛරල්පකෛරපි,
තුෂෙණාපි පරිත්‍යක්තා න ප්‍රරොහන්ති තණ්ඩුලාඃ.

1. "සමගිවූ මේපක්ෂීහු මාගේ දැල ගෙණයෙති, යම් වේලෙක වැටෙන්නාහු වෙද්ද එකල්හි මාගේ වශගයට පැමිණෙන්නාහු වෙති." යනුයි.

ඉක්බිත්තෙන් ඒ පක්ෂීන් නොපෙනිගියකල වැද්දා නැවැත්තේය. එකල්හි නැවතුනාවූ වැද්දා දැක පරවියෝ "දැනට කුමක්කිරීම සුදුසුද"යි මෙසේ කිව් ? චිත්‍රග්‍රීව තෙම.

2. "මවය, මිත්‍රයාය, පියාය යනමේ තුන්දෙනා ස්වභාවයෙන් හිතවෙති, ඉතිරි ජනයෝ වැඩ අවැඩ දෙක්හි හැසිරීමෙන් වැඩ අවැඩ කල්පනාවලින් යුක්තවූවාහු වෙත්.

එහෙයින් මාගේ මිත්‍රවූ හිරණ්‍යක නම් මී රජෙක් ගණ්ඩකී නදී ඉවුරෙහිවූ චිත්‍රවනයෙහි වෙසේ, ඒ මීයා අපගේ බැඳුම් කපයි" කීය. මෙසේ සලකා සියල්ලෝ හිරණ්‍යකයාගේ බිලය සමීපයට ගියහ. හිරණ්‍යකයාද විපත්තිවලට සැකයෙන් හැම කල්හිදොරවූ සියයකින් යුත් බිලයක් කොට වෙසේ. ඉක්බිත්තෙන් හිරණ්‍යකයා පරවියන් බස්නාකල උපන් පියාපත් ශබ්දය අසා භයින් ගටගත් චක්ෂුවල භාවයෙන් යුක්තව කථානොකොට සිටියේය.

"යහළු හිරණ්‍යකය! කුමක්නිසා මා හා කථා නොකරන් නෙහිද?"යි චිත්‍රග්‍රීවයාකීය, ඊට අනතුරුව හිරණ්‍යකයා ඔහුගේ වචනය අසා දැන වහා පිටතට නික්ම, "විස්මයේක පිණැත් තෙම් මාගේ ප්‍රියමිත්‍රවූ චිත්‍රග්‍රීව තෙම ආයේය.

3. මිත්‍රයා හා සමග කථාකිරීම යමක්හට වේද, මිත්‍රයා හා සමග එකතැන විසීම යමක්හට වේද, මිත්‍රයා හා සමග රහස් කථාකිරීම යමක්හට වේද ඔහුට වඩා පිණැත්තෙක් නැත්තේය"යි කීය.

එකල්හි දැලෙහි බැඳීගියාවූ මොවුන් දැක විස්මසහිතවූයේ ඇසිල්ලක් නැවතීසිට "යහළුව! මේ කිමෙක්ද"යි විචාළේය.

චිත්‍රග්‍රීව තෙම "මිත්‍රය! මේතෙම අපගේ පෙරජාතියෙහි කරණලද ක්‍රියාවෙහි ඵලය වෙයි.

---

1. සංහතාස්තු හරන්තිමෙ ජාලං මම විහඞ්ගමාඃ,
යදා තු නිපතිෂ්‍යන්ති වශමෙෂ්‍යන්ති මෙ තදා.
2. "මාතා මිත්‍රං පිතා චෙති ස්වභාවාත්ත්‍රිතයං හිතම්,
කාර්‍ය්‍යකාරණතශ්චාන්‍යෙ භවන්ති හිතබුද්ධයඃ.
3. යස්‍ය මිත්‍රෙණ සම්භාෂො යස්‍ය මිත්‍රෙණ සංස්ථිතිඃ,
යස්‍ය මිත්‍රෙණ සංලාපස්තතො නාස්තීහ පුණ්‍යවාන්.

1. කරණලද සුචරිත දුශ්චරිතදෙක පිළිබඳවූ තමාගේ ක්‍රියාව යම් කාරණයක් හෙතුකොටගෙණ වේද, යමෙක්හු කරණකොට ගෙණ වේද, යම් පරිච්ඡෙදකින් වේද, යම් කාලයෙක්හි වේද, යමක්ද, යම්පමණද, යම් තැනෙක්හිද, ඒ හෙතුකොටගෙණද, ඒ කරණකොටගෙණද, එපරිච්ඡෙදෙන්ද, එකල්හිද, ඒද, එප මණද, එහිද, බ්‍රහ්මයාගේ වශගය හෙතුකොටගෙණ පැමිණේ.

2. සකල සත්වයන්ගේ රොගය, ශොකය, කළවරදට නිතර තැවීමය, බන්ධනාගාරාදියෙහි බන්ධනයට පැමිණීමය, දුකය යන මොහු හැම තමන්විසින් කරණලද අපරාධ නැමති වෘක්ෂයාගේ ඵලයෝය”යි කීය.

මේ කීම් අසා මීයා චිත්‍රග්‍රීවයාගේ බැඳුම් කපනු පිණිස වහා එළඹේ.

චිත්‍රග්‍රීව තෙම “මිත්‍රය! මෙසේ නොකරව, මා ආශ්‍රය කරණ ලද මොවුන්ගේ බැඳුම් පළමුකොට සිඳුව මාගේ බැඳුම් පසුව සිඳුව”යි කීය. මීයාද “මම ස්වල්ප ශක්ති ඇත්තෙම්, මාගේ දද්ද මෙලෙක් වෙති, එහෙයින් මොවුන්ගේ රැහැන් කැපීම පිණිස මම කෙසේ පොහොසත් වෙම්ද? එහෙයින් මගේ දත් හිරිවැටීමට පළමු තාගේ රැහැන සිඳිම්. ඉන්පසු මොවුන්ගේද බැඳුම් හැකිතාක් සිඳින්නෙමි” යනු කියයි.

චිත්‍රග්‍රීව තෙම “එසේවේවා, එතකුදුවූවත් බලපමණින් මොවුන්ගේ බැඳුම් කපව”යි කීය. හිරණ්‍යකයා විසින් තමාගේ ආත්මය විනාශයටහැර ආශ්‍රය කරණලද්දවුන්ගේ යම් රක්ෂාකිරී මෙක් ඇද්ද ඒ තෙම නිතිදන්නවුන් විසින් සම්මත නොකරණ ලදී.

3. යම්හෙයකින්—විපත්ති කාලයෙහි ප්‍රයොජනය පිණිස ධන රක්ෂාකරන්නේය, ඒ ධනය කරණකොටගෙණද අඹුවන් රක්නේය, ධනය, අඹුවය යන දෙපක්ෂයම කරණකොටගෙණ නිතර තමා රක්නේය.

---

1. යස්මාච්ච යෙන ච යථා ච යදා ච යච්ච යාවච්ච යත්‍ර ච ශුභාශුභමාත්මකර්ම,
තස්මාච්ච තෙන ච තථා ච තදා ච තච්ච තාවච්ච තත්‍ර ච විධාතෘවශාදුපෛති.

2. රොගශොකපරිතාපබන්ධනව්‍යසනානි ච,
ආත්මාපරාධවෘක්ෂස්‍ය ඵලාන්‍යෙතානි දෙහිනාම්.

3. යතඃ:—ආපදර්ථෙ ධනං රක්ෂෙද්දාරාන් රක්ෂෙද්ධනෛරපි,
ආත්මානං සතතං රක්ෂෙද්දාරෛරපි ධනෛරපි.

1. අනිකකුදු—හිංසා නොකිරීමය, ධනය, කාමය, නිර්වාණය යන මොවුන්ගේ පැවැත්ම පිණිස ප්‍රාණයෝ මුල්වෙත්, ඒ ප්‍රාණයන් නසන්නා විසින් කුමක්නම් නොනසන ලදද? (සියල්ලම නසනලදී)රක්නහුවිසින් කුමක්නම් නොරක්නා ලදද?”(සියල්ලම රක්නාලදැයි) කියනලද්දේය.

චිත්‍රග්‍රීව තෙම “මිත්‍රය! නීතියවූ කලී එබඳුමය, එතකුදු වුවත් මම මා ආශ්‍රයකරණ ලද්දවුන්ගේ දුක ඉවසීමට සර්වප්‍රකාරයෙන් අසමර්ථවූයෙමි මෙසේ කීමි.

2. යම් හෙයකින්—ධනය, ජීවිතය යන දෙකම නුවණැති පුරුෂතෙම ලොකයාට උපකාර පිණිස පරිත්‍යාග කරන්නේය, විනාශය නියමවූකල සත්පුරුෂ ජනයන් කෙරේ ප්‍රාණ ධන දෙක පරිත්‍යාග කිරීම උතුම්වේ.

අනිකුදු මේ සියල්ලට සමාන නුවූ හෙතුවකි.

3. මොවුන්ගේ ජාතිය, ද්‍රව්‍යය, බලය යන මොවුන් මාහා සමබව වෙයි, එකල්හි මාගේ ස්වාමීභාවයාගේ ඵලය කියව, ඒ තෙම කවර කාලෙක කුමක් වන්නේද?

4. අනිකකුදු—මොහු සියල්ලෝ ආහාරයක් නැතිවම මාගේ සමීපයහැර ඉවත නොයෙත්, එහෙයින් මාගේ ජීවිතය පරිත්‍යාග කිරීමෙන් නමුදු මා ආශ්‍රයකරණ ලද්දවූ මොවුන් රකුව.

5. තවද—මිත්‍රය! මාංසය, මූත්‍රය, මලය, ඇටය යන මෙයින් පටන්ගන්නාලද නැසීම නියතවූ මේ දෙහයෙහි උත්සාහය නොසලකා මාගේ කීර්තිය රකුව.

---

1. අන්‍යච්ච:—ධර්මාර්ථකාමමොක්ෂාණාං ප්‍රාණාඃ සංස්ථිතිහෙතවඃ,
තාන්නිඝ්නතා කිං නහතං රක්ෂතා කිං න රක්ෂිතම්.

2. යතඃ:—ධනානි ජීවිතඤ්චෛව පරාර්ථෙ ප්‍රාඥ උත්සෘජෙත්,
සන්නිමිත්තෙ වරං ත්‍යාගො විනාශෙ නියතෙ සති.

3. ජාති ද්‍රව්‍යබලානාඤ්ච සාම්‍යමෙෂාං මයා සහ,
මත්ප්‍රභුත්ව ඵලං බ්‍රෑහි කදා කිං තද්භවිෂ්‍යති,?

4. අන්‍යච්ච:—විනා වර්තනමෙවෛතෙ න ත්‍යජන්ති මමාන්තිකම්,
තන්මෙ ප්‍රාණව්‍යයෙනාපි ජීවයෛතාන්මමාශ්‍රිතාන්.

5. කිඤ්ච:—මාංසමූත්‍රපුරීෂාස්ථිනිර්මිතෙ ච කලෙවරෙ,
විනශ්වරෙ විහායාස්ථාං යශඃ පාලය මිත්‍ර! මෙ.

1. අනිත්‍යවූද සලකාව—සර්වදානුවූ මල මූත්‍රාදී අපවිත්‍රයෙන් පිරුණු ශරීරය කරණකොටගෙණ නොනස්නා පිරිසිදුවූ කීර්ති යට ඉදින් පැමිණෙන්නේනම්, ලද්දාවූ ඒ කීර්තිය කුමක්නම් නොවන්නීද?

2. යම්හෙයකින්—ශරීරයාගේද ගුණයන්ගේද වෙනස අති ශයින් දුරුවසිටියේවේ, ශරීරය ඇසිල්ලෙකින් නස්නේය, ගුණයෝ වනාහි කල්පාන්තය දක්වා පවතිත් "යයි කීය.

මේ කථාව අසා සතුටුවූ හිරණ්‍යක තෙම රෝමොද්ගතවූ ශරීරයෙන් යුක්තවූයේ "මිත්‍රය! මනාවෙයි මනාවෙයි, ආශ්‍රය කරණලද්දවුන් කෙරේ ඇත්තාවූ ප්‍රේමය කරණකොටගෙණ තුන් ලොවටද ස්වාමිභාවය තාකෙරේ විද්‍යමානය"යි මෙසේ කියා ඔහු විසින් සියල්ලවුන්ගේ බැඳුම් කපනලද්දාහුය. ඉන් පසු හිරණ්‍යකයා සියල්ලවුන්ට ආදර සහිතව පූජා "මිත්‍රවූ චිත්‍ර ග්‍රීවය! සර්වප්‍රකාරයෙන් මේ දැලෙහි බැඳීම් ක්‍රියාව ඇතිකල්හි ඒ දෝෂයසිතා තමාකෙරේ ගර්හා නොකටයුතු වන්නීය.

3. යම්හෙයකින්—මේ ලොකයෙහි යම් පක්ෂියෙක් යොදුන් සියයකටද වඩා දුරුතැන්හිවූ ආහාර දකීද, මරණය ලංවූ ඒ පක්ෂියාම රුහැන් යොදාතැබීම නොදක්නේය.

4. අතිකුදු කරුණක්—චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනාට ග්‍රහයන් විසින් කරණලද පීඩාද, හස්ති සර්ප දෙදෙනාගේ බන්ධනයට පැමිණීමද, නුවණැත්තවූන්ගේ දිළිඳුබවද දැක විස්මයෙක! බ්‍රහ්මයා විසින් කරණලද බලවත්වූ විධාන ඇත්තේයයි මාගේ අදහස වෙයි.

5. අතිකතුදු වෙයි—ආකාශයාගේ එක් පෙදෙසක හැසිරී මෙන් යුක්තවූ පක්ෂීහුද විපත්තියට පැමිණෙති, ගැඹුරුවූ දියඇති

---

1. අපරඤ්ච පශ්‍ය :—යදි නිත්‍යමනිත්‍යෙන නිර්මලං මලවාහිනා, යශඃ කායෙන ලභ්‍යෙත තන්න ලබ්ධං භවෙන්නු කිම් ?.

2. යතඃ :—ශරීරස්‍ය ගුණානාඤ්ච දූරමත්‍යන්තමන්තරම්, ශරීරං ක්‍ෂණවිධ්වංසි කල්පාන්තස්ථායිනො ගුණාඃ."

3. යතඃ :—යො'ධිකාද් යොජනශතාත් පශ්‍යතීහාමිෂං ඛගඃ, ස එව ප්‍රාප්තකාලස්තු පාශබන්ධං න පශ්‍යති.

4. අපරඤ්ච :—ශශිදිවාකරයොර්ග්‍රහපීඩනං ගජභුජඞ්ගම යො රපි බන්ධනම්, මතිමතාඤ්ච විලොක්‍ය දරිද්‍රතාං විධිරහො බලවානිති මෙ මතිඃ.

5. අන්‍යච්ච :—ව්‍යොමෛකාන්තවිහාරිණො'පි විහගාඃ සංප්‍රාප්නුවන්ත්‍යාපදං බධ්‍යන්තෙ නිපුණෛරගාධසලිලාන්මත්ස්‍යාඃ සමුද්‍රාදපි, දුර්ණීතං කිමිහාස්ති? කිං සුචරිතං? කඃ ස්ථාන ලාභෙ ගුණඃ කාලො හි ව්‍යසනප්‍රසාරිතකරො ගෘහ්ණාති දූරාදපි.

සාගරය කෙරෙන්ද දක්‍ෂයන්විසින් මත්ස්‍යයෝ ගන්නාලැබෙත්. මේ සංසාරයෙහි දුශ්චරිතය කුමක්ද? සුචරිතය කුමක්ද? විපත්ති රහිත ඉඩම් ලැබීමෙහි ගුණ කවරේද? ඒ එසේමැයි විපත්තිය නියමවූකල දිගුකළ අතින්සූත් ඒ නියමය දුරුවූ ස්ථානයෙන්ද සමීපයට ගණී " කියයි.

මෙසේ අවබොධකරවා ආගන්තුක සත්කාර කොටපියා වැලඳගැණීමද කොට හැරියේය. චිත්‍රග්‍රීවයාද පිරිවරහා සමග රුචිවූ දෙශයට ගියේය. හිරණ්‍යකයාද තමාගේ බිලයටවන.

1. " යම් කිසි මිත්‍රයෝ බොහෝ සියගණනකුදු කටයුතුවෙති. මිත්‍රවූ මීයාවිසින් පරවියෝ බන්ධනයෙන් මුදනලද්දෝය, දනුව.

ඉන්පසු චිත්‍රග්‍රීවාදීන්ගේ රැහැන්කැපීම්ආදි සියලු කථාව දන්නා ලඝුපතනකනම් කවුඩා ආශ්චර්‍ය්‍යසහිතව " හිරණ්‍යකය! ඔබමයෙක පූජ්‍යවූයෙහිය, එබැවින් මමද තාහාසමග මිත්‍රභාවය කැමැත්තෙමි, එහෙයින් මට මිත්‍රභාවයෙන් අනුකම්පාකරන්ට සුදුසුවව " යි කියයි. මේ වචනයඅසා හිරණ්‍යකයාද බිලය තුළ හුන්නේ තෝ කවරෙක්දැයි අසයි.? ඒ තෙම මම ලඝුපතනක නම් කවුඩාවෙමි කියයි හිරණ්‍යකයා සිනාසී " තා හා සමග කරණ මිත්‍රභාවය කුමක්ද?

2. යම්හෙයකින්—ලොකයෙහි පණ්ඩිතතෙම යම් වස්තුවක් තවත් කිසියම් වස්තුවක්හා සමග ගළපාද ඒ වස්තුව ඒ හා සමග යොදන්නේය, මම ආහාරවෙමි, පින්වතා අනුභවකරන්නෙක, (එසේකල අප දෙදෙනාගේ) ප්‍රීතිය කෙසේ වන්නීද?

3. අනිකුදු කරුණක්—ගොදුරුවියයුතු තැනැත්තාගේ හා කන්නාගේද යනමේ දෙදෙනාගේ ප්‍රීතිය විපත්තියටම කාරණයෙක්වෙයි, සිවලා හෙතුකොටගෙණ රැහැණින් බඳනාලද ඒ මුවා, මිත්‍රවූ එක්තර කවුඩකුවිසින් බන්ධනයෙන් මුදා රක්නා ලද්දේයයි කියයි.

---

1. යානි කානි ච මිත්‍රාණි කර්තව්‍යානි ශතානි ච,
පශ්‍ය මූෂිකමිත්‍රෙණ කපොතා මුක්තබන්ධනාඃ.

2. යතඃ:—යද් යෙන යුජ්‍යතෙ ලොකෙ බුධස්තත්තෙන යොජයෙත්,
අහමන්නං භවාන් භොක්තා කථං ප්‍රීතිර්භවිෂ්‍යති.

3. අපරඤ්ච:—භක්ෂ්‍යභක්ෂකයොඃ ප්‍රීතිර්විපත්තෙරෙව කාරණම්,
ශෘගාලාත් පාශබද්ධො'සෞ මෘගඃ කාකෙන රක්ෂිතඃ.

ඒ කෙසේදැයි කවුඩා ඇසීය, හිරණ්‍යකයා මෙසේ කියයි.

මගධදෙශයෙහි චම්පකාවතීනම් මහවනයෙක්ඇත, මුව කවුඩු දෙදෙනෙක් මහත් සෙනහයෙන් ඒ වනයෙහි බොහෝ කාලයක් මුලුල්ලෙහි විසුවෝය, තමා කැමති පරිද්දෙන් හැසිරෙණ බබලන්නාවූ සථූල ශරීරයෙන්යුක්තවූ ඒ මුවාද එක්තරා සිවලක්හු විසින් දක්නාලද්දේය, ඒ මුවාදුක සිවලා මෙසේසිතී, "විශමයෙක මෙලෙක්වූ මේ මාංසය කෙසේ කන්නෙම්ද? වන්නාට පළමුකොට විශ්වාසය උපදවමි" යි මෙසේ සිතා මුවා කරා එළඹ "මිත්‍රය! තාගේ සැපත කෙසේද" යි ඇසීය. "තෝ කවරෙක්ද" යි? මුවාවිසින් අසනලද සිවලා මම ක්‍ෂුද්‍රබුධිනම් සිවලාවෙම්, නෑයෙක් නැත්තෙම් මළඑකක්හුමෙන් මේ වන යෙහි වසමි, දැන් මිත්‍රවූ තාකරා පැමිණ නැවත නෑයන් සහිතවූයෙම් ජීවිතයට ඇතුල්වූවෙක්වෙමි, දැන් තාගේ අනුචරවූ මා විසින් සියලුපරිද්දෙන් තාගාසමග වියයුතුය" යි කියයි. එකල්හි මුවාවිසින් එසේවේවයි කියනලදී, ඉන්පසු භාග්‍යවත්වූ රශ්මිමාලාවෙන්යුත් හිරුඅස්තයටගියකල ඔහුදෙදෙන මුවාවසනතැනට ගියෝය. ඒ ස්ථානයෙහි සපුගසක අත්තෙක මුවාගේ බොහෝකලක්මිත්‍රවූ සුබුධිනම් කවුඩා වෙසෙයි. ඔවුන්දෙදෙනා දැක කවුඩුතෙම "මිත්‍රය! මේ දෙවෙනි තැනැත්තා කවරෙක්ද" යි ඇසීය. "මේ තෙම සිවලෙක අපදෙදෙනාගා මිත්‍රභාවයකැමතිව ආයේවනැ" යි මුවා කියයි. ඒ අසා කවුඩා "මිත්‍රය! නොකරුණේ අලුතෙන්පැමිණි තැනැත්තාගා සමග මිත්‍රභාවය නොකටයුතුය, එහෙයින් තුසුදුස්සක් කරණලද්දේය.

1. එසේද කියනලදී—යම් කිසිවක්හුගේ ගොත්‍ර සවභාවය නොදන්නේනම් තුපුරුදුනම් ඔහට ආශ්‍රය කිරීමට අවකාශයෙක් නොදියයුතුය, ඒ එසේමැයි බළලාගේ දොෂය කරණකොටගෙණ ජරද්ගවනම් ගිජුලිහිනියා පක්‍ෂීන්විසින් මරණලද්දේය" යි කියයි.

මුව සිවල් දෙදෙන ඒ කෙසේදැයි ඇසුවෝය,? කවුඩා කියයි.

ගඞ්ගානදියගේ ඉව්රෙහි ගෘධ්‍රකුටනම් පර්වතයෙහි මහත්වූ පුලිලගසෙක්ඇත. ඒ ගස්හි බිලයෙක අභාග්‍යය හෙතුකොට

---

1. තථාචොක්තම්:—අඥාතකුලශීලස්‍ය වාසො දෙයො න කස්‍යචිත්,
මාර්ජාරස්‍ය හි දොෂෙණ හතො ගෘධ්‍රො ජරද්ගවඃ.

ගෙණ නියහා ඇස් දුර්වලවූ ජරද්ගවනම් ගිජුලිහිනියෙක්වෙසෙයි, එකල්හි ඔහුගේ ජීවත්වීම පිණිස ඒ ගස්හි වසන පක්ෂීහූතමන් ආහාරයෙන් මඳක්කඩා කරුණාවෙන් දෙති, එසින් මේ ගිජුලිහිනියා ජීවත්වෙයි. ඉක්බිත්තෙන් එක්දිනයෙක දීඝීකණ්නම් බළලෙක් පක්ෂිපොතකයන් කනුපිණිස ඒ ගසකරා ආය.

එකල්හි එන්නාවූ ඔහු දැක භයින් පීඩිතවූ පක්ෂිපොතකයන්විසින් අතිශයින් මහත්ශබ්දකරණලද්දේය, ඒ අසා ගිජුලිහිනියා විසින් මේ එන්නේ කවරෙක්දැයි" අසනලද්දේය, දීඝීකණ්ණතෙම ගිජුලිහිනියාදැක "නපුරෙක! නටුයෙමියි භයසහිත විය.

1. යම්හෙයකින්—යම්තාක් භයකාරණය නොපැමිණියේද ඊටපළමු භයට මුල්වනකාරණයට සැකවියයුතුය, පැමිණිභය දැකාවූකලි මිනිස්තෙම සුදුස්සක් කරන්නේය.

එබැවින් දූන් ඉතාලන්වූහෙයින් දුවන්නට නොහැක්කෙමි. එහෙයින් යමක් වියයුතුද ඒ වේවා, ඊට පළමු විශ්වාසය උපදවා මොහුගේ සමීපයටයෙමි" මෙසේ සිතා ගිජුලිහිනියාට නුදුරුවසිට "පූජ්‍යවූ සවාමීනි! නුඹවහන්සේට වඳිමි" යි මෙසේ කීය, තෝ කවරෙක්දැයි? ගිජුලිහිනියා ඇසීය. මම බළලෙක්මි හෙතෙම කීය, ගිජුලිහිනිතෙම "ඈතයව, ඉදින් නොගියෙහිනම් මාවිසින් මැරියයුතුවව" යි කියයි. බළල්තෙම "පළමුකොට මාගේ වචනය අසනුලැබේවා, ඉන්පසු ඉදින් මැරියයුතුනම් එකල්හි මැරියයුතුය.

2. යම්හෙයකින්—කිමෙක්ද ජාතියපමණක් සැලකීමෙන් යම්කිසිවෙක් යම්තැනෙක මරණුලැබේද, නොහොත් යම්කෙනෙක් පූදනුලැබේද, හැසිරීමහෝ පැවැත්මදැන මැරියයුතුහෝ නොහොත් පිදියයුතුවන්නේය" යි කීය.

ඒ අසා ගිජුලිහිනිතෙම කුමක්සඳහා ආයෙහිද? කියවයි කියයි, එකල බළලා "මම මේ ගඞ්ගාතීරයෙහි නිතර ජලස්නානය කරන්නෙමි මත්ස්‍යමාංස අනුභවයක් නැත්තෙමි සත්‍රී

---

1. යතඃ:—තාවද්භයස්‍ය භෙතව්‍යං යාවද්භයමනාගතම්,
ආගතන්තුව භයං වීක්ෂ්‍ය නරඃ කුර්‍ය්‍යාද් යථොචිතම්.

2. යතඃ:–ජාතිමාත්‍රෙණ කිං කශ්චිද්වධ්‍යතෙ පූජ්‍යතෙ ක්වචිත්,
ව්‍යවහාරං පරිඥාය බධ්‍යඃ පූජ්‍යො 'ථවා භවෙත්.

සේවනයෙන් තොරවූ බ්‍රහ්මචර්‍ය්‍යාවෙන් යුක්තව චාන්ද්‍රායණව්‍රතයෙහි හැසිරෙන්නෙම් වසමි, ධර්‍මයදන්නාවූ නුඹවහන්සේගේ ප්‍රිය විශ්වාසයට ස්ථානවූ පක්ෂීහු මාගේ ඉදිරියෙහි නුඹවහන්සේගේ ගුණසමූහය වර්‍ණනාකෙරෙති, එහෙයින් ශාස්ත්‍රයෙන්ද වයසින්ද ඒයුණුවට පැමිණි නුඹවහන්සේගෙන් ධර්‍මය ඇසීම පිණිස මෙහි ආමි, ධර්‍මයදන්නා මේ තරම්වූ නුඹවහන්සේලාද ආගන්තුකවූ මා මරණු පිණිස යම් උත්සාහයක් කරන්නාහුද? මේ ක්‍රියාව ගිහිගෙයි ධර්‍මයෙක්ද.

1. ගෙටආකල සතුරකෙරෙහිද ගිහියාවිසින් සුදුසුවූ ආගන්තුක සත්කාර කටයුතුය, ගසතෙම පාර්ශ්වයකටගිය සේවන ගසකපන සතුරකෙරෙන් නොමඟකුළුවයි.

ඉදින් ආහාරයෙක් නැත්තේනම් එකල්හි මනාප්‍රියවචනයෙන් පළමුකොට ආගන්තුකතෙම පිදියයුතුවෙයි.

2. එසේද කියනලදී—තණපතින් කරණලද අස්නද, විඩා සංසිඳුවන ස්ථානයක්ද, පාදයන් සෝදන පිණිස වතුරද, සතර වෙනිවූ සත්‍යප්‍රිය වචනයද යනමොහු සත්පුරුෂයන්ගේ ගෙයි කිසිකලක නොනස්නාලැබෙත්.

3. අනිකක්දු—සත්පුරුෂයෝ දුර්ජන සත්වයන් කෙරෙහිද අනුකම්පාකෙරෙත්, ඒ එසේමය, චන්ද්‍රයා සපර්‍ශකටයුතුනුවූ චාණ්ඩාලයාගේ ගෙය කෙරෙහි චන්ද්‍රාලොකය නොමඟකුලුවා.

4. අනිකක්දු—ගෙටආවාවූ ළදරුවෙක්හෝ නොහොත් මහල්ලෙක්හෝ තරුණයෙක්හෝවේද ඕහට පූජාකටයුතුවන්නිය, ඉදිරියටආ තැනැත්තේ සියලු ජනයාගේ ගුරුවේ.

---

1. අරාවප්‍යුචිතං කාර්‍ය්‍යමාතිථ්‍යං ගෘහමාගතෙ,
ඡෙත්තුඃ පාර්ශ්වගතාං ඡායාං නොපසංහරති ද්‍රුමඃ.

2. තථාචොක්තම්:—තෘණානි භූමිරුදකං වාක් චතුර්ථී ච සූනෘතා,
එතාන්‍යපි සතාං ගෙහෙ නොච්ඡිද්‍යන්තෙ කදාචන.

3. අපරඤ්ච:—නිර්ගුණෙෂ්වපි සත්වෙෂු දයාං කුර්වන්ති සාධවඃ,
න හි සංහරතෙ ජ්‍යොත්ස්නාං චන්ද්‍රශ්චාණ්ඩාලවෙශ්මනි.

4. අන්‍යච්ච:—බාලො වා යදි වා වෘද්ධො යුවා වා ගෘහමාගතඃ,
තස්‍ය පූජා විධාතව්‍යා සර්වස්‍යාභ්‍යාගතො ගුරුඃ.

1. අනිකුදු කාරණයෙක්-කැමතිවූ සත්කාරයක් නොලද්දාවූ ආගන්තුකයෙක් යමක්හුගේ ගෙයින් හැරීඑන්නේද, ඒආගන්තුකතෙම ගෙයඇත්තාට තමන්ගේ පාපයදී ඔහුගේ පින්නසායේ.

2. අනිකකුදුවෙයි—උතුම්කුල ඇත්තක්හුගේ ගෙයක්කරා ආ නිචයානමුදු සුදුසු පරිද්දෙන් පිදියයුතුවේ, ආගන්තුකයාසියලු දෙව්වරුන්ගේ ආත්මයන්මෙන් පිදියයුත්තෙක්ය" යි කීය.

ඒ අසා ගිජුලිහිනියා බළලා වනාහි මාංසයෙහි ප්‍රියවෙයි, මේ ගසෙහිද පක්ෂිපොතකයෝ වෙසෙත්, එහෙයින් මම මෙසේ කියමි" යි කීය, ඒ අසා බළලා බිමපහුරුගා ශාපකොට පවිටු වූකථා නොඇසෙන පිණිස කන්දෙක වසයි, දෙවියනි දෙවියනි" යි මෙසේද කියයි, ධර්මශාස්ත්‍රය අසා විෂයරසයෙහි නොඇලෙන්නාවූ මාවිසින් දුෂ්කරවූ මේ චාන්ද්‍රායණ ව්‍රතයෙහි පිහිටන ලද්දේය. ඔවුනොවුන් විවාදකරන්නාවුන්ටද හිංසා නොකිරීම මුල්වූයේ ධර්මයයි මෙහි ධර්මශාස්ත්‍රයන්ගේ එකම අදහසයි.

3. යම් කාරණයෙකින්—යම් මිනිස්කෙනෙක් සියල්ලවුන්ට කරණ හිංසාවෙන් වැළැක්කාහුද, යම්කෙනෙක් සියල්ල ඉවසද්ද, සියලුජනයාගේ ආශ්‍රයට පැමිණියෝද, ඒ මනුෂ්‍යයෝ ස්වර්ගයට යන්නාහුයි.

4. අනිකුදු කාරණයෙක්—යම් එකම මිත්‍රධර්මයෙක් ඇද්ද හෙතෙම මියයනකල්හිදු තමා පසුපස්සෙහි කැටිවයේ, ඉතිරි සියල්ලම ශරීරයහා සමග නාස්තියට පැමිණේ.

5. අනිකකුදු—යමෙක් යමක්හුගේ මාංස යම්විටෙක අනුභව කෙරේද, ඔවුන් දෙදෙනාගේ වෙනස පෙණේයි, (ඒ කවරේද) එකක්හට ඇසිල්ලෙක්හි ප්‍රීතියය, අනික් තැනැත්තා ප්‍රාණයන්විසින් මුදනුලැබේ.

---

1. අන්‍යච්ච:—අතිථිර්‍යස්‍ය භග්නාශො ගෘහාත් ප්‍රතිනිවර්ත්තෙ,
ස තස්මෛ දුෂ්කෘතං දත්වා පුණ්‍යමාදාය ගච්ඡති.

2. අන්‍යච්ච:—උත්තමස්‍යාපි වර්ණස්‍ය නීචො'පි ගෘහමාගතඃ,
පූජනීයො යථායොග්‍යං සර්වදෙවමයො'තිථිඃ.

3. යතඃ:—සර්වහිංසානිවෘත්තා යෙ නරාඃ සර්වංසහාශ්ච යෙ,
සර්වස්‍යාශ්‍රයභූතාශ්ච තෙ නරාඃ ස්වර්ගගාමිනඃ.

4. අන්‍යච්ච:—එක එව සුහෘද්ධර්මො නිධනෙ'ප්‍යනුයාති යඃ,
ශරීරෙණ සමං නාශං සර්වමන්‍යත්තු ගච්ඡති.

5. කිඤ්ච:—යො'ත්ති යස්‍ය යදා මාංසමුභයොඃ පශ්‍යතාන්තරම්,
එකස්‍ය ක්ෂණිකා ප්‍රීතිරන්‍යඃ ප්‍රාණෛර්විමුච්‍යතෙ.

1. නැවතද—ස්වභාවයෙන් තමා මැරියයුතුයයන කල්පනාව හටගැණීමෙන් පුරුෂයාහට යම්පමණ දුකෙක් උපදීද ඒ අනුමානයෙන් අන්‍යජනයාද රක්ෂාකළහැකිවේ.

2. නැවතද අසව—සියකැමැත්තෙන් වනයෙහි හටගත්තාඅලඟා පලවලින්ද කුසපුරණු ලැබේ, මේ කුසගින්න කාරණකොට කවරෙක් මහත් පාපයක් කරන්නේද?"

මෙසේ විශ්වාසකොට ඒ බළලා ගස්සිදුරෙහිවිසී, ඉන්පසු දවස් ඉක්මෙනකල පක්ෂිපොතකයන් අල්ලා ගස්බිලයටගෙණවුත් දවස්පතා කන්නේය. එකල්හි යම් පක්ෂීන්ගේ දරුවෝ කනලද්දෝද, ශොකයෙන් පීඩිතවූ හඬන්නාවූ ඒ පක්ෂීහුවිසින් හාත්පසින් සොයනු කැමැත්ත පටන්ගන්නා ලද්දේය, ඒ පරීක්ෂාකරණු කැමැත්ත දැන බළලා බිලයෙන් නික්ම පිටත ගියේය. පසුව ඇත මැත පරීක්ෂාකරන්නාවූ පක්ෂීහුවිසින් ඒ ගස්බිලයෙහි පැටවුන්ගේ ඇට ලද්දෝය. ඉන්පසු "මේ ජරද්ගවයා විසින් අපගේ පැටවිකනලද්දෝයයි සියලු පක්ෂීන්විසින් නියමකොට පියාරැස්වී ගිජුලිහිනියා මරණලද්දේය. "කුල ස්වභාවය දනනොහෙන තැනැත්තහුට," යනාමේ ආදිය එහෙයින් මම කියමි. මෙපවත්අසා ඒ සිවලා කොපසහිතව "මුවා පළමුකොට දුටු දිනයෙහි පින්වතාද කුල ස්වභාව දනනොහෙන තැනැත්තෙක්මවූයේය, එසේකල කෙසේනම් පින්වතාහා මේ මුවාගේ ප්‍රෙම පැවතීම මතුමත්තෙහි ක්‍රමයෙන් වැඩේද.?

3. යම් ප්‍රදෙශයෙක පණ්ඩිතජනයානැද්ද, ඒ ස්ථානයෙහි ශාස්ත්‍රනොදත් තැනැත්තේද ප්‍රසංශාකටයුතුවේ, රුක්නැති දෙශයෙහි එරඬුගසද රුකක්මෙන් ගණන්කරණුලැබේ.

---

1. අපිච:—මර්තව්‍යමිති යද්දුඃඛං පුරුෂස්‍යොප ජායතෙ,
ශක්‍යස්තෙනානුමානෙන පරෙ 'පි පරිරක්ෂිතුම්.

2. ශෂ්පපුනඃ:—ස්වච්ඡන්දවනජාතෙන ශාකෙනාපි ප්‍රපූර්‍යතෙ,
අස්‍ය දග්ධොදරස්‍යාර්ථෙ කඃ කුර්‍යාත් පාතකං මහත්.

3. යත්‍ර විවජ්ජනො නාස්ති ශ්ලාඝ්‍යස්තත්‍රාල්පධීරපි,
නිරස්තපාදපෙ දෙශෙ එරණ්ඩො 'පි ද්‍රුමායතෙ.

1. අනිකකුදු—මේතෙම තමාසන්තකය, මේ අනුන්සන්තක යයි ගණන්ගැණීම මඳ කල්පනා ඇත්තවුන්ගේ ක්‍රියාවෙක, මහත්වූ බුද්ධිමතුන්ටවූකලි සියලු පොළවම තමාවිසින් රැක්ක යුතු පුත්‍රදාරාදී කුලය සමානවෙයි.

මේ මුවා යම්පරිද්දෙකින් මාගේ නෑයෙක්වීද පින්වතාද එසේම නෑයෙක" යනු කියයි. මුවතෙම මේ විවාදයෙන් ප්‍රයොජනනොවෙයි, ප්‍රෙම විශ්වාසයෙන් පිරුණු කථාවලින් සැපතින් යුක්තව සියල්ලවුන්විසින් එක්තැනක වසනුලැබේවා.

2. යම්හෙයකින්—ඇතම්ජනයාට කිසියම් මිත්‍රයෙක් නැත්තේය, ඇතම්ජනයාහට එකම සතුරෙක්ද නැත්තේය, වැඩ අවැඩ පැවැත්මෙන් මිත්‍රයෝවෙත් සතුරෝද එසේමයයි කීය.

එසේ වේවයි කව්ඩාවිසින් කියනලදී. නැවත උදෑසන්හි සියල්ලෝ කැමතිදිශාවලට ගියෝය. එක්දිනෙක සිවලා රහස් ගතවඉඳ "මිත්‍ර මෘගය! මේ වනයෙහිම එක් පෙදෙසෙක්හි ගොයමින් පිරුණු කුඹුරෙක්ඇත, එහෙයින් මම තා එහි ගෙණ ගොස් දක්වමි" කියයි. එසේකළකල මුවා හැමදවස්හිම එහි ගොස් ගොයම්කයි, ඉක්බිත්තෙන් කිප දිනකින් කුඹුරහිමියා විසින් දැක මලයෙක් තබනලද්දේය. මලයෙදූපසු ආවාවූ මුවා කුඹුරෙහි ඇවිදිනේ රැහැන්වලින්බැඳී "මරුවාගේ මලය වැනි ගොවියාගේ මේ රැහැණෙන් මාගලවාගන්ට මිත්‍රයාහැර අන්කවරෙක් පොහොසද්ද" යි මෙසේ සිතීය. මේ අතරෙහි සිවලා එතනට අවුත් ලංවසිට "අපගේ කපටඋපායවූකලි සිදුවූයේය, මාගේ අභිමතාර්ථසිද්ධියද බොහෝසෙයින් වන්නේය, කපනුලබන්නාවූ මොහුගේ මාංසහා ලේ තැවරුණු ඇට මාවිසින් බොහෝසෙයින් ලැබියයුත්තාහුය" යි සිතීය. ඒ මුවාද සිවලාදැක සතුටුවූයේ "මිත්‍රය! මාගේ බැම්ම පළමුකොට කපව වහා මා රකුව.

---

1. අන්‍යච්ච:—අයං නිජඃ පරොවෙති ගණනා ලඝුචෙතසාම්,
උදාරචරිතානාන්තු වසුධෛව කුටුම්බකම්.

2. යතඃ:—න කශ්චිත් කස්‍යචින්මිත්‍රං නකශ්චිත් කස්‍යචිද්‍රිපුඃ,
ව්‍යවහාරෙණ මිත්‍රාණි ජායන්තෙ රිපවස්තථා.

1. යම්හෙයකින්—විපත්තියක් හටගත්කල මිත්‍රයා සොයන්නේය, සටනක්ඇතිකල ශූරයක්හුද, නයගතයුතුකල පිරිසිදු අදහස් ඇත්තක්හුද, ධනය කෙළවරවූකල අඹුවද, විනාසයක් පැමිණිකල නෑයන්ද පරීක්‍ෂාකරන්නේය.

2. අනිකකුදු—විවාහාදි සතුටුඵලවන ක්‍රියායෙහිද, විපත්තියෙහිද, දුර්භික්‍ෂකාලයෙහිද, රජුන්ගේ පීඩානිසා රටඇරයනකලද, විනිශ්චය ස්ථානයෙහිද, සොහොනෙහිද යමෙක් නොහැරසිටීනම් ඒතෙම නෑයෙක්වෙයි කියයි.

සිවලා රැහැණ නැවත නැවත බලා "මේ මුවා දැඩිවූ බන්ධනයෙන් බඳනාලද්දේය" යි සිතී. "මිත්‍රය! මේ රැහැන් නහරවලින් කළබැවින් අද ඉරිදා, කෙසේනම් දත්වලින් සපම්ද? මිත්‍රය! ඉදින් වෙනසක් නොසිතන්නෙහිනම් උදයකාලයෙහි තාගේ කීම කටයුතුය" යි මෙසේද කියයි. නැවත ඒ කවුඩා සවස්කාලයෙහි මුවා නාබැව්දැක නොයෙක්තැන් සොයනුයේ මළයෙන් බැඳීඋන් මුවාදැක "මිත්‍රය! මේ කුමක්දැ" යී ඇසීය, ඒ ඇසූ මුවාවිසින් මේතෙම අගෞරවකරණලද "මිත්‍රවාක්‍යයාගේ ඵලයවෙයි" කියනලද්දේය.

3. හෙදකියනලදී—"වැඩකැමති මිත්‍රයන්ගේ වචනය යමෙක් පිළිනොගණීද, ඕහට නාසතිය ලඟය, ඒ මනුෂ්‍යයා සතුරන් ප්‍රියකරන්නෙක්වේ.

ඒ වඤ්චාකාර සිවලා දැන් කොතනසිටින්නේදැයි? කවුඩා, විචාරයි, "මාගේ මාංස කැමැත්තේ මෙහිම සිටිනේය" යි මුවාවිසින් කියන ලද්දේය. මාවිසින් පළමුකොටම කියනලදැයි කවුඩා කියයි.

---

1. යතඃ:—ආපත්සු මිත්‍රං ජානීයාත් යුද්ධෙ ශූරමෘණෙ ශුචිම්,
භාර්‍ය්‍යාං ක්‍ෂීණෙෂු විත්තෙෂු ව්‍යසනෙෂු ච බාන්ධවාන්.

2. අපරඤ්ච:—උත්සවෙ ව්‍යසනෙ චෛව දුර්භික්‍ෂෙ රාෂ්ට්‍රවිප්ලවෙ,
රාජද්වාරෙ ශ්මශානෙ ච යස්තිෂ්ඨති ස බාන්ධවඃ.

3. තථාචොක්තම්:—සුහෘදාං හිතකාමානාං යඃ ශෘණොති න භාෂිතම්,
විපත් සන්නිහිතා තස්‍ය ස නරඃ ශත්‍රුනන්දනඃ.

1. මාගේ අපරාධයෙක් නැතැයියන මේතීම විශ්වාසකටයුතු කාරණයෙක්නොවේ, ඒ එසේමැයි, ක්‍රෑරවූ සත්‍වයන්කෙරෙන් නිරපරාධයන්ට පවා භයඇත්තේය.

2. මරණය ලංවූ තැනැත්තෝ පහන නිවුණු ගඳ නාශයෙන් දැන නොගණිති, එසේම මිත්‍රයාගේ වචනයද පිළිනොගණිති, අරුන්ධතී තරුවද නොදක්නෝය.

3. අසම්මුඛයෙහි කටයුතු හානිකරන්නාවූ සම්මුඛයෙහි ප්‍රිය වචන කියන්නාවූ එබඳු මිත්‍රයා ගැටියේ කිරිතැවරූ ඇතුළත විෂපිරවූ කලයක් මෙන් දුරුකරන්නේය.

ඉන්පසු කවුඩා අිඬිකොට සුසුම්ලා "බොල වචාකරය! පාපයෙහි හැසිරෙන්නාවූ තාවිසින් කුමක්කරණ ලදද?

4. යම්හෙයකින්—මිහිරිවූද ප්‍රියවූද වචන කථාකරන්නාවූ බොරු සැරසීම්වලින් හා වඤ්චාවලින් වශගකරණ ලද්දවුන්ගේද, ලොකයෙහි ලාභාශාවෙන් යුක්තවූ විශ්වාසයට පැමිණි යාචකයන්ගේද වංචාකටයුතු කුමක් ඇත්තේද?

5. අනිකකුදු—උපකාර ඇති භක්තිමත්වූ වංචාසිත් නැති පිරිසිදු අදහස් ඇත්තක්හු කෙරෙහි යමෙක් අපරාධ කෙරේද, එම්බා පිණැති පෘථිවිය! තී බොරුකියන්නාවූ ඒ සත්‍වයා කෙසේ නම් උසුලන්නිද?

---

1. අපරාධො න මෙ 'ස්තීති නෛතද්විශ්වාසකාරණම්,
විද්‍යතෙ හි නෘශංසෙභ්‍යො භයං ගුණවතාමපි.

2. දිපනිර්වාණගන්ධඤ්ච සුහෘද්වාක්‍යමරුන්ධතීම්,
න ජිඝ්‍රන්ති න ශෘණ්වන්ති න පශ්‍යන්ති ගතායුෂඃ.

3. පරොක්ෂෙ කාර්‍ය්‍යහන්තාරං ප්‍රත්‍යක්ෂෙ ප්‍රියවාදිනම්,
වර්ජ්ජයෙත්තාදෘශං මිත්‍රං විෂකුම්භං පයොමුඛම්.

4. යතඃ:—සංලාපිතානාං මධුරෛර්වචොභිර්මිථ්‍යොපචාරෛශ්ච වශීකෘතානාම්
ආශාවතාං ශ්‍රද්දධතාඤ්ච ලොකෙ කිමර්ථිනාං වඤ්චයිතව්‍යමස්ති?

5. අන්‍යච්ච:—උපකාරිණි විශ්‍රබ්ධෙ ශුද්ධමතෞ යඃ සමාචරති පාපම්,
තං ජනමසත්‍යසන්ධං භගවති වසුධෙ කථං වහසි?

1. දුර්ජනයා සමග මිත්‍රභාවය හෝ ප්‍රීතිය හෝ නොකරවන් නේය. (කුමක් නිසාද?) උණු අඟුරු ඇල්වූකල අත දවා, නිවී ගිය අඟුරු ඇල්වූකල අත කළුවූවාක්මෙන් වේ.

නොහොත් මෝ තොමෝ දුදනන්ගේ පැවැත්ම වන්නිය.

2. පළමුකොට පාදෙක්හි මදුරුවාගේ වැටීම මෙන් දුර්ජනයා නමස්කාර කෙරේ, නැවත මදුරුවා පිටේ දෂ්ටකිරීම මෙන් දුර්ජනයා මහත් අනර්ථයක් ගළපයි, කණ සමීපයේ නොයෙක් පරිද්දෙන් මධුරවූ නොකියයුත්තක් සෙමින් මදුරුවා ශබ්දකරන් නාමෙන් දුර්ජනයා මිහිරිවූකථා කියයි, රෙමකූපයක් ලැබී භය නැතිව මදුරුවාගේ දෂ්ටකිරීම මෙන් දුර්ජනයා විපත්හිආදී සිදුරක්ලැබී ඇතුල්ව විරුද්ධව පවතී, මෙසේ දුර්ජනයාගේ සියලු හැසිරීම මදුරුවෙක් කෙරේ.

3. දුර්ජනයා ප්‍රියමනාප කථාකරන්නේද මේ ප්‍රියවචනය තෙම විශ්වාසකටයුතු කාරණයෙක් නොවේ, ඔහුගේ මුඛයෙහි මීපැණි පවතී, සිතෙහි ඉතා තියුණු නපුරු විෂ ඇතිවේ."

ඉන්පසු උදය කාලයෙහි පොල්ලක්ගෙණ ඒ දිශාවට යන කුඹුරහිමියා කවුඩා විසින් දක්නා ලද්දේය. ඔහු දැක කවුඩා විසින් "මිත්‍ර මෘගය! තෝ තමා මළඑකෙක්හු මෙන් ප්‍රකාශකොට වාතයෙන් බඩපුරවාගෙණ පාදයන් තදකොටගෙණ සිටුව, මම තාගේ ඇස්වලට හොටයෙන් කොටන්නෙමි, මම යම් විටෙක ශබ්දකෙරෙම්ද, එකල්හි තෝ නැගිට වහාම දුවව"යි කීය, කවුඩාගේ වචනයෙන් මුවා එසේම සිටියේය.

නැවත සතුටින් ප්‍රබොධවූ ඇස්වලින්යුත් කුඹුර හිමියාවිසින් එබඳුවූ මුවා දක්නාලද්දේය, "(ආ: පීඩාවක්විය) තමාම මළෙහිදැ?"යි මෙසේ කියා මුවා බන්ධනයෙන් මුදා රැහැන් ඇකිලීමට උත්සාහකෙළේය. ඉන්පසු කුඹුර හිමියා මඳක් නොපෙණීගියකල

1. දුර්ජනෙන සමං සඛ්‍යං ප්‍රීතිඤ්චාපි න කාරයෙත්,
උෂ්ණො දහති චාඞ්ගාරඃ ශීතඃ කෘෂ්ණායතෙ කරම්.

2. ප්‍රාක් පාදයොඃ පතති ඛාදති පෘෂ්ඨමාංසං
කර්ණේ කලං කිමපි රෞති ශනෛර්විචිත්‍රම්,
ඡිද්‍රං නිරූප්‍ය සහසා ප්‍රවිශත්‍යශඞ්කඃ
සර්වං ඛලස්‍ය චරිතං මශකඃ කරොති.

3. දුර්ජනඃ ප්‍රියවාදී ච නෛතද්විශ්වාස කාරණම්,
මධුතිෂ්ඨති ජිහ්වාග්‍රෙ හෘදි හාලාහලං විෂම්.

කවුඩාගේ ශබ්දය අසා ඒ මුවා වහා නැගිට දිවී. දුවන්නාවූ මුවා දැක ඒ තුඹුර හිමියා විසින් කොපය හේතුකොටගෙණ දමාගසන ලද පොල්ලෙන් සිවලා මළේය.

1. එසේද කියනලදී—තුන් අවුරුද්දකින් හෝ තුන් මස කින් හෝ පන්සාළිස් දිනකින් හෝ තුන් දවසකින්දැයි මෙසේ ඉතා මහත්වූ සුචරිත දුශ්චරිතයන් කරණකොටගෙණ මේ ලොකයේදීම පලවිඳිති."

ගොදුරු වියයුත්තාගේ හා අනුභව කරන්නාගේද යනමේ දෙදෙනාගේ ප්‍රීතිය යනමේආදිය" එහෙයින් මම කියමි. නැවත කවුඩු තෙම,

2. "අනුභව කරණලද පින්වතා කරණකොටගෙණද මට බොහෝවූ ආහාරයෙක් නොවේ. නිර්දොෂවූ චිත්‍රග්‍රීවයා මෙන් තා ජීවත්වන කල ජීවත්වෙමි.

3. අනිකකුදු—නිතර සුචරිතයෙහි ඇළුනාවූ තිරිසනුන්ගේ පවා විශ්වාසය දක්නාලද්දේය, ඒ එසේමැයි, මනා සවභාවඇති බැවින් සත්පුරුෂයන්ගේ ගතිය නොපෙරළේ.

4. කොපයට පැමිණියාවූද සත්පුරුෂයාගේ සිත වෙනසකට නොයේ, ඒ එසේමය, සමුද්‍ර ජලය තණසුලකින් රත්කළ නො හෙයි" කීය.

හිරණ්‍යක තෙම "තෝ චපලයෙක චපලයාහා ප්‍රෙමය සියලු පරිද්දෙන් නොකටයුතුය.

5. හෙද කියනලදී, තවද—බළල්ය, මීවාය, එළුය, කවුඩුය, එසේම නින්දිත පුරුෂය යන මොව්හු විශ්වාස භාවයෙන් පව තිද්ද, එහි විශ්වාසය තරම් නොවේ.

තවද අනිකෙක්ද වෙයි, පින්වතා අපගේ සතුරුපක්ෂයවේ, මේද කියනලදී.

---

1. තථා චොක්තම්:—ත්‍රිභිර්වර්ෂෛස්ත්‍රිභිර්මාසෛස්ත්‍රිභිඃ පක්ෂෛස්ත්‍රිභිර්දිනෛඃ,
අත්‍යුත්කටෛඃ පාපපුණ්‍යෛරිහෛව ඵලමශ්නුතෙ."

2. භක්ෂිතෙනාපි භවතා නාහාරො මම පුෂ්කලඃ,
ත්වයි ජීවති ජීවාමි චිත්‍රග්‍රීව ඉවානඝඃ.

3. අන්‍යච්ච:—තිරශ්චාමපි විශ්වාසො දෘෂ්ටඃ පුණ්‍යෛකකර්මණාම්,
සතාං හි සාධුශීලත්වාත් ස්වභාවො න නිවර්තතෙ.

4. සාධොඃ ප්‍රකොපිතස්‍යාපි මනො නායාති වික්‍රියාම්,
න හි තාපයිතුං ශක්‍යං සාගරාම්භස්තෘණොල්කයා."

5. කිඤ්ච:—මාර්ජාරො මහිෂො මෙෂඃ කාකඃ කාපුරුෂස්තථා,
විශ්වාසාත් ප්‍රභවන්ත්‍යෙතෙ විශ්වාසස්තත්‍ර නොචිතඃ.



3296

1. මනා ගැළපීමෙන් යුක්තවූද මිත්‍රභාවය කරණකොට ගෙණ සතුරා හා නොගැළපෙන්නේය, ඒ එසේමය, අතිශයින් කකියනලද ජලයනමුදු ගින්න නිවයි.

2. ශාස්ත්‍රඥාන නැමති ආභරණයෙන් සැරසුනාවූද දුර්ජනයා දුරුකටයුතුය, මාණික්‍යයෙන් සරසනලද්දාවූද මේ සර්පතෙම කුමක්හෙයින් භය නොයෙළවාද?

3. යමක් කළ නොහැකිනම් ඒ කළ නොහෝමය, යමක්කළ හැකිනම් ඒ හැකිවේමය, ජලයෙහි ගැල යා නොහේ, ගොඩද නැව නොයේ.

4. අනිකකුදු—මහත් ධනය කරණකොටගෙණ සතුරන් කෙරේද, ප්‍රෙම රහිතවූ අඹුවකෙරේද, යමෙක් විශ්වාස කෙරේ නම් ඔහුගේ ජීවත්වීම ඒ ක්‍රියාව කෙළවරකොට පවතී.

එපවත් අසා ලඝුපතනක කවුඩා "මාවිසින් සියල්ල අසන ලද්දේය, එසේද තුඹ හා සමග මිත්‍රභාවය එකාන්තයෙන් කට යුතුය යන යමක් ඇද්ද මාගේ නියමය මෙපමණමය, ඒ මිත්‍ර භාවය නොලද්දෙම්නම් නිරාහාරව තාගේ දොරටුවෙහි දිවි නසාගන්නෙම්" කීය. එසේමැයි,

5. මිත්‍රවූ දුර්ජනයා මැටි කලයක් මෙන් සුවසේ බිඳියයුතුද මිත්‍රභාවයෙන් හෙදවූයේ නැවත ගැළපීමද නොහැකිවේ. සත්පුරුෂයාවූකලි රන්කලයක් මෙන් හෙදකළ නොහේ, බිඳුනේද වහා ගැළපියයුතුවේ.

---

1. ශත්‍රුණා න හි සන්දධ්‍යාත් සුශ්ලිෂ්ටෙනාපි සන්ධිනා,
සුතප්තමපි පානීයං ශමයත්‍යෙව පාවකම්.

2. දුර්ජනඃ පරිහර්තව්‍යො විද්‍යයාලඞ්කෘතො'පි සන්,
මණිනා භූෂිතඃ සර්පඃ කිමසෞ න භයඞ්කරඃ.

3. යදශක්‍යං න තච්ඡක්‍යං යච්ඡක්‍යං ශක්‍යමෙව තත්,
නොදකෙ ශකටං යාති න ච නෞර්ගච්ඡති ස්ථලෙ.

4. අපරඤ්ච:—මහතාප්‍යර්ථසාරෙණ යො විශ්වසිති ශත්‍රුෂු,
භාර්යාසු ච විරක්තාසු තදන්තං තස්‍ය ජීවනම්.

5. මෘද්ඝටවත් සුඛභෙද්‍යො දුඃසන්ධානශ්ච දුර්ජනො භවති,
සුජනස්තු කනකඝටවත් දුර්භෙද්‍යශ්චාශු සන්ධෙයඃ.

1. අනිකෙක්ද—සියලු වර්ගවල ධාතුන්ගේ ගැළපීම උණුවී වැගිරීම හෙතුකොටගෙණද, මෘගයන් හා පක්ෂීන්ගේ මිත්‍රභාවය ඉන්ද්‍රිය විෂයවූ ප්‍රයොජනවත් කාරණයක් හෙතුකොටගෙණද, අඥානයන්ගේමිත්‍රභාවය ශඞ්කාලොභදෙක හෙතුකොටගෙණද, සත්පුරුෂයන්ගේ මිත්‍රභාවය දැකීම හෙතුකොටගෙණද වේ.

2. අනිකෙක්ද—සත්පුරුෂයෝ කසපැන්පල මෙන් ඇතුළත මධුරවූවාහු දක්නා ලැබෙත්, අසත්පුරුෂයෝ ඩෙබර මෙන් ඇතුළත රළුවූවාහු පිටතම සිත්කළුවෙත්.

3. අනිකකුදු—සත්පුරුෂයන්ගේ ස්නෙහය නට කල්හිද අනුකූලභාවාදී ගුණයෝ වෙනස් නොවෙත්. මීට උපමාවක්, නෙළුම් දඬු බිඳීගිය කල්හිද නුහුල් එකාබඩව පවතිත්.

4. අනිකකුදු—කපට නුවූ පිරිසිදුබවය, ලොභ නැතිව දන් දීමය, ශූරභාවය, සැප දුක් දෙක්හි සමානබවය, අනුකූලත්වය, භක්තියය, සැබෑකියන බවය යන මොව්හු මිත්‍රයන්ගේ ගුණයෝයි.

මේ ගුණවලින් යුක්තවූ පින්වතා හැර අන් කවර මිත්‍රයෙක් මාවිසින් ලැබියයුතුද”යි මෙසේ කීය. ඒ කවුඩාගේ කථාව අසා හිරණ්‍යකයා ගුලින් පිටතට නික්ම “පින්වතාගේ මධුරවූ මේ කථාවෙන් මම පිණවන ලද්දෙමි.

5. එසේද කියනලදී—පිණැත්තවුන්ගේ සිත් තමාකරා නමා ගන්නා මන්ත්‍රයක් බඳුවූද මනා කාරණයෙන් සරසන ලද්දාවූද පණ්ඩිතයා විසින් කියනලද තෙපල චිත්තයාගේ බොහෝසේ

---

1. කිඤ්ච:—ද්‍රවත්වාත් සර්වලෞහානාං නිමිත්තාන්මෘගපක්ෂිණාම්,
භයාල්ලෝභාච්ච මූර්ඛාණාං සඞ්ගතං දර්ශනාත් සතාම්.

2. කිඤ්ච:—නාරිකෙලසමාකාරා දෘශ්‍යන්තෙ'පි හි සජ්ජනාඃ,
අන්‍යෙ වදරිකාකාරා වහිරෙව මනොහරාඃ,

3. අන්‍යච්ච:—ස්නෙහච්ඡෙදෙ 'පි සාධූනාං ගුණානායාන්ති වික්‍රියාම්,
භඞ්ගෙනාපි මෘණාලානාමනුබධ්නන්ති තන්තවඃ.

4. අන්‍යච්ච:—ශුචිත්වං ත්‍යාගිතා ශෞර්‍ය්‍යං සාමාන්‍යං සුඛදුඃඛයොඃ,
දාක්ෂිණ්‍යං චානුරක්තිශ්ච සත්‍යතා ච සුහෘද්ගුණාඃ.

5. තථාචොක්තම්:—ස්මීතත්වං න තථා සුශීතලජලෛඃ ස්නානං න මුක්තාවලී
න ශ්‍රීඛණ්ඩවිලෙපනං සුඛයති ප්‍රත්‍යඞ්ගමප්‍යර්පිතම්,
ප්‍රීත්‍යෛ සජ්ජනභාෂිතං ප්‍රභවති ප්‍රායො යථා චෙතසඃ
සද්‍යුක්ත්‍යා ච පරිෂ්කෘතං සුකෘතිනාමාකෘෂ්ටිමන්ත්‍රොපමම්.

ප්‍රීතියපිණිස යම්පරිද්දෙකින් වේද, ශරීර දාහයෙන් පීඩිතයන්හු මනා සිහිල් දියවලින් නෑමද, මුතු මාලාවද, සියලඟ ගල්වන ලද සඳුන් කල්ක ආලෙපයද ඒ නියායෙන් සැප ලැබීම පිණිස පොහොසත් නොවේ.

1. අනිකුදු කාරණයෙක්—රහස් කටයුතු කාරණය අන්‍යයන් සමීපයේදී එළිකිරීමය, යමක් ඉල්වීමය, රළුබවය, චංචල සිතැති බවය, කිපීමය, බොරුකියන බවය, දූකෙළියය, යන මේ සියල්ල මිත්‍රයා කිළුටුකරණ ක්‍රියාසි.

මේ ශ්ලොකයෙහි කියනලද ඒ එකම දූෂ්‍ය ක්‍රියාවකුදු තා කෙරේ දක්නානොලැබේ.

2. යම්හෙයකින්—දක්ෂභාවය, සත්‍යවාදී බවය යන මොව්හු කථාවෙන්ම දත්නාලැබෙත්. දැඩිනොවන බවය, සථිර බුද්ධිමත්වූ බවය යනමේ තෙම දැකීමෙන් අවබොධකරණු ලැබේ.

3. අනිකුදු කරුණක්—කපටි නුවූ පිරිසිදු සිතැත්තහුගේ මිත්‍රභාවය අන් නියාවකින්ම වන්නේය, වඤ්චා පැවතුම්වලින් දූෂ්‍යකරණලද සිතැත්තහුගේ වචනය අන් නියාවකින් පවත් නේය.

4. වඤ්චා සිත් ඇත්තවුන්ගේ සිතේ අනිකක්ද, වචනයෙහි එයින් අනිකක්ද, ක්‍රියාව ඉනුත් අනිකක්ද වන්නීය, උතුම් අදහස් ඇත්තවුන්ගේ සිත්හි එකක්මය, වචනයෙහිද එකක්මය, ක්‍රියාවෙහිද එකක්මය.

එහෙයින් පින්වතාගේ කැමැත්තම වේවයි" කීය. මෙසේ කියා හිරණ්‍යකයා මිත්‍රභාවය පවත්වා ආහාරවර්ගවලින් කවුඩා සතුටුකරවා බිලයට වන. කවුඩාද තමාගේ ස්ථානයට ගියේය. එවක් පටන් ඔවුනොවුන්ට ආහාරදීමෙන්ද, සැපසවිචාරීමෙන්ද විශ්වාසයෙන් පිරුණු කථාවලින්ද ඔවුන් දෙදෙනාගේ කාලය ඉක්මෙයි.

---

1. අන්‍යච්ච:—රහස්‍යභෙදො යාච්ඤා ච නෛෂ්ඨුර්‍ය්‍යං චලචිත්තතා,
ක්‍රොධො නිඃ සත්‍යතා ද්‍යූතමෙතන්මිත්‍රස්‍ය දූෂණම්.

2. යතඃ:—පටුත්වං සත්‍යවාදිත්වං කථායොගෙන බුධ්‍යතෙ,
අස්තබ්ධත්වමචාපල්‍යං ප්‍රත්‍යක්‍ෂෙණාවගම්‍යතෙ.

3. අපරඤ්ච:—අන්‍යථෛව හි සෞහාර්දං භවෙත් ස්වච්ඡාන්තරාත්මනඃ,
ප්‍රවර්තිතෙ'න්‍යථා වාණී ශාඨ්‍යොපහතචෙතසඃ.

4. මනස්‍යන්‍යද් වචස්‍යන්‍යත් කාර්‍ය්‍යමන්‍යද්දුරාත්මනාම්,
මනස්‍යෙකං වචස්‍යෙකං කර්මණ්‍යෙකං මහාත්මනාම්.

එක් දිනක් ලඝුපතනකයා හිරණ්‍යකයාට මිත්‍රය! මේ ස්ථානය කවුඩාහට දුකසේ ආහාර ලැබියයුතුය, එහෙයින් මෙතැන හැරපියා අන් තැනකට යනු කැමැත්තෙම්යි මෙසේ කීය. ඊට හිරණ්‍යක තෙම.

1. තමාගේ ඉඩමෙන් අන්තැනකට පැමිණියාවූ දත්ද, කෙශයෝද, නියද, මිනිස්සුද හොබනාහු නොවෙති, මෙපවත් දැන නුවණැති ජනතෙම තමාගේ ස්ථානය නොහරණේයයි කීය.

ඒඇසූ කවුඩා එම්බා සගය! මේතෙම නින්දිත පුරුෂයන්ගේ වචනයෙක.

2. යම්හෙයකින්—සිංහයෝය, සත්පුරුෂයෝය, ඇත්තුයයන මොව්හු තමාගේ ස්ථානය හැරපියායෙති, කවුඩෝය, අලස පුරුෂයෝය, මුවෝය යන මොව්හු තමාගේ ස්ථානයේම මියයෙත්.

3. අතිකුඩු කාරණයෙක්—ශූරවූ පණ්ඩිතයාට ස්වකීය දෙශයෙක්නම් කිමෙක්ද, අන්‍ය දෙශයෙක් හෝ කුමක්නම් දන්නා ලදද, යම් රටකට යේද, ඒ දෙශයම භස්තබලයෙන් තමාට අයිතිකෙරේ. දත්ය, නියය, නඟුටය යනමේ අවයවම ආයුධ කරගත් සිංහයෙක් යම් වනයකට වදීද, ඒ වනයෙහිම නසන ලද ඇතුන්ගේ ලෙහෙවලින් තමාගේ පිපාසය නසයි කීය.

ඒ අසා හිරණ්‍යකයා මිත්‍රය! කොතැන්හි යායුතුද?

4. නුවණැති පුරුෂතෙමේ එක් පාදයෙකින් ගමන්කෙරේද එක් පාදයෙකින් සිටීද, අන් තැනක් නියම නොකොට පළමු ස්ථානය නොහරණේයයි කීය.

කවුඩුතෙමේ සිතනලද ස්ථානයෙක් ඇතැයිකීය, ඒ ස්ථානය කවරේදැයි? හිරණ්‍යකයා ඇසීය, "දණ්ඩක වනයෙහි කර්පූර

---

1. ස්ථානභ්‍රෂ්ටා න ශොභන්තෙ දන්තාඃ කෙශා නඛා නරාඃ,
ඉති විඥාය මතිමාන් ස්වස්ථානං න පරිත්‍යජෙත්.

2. යතඃ:—ස්ථානමුත්සෘජ්‍ය ගච්ඡන්ති සිංහාඃ සත්පුරුෂා ගජාඃ,
තත්‍රෛව නිධනං යාන්ති කාකාඃ කාපුරුෂා මෘගාඃ.

3. අන්‍යච්ච:—කො වීරස්‍ය මනස්විනඃ ස්වවිෂයඃ කො වා විදෙශඃ ස්මෘතඃ
යං දෙශං ශ්‍රයතෙ තමෙව කුරුතෙ බාහුප්‍රතාපාර්ජිතම්,
යද්දංෂ්ට්‍රානඛලාඞ්ගූලප්‍රහරණඃ සිංහො වනං ගාහතෙ
තස්මින්නෙව හතවිපෙන්ද්‍රරුධිරෛඃ තෘෂ්ණාං ඡිනත්ත්‍යාත්මනඃ.

4. චලත්‍යෙකෙන පාදෙන තිෂ්ඨත්‍යෙකෙන බුද්ධිමාන්,
නාසමීක්ෂ්‍ය පරං ස්ථානං පූර්වමායතනං ත්‍යජෙත්.

ගෞරනම් විලෙකැත, ඒ විලෙහි බොහෝකලක් එක්ව වසන ලද මාගේ ප්‍රියමිත්‍රවූ ස්වභාවයෙන් ධාර්මිකවූ මන්ථර යන නම් ඇති ඉබ්බෙක් වෙසෙසි.

1. යම්හෙයකින්—අනුන්ගේ ගුරුකම් ලදකල පණ්ඩිත හාවය සියලු මිනිසුන්ටම පාසුය, සුචරිත ක්‍රියායෙහි තමාට අසිනිවූ ආරම්භය තෙමේ ඇතම් උතුම් අදහස් ඇත්තක්හට වේ.

ඒ ඉබ්බාද ආහාරවර්ගීවලින් මා වර්ධනයකරන්නේය"යි කවුඩා කීය. එසේනම් මෙහි සිට මාවිසින් කුමක් කටයුතුදැයි? හිරණ්‍යකයාද,

2. යම්හෙයකින්—යම් දේශයෙක්හි ආදර ගෞරව නැද්ද, ජීවිකාව කිරීමට උපාය නැත්තේද, නෑයෝ නැත්තෝද, කිසි ශාස්ත්‍ර ඉගණීමෙක් නැද්ද ඒ දෙශය හරණේය.

3. අනිකෙක්ද—ධනවත්තයෙක්ද, මනාගොත්‍රයෙහි උපන්නෙක්ද, අධිපතියෙක්ද, ගඞ්ගාවක්ද, පස්වෙනිවූ වෙදෙක්ද යනමේ පස යම් රටක නැත්තාහුද ඒ රටේ විසීම නොකරන්නේය.

4. අනිකෙක්ද—ශරීරය උසුලන ජීවිකාවය, භයය, ලජ්ජය, අනුකූලවූ හැසිරීමය, ලොභරහිත ස්වභාවය යන පස යම්තැනකනැද්ද, එහි විසීම නොකරන්නේය.

5. තවත් කාරණයෙක්—මිත්‍රය! නයදෙන්නෙක්ද, වෙදෙක්ද, ප්‍රසිඞ කුලවතෙක්ද, දියසහිත නදියක්ද යන මේ සතර අවයවය යම්තැනෙක නැද්ද, ඒ දෙශයෙහි නොවිසියයුතු.

---

1. යත :—පරොපදෙශෙ පාණ්ඩිත්‍යං සර්වෙෂාං සුකරං නෘණාම්,
ධර්මෙ ස්වීයමනුෂ්ඨානං කස්‍යචිත්තු මහාත්මනඃ.

2. යතඃ :—යස්මින් දෙශෙ න සම්මානො න වෘත්තිර්න ච බාන්ධවාඃ,
න ච විද්‍යාගමඃ කශ්චිත් තං දෙශං පරිවර්ජයෙත්.

3. අපරඤ්ච :—ධනිකඃ ශ්‍රොත්‍රියො රාජා නදී වෛද්‍යස්තු පඤ්චමඃ,
පඤ්ච යත්‍ර න විද්‍යන්තෙ තත්‍ර වාසං න කාරයෙත්.

4. අපරඤ්ච :—ලොකයාත්‍රා භයං ලජ්ජා දාක්ෂිණ්‍යං ත්‍යාගශීලතා,
පඤ්ච යත්‍ර න විද්‍යන්තෙ න කුර්‍යාත් තත්‍ර සංස්ථිතිම්.

5. අන්‍යච්ච :—තත්‍ර මිත්‍ර න වස්තව්‍යං යත්‍ර නාස්ති චතුෂ්ටයම්,
ඍණදාතා ච වෛද්‍යශ්ච ශ්‍රොත්‍රියඃ සජලා නදී.

එබැවින් මමද ඒ ස්ථානයට ගෙණයවයි කීය. එකල්හි කවුඩා ඒ මිත්‍රයා හා සමග අනෙකවිධවූ කථාවලින් යුක්තව සුවසේ ඒ විල සමීපයට ගියේය, ඉක්බිත්තෙන් මන්ථරතෙම දුරදීම ලඝුපතනකයා දැක නැගිට සුදුසුවූ ආගන්තුක සත්කාරකොටපියා මීයාටද ආගන්තුක සත්කාර කෙළේය.

1. යම්හෙයකින්—බ්‍රාහ්මණයන් විසින් ගිනි පිදිය යුතුවේ. ගොත්‍රයන් අතුරෙන් බ්‍රාහ්මණයා උතුම, ස්ත්‍රීන්විසින් හිමියා නියමයෙන් පිදිය යුත්තෙක, එසේම තමාකරා පැමිණි ආගන්තුක තෙමේ පිදියයුතුවේ.

2. අනිකකුදු—ශ්‍රෙෂ්ඨ කුල ඇත්තක්හුගේද ගෙට පැමිණි අධම කුල ඇත්තෙක් නමුදු සුදුසු නියායෙන් පිදිය යුතුය. ආගන්තුකයා සියලු දෙව්වරුන්ගේ ආත්මය මෙන් පිදියයුතු.

කවුඩුතෙමේ "මිත්‍ර මන්ථරය! යම්හෙයකින් මේතෙම පුණ්‍ය කර්‍මයන්ට අග්‍රයයි ගණන්කළයුතුද; කරුණාසාගරවූ හිරණ්‍යක නම් මී රජ්ජුරුවෝය, දිව් දෙදහසකිහුදු ඉදින් අනන්ත නාගරාජයා කිසිකලක මොහුගේ ගුණ වර්ණනාව කරන්ට පොහොසත්වන්නේය, එහෙයින් මොහුට විශෙෂසහිත පූජා කරව" යි කීය. මෙසේ කියා චිත්‍රග්‍රීවයාගේ පළමු කථාව කීය. මන්ථරයා ආදරසහිතව හිරණ්‍යකයාටපුද "පිණැත්ත! තෝ මිනිසුන්නැති වනයට ආ කාරණය කියන්ට සුදුසුවව" යි කීය ඒ කියම් අසනුලැබේවයි හිරණ්‍යකයා කීය.

"චම්පකනම් නුවර පරිව්‍රාජකයන් වසන අසපුවෙක්ඇත. එහි චූඩාකර්ණනම් පරිව්‍රාජකයෙක්වෙසේ. ඒ තෙමේද අනුභවයෙන් ඉතිරි සිගාලත් සහල්සහිත සිඟන භාජනය බිත්තියෙහි යොදාතිබෙන දත්ඩෙහිතබා සැතපේ, මමද ඒ සහලට පැන නිතර සහල්කමි.

ඉන්පසු ඔහුගේ ප්‍රියමිත්‍ර වීණාකර්ණනම් පරිව්‍රාජකයා ආයේය. ඔහු හා සමග නොයෙක්කථාවලයෙදී උන් චූඩාකර්ණයා මා තැතිගැන්වීම පිණිස දිරාගිය බටදණ්ඩකින් බිමට

---

1. යතඃ:—ගුරුරග්නිර්ද්විජාතීනාං වර්ණානාං බ්‍රාහ්මණො ගුරුඃ,
පතිරෙකො ගුරුඃ ස්ත්‍රීණාං සර්වත්‍රාභ්‍යාගතො ගුරුඃ

2. අපරඤ්ච :—උත්තමස්‍යාපි වර්ණස්‍ය නීචොපි ගෘහමාගතඃ,
පූජනීයො යථායොග්‍යං සර්වදෙවමයො'තිථිඃ.

ගැසුයේය. එසේකරණ චූඩාකර්ණියා දැක මිත්‍රය! කිමෙක්ද? පින්වතා මාගේ කථාවෙහි නොඇළුනෙහි අනිකක යෙදුනෙහි යයි වීණාකර්ණියා කීය.

1. යම්හෙයකින්—සතුට ප්‍රකාශවන ප්‍රසන්නමුඛය, හාත් පසින් සන්තොෂය ප්‍රකාශවන බැලීමය, කථාවෙහි ඇළීමය, මිහිරි වචනය, මහත්වූ ඇළීමය, නැවත නැවත උත්සාහවත් බැලීමය යන මොව්හු අතිශයින් ඇළුම්ඇති ජනයාගේ ලකුණුයි.

2. ඉවත බැලීමය, පළමුකළ විරූදෙය නැතිකර කීමය, අගෞරවය, නොකටයුතු ක්‍රියාවන් විස්තර කිරීමය, කථාවෙහි යෙදීමෙත්ද නම සිහිනැතිවීමය යන මොව්හු නොඇළුනු අදහසින් යුත් ජනයාගේ ලකුණුයි.

එපවත්අසා චූඩාකර්ණියා විසින් "මිත්‍රය! මම නොඇළුනෙම් නොවෙම් බලව මේ මීයා මාගේ සතුරෙක ඇමකල්හි පැන භාජනයෙහි තැබූ සිගාලද සහල් කන්නේය" යි කියනලද්දේය. වීණාකර්ණතෙමේ බිත්තියෙහි පිහිටුවනලද දණ්ඩ දෙසබලාපියා "ස්වල්ප ශක්තිමත්වූ මීයා මෙපමණදුර කෙසේ පනීද? එබැවින් මෙතැන කිසියම් කාරණයක් හෙතුකොට ගෙණ වියයුතුය" යි සිතා "මෙතැන්හි කාරණය බොහෝ දන රැස්කළබවයයි හැඟෙයි.

3. යම්හෙයකින්—ලොව හැමතැන්හි හැමකාලයෙහි ධනවත් සියලු ජනතෙම බලඇතිවේ, ධනය මුල්කොට පවත්නා ස්වාමිභාවය වනාහි රජුන්ටපවා ලැබේ."

ඉන්පසු ආයුධයක්ගෙණ ඔහුවිසින් ගුලසාරා නැතක්කල් රැස්කරණලද මාගේ ධනයගන්නාලදී. එතැන්පටන් ස්වකීය

---

1. යතඃ:—මුඛං ප්‍රසන්නං විමලා ච දෘෂ්ටිඃ
කථානුරාගො මධුරා ච වාණී,
ස්නෙහො 'ධිකං සම්භ්‍රමදර්ශනඤ්ච
සදනුරක්තස්‍ය ජනස්‍ය ලක්ෂම.

2. අදෘෂ්ටිදානං කෘතපූර්වනාශනං
අමානනං දුශ්චරිතානුකීර්තනම්,
කථාප්‍රසඞ්ගෙන ච නාමවිස්මෘති
විරක්තභාවස්‍ය ජනස්‍ය ලක්ෂණම්.

3. යතඃ:—ධනවාන් බලවාන් ලොකෙ සර්වඃ සර්වත්‍ර සර්වදා,
ප්‍රභුත්වං ධනමූලං හි රාඥාමප්‍යුපජායතෙ.

ශක්තියෙන් පිරිහුණෙම් බලහා උත්සාහ නැත්තෙම් තමාගේ ආහාරයපවා උපදවාගැන්ම පිණිස අපොහොසත්වූයෙම් භයසහිතව සෙමින් සෙමින් එන්නාවූ මම චූඩාකර්ණයා විසින් දක්නා ලද්දෙම්; ඉන්පසු චූඩාකර්ණයාවිසින් මෙසේ කියනලදී.

1. ධනය හෙතුකොටගෙණ ජනයා බලඇතිවේ, ධනය හෙතුකොටගෙණ පණ්ඩිතයෙක්දවේ, දැන් ධනයනැතිකල තමාගේ ජතියහා සමාන බලවත්බවට පැමිණි දුර්වලවූ මේ මීයා බලව.

2. තවද—ධනයෙන් පිරිහුණාවූ නුවණනැති පුරුෂයාගේ වනාහි සියලු ක්‍රියාවෝ ග්‍රීෂ්මකාලයෙහි කුඩා ඇලෙහි දියමෙන් නැසෙති.

3. අනිකුදුකාරණයෙක්—ධනය යමක්හට ඇද්ද මිත්‍රයෝ ඕහට ඇත්තෝය, ධනයෝ යමක්හුගේද නෑයෝ ඔහුගේවෙත්, ධනය යමක්හුගේද හෙතෙම ලොව පුරුෂවේ, ධනවන්තයා පණ්ඩිතදවේ.

4. අනිකකුදු—පුතුන්නැත්තහුගේ ගෙය සිස්වේ, මනා මිත්‍රයන් නැත්තාහටද, අඥානයාටද දිශාවෝ සිස්වෙත්, දිළිඳුබව සියල්ලෙන් සිස්වන්නේය.

5. නැවතද—දිළිඳුබවද මරණයද යන දෙකින්ද දිළිඳුබව අධමයයි දන්නාලදී, කවරහෙයකින්දයත්, මරණය ස්වල්පකාලයක් දුකින් යුතුවේ, දිළිඳුබව වනාහි සියලුකාලයෙහි අතිශයින් ඉවසියනොහේ.

---

1. ධනෙන බලවාල්ලොකො ධනාද්භවති පණ්ඩිතඃ,
පශ්‍යෛනං මූෂිකං පාපං ස්වජාතිසමතාං ගතම්.

2. කිඤ්ච:—අර්ථෙන තු විහීනස්‍ය පුරුෂස්‍යාල්පමෙධසඃ,
ක්‍රියාඃ සර්ව්වා විනශ්‍යන්ති ග්‍රීෂ්මෙ කුසරිතො යථා.

3. අපරඤ්ච:—යස්‍යාර්ථාස්තස්‍ය මිත්‍රාණි යස්‍යාර්ථාස්තස්‍ය බාන්ධවාඃ,
යස්‍යාර්ථාඃ ස පුමාංල්ලොකෙ යස්‍යාර්ථාඃ ස හි පණ්ඩිතඃ.

4. අන්‍යච්ච:—අපුත්‍රස්‍ය ගෘහං ශූන්‍යං සන්මිත්‍රරහිතස්‍ය ච,
මූර්ඛස්‍ය ච දිශඃ ශූන්‍යාඃ සර්ව්වශූන්‍යා දරිද්‍රතා.

5. අපිච:—දාරිද්‍ර්‍යාන්මරණාද්වාපි දාරිද්‍ර්‍යමවරං සමෘතම්,
අල්පක්ලෙශෙන මරණං දාරිද්‍ර්‍යමතිදුඃසහම්.

1. අනිකෙක්ද—ධනවන්තයාගේ ඉන්ද්‍රියයෝ විකලනොවෙත්, ධනවන්තයාගේ නාමයම නාමයවේ, ධනවන්තයාගේ ඥානයම පැකිලනොපවත්නා නුවණය, ඔහුගේබසම වචනයය, ධනය පිළිබඳ අහංකාරයෙන් තොරවූ ඒ පුරුෂයාම ඇසිල්ලෙකින් අනිකෙක්වේ, මෙසේ මේ කාරණය ආශ්චර්‍ය්‍යවේ.

මේ සියල්ල අසා "මාගේ මෙහි විසීම සුදුසුනොවේ, මෙප. වත් අනිකක්හට කීමද යුතුනොවේයයි මාවිසින් සිතනලදී.

2. යම්හෙයකින්—ධන හානියද, ශොකයද, තමාගේ ගෙයි නොකටයුත්ද, අනුන්ටකළ වඤ්චාවද, අනුන් විසින් තමාට කළ අගෞරවයද, නුවණැති තැනැත්තේ අනුන් ඉදිරියේ ප්‍රකාශනොකරන්නේය.

3. එසේද කියනලදී—ආයුගණනය, ධනය, ගෙයි නොකටයුතුය, රහසය, මෛථුනයහා බෙහෙතය, තපසය, දීමහා අගෞරවයද යන නවය උත්සාහයෙන් රක්‍ෂාකටයුතුවෙත්.

4. එසේද කියනලදී—භාග්‍යය අතිශයින් ඉවතබැලූකල, පුරුෂයාපිළිබඳවූ උත්සාහයද සිස්වූකල දිළිඳුවූ පණ්ඩිතයාට වනයෙහිගැර අන්කවරතැනෙක සැපයෙක් ඇත්තේද.?

5. අනිකකුදු—ස්ථිරබුද්ධිමත් ජනතෙමේ ඒකාන්තයෙන් මියයේ සැහැල්ලුබවට නොපැමිණේ, ඊට උපමාවනම්, ගින්න නිවීමටදයේ, එසේද සිහිල්බවට වනාහි නොපැමිණේ.

---

1. අන්‍යච්ච:—තානීන්ද්‍රියාණ්‍යවිකලානි තදෙව නාම සා බුද්ධිරප්‍රතිහතා වචනං තදෙව,
අර්ථොෂ්මණා විරහිතඃ පුරුෂඃ ස එව අන්‍යඃ ක්‍ෂණෙන භවතීති විචිත්‍රමෙතත්.

2. යතඃ:—අර්ථනාශං මනස්තාපං ගෘහෙ දුශ්චරිතානි ච,
වඤ්චනඤ්චාපමානඤ්ච මතිමාන්න ප්‍රකාශයෙත්.

3. තථාචොක්තම්:—ආයුර්විත්තං ගෘහච්ඡිද්‍රං මන්ත්‍රමෛථුනභෙෂජම්,
තපොදානාපමානඤ්ච නව ගොප්‍යානි යත්නතඃ.

4. තථාචොක්තම්:—අත්‍යන්තවිමුඛෙ දෛවෙ ව්‍යර්ථයත්නෙ ච පෞරුෂෙ,
මනස්විනො දරිද්‍රස්‍ය වනාදන්‍යත් කුතඃ සුඛම්?.

5. අන්‍යච්ච:—මනස්වී ම්‍රියතෙ කාමං කාර්පණ්‍යං න තු ගච්ඡති,
අපිනිර්වාණමායාති නානලො යාති ශීතතාම්.

1. තවද—මල්කැනමෙන් උසස්වූ අදහස් ඇත්තහුගේ වනාහි පැවතුම් දෙකක්වෙත්, සියලු ජනයාගේ මුදුනෙහිහෝ සිටිනේය, නොහොත් වනයෙහි විසිරයන්නේය.

මෙහිම ඉල්වීමෙන් යම් ජීවත්වීමෙක් ඇද්ද ඒතෙම අනිශයින් නින්දිතවෙයි.

2. යම්හෙයකින්—ධන හීනයා විසින් ප්‍රාණයන් කරණ කොටගෙණ තෘප්තියට පමුණුවනලද ගින්න උතුම්වේ, ගෞරවයෙන් පිරිහුණු දිළිඳු පුරුෂතෙම ප්‍රාර්ථනා කරණු නොලැබේ.

3. අනිකෙක්ද—දිළිඳුබව හෙතුකොටගෙණ ලජ්ජාවට පැමිණේ, ලජ්ජාවෙන් පීඩිත තැනැත්තේ අනුභාවයෙන් පිරිහේ, අනුභාවනැති තැනැත්තේ ලොකයාවිසින් නින්දාකරණුලැබේ, ගර්හාකිරීම හෙතුකොටගෙණ කලකිරීමට පැමිණේ, කලකිරුණු තැනැත්තේ සිත්තැවීමට පැමිණේ, ශොකයෙන් වසනාලද තැනැත්තේ ප්‍රඥාව විසින් තොරකරණුලැබේ, ප්‍රඥා හීන තැනැත්තේ දුර්වලබවට පැමිණේ, විස්මයෙක දිළිඳුබව සියලු විපත්තිවලට ස්ථානවේ.

4. අනිකෙක්—කථානොකරණ තපස රක්ෂාකටයුතුවූයේ උතුම කියනලද යම්වචනයෙක් සත්‍යනොවේද උතුම්නොවේ, පුරුෂයන්ගේ නපුංසකබව උතුම්වේ, අනුන් අඹුවන්හා අභිරමණය උතුම්නොවේ මියයාම උතුම්වේ, කෙලාම්කීමෙහි ඇළීම උතුම්නොවේ, සිඟමනෙන් ජීවත්වීම උතුම්වේ අනුන්විසින් දෙනලද ධනය අනුභවකරණ සැපය උතුම්නොවේ.

---

1. කිඤ්ච:—කුසුමස්තබකස්‍යෙව ද්වෙ වෘත්තී තු මනස්විනඃ,
සර්වේෂාං මූර්ධ්නි වා තිෂ්ඨෙද්විශීර්‍යෙදථ වා වනෙ.

2. යතඃ:—වරං විභවහීනෙන ප්‍රාණෛඃ සන්තර්පිතො 'නලඃ,
නොපචාරපරිභ්‍රෂ්ටඃ කෘපණඃ ප්‍රාර්ථ්‍යතෙ ජනඃ.

3. අන්‍යච්ච:—දාරිද්‍ර්‍යා හ්‍රියමෙති හ්‍රීපරිගතඃ ප්‍රභ්‍රශ්‍යතෙ තෙජසො
නිස්තෙජාඃ පරිභූයතෙ පරිභවාන්නිර්වේදමාපද්‍යතෙ,
නිර්විණ්ණඃ ශුචමෙති ශොකපිහිතො බුද්ධ්‍යා පරිත්‍යජ්‍යතෙ
නිර්බුද්ධිඃ ක්ෂයමෙත්‍යහො නිර්ධනතා සර්වාපදාමාස්පදම්.

4. කිඤ්ච:—වරං මෞනං කාර්‍ය්‍යං න ච වචනමුක්තං යදනෘතං
වරං ක්ලෛබ්‍යං පුංසාං න ච පරකලත්‍රාභිගමනම්,
වරං ප්‍රාණත්‍යාගො න ච පිශුනවාක්‍යෙෂ්වභිරුචි
ර්වරං භික්ෂාශිත්වං න ච පරධනාස්වාදනසුඛම්.

1. ගවයන්ගෙන් සිස්වූ ගොශාලාව උතුම්වේ රළුගවයා එකාන්තයෙන් උතුම්නොවේ, පරපුරුෂයන්ටඇළුනුඅඹුතොමෝ උතුම්වන්නීය නැවතනොහික්මුනු අඹුව උතුම්නොවන්නීය, වෙනෙහි විසීම උතුම්වේ නැවත පරීක්ෂාරහිතවූ රජුගේ පුරයෙහි විසීම උතුම්නොවේ, මරණය උතුම නැවත අධමයන් සමග විසීම උතුම්නොවේ.

2. නැවතද—සියලු ගෞරවය සෙවකභාවය නැතිකරන්නාක්මෙන්ද, ඇඳිරිය චන්ද්‍රකාන්තිය නැතිකරන්නාක්මෙන්ද, ශරීරශොභාව ජරාව නැතිකරන්නාක්මෙන්ද, පාපය විෂ්ණු ඊශ්වර දෙදෙනා පිළිබඳ කථාව නැතිකරන්නාක්මෙන්ද, ඉල්වනබව ගුණ සියයක්නමුදු නසා.

මෙසේ පරීක්ෂාකොටපියා එබැවින් මම අනුන්විසින් දෙනලද ආහාරයන් කාරණකොටගෙණ කුමට ආත්මය රක්ෂාකෙරෙම්ද? පින්වත ! හෙද දුන, දෙවෙනි මරණයමෙන් දුක්දෙයි.

3. යම්හෙයකින්—කොළඅතු අගක් අතටගන්නා ස්වල්පමාත්‍ර පණ්ඩිතභාවයද, මිලදීහැසිරෙණ මෛථුනයද, අනුන්සතු අනුභවයද යනමේ තුණ පුරුෂයන්ගේ සිනාවට කාරණයෝයි.

4. අනිකෙක්ද—ලෙඩින් පෙළෙන තැනැත්තේද, බොහෝකලක් පිටරටකවසන තැනැත්තේද, අනුන්විසින් දෙනලද ආහාරයෙන් ජීවිකාවකරණ තැනැත්තේද, අනුන්ගේ ගෙයි නිදන සුලු තැනැත්තේද, යනමොවුන්ගේ යම් ජීවත්වීමෙක් ඇද්ද ඒ තෙමේ මරණයයි, යම් මරණයෙක් ඇද්ද ඒ තෙම මොහුගේ විඩා සංසිඳීමයි."

මෙසේ සිතාද ලොභය හෙතුකොටගෙණ නැවතත් ඔහුගේ සහල්ගන්නා පිණිස උත්සාහ කෙළෙම්ද.

---

1. වරං ශූන්‍යා ශාලා න ච ඛලු වරො දුෂ්ටවෘෂභඃ
වරං වෙශ්‍යා පත්නී න පුනරවිනීතා කුලවධූඃ,
වරං වාසො 'රණ්‍යෙ පුනරවිවෙකාධිපපුරෙ
වරං ප්‍රාණත්‍යාගො න පුනරධමානාමුපගමඃ.

2. අපිච:—සෙවෙව මානමඛිලං ජ්‍යොත්ස්නෙව තමො ජරෙව ලාවණ්‍යම්,
හරිහරකථෙව දුරිතං ගුණශතමප්‍යර්ථිතා හරති.

3. යතඃ:—පල්ලවග්‍රාහී පාණ්ඩිත්‍යං ක්‍රයක්‍රීතඤ්ච මෛථුනම්,
භොජනඤ්ච පරාධීනං තිස්‍රඃ පුංසාං විඩම්බනාඃ.

4. අන්‍යච්ච:—රොගී චිරප්‍රවාසී පරාන්නභොජී පරාවසථශායී,
යජ්ජීවති තන්මරණං යන්මරණං සො ස්‍ය විශ්‍රාමඃ.

1. ලොභය කරණකොටගෙණ ඥානය චඤ්චලවෙයි, ලොභයතෙමේ අධික ආශාවයයි කියනලද පිපාසය උපදවා, ඒ මහත් ආශාවනම්වූ පිපාසයෙන් පීඩිතවූ මනුෂ්‍යයා පරලොක යෙහිද මේ ආත්මයෙහිද දුකටපැමිණේ.

එබැවින් මම සෙමින් සෙමින් එළඹෙන්නෙමි ඒ විණ කාණ්ණියා විසින් දිරාගිය බටදණ්ඩකින් තළනලද්දෙම් ලද දෙයකින් සතුටුනොවන ගිජුතැනැත්තා නියමයෙන් තමාගේ සතුරෙකැයි සිතීම්.

2. එසේද කියනලදී—ධනයෙහි ලොභවූ ලදදෙයකින් සතු ටුනොවන නොහික්මුනුසිතින් යුක්තවූ ඉන්ද්‍රිය නිග්‍රහනොක රන්නෙක්වේද, යමක්හුගේ සිත සතුටුනුවූයේද ඕහට සියලු විපත්තිහුමවෙත්.

3. යමක්හුගේ අදහස ලදදෙයකින් සතුටුවූයේද සියලු සම්පත් ඔහුගේවෙත්, (මීට උපමාවනම්) වහන්දෙකින් පත්ල වසනලද්දක්හට පොළව සම් අතුරණලද්දීයක්ම වැනිය.

4. අනිකක්ද—සතුටුවීමයයි කියනලද අමෘතයෙන් තෘප්ති යට පැමිණි සංසිඳුනු සිත්ඇත්තවුන්ගේ යම් සැපයෙක්වේද හාත්පසදුවන ධනලොභීන්ට ඒ සැපය නොලැබේ.

5. තවද—යමක්හුවිසින් ආශාවන් දුරුකොට ආශානැතිබව වැළඳගන්නා ලදද, ඔහුවිසින් ශාස්ත්‍ර පුහුණුකරණ ලද්දේය ඔහුවිසින් නීතිය අසනලද්දීය, ඔහුවිසින් සියල්ලකොට නිම වනලද්දේය.

---

1. ලොභෙන බුද්ධිශ්චලති ලොභො ජනයතෙ තෘෂාම්,
තෘෂාර්තො දුඃඛමාප්නොති පරත්‍රෙහ ච මානවඃ.

2. තථාච:—ධනලුබ්ධො හ්‍යසන්තුෂ්ටො නියතාත්මා ජිතෙන්ද්‍රියඃ,
සර්වා එවාපදස්තස්‍ය යස්‍ය තුෂ්ටං න මානසම්.

3. සර්වාඃ සම්පත්තයස්තස්‍ය සන්තුෂ්ටං යස්‍ය මානසම්,
උපානද්ගූඪපාදස්‍ය නනු චර්මාවෘතෙව භූඃ.

4. අපරඤ්ච:—සන්තොෂාමෘතතෘප්තානාං යත් සුඛං ශාන්තචෙතසාම්,
කුතස්තද්ධනලුබ්ධානාමිතශ්චෙතශ්ච ධාවතාම්.

5. කිඤ්ච:—තෙනාධීතං ශෘතං තෙන තෙන සර්වමනුෂ්ඨිතම්,
යෙනාශාඃ පෘෂ්ඨතඃ කෘත්වා නෛරාශ්‍යමවලම්බිතම්,

1. නැවතද—ධනවතුන්ගේ දොරටුවල ආශ්‍රය නොකළාවූ, පුත්‍රාදීන්ගේ වෙන්වීමෙහි දුකක් නොදත්තාවූ, සිස්බස් නොකියනලද්දාවූ කවරක්හුගේ නමුදු ජීවත්වීම සඵලවේ.

2. යම්හෙයකින්—ආශාවෙන් පීඩාකරණු ලබන්නාහට යොදුන් සියය දුරු නොවේ, ආශා නැත්තාට අතට ලැබුණු ධනයෙහිද උත්සාහයෙක් නොවේ.

එබැවින් මේ කාලයට සුදුසු කටයුතු නියමකිරීම අතිශයින් ශුභවේ.

3. කියනලද්දේද වෙයි—ලෝකයෙහි ජනයාගේ ධර්මයනම් කවරේද? සත්ත්වයන් කෙරේ අනුකම්පා කිරීමයි, සැපතනම් කුමක්ද? නිරෝගීතාවයයි, ස්නේහයනම් කවරේද? සත්පුරුෂ බවයි, පණ්ඩිතභාවයනම් කුමක්ද? කටයුතු නොකටයුතු නියමයයි.

4. එසේද කියනලදී—යම් නියමයකින් විපත්තිවලට පැමිණේද එයින් වෙන්වූ කටයුතු නියමකිරීමම පණ්ඩිත භාවයයි, එබඳු නියමයක් නැතිව හැසිරෙන්නවුන්ට නිතර විපත්ති එළවන්නාහුය.

5. ඒ එසේමැයි—කුලසිරිත රැකීමපිණිස පුත්‍රාදී එක් පුරුෂයකු හරණේය, එසේම ස්වකීය ග්‍රාමවාසීන්ට උපකාර පිණිස තමාගේ සියලු පිරිවර හරණේය, දෙශය රක්නා පිණිස ගම හරණේය, තමා රැකගැන්ම පිණිස පොළව හරණේය.

---

1. අපිච :—අසෙවිතෙශ්වරද්වාරමදෘෂ්ටවිරහව්‍යථම්,
අනුක්තක්ලීබවචනං ධන්‍යං කස්‍යාපි ජීවනම්.

2. යතඃ :—න යොජනශතං දූරං බාධ්‍යමානස්‍ය තෘෂ්ණයා,
සන්තුෂ්ටස්‍ය කරප්‍රාප්තෙ 'ප්‍යර්ථෙ භවති නාදරඃ.

3. උක්තඤ්ච:—කො ධර්මෝ? භූතදයා කිං සෞඛ්‍යම්? අරොගිතා ජගති ජන්තොඃ
කඃ ස්නෙහඃ? සද්භාවඃ කිං පාණ්ඩිත්‍යං? පරිච්ඡෙදඃ.

4. තථාච :—පරිච්ඡෙදෙ හි පාණ්ඩිත්‍යං යදාපන්නා විපත්තයඃ,
අපරිච්ඡෙදකර්තෘණාං විපදඃ ස්‍යුඃ පදෙ පදෙ.

5. තථාහි :—ත්‍යජෙදෙකං කුලස්‍යාර්ථෙ ග්‍රාමස්‍යාර්ථෙ කුලං ත්‍යජෙත්,
ග්‍රාමං ජනපදස්‍යාර්ථෙ ආත්මාර්ථෙ පෘථිවීං ත්‍යජෙත්.

1. අනිකෙක්ද—දුකක් නැතිව ලැබියයුතු පැන් හෝ මතු හයඑළවන මධුර ආහාරහෝ මේදෙක පරීක්ෂාකොට බලම්, යම් වස්තුවෙක සිත් සැනසීම වේද ඒ වස්තුව සැපයි.

මෙසේ සලකා මම මිනිසුන්ගේ රැස්වීමක් නැති වන යටආම්.

2. යම්හෙයකින්—ව්‍යාඝ්‍රයන් හා හස්ත්‍යාදී චණ්ඩ සත්වයන් ගෙන් ගැවසීගත්තාවූ වෘක්ෂයන්ගෙන් පිරුණාවූද විලිකුත්පල හා වතුරද යනමේ ආහාරවලින් යුක්තවූද තණමත්තේ සැතපීමෙන් යුක්තවූද පත්‍ර වස්ත්‍රවලින් යුක්තවූ වනය සැපවේයි, නෑයන්ගෙන් ගැවසීගත් නාගරයෙහිද ධන රහිතව විසීම උතුම් නොවේ.

නැවත මාගේ පින්බලයෙන් මේ මිත්‍රයා විසින් ප්‍රෙම සම්බන්ධයෙන් අනුග්‍රහකරණ ලද්දෙම්වෙමි. දැනුදු පූර්ව පටිපාටියෙන් මාවිසින් පින්වතාගේ ආශ්‍රය නැමති ස්වර්ගයටම පැමිණෙන ලද්දේය.

3. යම්හෙයකින්—දුක් බහුලවූ සංසාරනැමති විෂ වෘක්ෂයාගේ මිහිරි පලදෙකක්ම වෙත්, කවර දෙකක්දයත්, කාව්‍ය නැමති රස අනුභවය, සත්පුරුෂජනයාහා එක්ව විසීමය යනමේදෙකයි.

4. අනිකෙක්ද—සත්පුරුෂයන් හා සම්බන්ධය, විෂ්ණු කෙරේ ශ්‍රද්ධාවය, ගඞ්ගා නදියෙහි ස්නානය යනමේ තුණ එකාන්තයෙන් ක්ෂණයකින් නස්නා සුලුවූ මේ උත්පත්තියෙහි සාරයෝයයි සනිටුහන් කරන්නේය.

---

1. අපරඤ්ච :—පානීයං වා නිරායාසං ස්වාද්වන්නං වා භයොත්තරම්,
විචාර්‍ය ඛලු පශ්‍යාමි තත්සුඛං යත්‍ර නිර්වෘතිඃ.

2. යතඃ :—වරං වනං ව්‍යාඝ්‍රගජෙන්ද්‍ර සෙවිතං
ද්‍රුමාලයඃ පක්වඵලාම්බු භක්ෂණම්,
තෘණානි ශය්‍යා පරිධානවල්කලං
නබන්ධුමධ්‍යෙ ධනහීනජීවනම්.

3. යතඃ :—සංසාරවිෂවෘක්ෂස්‍ය ද්වෙ එව මධුරෙ ඵලෙ,
කාව්‍යාමෘතරසාස්වාදඃ සඞ්ගමඃ සජ්ජනෛඃ සහ.

4. අපරඤ්ච :—සඞ්ගමඃ කෙශවෙ භක්තිර්ගඞ්ගාම්භසි නිමජ්ජනම්,
අසාරෙ ඛලු සංසාරෙ ත්‍රීණි සාරාණි භාවයෙත්.

1. මන්ථර ඉදිබුතෙම, “ධනයො පාදයෙහි තැවරුණු ධූලි මෙන් ක්ෂණයකින් නැසෙත්, තරුණ අවස්ථාව පර්වතයෙහිවූ නදීයගේ වෙගය මෙන් වැඩීමට නොයේ, මිනිස්බව දියබිඳුවක් මෙන් අතිශයින් චඤ්චලවෙයි, ආයු කාලය පෙනවැනි වෙයි, එ හෙයින් යම් මිනිසෙක් ස්ථිරවූ අදහසින් යුක්තවූයේ ස්වර්ගයෙහි අගුල නගන්නාවූ සුචරිතයෙහි නොහැසිරේද ඒ ජනතෙම ජරාවෙන් ලිහිල්කරණලද අවයවවලින් යුක්තවූයේ පශ්චාත්තාපයෙන් මඩනාලද්දේ ශොක ගින්නෙන් දවනුලැබේ.

තොප විසින් අධිකකොට ධනය රැස්කරණ ලද්දේය, මේ තෙම ඒ රැස්කිරීමේ දොෂය වෙයි.

2. අසව—ලද්දාවූ ධනයාගේ රක්ෂාකිරීමනම් සුදුසු ස්ථානයෙහි යෙදීමය, කුමක්මෙන්ද? විලමැද සිටියාවූ ජලයන්ගේ නික්මීම මෙනි.

3. අනිකක්ද—ගිජු පුරුෂතෙම පොළෝ තලයෙහි ඉතා යට භාගයෙහි යම් ධනයක් පිහිටුවූයේද, ඒ ධනය පළමුකොටම යටභාගයෙහි වාසස්ථානයට යාමපිණිස මාර්ගය කෙළේය. තිසි වක්හට උපකාර පිණිස නුවූයේය.

4. යම්හෙයකින්—යම් ජනයෙක් තෙමේ තමාගේ සැපය වළක්වන්නේ ධන රැස්කිරීම කැමතිවේද, ඒජනතෙම අනුන් සඳහා බරඋසුලන සුලු ගොනකු මෙන් දුකටම ස්ථානවේ.

5. එසේද කියනලදී—දීමය, අනුභවය යන මෙයින් තොරවූ ධනය කරණකොටගෙණ ජනයෝ ඉදින් ධනවත්හු වෙත්ද, එසේවීනම් පෘථිවිගර්භයෙහි පවත්නා මාණික්‍ය රත්නාදී ධනය කරණකොටගෙණ අපිද ධනවත්වමු.

---

1. අර්ථාඃ පාදරජෝපමා ගිරිනදීවෙගොපමං යෞවනං
මානුෂ්‍යං ජලබින්දුලොලචපලං ඵෙනොපමං ජීවනම්,
ධර්මං යො න කරොති නිශ්චලමතිඃ ස්වර්ගාර්ගලොද්ඝාටනං
පශ්චාත්තාපහතො ජරාපරිණතඃ ශොකාග්නිනා දහ්‍යතෙ.

2. ශාඞ්ග :—උපාර්ජිතානාං විත්තානාං ත්‍යාග එව හි රක්ෂණම්,
තඩාගොදරසංස්ථානාං පරීවාහ ඉවාම්භසාම්.

3. අන්‍යච්ච :—යදධො ධඃ ක්ෂිතෞ විත්තං නිචඛාන මිතම්පචඃ,
තදධො නිලයං ගන්තුං චක්‍රෙ පන්ථානමග්‍රතඃ.

4. යතඃ :—නිජසෞඛ්‍යං නිරුන්ධානො යො ධනාර්ජනමිච්ඡති,
පරාර්ථං භාරවාහීව ක්ලෙශස්‍යෙව හි භාජනම්.

5. තථාචොක්තම් :—දානොපභොගහීනෙන ධනෙන ධනිනො යදි,
පෘථ්වීඛාතනිඛාතෙන ධනෙන ධනිනො වයම්.

1. දීමය, අනුභවය යන දෙකින් තොරවූ දිනයෝ යමක්හට ඉක්මයෙද්ද, හෙතෙම කඹුරන්ගේ සුලන් පූරවන සම් යන්ත්‍ර මෙන් ශ්වාස කරන්නේද ජීවත්නොවේ.

2. යම් ධනයක් සුදුසු ස්ථානයකට නොදේද, අනුභව නො කෙරේද එබඳු ධනයෙන් ප්‍රයොජන කවරේද? යම් බලයෙක් සතුරන් පරාජය නොකෙරේද ඒ බලයෙන් ප්‍රයොජන කවරේද? යම් ශාස්ත්‍රඥානයෙක් ධර්මයෙහි නොපිහිටියේනම් ඒ ඥානයෙන් කම්කිම? යමෙක් ජයගන්නාලද ඉන්ද්‍රියයන් නැත්තේද ඔහුගේ ආත්මයෙන් ප්‍රයොජන කිම?.

3. අනිකක්ද—මසුරාගේ ධනය අනුභව නොකිරීමෙන් අන්‍ය ජනයා හා සාධාරණවෙයි, ඒ ධනය සොරු ආදීන්ගෙන් හානිවූ කල ලැබෙන දුකින් මොහුගේ මේ ධනයයි හැඟේ.

4. නැවතද—මසුරු තැනැත්තාගේ ධනය දෙවියන්ට යාග කිරීමපිණිස නොවෙයි, බ්‍රාහ්මණයන්ට ප්‍රයොජන පිණිස නො වේ, නෑයන්ට උපකාර පිණිසද නොවේ, තමාට වැඩපිණිසද නොවේ, ගිනිය, සොරුය, රජහුය යන මොවුන් විසින් ගන්නා ලැබේ.

5. අනිකක්ද—ධනයාගේ දීමය, අනුභවය, නැසීමය, යන මේ පැවතුම් තුණක්වෙත්, ඒ ධනය යමෙක් නොමදේද අනු භව නොකෙරේද ඔහුගේ ධනය නැසීමයයි කියනලද තුන් වෙනි අවස්ථාව වන්නීය.

6. එසේද කියනලදී—ප්‍රිය වචනයෙන් යුක්තවූ දීමය, අහං කාර රහිත බුද්ධිය, ඉවසීමෙන් යුක්තවූ ශූරභාවය, සුදුසු ස්ථාන

---

1. දානභොගවිහීනාශ්ච දිවසා යාන්ති යස්‍ය වෛ,
ස කම්මකාරභස්ත්‍රෙව ශ්වසන්නපි න ජීවති.

2. ධනෙන කිං? යන්න දදාති නාශ්නුතෙ
බලෙන කිං? යච්ච රිපූන් න බාධතෙ,
ශ්‍රුතෙන කිං? යෙනන ච ධම්මාචරෙත්
කිමාත්මනා යො න ජිතෙන්ද්‍රියො භවෙත්.

3. අන්‍යච්ච:—අසම්භොගෙන සාමාන්‍යං කෘපණස්‍ය ධනං පරෛඃ,
අස්‍යෙදමිති සම්බන්ධො හානෞ දුඃඛෙන ගම්‍යතෙ.

4. අපිච:— න දෙවාය න විප්‍රාය න බන්ධුභ්‍යො න චාත්මනෙ,
කෘපණස්‍ය ධනං යාති වහ්නිතස්කරපාර්ථිවෛඃ.

5. අන්‍යච්ච:—දානං භොගො නාශස්තිස්‍රො ගතයො භවන්ති විත්තස්‍ය,
යො න දදාති න භුඞ්ක්තෙ තස්‍ය තෘතීයා ගතිර්භවති.

6. තථාචොක්තම්:—දානං ප්‍රියවාක්සහිතං ඥානමගර්වං ක්ෂමාන්විතං ශෞර්‍ය්‍යම්,
ත්‍යාගසහිතඤ්ච විත්තං දුර්ලභමෙතච්චතුර්භද්‍රම්.

යෙහි යොදනලද ධනයද යනමේ මඞ්ගල්‍ය සතර ලොකයෙහි ලැබීම දුෂ්කරවෙයි.

1. අතිකක්ද—හැමදවස්හි ධනය රැස්කටයුතුය, ආපංමයට දුක්දී අධිකකොට රැස්නොකටයුතුය, අධිකකොට රැස්කළ මේ සිවලා දුන්නෙන් නසනලද්දේය, බලව.”

ඒ කෙසේදැයි හිරණ්‍යකයා ඇසී, ඉඳිබුතෙම කියයි.

“කල්‍යාණ කටක නම් ස්ථානයෙහි වසන භෛරව නම් වැද් දෙක් ඇත. ඒ වැද්දූද එක් දිනයෙක මාංසයෙහි ලොභවූයේ දුන්නගෙණ වින්ධ්‍යවන මධ්‍යයට ගියේය. ඔහුවිසින් එහිදී එක් මුවෙක් මරණලද්දේය. මුවා ඇරගෙණයන්නාවූ ඒ වැද්දූවිසින් භයානක ආකාරයෙන්යුත් ඌරෙක් දක්නාලදී. ඉක්බිත්තෙන් ඔහුවිසින් මුවා බිමතබා හූරුතෙම ඊයෙන් විදිනාලද්දේය. ඌරා විසින්ද කල්පාන්ත මේඝයමෙන් භයජනක ශබ්දකරමින් අවුත් වැද්දූගේ අණ්ඩප්‍රදෙශයෙහි දත්වලින් පහරාපියනලද්දේ මුල් උදුරණලද රුකක්මෙන් වැටුනේය.

2. යම්හෙයකින්—දියද, ගිනිද, විෂද, ආයුධද, ආහාර නොලැබීමද, රොගද, පර්වතයෙන් පැණීමද, යන කිසියම්කාරණයකට පැමිණ සත්වතෙම ප්‍රාණයන් විසින් මුදනුලැබේ.

ඔවුන් දෙදෙනාගේ පාදයන් වැදීමෙන් සර්පයෙක්ද මළේය, මේ අතුරෙහි දීර්ඝරව නම් සිවලෙක් ආහාර කැමතිව ඇවිද්දනේ මළාවූ ඒ මුව, වැදි, සර්ප, හූරු යන මොවුන් දුටුයේය. දැක මේ සිවල්තෙම මහත්ආහාරයෙක් එළඹසිටියේය, “භාග්‍යය විශම යෙක.

3. නොහොත්—යම් පරිද්දෙකින් නොසිතනලද දුක් මිනිසුන්කරා පැමිණේද්ද, සැපයෝද එසේම පැමිණෙත්යයි සිතමි මෙහි භාග්‍යය බලවත්වේ.

වේවා, මොවුන්ගේ මාංසවලින් මාස තුණකට වැඩියෙන් මට ආහාර වන්නේය.

---

1. අන්‍ය වච:—කර්තව්‍යඃ සඤ්චයො නිත්‍යං කර්තව්‍යො නාති සඤ්චයඃ,
පශ්‍ය සඤ්චයශීලො සෞ ධනුෂා ජම්බුකො හතඃ.

2. යතඃ : ජලමග්නිර්විෂං ශස්ත්‍රා ක්ෂුද්ව්‍යාධිඃ පතනං ගිරෙඃ,
නිමිත්තං කිඤ්චිදාසාද්‍ය දෙහී ප්‍රාණෛර්විමුච්‍යතෙ.

3. අථවා :—අචින්තිතානි දුඃඛානි යථෛවායාන්ති දෙහිනාම්,
සුඛාන්‍යපි තථා මන්‍යෙ දෛවමත්‍රාතිරිච්‍යතෙ.

1. වැදි තෙම එක්මාසයක් මුලුල්ලේ ආහාර බවට පැමිණේ, මුව ඌරු දෙදෙන මාස දෙකක් මුලුල්ලේ ආහාරබවට පැමිණෙත්, සර්පයා එක් දවසකට ආහාරබවට පැමිණේ, දුනුදිය අද දවස්හි කෑ යුතුවෙයි.

එබැවින් මේ පළමුවෙනි ක්‍ෂුධාවෙහි දුනුකෙළවර බඳනා ලද මධුරනුවූ නහරයෙන්කළ රැහැන් බැම්ම කන්නෙමි" සිතී. මෙසේ කියා එසේ කෙළේය. ඉක්බිත්තෙන් නහරගැටය සුන් කල වහා නැඟුණු දුන්නෙන් ලය පැලුණේ ඒ දීර්ඝරාව තෙම මරණයට පැමිණියේය. දවස්පතා ධන රැස්කටයුතුය, යන මේ ආදිය එහෙයින් මම කීමි.

2. එසේද කියනලදී යමක් සුදුසු ස්ථානයෙහි යොදාද, යමක් අනුභව කෙරේද, ඒ ධනයම ධන ස්වාමියාගේ ධනයයි. මළාවූ වස්තුස්වාමීහුගේ අඹුවන්හා සමගද ධනයහා සමගද අන්‍ය ජනයෝ ක්‍රීඩා කෙරෙති.

3. තවද—යම් ධනයක් සුදුසු ස්ථානවලට දෙන්නෙහිද, යම් ධනයක් නිතර වියදම්කොට අනුභව කරන්නෙහිද, ඒ ධනය මාගේයයි සිතන්නේය, ඉදින් රක්නෙහිද කවරක්හට නම් රක්‍ෂා කටයුතු වන්නේද?

එබැවින් දැන් වසව ඉක්මගිය කථාව කීමෙන් ප්‍රයොජන නොවේ.

4. යම්හෙයකින්—පරීක්‍ෂා ඥානයෙන් යුක්තවූ මනුෂ්‍යයෝ නොලදහැකි වස්තුවක් ප්‍රාර්ථනා නොකෙරෙත්, නටුවාවූ වස්තුවක් සඳහා ශොක කරන්ටද කැමති නොවෙත්, විපත්තියක් එළඹසිටි කලද මුළා නොවෙත්.

එහෙයින් මිත්‍රය! හැමකල්හි උත්සාහ සහිතවන්නාවූ තා විසින් වියයුතුය.

---

1. මාසමෙකං නරො යාති ද්වෞ මාසෞ මෘගසූකරෞ,
අහිරෙකං දිනං යාති අද්‍ය භක්ෂ්‍යො ධනුර්ගුණඃ.

2. තථාච :—යද් දදාති යදශ්නාති තදෙව ධනිනො ධනම්,
අන්‍යෙ මෘතස්‍ය ක්‍රීඩන්ති දාරෛරපි ධනෛරපි.

3. කිඤ්ච :—යද්දදාති විශිෂ්ටෙභ්‍යො යච්චාශ්නාති දිනෙ දිනෙ,
තදෙව විත්තමහං මන්‍යෙ ශෙෂං කස්‍යාපි රක්ෂසි.

4. යතඃ :—නාප්‍රාප්‍යමභිවාඤ්ඡන්ති නෂ්ටං නෙච්ඡන්ති ශොචිතුම්,
ආපත්ස්වපි න මුහ්‍යන්ති නරාඃ පණ්ඩිතබුද්ධයඃ.

1. යම්හෙයකින්—කිසිවෙක් වෙදාදී ශාස්ත්‍ර ඉගෙණද ක්‍රියා වෙහි පරීක්ෂා රහිතවූවාහු වෙත්, යමෙක් ශාස්ත්‍ර ඉගෙණ යාගාදී ක්‍රියා කරන්නේද ඒ පුරුෂයාම පණ්ඩිතවේ, මනාකොට සල කනලද රොගයට හිතවූ බෙහෙත නමුදු නාමය පමණින් ලෙඩුන්ගේ නිරොගිබව නොකෙරේ.

2. අනිකක්ද—විඥාන ශාස්ත්‍රය තෙමේ ශාස්ත්‍රාර්ථ පරීක්ෂා වෙහි උත්සාහ රහිත තැනැත්තාට මඳකුදු උපකාරයෙක් නො කෙරේ, හස්තතලයෙහිවූ ප්‍රදීපය නමුදු අන්ධයාහට මේ ලොක යෙහි කවර වස්තුවක් නම් දක්වාද?

එහෙයින් මිත්‍රය! මෙහි අවස්ථාවගේ පෙරළෙන සුලුබව නියමකොට නිවීම කටයුතු.

3. එළඹසිටි සැපය සෙවනය කරන්නේය, එසේම එළඹසිටි දුකද විඳිනේය, දුක් සැප දෙක රථ චක්‍රයමෙන් පෙරළෙත්.

4. අනිකක්ද—සියලු සම්පත්තීහු ගුණයට ඇළීමෙන් වශග වූවාහු මැඩියන් ළිඳක් කරා මෙන්ද, දිය පිරුණු විලක් කරා පක්ෂීන් මෙන්ද උත්සාහ සහිත ජනයා කරා එළඹෙත්.

5. නැවතද— උත්සාහවත්වූ, පටන්ගත් ක්‍රියාව කල්නොය වන්නාවූ, ක්‍රියා නියමයදත්, දූකෙළි ආදියෙහි නොඇළුනු,

---

1. යතඃ :—ශාස්ත්‍රාණ්‍යධීත්‍යාපි භවන්ති මූර්ඛා
යස්තු ක්‍රියාවාන් පුරුෂඃ ස විද්වාන්,
සුචින්තිතං චෞෂධමාතුරාණාං
න නාමමාත්‍රෙණ කරොත්‍යරොගම්.

2. අන්‍යච්ච :—න ස්වල්පමප්‍යධ්‍යවසාය භීරොඃ
කරොති විඥානවිධිර්ගුණං හි,
අන්ධස්‍ය කිං හස්තතලස්ථිතොපි
ප්‍රකාශයත්‍යර්ථමිහ ප්‍රදීපඃ.

3. සුඛමාපතිතං සෙවෙත් දුඃඛමාපතිතං තථා,
චක්‍රවත් පරිවර්ත්තන්තෙ දුඃඛානි ච සුඛානි ච.

4. අපරඤ්ච :—නිපානමිව මණ්ඩූකාඃ සරඃ පූර්ණමිවාණ්ඩජාඃ,
සොද්‍යොගං නරමායාන්ති විවශාඃ සර්වසම්පදඃ.

5. අපිච :—උත්සාහසම්පන්නමදීර්ඝසූත්‍රං
ක්‍රියාවිධිඥං ව්‍යසනෙෂ්වසක්තම්,
ශූරං කෘතඥං දෘඪසෞහෘදඤ්ච
ලක්ෂ්මීඃ ස්වයං යාති නිවාසහෙතොඃ.

ශූරවූ, කළ උපකාරදත්, ස්ථිර මිත්‍රයන්ගෙන්යුත් ජනයාකරා ලක්ෂ්මී තොමෝ වාසයපිණිස තමාම එළඹෙන්නීය.

1. විශෙෂයෙන්ද—පණ්ඩිත ජනතෙම ධනයෙන් තොරවූයේද මහත් ගෞරවයෙන්යුත් උසස්වූ ස්ථානය ලබා, ලොභ තැනැත්තේ ධනයන්ගෙන් යුක්තවූයේද නින්දාකටයුතු ස්ථානයට පැමිණේ. බල්ලුතෙම රන් මාලාවෙන් සැරසුනේද ස්වභාවයෙන් බබලන ගුණ දහසකට පැමිණීම ප්‍රකාශකරණ සිංහයා පිළිබඳවූ ශොභාව කෙසේ ලබාද?

2. නැවතද—ධන ඇත්තෙමැයි තාගේ කවර අහංකාරයෙක්ද? ධනයෙන් පිරිහුණු තැනැත්තේ දුකට පැමිණෙන්නේය,මිනිසුන්ගේ උසස්බව හා අධමත්වය අතෙහි තබනලද පන්දුවක් හා සමවෙයි.

3. අනිකක්ද--අසත්පුරුෂයාගේ ප්‍රෙමය, වැසිවලාපටලය, මුං මැ ආදී අභිනව ශස්‍යය, ස්ත්‍රීයගේ තරුණභාවය, ධන්යද යන මොව්හු මඳකාලයෙක්හි අනුභව කටයුතුවෙත්.

4. අනික්ක්ද—ජීවිකාව සඳහා අධික උත්සාහ නොකරන්නේය, ඒ ජීවිකාව බ්‍රහ්මයා විසින්ම මවනලද්දීය, ඒ එසේමැයි, සත්වයා මව්ගැබී යෙන් නික්මුනුකල මවගේ පයොධරයෝ කිරි වගුරුවත්.

5. මිත්‍රය! අසව—යම් බ්‍රහ්මයකු විසින් හංසයෝ සුදුපැහැ කරණලද්දාහුද, ගිරව් රන්වන් කරණලද්දාහුද, මොනරු විසිතුරු වර්ණවත් කරණලද්දාහුද, ඒ බ්‍රහ්මතෙම තට ජීවිකාව නියම කරන්නේය.

---

1. විශෙෂතශ්ච :—විනාප්‍යර්ථෛර්ධීරඃ ස්පෘශති බහුමානොන්නතිපදං
සමායුක්තොප්‍යර්ථෛඃ පරිභවපදං යාති කෘපණඃ,
ස්වභාවාදුද්භූතාං ගුණසමුදයාවාප්තිවිෂයාං
ද්‍යුතිං සෛංහීං කිං ශ්වා ධෘතකනකමාලොපි ලභතෙ.

2. කිඤ්ච :—ධනවානිති හි මදස්තෙ කිං ගතවිභවො විෂාදමුපයාසි,
කරනිහතකන්දුකසමාඃ පාතොත්පාතා මනුෂ්‍යාණාම්.

3. අපරඤ්ච:—අභ්‍රච්ඡායා ඛලප්‍රීතිර්නවශස්‍යානි යොෂිතඃ,
කිඤ්චිත්කාලොපභොග්‍යානි යෞවනානි ධනානි ච.

4. අන්‍යච්ච :—වෘත්ත්‍යර්ථං නාතිචෙෂ්ටෙත සා හි ධාත්‍රෛව නිර්මිතා,
ගර්භාදුත්පතිතෙ ජන්තෞ මාතුඃ ප්‍රස්‍රවතඃ ස්තනෞ.

5. සඛෙ ? ශෘණු :—යෙන ශුක්ලීකෘතා හංසාඃ ශුකාශ්ච හරිතීකෘතාඃ,
මයූරාශ්චිත්‍රිතා යෙන ස තෙ වෘත්තිං විධාස්‍යති·

මිත්‍රය! අනිකුදු පණ්ඩිතයන්ගේ රහසක් අසව,

1. ධනය රැස්කරණකල දුක් උපදවත්, චෞරාදීන් විසින් පැහැර ගැණීමෙන් ධනය නටකල සිතතැවීමකරවත්, ධනය ඇතිකල මූළාකරවත්, එහෙයින් ධනයෝ කෙසේ සැප ඵළවද්ද?

2. අනිකක්ද—යමක්හුගේ ධනාශාව යාගහිරීම් ආදි සුචරිතය සඳහානම් ඒ ජනයා ධන රැස්නොකරණ බව උතුම්වේ, (මීටඋපමාවක්නම්) ඒ එසේමැයි, පාදයඋළා මඩසේදීමට වඩා දුරින්ම මඩනොතැවරීම උතුම.

3. යම්හෙයකින්—පක්ෂීන් විසින් ආකාශයෙහිද, ව්‍යාඝ්‍රාදි චණ්ඩසත්‍වයන් විසින් පොළවෙහිද, මසුන්විසින් දියෙහිද යම්සේ ආහාර ගන්නාලැබේද, එසේම ධනවත් ජනතෙම සියළුතැන්හි සියල්ලවුන්ගේ ධනය පැහැරගණී.

4. අනිකක්ද—සත්‍වයන්ට මරහුකෙරෙන් නිතර භය එළවන් නාමෙන් රජුන්ගෙන්ද, ජලයෙන්ද, ගින්නෙන්ද, සොරුන්ගෙන්ද සවකීයජනයාගෙන්ද ධනවත් ජනයන්ට නිතර් භයඑළවා.

5. ඒ එසේමැයි—යම් උත්පත්තියෙක්හි ආශාවපිරෙණ පරිද්දෙන් සම්පත් නොලැබේද, යම් උත්පත්තියෙක්හි ආශාව කෙළවර නොවේද, දුක්බහුලවූ ඒ උත්පත්තිය ඇතිකල පින්වත ඊට වඩාමහත්වූ කවරදුකෙක්ද.

6. පින්වත්සහෝදරය! අසව—පළමුකොට ධනය සුවසේ ලද නොහේ, රැස්කළ ධනය චොරාදීන්ගෙන් දුකින් රැක්ක

---

1. ජනයන්ත්‍යර්ජ්ජනෙ දුඃඛං තාපයන්ති විපත්තිෂු,
මොහයන්ති ච සම්පත්තෞ කථමර්ථාඃ සුඛාවහාඃ.

2. අපරඤ්ච :—ධර්මාර්ථං යස්‍ය විත්තෙහා වරං තස්‍ය නිරීහතා,
ප්‍රක්ෂාලනාද්ධි පඞ්කස්‍ය දූරාදස්පර්ශනං වරම්.

3. යතඃ :—යථා හ්‍යාමිෂමාකාශෙ පක්ෂිභිඃ ශ්වාපදෛර්භුවි,
භක්ෂ්‍යතෙ සලිලෙ මත්ස්‍යෛස්තථා සර්වත්‍ර විත්තවාන්.

4. අන්‍යච්ච :—රාජතඃ සලිලාදග්නෙශ්චෞරතඃ ස්වජනාදපි,
භයමර්ථවතාං නිත්‍යං මෘත්‍යොඃ ප්‍රාණභෘතාමිව.

5. තථාහි :—ජන්මනි ක්ලෙශබහුලෙ කින්නු දුඃඛමතඃ පරම්,
ඉච්ඡා සම්පද් යතො නාස්ති යච්චෙච්ඡා න නිවර්තතෙ.

6. ධනං තාවදසුලභං ලබ්ධං කෘච්ඡ්‍රෙණ පාල්‍යතෙ,
ලබ්ධනාශො යථා මෘත්‍යුස්තස්මාදෙතන්න චින්තයෙත්.

සුතුවේ, යම්හෙයකින් ලදධනය නැසීම මරණයහා සමවේද, එහෙයින් මේධනය උතුම්කොට තකා නොතැවෙන්නේය.

1. ඒ ධන ආශාව යම්හෙයකින් පහකරණලද්දද එසඳ දිළිඳෙක්නම් කවරේද? පොහොසතෙක්නම් කවරේද? ඒ ආශාව වැඩීමට ඉඩින්අවකාශ දෙනලද්දේද එකල්හි දුසහාවය මස්‍යාක යෙහිවේ.

2. අතිකක්ද—යම්කලෙක්හි යම් වස්තුවක් කැමතිවේද, ඒ වස්තුවකෙරේ ලාභආශාව පැතිරේ, යම්වස්තුවකට ආශාව නොකළේද, එක්ක්‍රමයකින් ඒ වස්තුව ලද්දේමය.

අධිකවූ කථාවෙන් ප්‍රයොජනනොවේ, ප්‍රියකථාවලින් මෙහි මකාලය ඉක්මවනු ලැබේවා.

3. යම්හෙයකින්—උතුමන්ගේ ප්‍රේමයෝ මරණයදක්වා පවතිත්, කොපයෝ උපන්කෙණෙහි බිඳෙනාසුලුවෙත්, වෙන්වීම නම් නොඇළිම් පමණක්වෙත්.

මේඅසා ලඝුතනකතෙම පින්වත් මත්රය! ආශ්‍රයකටයුතු යෙහිය.

4. යම්හෙයකින්—පණ්ඩිතයන්ට විපත්තියක් ඇතිකල එට ප්‍රතිකාර කිරීමට පණ්ඩිතයෝම පොහොසත්වෙත්, ඒ එසේමැයි, මඩෙහි එරීගිය ඇතුන් එයින්නගා සිටුවීමට හස්තීහූම පෙහොසත්වෙත්.

5. එසේදතියනලදී—ගුණදත්තැනැත්තේ ගුණවතාකෙරේ සතුටුවේ, ගුණනැත්තාහුගේ ගුණවතා කෙරෙහි ප්‍රීතියක්නොවේ. බමරාදුරැවූද වනයකෙරෙන් පියුමකරාඑයි, මැඩියාවනාහි එක්ස්ථානයෙහි වසන්නේද පියුමකරානොයේ.

---

1. සා තෘෂණා චෙත් පරිත්‍යක්තා කො දරිද්‍රඃ ක ඊශ්වරඃ,
තස්‍යා ශෙචත් ප්‍රසරො දත්තො දාස්‍යඤ්ච ශිරසි ස්ථිතම්.

2. අපරඤ්ච :—යද්‍යදෙව හි වාඤ්ඡන්ත තතො වාඤ්ඡා ප්‍රවර්තතෙ,
ප්‍රාප්ත එවාර්ථතඃ සො ඓ යතො වාඤ්ඡා නිවර්ත්තතෙ.

3. යතඃ :—ආමරණාන්තාඃ ප්‍රණයාඃ කොපාස්තත්ක්ෂණභඞ්ගුරාඃ,
පරිත්‍යාගාශ්ච නිඃ සඞ්ගා භවන්ති හි මහාත්මනාම්.

4. යතඃ :—සන්ත එව සතාං නිත්‍යමාපදුද්ධරණක්ෂමාඃ,
ගජානාං පඞ්කමග්නානාං ගජා එව ධුරන්ධරාඃ.

5. තථාච :—ගුණිනි ගුණඥෙ රමතෙ නාගුණශීලස්‍ය ගුණිනි පරිතොෂඃ,
අලිරෙති බලාත් කමලං න හි භෙකස්ත්වෙකවාසො පි.

1. අතික්කන්ද—යම් ජනයක්හුගේ ඉදිරියට පැමිණි යාචකයෝ නොහොත් පිහිටකැමති ජනයෝ ආශාරහිතවූවාහු කලකිරුණාහු නොයෙද්ද, ලොවම්නිසුන් අතරේ මේ එකමතැනැත්තේ ප්‍රශංසාකිරීමට ස්ථානවෙයි, හෙතෙම උතුම්ද, සත්පුරුෂද, සඵලවූආත්මයෙන් යුක්තද වේ.

එකල මෙසේ සියකැමැත්තෙන් ආහාරගැන්මහා පැවැත්මද කරන්නාවූ සතුටුවූ ඔව්හුසැපසේ විසූහ. ඉක්බිත්තෙන් එක්දිනක් චිත්‍රාඞ්ගදනම්මුවා කිසිවක්හු විසින් තැතිගන්වන ලද්දේ එහිඅවුත් එක්වූයේය. ඉක්බිති පසුවඑන්නාවූ භයකාරණය සලකා මන්ථරතෙමේදියටවන, මීයාද බිලයතුළට ගියේය. ඉගුලුනාවූ කවුඩුතෙමේ ගස්මුදුනකට නැංගේය. පසුව ලඝුපතනකයා විසින් ඉතාදුරබලාද භයට හෙතු කිසිකාරණයකුදු නොදක්නාලද්දේය. පසුව අවුත් නැවත සියල්ලෝ එක්වී උන්නෝය. මන්ථරයාවිසින් පින්වත් මෘගය! තාගේ සැපතකොසේද? සියකැමැත්තෙන් පැන්ආදි ආහාර අනුභව කරණු ලැබේවා. මෙහිවිසීමෙන් මේවනය බබලවිනු ලැබේවයි කියන ලද්දේය. චිත්‍රාංගතෙම "වැද්දාවිසින් තැතිගන්වනලද මම පින්වතුන්ගේ පිහිටසඳහා මෙතනට ආමි.

2. යම්හෙයකින්—යම්ජනයෙක් ලොභයෙන් හෝ භයෙන් ආශ්‍රයට පැමිණි තැනැත්තා දුරුකෙරේද,ඔහුගේ පාපය බ්‍රාහ්මණයක්හු මැරීමහාසමයයි පණ්ඩිතයෝ කියති.

එසේද පින්වතුන්හා මිත්‍රභාවය කැමැත්තෙමියි, කියයි, "හිරණ්‍යකතෙම අපහාසමග පින්වතාගේ මිත්‍රභාවය නිරායාසයෙන් හටගත්තේමය.

3. යම්හෙයකින්—පුත්‍රාදියය, විවාහාදී සම්බන්ධයෙන් යුක්තයාය, ස්වකීයපරම්පරාවේ පිළිවෙළින් පැවත ආ තැනැත්තාය, විපත්තිවලින් මුදාරක්ෂාකළ තැනැත්තාය යනමේ චතුර්විධ මිත්‍රයා දතයුතුවෙයි.

---

1. අපරඤ්ච :—ශ්ලාඝ්‍යඃ ස එකො භුවි මානවානාං
ස උත්තමඃ සත්පුරුෂඃ ස ධන්‍යඃ,
යස්‍යාර්ථිනො වා ශරණාගතා වා
නාශාවිභින්නා විමුඛාඃ ප්‍රයාන්ති.

2. යතඃ :—ලොභාද්වාථ භයාද්වාපි යස්ත්‍යජෙච්ඡරණාගතම්,
බ්‍රහ්මහත්‍යාසමං තස්‍ය පාපමාහුර්මනීෂිණඃ.

3. යතඃ :—ඖරසං කෘතසම්බන්ධං තථා වංශක්‍රමාගතම්,
රක්ෂකං ව්‍යසනෙභ්‍යශ්ච මිත්‍රං ඥෙයං චතුර්විධම්.

එහෙයින් මෙහිතමාගේ ගෙයමෙන් වෙනසක්නැතිව වසනු ලැබේව " යි කීය. ඒ අසා මුවාසතුටුව සියකැමැත්තෙන් ආහාර ගෙණ පැන්බී ජලයට ලංවූ ගස්සෙවනකට වන්නේය.

1. යම්හෙයකින්—ළිඳෙහිවූජලය, නුගගසෙහි සෙවනය, කළුරන්වන්වූ ස්ත්‍රීය, ගඩොළින්කළ ගෙය යනමේ සතරශීතකාල යෙහි උෂ්ණවෙත් උෂ්ණකාලයෙහිද ශීතවෙත්.

ඉක්බිත්තෙන් මන්ථරතෙම "පින්වත්මෘගය! කවරක්හු විසින් තැතිගන්වන ලද්දෙහිද, මිනිසුන්නැති මේ වනයෙහි කිමෙක්ද කිසිකලක වැද්දෝ ඇවිදිද්දැයි " කියයි. එකල්හි මුවා විසින් "කාලිඞ්ගදෙශයෙහි රුක්මාඞ්ගදනම් රජෙක් ඇත. ඒ රජතෙමේද දිශාජයගන්නා ක්‍රමයෙන් අවුත් චන්ද්‍රභාගානදී ඉව් රෙහි සෙනාවළල්ල ප්‍රවෙශකොට වාසයකෙරේ. ඒ රජුවිසින් උදයකාලයෙහි අවුත් කර්පූරවිල සමීපයෙහිවිය යුතුයයි මෙසේ වැද්දන්ගේ මුඛයෙන් ආරංචියෙක් අසනුලැබේ. එබැවින් මෙහි උදයකාලයෙහි භයහෙතුව පිහිටිය යුතුයයි සලකා ඒ සඳහා කටයුතු පටන්ගන්නා ලැබේව " යි කියනලද්දේය. ඒ අසා ඉදිබු තෙම භයසහිතව "සඛය! අන්‍ය ජලස්ථානයකටයෙමි " කියයි. කවුඹු මුවදෙදෙනද "මිත්‍රය! එසේවේව " යි කීවෝය. හිරණ්‍ය කතෙම පරීක්ෂාකොට "නැවත ජලස්ථානයකට පැමිණිකල ඉදි බුවා හට සැපවෙයි. ගොඩතැන්හි ගමන්කරණ මේ ඉබ්බාට කෙබඳුවන්නේද?

2. යම්හෙයකින්—දියෙහි වසන සත්වයන්ට ජලයත්ද, පර්වත විවරාදියානොහැකි ස්ථානවල වසන සත්වයන්ට එම ස්ථානද, ව්‍යාඝ්‍රාදි චණ්ඩසත්වයන්ට වනයද, රජුන්ට සෙනාව වසනතැනද උතුම් බලවත්වූයේවේ.

මඩින් ගැවසීගත් මාර්ගයෙන් යන්නාවූ සිවලා විසින් ඇතා මරණලදී, ගොඩ මගින්යන්නාවූ තෝද එසේම වන්නෙහියයි කීය.

ඉක්බිත්තෙන් මන්ථරයා විසින් ඒ කෙසේදැයි කියනලදී, හිරණ්‍යකතෙම කියයි.

---

1. යතඃ :—කූපොදකං වටච්ඡායා ශ්‍යාමා ස්ත්‍රී ඉෂ්ටකාලයම්,
ශීතකාලෙ භවෙදුෂ්ණමුෂ්ණකාලෙ ච ශීතලම්.

2. යතඃ :—අම්භාංසි ජලජන්තූනාං දුර්ගං දුර්ගනිවාසිනාම්,
ස්වභූමිඃ ශ්වාපදාදීනාං රාඥං සෛන්‍යං පරං බලම්.

බ්‍රහ්මවනයෙහි කර්පූරතිලකනම් ඇතෙක් ඇත. ඒ ඇතාදැක සියලු හිවල්හු "ඉදින් මේ ඇතා කිසියම් උපායකින් මැරෙන්නේනම් එකල්හි අපට මේ ඇතාගේ ශරීරයෙන් සාරමසකට බොහෝවූ ආහාරයෙක් වන්නේය" යි සිතූහ. ඉක්බිත්තෙන් ඔවුන් අතුරෙන් එක් මහලු සිවලෙක්හු විසින් "මාවිසින් බුද්ධිශක්තියෙන් මේ ඇතාගේ මරණය සිද්ධකටයුතුය" යි නියම කරණලද්දේය. ඉන්පසුව ඒ වඤ්චාකාර සිවලා කර්පූරතිලකයාගේ සමීපයට ගොස් පොළව ස්පර්ශකළාවූ ශරීරයෙහි අවයව අටක් සහිතව නමස්කාරකොට පියා "දේවයන්වහන්ස! මාදෙස බැලීමෙන්මට අනුකම්පාකළ මැනවැ" යි කීය. හස්තිතෙම "තෝ කවරෙක්ද කොතනසිට ආයෙහිද" යි අසයි? සිවල්තෙම "මම සිවලෙක්මි වනයෙහි වසන සියලු සිව්පාවුන් විසින් රැස්ව පින්වතා සමීපයට එවන ලද්දෙමි. යම්හෙයකින් රජක්හු නැතිව විසීම යුතුනැද්ද එහෙයින් මේ වනයෙහිවූ රාජ්‍යපදවියෙහි සියලු ස්වාමිගුණයෙන් යුක්තවූ පින්වත්තෙමේ නියම කරණලද්දේය.

1. යම්හෙයකින්—යමෙක් පොළෝතලයෙහි වංශයෙහි පැවත ආ නියමය ලෝකයෙහි පැවතආ නියමය යනමෙයින් ඉතා පිරිසිදුද තේජස් ඇත්තේද ධර්මය දන්නේද නීතියෙහි දක්ෂද, හෙතෙම රාජ්‍යපදවියෙහි සුදුසුවේයි.

2. අනිකක්දබලව—පළමුකොට රජක්හු ලබන්නේය, ඉන්පසු බිරින්දක් ලබන්නේය, නැවත ධනය ලබන්නේය, මේ ලෝකයෙහි රජ්ජුරුවන් නැතිකල්හි කවර අඹුවක් රක්ෂාකට යුත්තිද, කිනම් ධනයක් රැක්ක යුතුද.

3. අනිකක්ද—රජතෙම වැසිවලාවක්මෙන් සත්වයන්ට ආධාර වෙයි, වැසිවලාව නොනැගිකල්හිද ලෝකයා ජීවත්වනුලැබේ, එසේවීනමුදු රජ්ජුරුවන් නැතිකල්හි ජීවත්වනු නොලැබේ.

---

1. යතඃ—කුලාචාරජනාචාරෛරතිශුද්ධඃ ප්‍රතාපවාන්,
ධාර්මිකො නීතිකුශලඃ ස ස්වාමී යුජ්‍යතෙ භුවි.

2. අපරඤ්චපශ්‍ය:—රාජානං ප්‍රථමං වින්දෙත් තතො භාර්‍ය්‍යාං තතො ධනම්,
රාජන්‍යසති ලොකෙ ස්මින් කුතො භාර්‍ය්‍යා කුතො ධනම්.

3. අන්‍යච්ච :—පර්ජන්‍ය ඉව භූතානාමාධාරඃ පෘථිවීපතිඃ,
විකලෙ ’පි හි පර්ජන්‍යෙ ජීව්‍යතෙ න තු භූපතෞ.

1. නැවතද—රජුන්ට අයිතිවූ මේ ලොකයෙහි බොහෝ සෙයින් ආශුවට හයින් ජනතෙම හික්මීමෙහි පවතී, ස්වභාව යෙන් මනාපැවතීමෙන් යුක්තයෙක් ලැබියනොහෙයි, කුලස්ත්‍රී තොමෝ දුර්වලවූහෝ, විකල අවයවයන්ගෙන් යුක්තවූහෝ, රොගයෙන්පීඩිතවූහෝ, ධනරහිතවූහෝ ස්වකීය ස්වාමියා දඬුවමටහයින් එළඹෙන්නිය.

එබැවින් යම්හෙයකින් අභිෂෙකය සඳහා නියමකරණලද කාලය නොයික්මේද, එපරිද්දෙන් දෙවයන්වහන්සේ විසින් වහාඑළඹෙනුලැබේව " යි කීයේය. මෙසේකියා නැඟිටගියේය, ඉක්බිත්තෙන් රාජ්‍ය ලොභයෙන් අදනාලද මේ කර්පූරතිලක තෙම සිවලා විසින් දක්වනලද මාර්ගයෙන් දිවන්නේ මහමඩෙහි ගිලුනේය. එකල්හි ඇතා විසින් "මිත්‍රවූ සිවල! මම මහ මඩෙහි වැටුනෙමි දැන්කුමක් කටයුතුද" යි කියන ලද්දේය. සිවලාවිසින් "ස්වාමීනි! මාගේවල්ගය අගඅල්වාපියා නැඟීසිටුව මැනව, යම්හෙයකින් මාවැනි කපටයකුගේ වචනයෙහි නුඹ වහන්සේ විසින් විශ්වාසකරණලදද ඒ විශ්වාසකිරීමෙහි මේ තෙම පලයවෙයි.

2. එසේද කියනලදී, යම්කලෙක්හි මාවැනි අසත්පුරුෂයන් හා ඇලීමෙන් වෙන්වූයේ වන්නෙහිද එකල්හි ජීවත්වන්නෙහිය, යම්කලෙක්හි අසත්පුරුෂයන් හා ඇලීමෙහි වැටෙන්නෙහිද එකල්හි අධොභාගයට වැටෙන්නෙහිය " යි කියනලදී.

ඉක්බිත්තෙන් මහ මඩෙහි ගිලුනු ඇතා සිවලුන් විසින් කන ලද්දේය. එහෙයින් හස්තිතෙම සිවලා විසින් මරණලද්දේය." යන මේ ආදිය මම කියම්යි කීයේය. ඉක්බිත්තෙන් ඔහුගේ වචනය පරීක්ෂාකොට මහත්භයින් මන්ථරතෙම ජලස්ථානය හැරගියේය. ඒ හිරණ්‍යකාදිහුද මන්ථරයා පසුපස්සෙහි ගියෝය. ඉක්බිත්තෙන් ගොඩබිමෙහි යන්නාවූ ඒ ඉදිබුතෙමෙ වනයෙහි ඇවිදිනා එක්තරා වැද්දෙකු විසින් මඩනාලද්දේය. ඒ වැදී

---

1. කිඤ්ච :—නියතවිෂයවර්තී ප්‍රායශො දණ්ඩයොගාත්
ජගති පරවශෙ 'ස්මින් දුර්ලභඃ සාධුවෘත්තඃ,
කෘශමපි විකලං වා ව්‍යාධිතං වා 'ධනංවා
පතිමපි කුලනාරී දණ්ඩභීත්‍යාභ්‍යුපෛති.

2. තථාචොක්තම් :—යදා සතසඞ්ගරහිතො භවිෂ්‍යසි භවිෂ්‍යසි,
යදා සජ්ජන ගොෂ්ඨීෂු පතිෂ්‍යසි පතිෂ්‍යසි.

තෙමේද ඒ ඉදිබුවාගෙණ පෙරළා දුන්නෙහි බැඳගෙණ පිණෑත් තෙම්කියා තමාගේ ගෙට අභිමුඛව ගියේය. ඉක්බිත්තෙන් ඒ මුව, කවුඩු, මී, යන මොව්හු අතිශයින් කලකිරීමට පැමිණියාහු වැද්දා පසුපස්සේ ගියෝය. එකල්හි හිරණ්‍යකයා විලාපකියයි.

1. මම සාගරයාගේ එතරටමෙන් යම්තාක් එක්දුකක කෙළවරට නොයෙම්ද ඊටපළමු දෙවෙනිවූ අනික්දුකෙක් එළඹ සිටියේය. සිදුරු ඇතිකල්හි විපත්තීහු බහුලවෙත්.

2. ස්වභාවයෙන් හටගත් යම් මිත්‍රයෙක්ඇද්ද ඒ තෙම මහත්වූ පිණින්ම උපදී, ඒ ස්වභාවයෙන් හටගත් මිත්‍රභාවය ඇත්තා විපත්තියක් ඇතිකල්හිද නොහරී.

3. අනිකක්ද—පුරුෂයන්ගේ ස්වභාවයෙන් හටගත් මිත්‍රයා කෙරෙහි යම් බඳුවූ ඇදහිමෙක් වේද ඒතරම් විශ්වාසයෙක්මව කෙරේද, අඹුවන්කෙරේද, සහොදරයා කෙරේද පුත්‍රයාකෙරේද නැත්තේය.

මෙසේ වරින්වර සිතමින් මාගේ අවාශනාව විසමයෙක.

4. යම්හෙයකින්—මේ සංසාරයෙහිම ස්වකීය කර්මසමූහයන්ගේ ක්‍රියාවෝ අන්‍ය කාලයකට පෙරළීමෙන් සැපදුක් වින්ද යුතු වෙති, ඒ නියමවූ පූර්වජාතියෙහි කර්මයෝ පෙරජාතියෙහි කරණලද පින්පව්මෙන් මාවිසින්ම අනුභවකරණ ලද්දාහුය.

නොහොත් සංසාරයාගේ පෙරළෙන සුලුබව මෙබඳුමය.

5. ශරීරය සමීපව පවත්නා විනාශයෙන් යුක්තවෙයි, සම්පත්තීහු විපත්තිවලට ස්ථානවෙත්, සමාගමයෝ වෙන්වීමෙන් යුක්තවෙත්, සියලුඉපදීම නැසෙනසුලුවෙයි.

---

1. එකස්‍ය දුඃඛස්‍ය න යාවදන්තං
   ගච්ඡාම්‍යහං පාරමිවාර්ණවස්‍ය,
   තාවද්විතීයං සමුපස්ථිතං මෙ
   ඡිද්‍රෙෂ්වනර්ථා බහුලී භවන්ති.
2. ස්වාභාවිකං තු යන්මිත්‍රං භාග්‍යෙනෛවාභිජායතෙ,
   තදකෘත්‍රිමසෞහාර්දමාපත්ස්වපි න මුඤ්චති.
3. අපිච :—න මාතරි න දාරෙෂු න සොදර්‍ය්‍යෙ න චාත්මජෙ,
   විශ්වාසස්තාදෘශඃ පුංසාං යාදෘඞ්මිත්‍රෙ ස්වභාවජෙ.
4. යතඃ :—ස්වකර්මසන්තානවිචෙෂ්ටිතානි
   කාලාන්තරාවර්තිශුභාශුභානි,
   ඉහෛව දෘෂ්ටානි මයෛව තානි
   ජන්මාන්තරාණීව දශාන්තරාණි.
5. කායඃ සන්නිහිතාපායඃ සම්පදඃ පදමාපදාම්,
   සමාගමාඃ සාපගමාඃ සර්වමුත්පාදි භඞ්ගුරම්.

1. නැවත විමසා කියයි, පුත්‍රාදීන්ගෙන් වෙන්වීමේ දුකය සතුරුය භයය යන මෙසිත් රක්නාවූ, ප්‍රසන්නය විශ්වාසය යන මොවුන්ට ස්ථානවූමිත්‍රම් යන අක්ෂරදෙකින් යුක්තවූ මේ රත්නය කවරක්හු විසින් මවනලද්දේද.

2. තවද—මිත්‍රතෙම නෙත්‍රයන්ගේ ප්‍රීතියකරණ සිනිදුරසඳුනෙක්වෙයි, සිත සතුටුකෙරෙයි, යමෙක් මිත්‍රයා හා සමග සැප දුක්දෙක්හි භාජනවන්නේද එබන්දෙක් නොලැබිය හැකිවේ, සම්පත් ඇතිකල ධනාශාවෙහි ගිජුවූ අනික් මිත්‍රයෝ සියලු තැන්හි සිටිති, ඒ මිත්‍රයන්ගේවූකලි විපත්තිකාලයෙහිම උරගල වෙ" යි.

මෙසේබොහෝ විලාපකියා හිරණ්‍යකතෙමේ "මේ වැද්දා වනයෙන් නික්මීමට පළමු මන්ථරයා බන්ධනයෙන් මිදීමපිණි උත්සාහකරණු ලැබේව" යි චිත්‍රාඞ්ග ලඝුපතනක දෙදෙනාට කියයි. එකල්හි ඔව්හු දෙදෙන "කටයුතුදෙයක් යුහුවකියව" යි කිවූය. හිරණ්‍යක තෙම චිත්‍රාඞ්ගයා ජලස්ථානයක් සමීපයට ගොස් මළඑකක්හුමෙන් නොසොල්වන්නාවූ ශරීරය දක්වව, කවුඩාද ඔහුගේ ශරීරය මත්තේ ඉඳ හොටයෙන් කිසි කෙටීමක් කරව, එකාන්තයෙන් මුවමාංස කැමතිවූ මේ වැද්දා විසින් ඒ ස්ථානයෙහි ඉදිබුවා තබා වහා යායුතුවෙයි. එවිට මම මන්ථරයාගේ බැම්ම කපන්නෙමි" කියයි. ඉක්බිත්තෙන් චිත්‍රාඞ්ගලඝුපතනක දෙදෙනා විසින් වහා ගොස් එසේ සිටිකල්හි විඩාවට පැමිණි ඒ වැද්දා පැන්බී පියා ගසක්මුලට පැමිණියේ මළඑකක්හු මෙන් උන් ඒ මුවා දැක ඉදිබුවා ජලස්ථානය සමීපයේ තබා ආයුධය ගෙණ සොම්නසින් මුවාසමීපයට ගියේය. මේ අතුරෙහි හිරණ්‍යකයා විසින් අවුත් බැම්ම කපනලද ඒ ඉදිබුවා වහාදියට වන්නේය. ඒ මුවාද ලන්වඑන වැද්දා දැක නැගිට යුහුව දිව්යේය. වැදිතෙමේ ආපසු ගසමුලට ආකල ඉදිබුවා නොදක්නා තැනැත්තේ "අපරීක්ෂාකාරීවූ මාගේ ක්‍රියාවට මේ තෙම තරම් වෙයි.

---

1. පුනර්විමෘශ්‍යාහ :—ශොකාරාතිභයත්‍රාණං ප්‍රීතිවිශ්‍රම්භභාජනම්,
කෙන රත්නමිදං සෘෂ්ටං මිත්‍රමිත්‍යක්ෂරද්වයම්.

2. කිඤ්ච :—මිත්‍රංප්‍රීතිරසායනං නයනයොරානන්දනං චෙතසඃ
පාත්‍රං යත් සුඛදුඃඛයොඃ සහ භවෙන්මිත්‍රෙණ තද්දුර්ලභම්,
යෙ චාන්‍යෙ සුහෘදඃ සමෘද්ධිසමයෙ ද්‍රව්‍යාභිලාෂාකුලා
ස්තෙ සර්වත්‍ර මිලන්ති තත්ත්වනිකෂග්‍රාවා තු තෙෂාං විපත්,

1. යම්හෙයකින්—යම් ජනයෙක් නියමයෙන් පැමිණියවුන් හැරදමා නියමනුවූවන් වැළඳගණීද, ඔහුගේ නියමයෙන් පැමිණියාහු නැසෙත්, නියමනුවූ වාහූ නැත්තාහූම වෙත්"යයිසිති.

ඉක්බිත්තෙන් මේ රජතෙම තමාගේ අවාශනා වශගත්වයෙන් ආශානැත්තේ ඉසනාව වසනතැනට වන්නේය. ඉදිබූ ආදීහූද විපත්ති රහිතවූවාහූ සියල්ලෝ සවකීය ස්ථානයට ගොස් සැපසේ විසුවෝය."

ඉක්බිත්තෙන් රාජපුත්‍රයන් විසින් "සියල්ල අසන ලද්දාවූ අපි සැපතට පැමිණියම්හ, අපගේ මනොරථය සිඬවූයේය" යි සතුටින් කීවෝය.

විෂ්ණුශර්මන්තෙමේ මෙතෙකින් පින්වතුන්ගේ ප්‍රාර්ථනාව සිදුවූයේය. නැවතද මේ මඞගල්‍යයවේවා.

2. සත්පුරුෂයෙනි මිත්‍රබවට පැමිණෙවු, ජනපදවාසීන් විසින් ලක්‍ෂ්මීතොමෝ ලංකාරණුලබාවා, රජහු ජනයා සතුටුකිරීම් ආදීයෙහි නිරන්තරයෙන් ඇළුනාහු පෘථිවිය රකිත්වා, තොපගේ නීතිය තොමෝ අලුත විවාහකළ අඹුවක්මෙන් පණ්ඩිතයන්ගේ සිත් සන්තොෂය පිණිසවේවා, භාග්‍යවත්වූ ඊශ්වරතෙමේ ජනයාට මඞගල්‍යයක් කෙරේවා.

විෂ්ණුශර්මන් විසින් සඞග්‍රහ කරණලද හිතොපදෙශයෙහි
මිත්‍රලාභනම් ප්‍රථමකථා සඞග්‍රහය මෙසේයී.

---

1. යතඃ :—යො ධ්‍රැවාණි පරිත්‍යජ්‍ය අධ්‍රැවාණි නිෂෙවතෙ,
ධ්‍රැවාණි තස්‍ය නශ්‍යන්ති අධ්‍රැවං නෂ්ටමෙව හි.

2. මිත්‍රං ප්‍රාප්නුත සජ්ජනා ජනපදෛඃ ලක්‍ෂ්මීඃ සමාලභ්‍යතාම්
භූපාලාඃ පරිපාලයන්තු වසුධාං ශශ්වත් ස්වධර්මෙ ස්ථිතාඃ,
ආස්තාං මානසතුෂ්ටයෙ සුකෘතිනාං නීතිර්නවොඪෙව වඃ
කල්‍යාණං කුරුතාං ජනස්‍ය භගවාං ශචන්ද්‍රාර්ධචූඩාමණිඃ,

# මිත්‍රභේදය.

# මි ත්‍ර භේ ද ය.

## ඉක්බිතිව මිත්‍රභෙදනම් පරිච්ඡෙදය කියනුලැබේ.

නැවත රාජපුත්‍රයෝ ස්වාමිනි! මිත්‍රලාභයවූ කලිඅපවිසින් අසනලදී, දැන් අපි මිත්‍රභෙදය අසනු කැමැත්තමෝ යයි කීවුය. විෂ්ණුශර්මන් තෙම යම් මිත්‍රභෙදයක්හු ගේ මේ මුල් ශ්ලෝකයද ඒ මිත්‍රභෙදයද අසව්.

1. “වනයෙහි සිංහ ගව දෙදෙනාගේ දවස්පතා වැඩෙන ස්ථිරප්‍රේමය ඉතාලෝභවූ කේලාම්කියන සිවලා විසින් නසන ලදැ” යි කීය.

ඒ කෙසේදැයි? රාජපුත්‍රයන් විසින් අසන ලද්දේය. විෂ්ණු ශර්මන්තෙමේ කියයි.

දකුණුදිග සුවර්ණවතීනම් නුවරෙක්ඇත. ඒ නුවර මහත් ධනවත් වර්ධමාන නම් වෙළෙන්දෙක්විසී. ඔහට මහත්වූ ධනය ඇතිකල්හිද ධනයෙන් තමාටවඩනා අනික්නෑයන් දැක නැවත ධනයාගේ වැඩීම කටයුතුයයි අදහස්වූයේය.

2. යම්හෙයකින්—තමා පහත්යයි සිතන කවරක්හුගේ නම් ප්‍රධානබව නොවීඩේද, තමා උසස්යයි සිතන සියලුජනයාම දිළිඳුවෙයි.

3. අනිකක්ද—යම් ජනයක්හට මහත් ධනය ඇත්තේද ඒ මනුෂ්‍යතෙමේ බ්‍රාහ්මණයන් මරන්නෙක්වූයේ නමුදු ලෝකයා විසින් සත්කාර කටයුත්තෙක්වේ, චන්ද්‍රයා හා සමාන පිරිසිදුවූවංශ යෙහි උපන්නෙක් නමුදු ධනහීනයෙක් නම් හෙලාදකිනු ලැබේ.

4. අනිකක්ද—උත්සාහනැත්තාවූ, මැළිවූ, පින් නැත්තාවූ, චිත්තවීර්‍ය රහිතවූ මහලු සමනා වැළඳගැණීමට තරුණ භාර්‍ය්‍යාව

---

1. වර්ධමානො මහාස්නෙහො මෘගෙන්ද්‍රවෘෂයොර්වනෙ,
පිශුනෙනාතිලුබ්ධෙන ජම්බුකෙන විනාශිතඃ.

2. යතඃ :—අධො 'ධඃ පශ්‍යතඃ කස්‍ය මහිමා නොපචීයතෙ,
උපර්‍ය්‍යුපරි පශ්‍යන්තඃ සර්වෙ එව දරිද්‍රති.

3. අපරඤ්ච :—බ්‍රහ්මහා 'පි නරඃ පූජ්‍යො යස්‍යාස්ති විපුලං ධනම්,
ශශිනස්තුල්‍යවංශො 'පි නිර්ධනඃ පරිභූයතෙ.

4. අන්‍යච්ච :—අව්‍යවසායිනමලසං දෛවපරං සාහසාච්ච පරිහීනම්,
ප්‍රමදෙව හි වෘද්ධපතිං නෙච්ඡත්‍යුපගූහිතුං ලක්ෂ්මීඃ.

නොකමැති වන්නාමෙන් ඓශ්වර්‍ය්‍යයට අධිග්‍රහිත දෙවීතොමෝ වැළඳගැන්මට නොකමැති වන්නීය.

1. තවද—උත්සාහ නැතිබවය, ස්ත්‍රීසම්භොගයෙහි ඇලීමය, බොහෝකාලයක් රොගසහිතවීමය, නොරට යාමෙහි නොකමැතිව ස්වකීය දෙශයෙහි ඇලීමය, හීනස්වභාවයෙහිද හිත ප්‍රසන්නවීමය, කටයුතු සම්පාදනය කිරීම් ආදියෙහි මහත් සැක යෙන් භය සුලුබවය යනමේ සය උසස්භාවයට බාධාකරන්නෝ වෙත්.

2. යම්හෙයකින්—යම් මනුෂ්‍යයෙක් ඉතාස්වල්ප ඓශ්වර්‍ය්‍ය යෙන්ද සැපතට පැමිණියෙමැයි සිතන්නේවේද, බ්‍රහ්මතෙමේ සම්පාදනය කරණලද තමාගේ කටයුතු නිෂ්ඨාවූයේයයි සිතාද, ඔහුගේ ඒ ස්වල්පධනය වැඩීමට නොයේ.

3. අනිකක්ද—උත්සාහරහිතවූ, සතුටුනූවූ, වීර්‍ය්‍යයෙන් තොරවූ සතුරන් සතුටුකරණ මෙබඳු පුත්‍රයකුහු කිසියම් ස්ත්‍රියක් තොමෝ නොවදුවා.

4. එසේද කියනලදී—නොලත් ධනය ලැබීමපිණිස කැමති වන්නේය, ලද ධනය නැසීමට නොහැර රක්නේය, රක්නාලද ධනය මනාකොට වර්ධනය කරන්නේය, වැඩුනු ධනයදීමට සුදුසු ස්ථානවිෂයෙහි යොදන්නේය.

වර්ධනයකරණු නොලබනා ධනය මඳමඳ වියදම ඇතිකල්හිද කල්ඉක්මීමෙන් ඇසගානා අඳුන්මෙන් කෙළවරවෙයි, අනුභව කරණු නොලබනා ධනයද ප්‍රයොජන නැත්තේමය.

5. එසේද කියනලදී—ඇසගානා අඳුන්ක්‍රමයෙන් කෙළවර වීමද, තුඹසවැඩීමද බලා, දීමය හැදෑරීමය යනක්‍රියාවලින්ද වස සිස්නොකරන්නේය.

---

1. කිඤ්ච, :—ආලස්‍යං ස්ත්‍රීසෙවා සරොගතා ජන්මභූමිවාත්සල්‍යම්,
සන්තොෂො භීරුත්වං ෂඩ් ව්‍යාඝාතා මහත්ත්වස්‍ය.

2. යතඃ :—සම්පදා සුස්ථිතම්මන්‍යො භවති ස්වල්පයාපි යඃ,
කෘතකෘත්‍යො විධිර්මන්‍යෙ න වර්ධයති තස්‍ය තාම්.

3. අපරඤ්ච :—නිරුත්සාහං නිරානන්දං නිර්වීර්‍ය්‍යමරිනන්දනම්,
මාස්ම සිමන්තිනී කාචිත් ජනයෙත් පුත්‍රමීදෘශම්.

4. තථාහ්‍යුක්තම් :—අලබ්ධං චෛව ලිප්සෙත ලබ්ධං රක්ෂෙදවෙක්ෂයා,
රක්ෂිතං වර්ධයෙත් සම්‍යක් වෘද්ධං තීර්ථෙෂු නික්ෂිපෙත්.

5. තථාහ්‍යුක්තම් :—අඤ්ජනස්‍ය ක්ෂයං දෘෂ්ට්වා වල්මීකස්‍ය ච සඤ්චයම්,
අබන්ධ්‍යං දිවසං කුර්‍ය්‍යාත් දානාධ්‍යයනකර්මභිඃ.

1. යම්හෙයකින්—දියබිඳු වැටීමෙන් කලය ක්‍රමයෙන් පිරෙන්
නේවෙයි, සියලු ශාස්ත්‍රයන්ටද ධර්මයටද ධනයටද එම කාර
ණයමය.

මෙසේ සිතා වර්ධමානතෙම සඤ්ජීවකය, නන්දකය යන ගව
යන් දෙදෙන ගැල්වියෙහි යොදා නොයෙක් වෙළඳම් බඩුවලින්
ගැල පුරවා වෙළඳාමෙහි යෙදී කාශ්මීර දෙශයට ගියේය.

2. යම්හෙයකින්—මහත් බලඇත්තවුන්ට ඉසිලිය නොහැකි
මහත් බරෙක් නම් කවරේද, වෙළඳාම් කිරීමෙන් ධනයාගේරැස්
කිරීම කැමැත්තවුන්ට දුරනම් කවරේද, ශාස්ත්‍රවන්තයන්ට
අන්‍ය දෙශයෙක්නම් කවරේද, මධුර වචන කියන්නවුන්ට සතු
රෙක් කොයින්ද.

ඉක්බිත්තෙන් දුර්ගමනම් මහ වනයෙහි යන්නාවූ ඔහුගේ
සඤ්ජීවකගවයා දනබිඳී වැටුණේය. මේ ගවයා දැක වර්ධමාන
තෙමේ මෙසේසිතී.

3. නීතියෙහි දක්ෂපුරුෂතෙම හාත්පසින් වෙළඳාම කරන්
නේමය. එසේවීනමුත් බ්‍රහ්මයාගේ සිත්හි යමක් පැවැත්තේද
වෙළඳාමෙහි ලාභයනම් එතෙක්මය.

4. තවද—සියලු කටයුතුවලට බාධාවූ විෂමය සියලු පරිද්
දෙන් දුරුකටයුතුවෙයි, එහෙයින් විෂමයහැරදමා කටයුතුසිද්ධ
කිරීම කරණු ලැබේ.”

මෙසේ සිතා සඤ්ජීවකයා ඒ වනයෙහි මුදාහැර වර්ධමාන
තෙමේ ගියේය. සඤ්ජීවකයාද දුකසේ කුර තුනෙහි බරකොට
ඇවිදිනේ ඒ වනයෙහිම සිටියේය.

5. යම්හෙයකින්—සමුද්‍රයෙහි ගිලුනාහුගේද, පර්වතයෙන්
වැටුනාහුගේද, සර්පයා විසින් දෂ්ටකරණ ලද්දහුගේද, ආයුෂය
තෙම මර්මස්ථානයන් රක්ෂාකෙරේ.

---

1. ජලබින්දුනිපාතෙන ක්‍රමශඃ පූර්‍යතෙ ඝටඃ,
සහෙතුඃසර්වවිද්‍යානාං ධර්මස්‍ය ච ධනස්‍යච.

2. යතඃ :—කො ‘තිභාරඃ සමර්ථානාං කිං දූරං ව්‍යවසායිනාම්,
කො විදෙශඃ සවිද්‍යානාං කඃ පරඃ ප්‍රියවාදිනාම්.

3. “කරොතු නාම නීතිඥො ව්‍යවසාය මිතස්තතඃ,
ඵලං පුනස්තදෙව ස්‍යාද් යද්විධෙ ර්මනසි ස්ථිතම්.

4. කිංතු :—විෂමඃ සර්වථා හෙයඃ ප්‍රත්‍යූහඃ සර්වකර්මණාම්,
තස්මා විෂමමුත්සෘජ්‍ය සාධ්‍යසිද්ධිර්විධීයතෙ.

5. යතඃ :—නිමග්නස්‍ය පයොරාශෞ පර්වතාත් පතිතස්‍ය ච,
තක්ෂකෙණාපි දෂ්ටස්‍ය ආයුර්මර්මාණි රක්ෂති.

1. අතිකත්ද—ඊදඬු සියගණනකින් විදිනලද්දේනමුදු සත්ව තෙමේ නියම කාලය නොපැමිණි කල්හි නොමියයි, මරණකාලයට පැමිණි තැනැත්තේ තණපත් අගකින්ම සපර්ශකරණලද්දේ ජීවත්නොවේ.

2. යම්හෙයකින්—සොරුන්ගෙන් රක්‍ෂානොකරණලද ධනය භාග්‍යය විසින් රක්නාලද්දේ නොනැසී පවතී, භාග්‍යය විසින් තොරකරණ ලද්දාවූ මනාකොට රක්නාලද ධනයද නැසෙයි, වනයෙහි හරණලද්දාවූ චණ්ඩ සත්වයන්ගෙන් රක්‍ෂානොකරණලද තැනැත්තේද ජීවත්වෙයි, නෑයන් විසින් උත්සාකරණලද තැනැත්තේද ගෙයතුළ නැසෙයි.

ඉක්බිත්තෙන් දවස් ඉක්මෙන කල්හි සඤ්ජීවකතෙම තමා කැමැත්තෙන් තෘණාදිය අනුභවකොට ඒ වනයෙහි ඇවිදිනේ චක්‍ෂුවලවත්නාවූ මාංසයෙන් වැඩුනේ මහත් ශබ්දපැවැත්තුයේය. ඒ වනයෙහි පිඞ්ගලකනම් සිංහයෙක් ස්වකීයබාහු බලයෙන් ලැබියයුතු රජසැපත විඳින්නේ සිටියේය.

3. මෙසේ කියනලදී—මෘගයන් විසින් සිංහයාහට අභිෂෙක ජලයවත්කිරීමක්ද පිරිසිදු භාවයක්ද නොකරණු ලැබේ, තමාගේ භුජබලයෙන් ලැබියයුතු රාජ්‍යය සම්බන්ධව තමාම මෘගෙන්ද්‍රභාවය භජනය කෙරෙයි.

ඒ සිංහ තෙමේද එක්දිනක් පිපාසයෙන් කැලඹුනේ පැන් බීමපිණිස යමුනා නදියගේ ඉව්රට ගියේය. එතැන්හිද ඒ සිංහයා විසින් පෙරනොඇසූ විරූ ලොකවිනාශක මෙඝ ගජිනාව වැනිවූ සඤ්ජීවකයාගේ ශබ්දයඇසී. ඒ අසාමේ සිංහතෙම පැන් නොබී චක්‍ෂුවලව ආපසුහැරී තමාගේ ස්ථානයට අවුත් බැණ නොනැගී මේ කිමෙක්දැයි බලාසිටියේය. එසේ සිටියාවූ ඒ සිංහ තෙමේද ඔහුගේ අමාත්‍ය පුත්‍රවූ කරටක දමනක යන නම් ඇති සිවලුන් දෙදෙනාවිසින් දක්නාලද්දේය. එබඳුවූ ඔහුදැක දමනකතෙමේ කරටකයාට සබඳ කරටකය! "පැන්බොනු කැමතිවූ

---

1. අපරඤ්ච :—නාකාලෙ ම්‍රියතෙ ජන්තුර්විද්ධඃ ශරශතෛරපි,
කුශාග්‍රෙණෛව සංස්පෘෂ්ටඃ ප්‍රාප්තකාලො න ජීවති.

2. යතඃ :—අරක්‍ෂිතං තිෂ්ඨති දෛවරක්‍ෂිතං සුරක්‍ෂිතං දෛවහතං විනශ්‍යති,
ජීවත්‍යනාථො 'පි වනෙ විසර්ජිතඃ කෘතප්‍රයත්නො 'පි ගෘහෙ න ජීවති.

3. යථොක්තම්—නාභිෂෙකො න සංස්කාරඃ සිංහස්‍ය ක්‍රියතෙ මෘගෛඃ,
වික්‍රමාර්ජිතරාජ්‍යස්‍ය ස්වයමෙව මෘගෙන්ද්‍රතා.

මේ ස්වාමීතෙම පැන්නොබී සෙමින් සෙමින් තුමක් නිසා ඉවත්ව සිටිනේද" යි අසයි. ඒ අසා කරටක තෙම මිත්‍ර දමනකය! "අප ගේ අදහස් පරිද්දෙන් මේ සිංහයාගේ සෙවනයම නොකරණු ලැබේ. යම් කාරණයෙකින් අපරාධයක් නොකරණ ලද්දාවූ මේ රජහු විසින් ගහීකරණලද අප විසින් බොහෝ කාලයක් මුලුල්ලේ දුක් විඳිනලදද එහෙයින් මොහුගේ කථා නොකිරීම මුල්වූ ක්‍රියාව පරීක්‍ෂාකිරීමෙන් කවර ප්‍රයොජනද?

1. ස්වාමීන් ආශ්‍රයකිරීමෙන් ධනලාභය කැමතිවූ සෙවකයන් විසින් යමක් කරණ ලදද ඒ ක්‍රියාව බලව, අඥාන සෙවකයන් විසින් ශරීරයාගේ යම් තමා අයතිබවක් ඇද්ද ඒ අයතිබවද නසනලදී.

2. අනිකක්ද—අනුන් අයතිව පවත්නා යම් ජනයෝ ඇද්ද ඔව්හු ශීතය, සුලගය, අව්වය යන මේ දුක් ඉවසන්නාහුය, නුවණැති පුරුෂතෙම ඒ දුකින් අඩියකිහුදුයුක්තව තපස්රැක සැප යෙන් යුක්තවන්නේය.

3. අනිකක්ද—යම්හෙයකින් තමා අයති පැවැත්මක් ඇද්ද මෙපමණක්ම ඉපදීමෙහි ඵලයයි, යම්කෙනෙක් අනුන් අයති බවට පැමිණියෝද ඒ ජනයෝ ඉඳින් ජීවත්වෙත්නම් මළාහු කවරහුද?

4. අනිකක්ද—ධනවන්තයෝ ධන ආශාවයයි කියනලද අභාග්‍යය විසින් මඩනාලද යාචකයන් කරණකොටගෙණ එව, යව, වැටෙව, නැගිසිටුව, කථාකරව, බැණනොනැගී ඉඳුවයි මෙසේක්‍රීඩාකෙරෙත්.

---

1. සෙවයා ධනමිච්ඡද්භිඃ සෙවකෛඃ පශ්‍ය යත් කෘතම්,
ස්වාතන්ත්‍ර්‍යං යච්ඡරීරස්‍ය මූඪෛස්තදපි හාරිතම්.

2. අපරඤ්ච :—ශීතවාතාතපක්ලෙශාන් සහන්තෙ යෙ පරාශ්‍රිතාඃ,
තදංශෙනාපි මෙධාවී තපස්තප්ත්වා සුඛී භවෙත්.

3. අන්‍යච්ච :—එතාවජ්ජන්මසාඵල්‍යං යදනායත්තවෘත්තිතා,
යෙ පරාධීනතාං යාතාස්තෙ වෛ ජීවන්ති කෙ මෘතාඃ.

4. අපරඤ්ච ;—එහි ගච්ඡ පතොත්තිෂ්ඨ වද මෞනං සමාචර,
එවමාශාග්‍රහග්‍රස්තෛඃ ක්‍රීඩන්ති ධනිනො ’ර්ථිභිඃ.

1. තවද—අඥානයන් විසින් ධනලාභය පිණිස වේශීන් විසින් මෙන් තමාම ශරීරය සරස සරසා අනුන්ට උපකාර පිණිස එළ වන ලද්දේය.

2. අනිකෙක්ද—යමක් තොමෝ ස්වභාවයෙන්ම චඤ්චලවූ බැලීමෙන් යුක්තද අපවිත්‍ර වස්තුවෙහි පවා වැටෙන්නීද ඈටම ස්වාමීහුගේ බැලීම සේවක පුරුෂයෝ කරුණාසහිත බැලීමයයි සිතත්.

3. විශේෂයෙන්ද—උසස්වෙමැයි සිතා නමස්කාර කෙරේ, ජීවිකාව කිරීමපිණිස ප්‍රාණයන් පරිත්‍යාග කෙරේ, සැපවිඳීම පිණිස දුක්උසුලයි, මෙසේසිටිකල්හි සේවකයා හැර අන් අඥාන යෙක් නම් කවරෙක්ද?

4. අනිකෙක්ද—අඩුවූ කථාව හේතුකොටගෙණ අඥානයෙක් වේ, මනොහර කථාවෙහි ඉදින් දක්ෂද එකල්හි උන්මත්තක යෙක් නොහොත් වාචාලයෙක්වෙයි, ඉදින් ඉවසීමෙන් යුක්තද එකල්හි භයසුළු එකෙක්වෙයි, ඉදින් නොයිවසන්නෙක් වේද එකල්හි , බොහෝසෙයින් නොහික්මුනු එකෙක්වෙයි, ඉදින් නිරන්තරයෙන් පාර්ශ්වයෙහි වසන්නෙක්වේද එකල්හි උඩඟුවූ වෙක්වෙයි, ඉදින් දුරුව සිටින්නෙක්වේද එකල්හි අහංකාර යුක්තයෙක් වෙයි, සේවකබව ඊශ්වර සේවකයන් විසින් පවා දැන ගත නොහෙන අතිශයින් දුෂ්කරවූ පැවැත්මෙක් වෙයි" කියයි.

දමනකතෙම මිත්‍රය! මේ ස්වාමියක්හට සේවය කිරීමෙහි මැලිබව සර්වප්‍රකාරයෙන් සිහිනුදු නොකටයුතු වෙයි.

---

1. කිඤ්ච :—අබුධෛරර්ථලාභාය පණ්‍යස්ත්‍රීභිරිව ස්වයම්,
ආත්මා සංස්කෘත්‍ය සංස්කෘත්‍ය පරෝපකරණීකෘතඃ.

2. අන්‍යච්ච :—යා ප්‍රකෘත්‍යෛව චපලා නිපතත්‍යශුචාවපි,
ස්වාමිනො බහු මන්‍යන්තෙ දෘෂ්ටිං තාමපි සේවකාඃ.

3. විශේෂතශ්ච :—ප්‍රණමත්‍යුන්නතිහෙතොර්ජීවිතහෙතොර්විමුඤ්චති ප්‍රාණාන්,
දුඃඛීයති සුඛහෙතොඃ කො මූඪඃ සේවකාදන්‍යඃ.

4. අපරඤ්ච :—මෞනාන්මූකඃ ප්‍රවචනපටුර්වාතුලො ජල්පකො වා
ක්ෂාන්ත්‍යා භීරුර්යදි න සහතෙ ප්‍රායශෝ නාභිජාතඃ,
ධෘෂ්ටඃ පාර්ශ්වේ වසති නියතං දූරතශ්ච ප්‍රගල්භඃ
සේවාධර්මඃ පරමගහනො යොගිනාමප්‍යගම්‍යඃ ".

1. යම්කෙනෙක් සතුටුවූවාහූ ස්වල්ප කාලයකින් අභිමතාර්ථයන් සම්පූර්ණ කෙරෙද්ද, ඒ ස්වාමීහු උත්සාහයෙන් කෙසේනම් ආශ්‍රයකරණු නොලබන්නාහූද?

2. අනිකෙක්ද—රජුන්ගේ සෙවනයෙන් තොරවූවන්ට චාමරය යන රජ ලකුණෙන් ප්‍රකාශවන්නාවූ සම්පත් කොයින්ද? දණ්ඩහි නගණලද සුදු කුඩද අසුන්හා ඇතුන්ගෙන් යුක්තවූ සෙනාවද කෙසේ ලැබේදැයි කීය.

කරටකතෙමේ එසේවීනමුදු මේ අනුන් අයිති ක්‍රියාව පරීක්‍ෂා කිරීමෙන් අපට ප්‍රයෝජන කවරේද? අනුන් අයිති ක්‍රියාවන් කෙරෙහි පරීක්‍ෂාකිරීම සියලුලෙසින් දුරුකට යුතුවෙයි.

3. බලව—යම් මනුෂ්‍යයෙක් අනුන් සන්තක ක්‍රියාවන්හි ක්‍රියා පැවැත්මට කැමතිවේද ඒ මනුෂ්‍යතෙම උල ඉගිල්වූ වානරයාමෙන් බිමවැටුනේමියයි. කියයි.

දමනකතෙම ඒ කෙසේද?"යි ඇසීය, කරටකයා කියයි.

"මගධදෙශයෙහි ධර්මාරණ්‍යයට සමීපවූ ස්ථානයෙක්හි ශුභදත්තනම් ජනයාගේ සමාගම විසින් ක්‍රීඩාශාලාවක් කරවීමට පටන්ගන්නා ලද්දේ ඇත්තේය. ඒ ස්ථානයෙහි කියතකින් ඉරණලද දණ්ඩෙහි මැදක් දුර ඉරා වෙන්කරණලද ලීපලුදෙක මැද වඩුවා විසින් උලක් ගසන ලද්දේය. එහිද වනයෙහි වසන මහත් වඳුරුරැලක් ක්‍රීඩාකිරීම පිණිස ආයේය. ඔවුන් අතුරෙන් එක්වඳුරෙක් තමන් නියමයෙන් මෙහෙයන ලද්දක් හූමෙන් ඒ උල අත්දෙකින් අල්වාගෙණ උන්නේය. එකල්හි එල්වෙන ඔහුගේ අණ්ඩදෙක ලීපලුදෙක මැදටවන්නේය. ඉන්පසු ස්වභාවයෙන් පවත්නා චඤ්චලභාවය කාරණකොට ගෙණ මහත් උත්සාහයෙන් වඳුරා උල ඇද්දේය. ඇද්දකල්හි ලීපලුදෙකින් සුණුකරණලද අණ්ඩදෙකින් යුක්තව වඳුරා මරණයට පැමිණියේය. තමන් පිළිබඳනුවූ ක්‍රියාවිෂයෙහි පැවැත්ම, යන මේ ආදිය එහෙයින් මමකියමි" කීය. දමනක තෙම එසේ වීනමුදු ස්වාමීහුගේ ක්‍රියාව පරීක්‍ෂා කිරීම සෙවකයන් විසින් කට

---

1. කථං නාම න සෙව්‍යන්තෙ යත්නතඃ පරමෙශ්වරාඃ?,
අචිරෙණෛව යෙ තුෂ්ටාඃ පූරයන්ති මනොරථාන්.

2. අන්‍යච්ච :—කුතඃ සෙවාවිහීනානාං චාමරොද්ධූතසම්පදඃ,
උද්දණ්ඩධවලච්ඡත්‍රවාජිවාරණවාහිනී.

3. පශ්‍ය :—අව්‍යාපාරෙෂු ව්‍යාපාරං යො නරඃ කර්තුමිච්ඡති,
සභූමෞ නිහතඃ ශෙතෙ කීලොත්පාටීව වානරඃ.

යුතුයයි කීයයි. ඒ අසා කරටකතෙම "යමෙක් සියලු කටයුතු පරීක්‍ෂාවෙහි යෙදුනේද ප්‍රධාන අමාත්‍යවූයේද හෙතෙම පරීක්‍ෂා කෙරේවා. යම් කාරණයෙකින් සෙවකයා විසින් අනුන්ගේ කට යුතු පරීක්‍ෂාකිරීම නොකට යුතුවන්නේද එහෙයින්,

1. බලව—යමෙක්තෙමේ ස්වාමියා හට වැඩ සිදුකිරීම පිණිස කැමැත්තෙන් අනුන් විසින් කළයුතු ක්‍රියාව සොයන්නේද ඒ තැනැත්තේ රෞද්‍රවූ ශබ්දකිරීම හෙතුකොටගෙණ තළනලද කොටලුවාමෙන් කලකිරීමට පැමිණෙයි" කියයි.

ඒ අසා දමනකතෙම ඒ කෙසේදැයි? විචාරයි, කරටකතෙමේ කියයි.

"බරණැස්නුවර කර්පූරපටනම් රදවෙක් ඇත. ඒ තෙමේද එක්දිනක් තරුණවූ අඹුවහා සමග දැඩිකොට වැළඳගෙණ සැත පූනේය. ඉන්පසු ගෙයිබඩු පැහැරගැණීම පිණිස ඔහුගේ ගෙට සොරෙක් ඇතුල්වූයේය. ඒ ග්‍රහයේ මිදුලෙහි කොටලු වෙක් බඳනාලද්දේ සිටී. බල්ලෙක්ද එහි උන්නේය. ඒ සොරු දැක කොටලුතෙමේ බල්ලාට "මේ ක්‍රියාව පින්වතාට අයිතිය එහෙයින් තුමාත්නිසා නිශශබ්දවූයෙහිද, තෝ උස්වූ ශබ්දකොට ස්වාමියා පුබුදු නොකරවන්නෙහිදැ"? යි කියයි. ඊට බලුතෙමේ "මා විසින් කටයුතු ක්‍රියාවෙහි පරීක්‍ෂාව තා විසින් නොකටයුතු වන්නිය. මම යම් පරිද්දෙකින් මේ රදවාගේ ගෙය රක්‍ෂා කෙරෙම්ද ඒ කාරණය තෝම දන්නෙහිය. යම් හෙයකින් මේ තෙම බොහෝ කාලයකින් චොරාදීන්ගේ උපද්‍රව රහිතවූයේ මාගේ ආහාර නොතකාද, ඒ කාරණයෙන් මටආහාර දීමෙහිද ආදරනැත්තේය. විපතක් නොදක්නාවූ ස්වාමීහු සෙවක යන් කෙරෙහි ආදරනැත්තාහු වෙති" යි කියයි. කොටලුතෙම එම්බල අඥනය! අසව.

"යම් ජනයෙක් කටයුත්තක් පැමිණිකල ස්වාමියාගෙන් ධනාදිය ඉල්වාද හෙතෙම නින්දකටයුතු සෙවකයෙක්වෙයි, හෙතෙම නින්දක්ටයුතු නෑයෙක්වෙයි" කියයි.

2. බල්ලාද—කටයුත්තක් පැමිණිකල යමෙක් සෙවකයන්ට ධනදනාදියෙන් ආදර නොකරේද ඒ තෙම නින්දකටයුතු ස්වාමි යෙක්වෙයි.

---

1. පශ්‍ය :—පරාධිකාරචර්චාං යඃ කුර්‍ය්‍යාත් ස්වාමිහිතෙච්ඡයා,
ස විෂීදති චීත්කාරාත් තාඩිතො ගර්දභො යථා."

2. කුක්කුරොබ්‍රැතෙ:—යාචතෙ කාර්‍ය්‍යකාලෙ යඃ ස කිං භෘත්‍යඃ ස කිං සුහෘත්,
යො න සම්භාවයෙද් භෘත්‍යාන් කාර්‍ය්‍යකාලෙ ස කිං ප්‍රභුඃ.

1. තවද—සෙවකයන්ගේ පොෂ්‍යය කිරීමෙහිද, ස්වාමිසෙවක දෙපක්‍ෂයෙහිවූ මන්ත්‍රියා පැවැත්මෙහිද, පුත්‍රයාගේ ඉපදීමෙහිද, වළක්වන්නෝ නොවෙත්ය" යි කියයි.

නැවත කොටලුතෙම කොපසහිතව "විස්මයෙක නෝ පව්වූ ක්‍රියාවෙහි ඇළුනු එකෙක්වෙයි, එහෙයින් ස්වාමීහුගේ කටයුතු පමාකරන්නෙහිය. වන්නාට. ස්වාමියා නොනිදා ඉන්දදී යම් පරිද්දෙකින් කටයුතුද එසේම මාවිසින් කටයුතුවෙයි.

2. යම්හෙයකින්—සූය්‍ය රශ්මිය පිටපැත්තෙන් සෙවනය කරන්නේය ගින්න කුක්ෂිපාශ්වීයෙන් සෙවනය කරන්නේය, ස්වාමියා සියලු අවස්ථාවෙහි සෙවනය කරන්නේය, පරලොවට අයිතිවූ සුචරිතය කපටිනොවීමෙන් සෙවනය කරන්නේය" යි කියයි.

මෙසේ කියා ඒ කොටලුතෙමේ අතිශයින් උස්වූ ශබ්ද කෙළේය. ඉක්බිත්තෙන් ඒ රදවා ඒ ශබ්දයෙන් පිබිදුනේ නින්ද වැළැක්විමනිසා කොපයෙන් නැගිට කොටලුවාට පොල්ලකින් තැළුයේය. ඒ තැළීමෙන් කොටලුවා මළේය. "එහෙයින් තමාට අයිතිනොවන ක්‍රියාව පරීක්ෂාකිරීම යන මේ ආදිය මම කියමි. බලව පසුවගීයාගේ සෙවීම අපගේ නියොගයවෙයි. එහෙයින් ස්වකීය නියොගයාගේම පරීක්ෂාව කටයුතුවන්නිය." පරීක්ෂා කරව. "එසේද අද දවස්හි ඒ පරීක්ෂාවෙන්ද ප්‍රයොජන නොවෙයි, යම්හෙයකින් අප දෙදෙනාගේ කෑමෙන් ඉතිරිවූ බොහෝ ආහාර ඇත්තේද එහෙයිනි." දමනකතෙමේ කොප සහිතව "ආහාරයපමණක් කැමැත්තාවූ පින්වත්තෙමේ කෙසේ නම් රජ්ජුරුවන් ආශ්‍රයකෙරේද? මේතෙම සෙවකයාහට නොතරම්ය" යි කියයි.

3. යම්හෙයකින්—මිත්‍රයන්ට උපකාරකිරීම සඳහාද, පසමිතුරන්ට අනුප කාරකිරීමසඳහාද නුවණැත්තන් විසින් රජුන්ගේ ආශ්‍රය කැමතිවනුලැබේ, කවරනම් ජනයෙක් තමාගේ එකම කුක්ෂිය පමණක් පොෂ්‍යය නොකෙරේද?.

---

1. කියනුව :—ආශ්‍රිතානාං භෘතෞ ස්වාමි සෙවායාං ධම්සෙවනෙ, පුත්‍රස්‍යොත්පාදනෙ චෛව න සන්ති ප්‍රතිහස්තකාඃ.

2. යතඃ :—පෘෂ්ඨතඃ සෙවයෙදකීං ජඨරෙණ හුතාශනම්, ස්වාමිනං සව්භාවෙන පරලොකමමායයා.

3. යතඃ :—සුහෘදමුපකාරකාරණාත් ද්විෂතාමප්‍යපකාරකාරණාත්, නෘපසංශ්‍රය ඉෂ්‍යතෙ බුධෛර්ජඨරං කො න බිභර්ති කෙවලම්.

1. යමක්හුගේ ජීවත්වීම ඇතිකල බමුණෝද, මිත්‍රයෝද, නෑයෝද, යනමොව්හු ජීවත්වෙද්ද ඔහුගේ ජීවිතය ඵලසහිත වෙයි, තමා සඳහා කවරෙක්නම් ජීවත්නොවේද?.

2. නැවතද—යමක්හු ආශ්‍රයකොට බොහෝ ජනයා ජීවත් වෙද්ද හෙතෙමවූකලි ජීවත්වේවා, කවුඩෙක්පවා කෙසේනම් තුඩින් තමාගේ කුසපිරවීම නොකෙරේද?.

3. බලව—ඇතම් මනුෂ්‍යයෙක් පුරාණ නම් මුදල්පසකින් දාස බවට පැමිණේ, කිසිවෙක් ලක්ෂගණනකින්ද දාස බව කරණ ලද්දේය, සමහරෙක් ලක්ෂගණනින්ද, දාසබව නොකරණලදී.

4. යම්හෙයකින්—මනුෂ්‍යජාතියෙහි සමානබව ඇතිකල්හිද දාස භාවය අතිශයින් නින්දිතවෙයි, ඒ දාසයන් අතුරෙහිද යම් දාස යෙක් සෙස්සවුන්ට ප්‍රධානනොවේද හෙතෙමේද ජීවත්වන්න වුන් අතුරෙහි ගණන්කරණු ලැබේද?

5. එසේද් කියනලදී—අශ්වය, හස්තිය, ලොහය යන මොවුන් ගේද, දඬුය, ගල්ය, වස්ත්‍රය යන මොවුන්ගේද, ස්ත්‍රීය, පුරුෂය, ජලය යන මොවුන්ගේද ඔවුනොවුන් හා වෙනස මහත් වෙයි.

6. ඒ එසේමැයි—බල්ලෙක් මඳවූ නහර හා තෙලින් ඉතිරිව කිලිටිවූ මාංස නැත්තාවූද ඇටයක් රසවිඳ සන්තොෂයට පැමි ණෙයි, ඒ ඇටය බල්ලාගේ කුසගිනි නිවීමපිණිස නොවේ, සිංහ

---

1. ජීවිතෙ යස්‍ය ජීවන්ති විප්‍රා මිත්‍රාණි බාන්ධවාඃ,
සඵලං ජීවිතං තස්‍ය ආත්මාර්ථෙ කො න ජීවති?.

2. අපිච :—යස්මින් ජීවති ජීවන්ති බහවඃ ස තු ජීවතු,
කාකො ‘පි කිං න කුරුතෙ චඤ්චවා ස්වොදරපූරණම්.

3. පශ්‍ය :—පඤ්චභිර්‍යාති දාසත්වං පුරාණෛඃ කො ‘පි මානවඃ,
කො ‘පි ලක්ෂෛඃ කෘතඃ කො ‘පි ලක්ෂෛරපි න ලභ්‍යතෙ.

4. යතඃ :—මනුෂ්‍යජාතෞ තුල්‍යායාං භෘත්‍යත්වමතිගර්හිතම්,
ප්‍රථමො යො න තත්‍රාපි සො ‘පි ජීවත්සු ගණ්‍යතෙ.

5. තථාචොක්තම් :—වාජිවාරණලොහානාං කාෂ්ඨපාෂාණවාසසාම්,
නාරීපුරුෂතොයානාමන්තරං මහදන්තරම්.

6. තථාහි :—අල්පස්නායුවසාවශෙෂමලිනං නිර්මාංසමප්‍යස්ථිකං
ශ්වා ලබ්ධ්වා පරිතොෂමෙති න ච තත්තස්‍ය ක්ෂුධාශාන්තයෙ,
සිංහො ජම්බුකමඞ්කමාගතමපි ත්‍යක්ත්වා නිහන්ති ද්විපං
සර්වඃ කෘච්ඡ්‍රගතො ‘පි වාඤ්ඡති ජනඃ සත්ත්වානුරූපං ඵලම්.

යෙක් තමා සමීපයට පැමිණියාවූද සිවලා ඉවත්කොට හස්ති යක්හු මරයි, සියලු ජනතෙමේ දුක් අනුභව කරන්නේද ස්වයාට යෝග්‍යවූ ඵලය ප්‍රාර්ථනාකෙරේ.

අනිකෙක්ද—සෙවනය කටයුත්තාගේ හා සෙවකයාද යන මේ දෙදෙනාගේ වෙනස බලව.

1. බල්ලෙක් නගුට සෙලවීමය පාමුලවැටීමය භූමියෙහිවැද හෙව මුඛයහා කුක්ෂිය දැක්වීමය යන මේ ස්වභාව ආහාරදුන්න ඉදිරියෙහි කෙරේ, හස්තිරාජයෙක්වූකලි ආහාරදුන් තැනැත්තා ගැඹුරුව බලයි. අනෙක ප්‍රියවචනවලින් යුක්තව අනුභව කටයුතුදෙය අනුභවකෙරේ.

2. තවද—දර්ශන ශාස්ත්‍රයාගේ දැනීමය, තේජසය, කීර්තිය යන මෙයින් තොරනුවූ ප්‍රසිද්ධවූ යම් ජීවත්වීමෙක් ඇද්ද ඒ ජීවත්වීම ඇසිල්ලකුදු මිනිසුන් විසින් කරණුලැබේද ඒ තෙම මේ ලොකයෙහි ජීවිතයයි පණ්ඩිතයෝ කියත්, කවුඩෙක්ද ජීවත් වෙයි, ජීවත්වනතුරු ආහාරද අනුභව කෙරේ.

3. අනිකෙක්ද—වැඩ අවැඩ දෙක පරීක්ෂාකරණ නුවණ නැත්තාවූ අනෙකවිධ ශාස්ත්‍රයන් විසින් තොරකරණ ලද්දාවූ හුදකලාව කුස පිරීමපමණක් කැමැත්තාවූ මනුෂ්‍ය සිව්පාවාගේද සිව්පාවාගේද වෙනස කවරේද?"සි කියයි.

කරටක තෙමේ "අප දෙදෙනා වනාහි අප්‍රධානවම්හ. එ හෙයින් අපගේ මේ පරීක්ෂාකිරීමෙන් ප්‍රයොජන කවරේද?" සි කියයි. නැවත දමනක තෙම "යම් පමණ කල් ස්වාමියා සෙවනයකිරීමෙන් අමාත්‍යතෙම ප්‍රධානභාවය හෝ අප්‍රධානභාවය ලබන්නේද?

---

1. ලාඞ්ගූලචාලනමධශ්චරණාවපාතං
භූමෞ නිපත්‍ය වදනොදර දර්ශනං ච,
ශ්වා පිණ්ඩදස්‍ය කුරුතෙ ගජපුඞ්ගවස්තු
ධීරං විලොකයති චාටුශතෛශ්ච භුඞ්ක්තෙ.

2. කිඤ්ච :—යජ්ජීව්‍යතෙ ක්ෂණමපි ප්‍රථිතං මනුෂ්‍යෛ
විඥානවික්‍රමයශොභිරභජ්‍යමානම්,
තන්නාම ජීවිතමිහ ප්‍රවදන්ති තජ්ඥාඃ
කාකො'පි ජීවති චිරය බලිං ච භුඞ්ක්තෙ.

3. අපරඤ්ච:—අහිතහිතවිචාරශූන්‍ය බුද්ධෙඃ
ශ්‍රුතිසමයෛර්බහුභිර්බහිෂ්කෘතස්‍ය.
උදරභරණමාත්‍රකෙවලෙච්ඡොඃ
පුරුෂපශොශ්ච පශොශ්ච කො විශෙෂඃ,?

1. යම්හෙයකින්—මේ ලොකයෙහි කිසි සත්වයෙක් කිසිවක් හට ස්වභාවයෙන්ම මහත් ප්‍රිය හෝ නොහොත් ක්‍රෑරවූයේද නොවේ, ලොකයෙහි තමාගේ ක්‍රියාවෙන්ම ශ්‍රෙෂ්ඨබවටහෝ හීන බවට මනුෂ්‍යයා පමුණුවත්.

2. තවද—යම්සේ පර්වත මස්තකයකට ගලක් මහත් උත්සාහ යෙන් නගනුලැබේද, යටහාගය කරා ඇසිල්ලකින්ම හෙලනු ලැබේද, එසේම තමාගුණදොෂ දෙක කෙරේ නගනුලැබීමද හෙලනුලැබීමද වෙයි. .

3. එහෙයින් පින්වත! සියලු ලොකයාගේ උසස්බව හා හීන බව තමතමන්ගේ ස්වකීය ක්‍රියාවට අනුරූපව පවතී. මනුෂ්‍ය යෙක් තමාවිසින්ම කරණලද අධර්මක්‍රියාවන් කාරණකොටගෙණ ක්‍රම ක්‍රමයෙන් පහත් පහත්බවට පැමිණෙයි. එසේම මනා ක්‍රියාවන් කරණකොටගෙණ ක්‍රමයෙන් උසස්බවටද පැමිණේ. ඒ කෙසේද, ළිඳක් සාරන්නෙක්ද ප්‍රාකාරයක් කරන්නෙක්ද මෙනැයි කියයි.

කරටක තෙමේ "පින්වතා කුමක් කියයිද" යි? කියයි. දමනක තෙමේ "ස්වාමිවූ මේ පිඞ්ගලකයා වනාහි පැන් නොබී කිසි සත්වයක්හට හයින් හැරීඅවුත් භය සහිතව උන්නේය" යි කියයි. කරටක තෙම "ඒ කාරණයද තෝ කෙසේ දන්නෙහි ද" යි? කියයි. දමනක තෙම "නුවණැත්තවුන් විසින් අවබොධ නොකරණලද කුමක්නම් ඇත්තේද?

4. කියනලද්දේද වෙයි—මනාකොට කියනලද වචනයාගේ අර්ථය අඥනයා විසින්ද දන්නා ලැබේ, අශ්වයෝද ඇත්තුද වක්‍රවල කරණලද්දාහු බරගෙණ යෙත්, පණ්ඩිත ජනතෙමේ

---

1. යතඃ:—— නකස්‍යචිත් කශ්චිදිහ ස්වභාවා
ද්භවත්‍යුදාරො 'භිමතඃ ඛලො වා,
ලොකෙ ගුරුත්වං විපරීතතාං වා
ස්වචෙෂ්ටිතාන්‍යෙව නරං නයන්ති.

2. කිඤ්ච:—ආරොප්‍යතෙ ශිලා ශෛලෙ යත්නෙන මහතා යථා,
නිපාත්‍යතෙ ක්ෂණෙනාධස්තථාත්මා ගුණදොෂයොඃ,

3. යාත්‍යධො'ධො ව්‍රජත්‍යුච්චෛර්නරඃ ස්වෛරෙව කර්ම්මභිඃ,
කූපස්‍ය ඛනිතා යද්වත් ප්‍රාකාරස්‍යෙව කාරකඃ.

4. උක්තඤ්ච:—උදීරිතො'ර්ථඃ පශුනා'පි ගෘහ්‍යතෙ
හයාශ්ච නාගාශ්ච වහන්ති දෙශිතාඃ,
අනුක්තමප්‍යූහති පණ්ඩිතො ජනඃ
පරෙඞ්ගිතඥානඵලා හි බුද්ධයඃ.

නොකියනලද අදහස සැලකීමෙන් අවබොධ කෙරේ, ඒ එසේ මැයි, ප්‍රඥාවෝ අනුන්ගේ සිතෙහිවූ අදහස දැනිමයයි කියනලද ප්‍රයොජනයෙන් යුක්ත[illegible]න්.

1. නැවතද—මුඛයෙහි වර්ණාදී ආකාරවලින්ද, ඉඟිවලින්ද, ගමනින්ද, ක්‍රියාවෙන්ද, කථාවෙන්ද, . නෙත්‍ර විකාරයෙන් හා මුඛ විකාරයෙන්ද අනුන්ගේ සිත්හිපැවති අදහස දන්නාලැබේ.

එහෙයින් මෙතැන්හි එළඹසිටියාවූ භයවීමට යොග්‍ය කාරණය ඇතිකල්හි මම මේ කාරණය ප්‍රඥාබලයෙන් අවබොධ කරන්නෙමි.

2. යම් හෙයකින්—එළඹසිටි කාරණයට අනුරූපවූ කථාවද, ස්නෙහයට අඩුවැඩි නුවූ ප්‍රියභාවයද, තමාගේ ශක්තිය හා සමවූ කිපීමද යමෙක් දන්නේනම් හෙතෙම පණ්ඩිත වෙයි.

කියයි, කරටක තෙමේ මිත්‍රය! තෝ ස්වාමීන්ගේ ආශ්‍රය කිරීම නොදන්නෙහිය.

3. බලව—යමෙක් වනාහි නොකැඳවනලද්දේ රාජසභාවට වදීද, එසේම නොවිචාරණ ලද්දේ ප්‍රයොජන රහිතවූ යම් [illegible]ම් කථාවක් කෙරේද, එසේම තමාවිසින් රජතෙමේ සතුටුකරණලද්දේයයි සිතාද ඒ තැනැත්තේ එකාන්තයෙන් අඥානවෙයි කියයි.

දමනක තෙම පින්වත! මම ආශ්‍රය කිරීම නොදන්නේ කෙසේද?

4. බලව[illegible]ස්වභාවයෙන්ම සිත්කළුවූ හෝ ප්‍රියනොකරන්නාවූද කිසියම් වස්තුවෙක් ඇත්තේද, යමක්හට අමනොඥවූ හෝ යම් වස්තුවක් රුචිද ඕහට ඒ වස්තුව සිත්කළුවෙයි.

---

1. අපිච:—ආකාරෛරිඞ්ගිතෛර්ගත්‍යා චෙෂ්ටයා භාෂණෙන ච,
නෙත්‍රවක්ත්‍රවිකාරෙණ ලක්‍ෂ්‍යතෙ'න්තර්ගතං මනඃ.

2. යතඃ;—ප්‍රස්තාවසදෘශං වාක්‍යං සද්භාවසදෘශං ප්‍රියම්,
ආත්මශක්තිසමං කොපං යො ජානාති ස පණ්ඩිතඃ

3. පශ්‍ය:— අනාහූතො විශෙද් යස්තු අපෘෂ්ටො බහු භාෂතෙ, .
ආත්මනා මන්‍යතෙ ප්‍රීතො භූපාලො වෛ ස දුර්මතිඃ.

4. පශ්‍ය :—කිමප්‍යස්ති ස්වභාවෙන සුන්දරං වාප්‍යසුන්දරම්,
යදෙව රොචතෙ යස්මෛ භවෙත් තත්තස්‍ය සුන්දරම්.

1. අනිකක්ද—යම් යම් ජනයක්හුගේ යම් බඳුවූ අදහසෙක් වේද ඒ ඒ අභිප්‍රායෙන් වනාහි ඒ මනුෂ්‍යයාගේ සිත්ගෙණ නුවණැති තැනැත්තේ වහා තමාගේ [illegible]ගයට පමුණුවන්නේය.

2. අනිකක්ද—මේ ස්ථානයෙහි කවරෙක් සිටිනේදැයි විචාරණලද තැනැත්තේ මම මෙහි සිටිමියි මනාකොට ආඥකළ මැනවැයිද කියන්නේනම් සෙවකයෙක්වෙයි, රජහුගේ ආඥව තමාබලවූ නියායෙන් සිස්නොකරන්නේය යන මේ තෙම සෙවකයාගේ පැවැත්මවේ.

3. තවද—යමෙක් ලොභනැත්තේද, ධෛර්‍ය්‍යයෙන්යුක්තද, නුවණැත්තේද, ඡායාව මෙන් හැමකල්හි පසුපස්සෙහි සිටීද, ආඥකරණලද යමක් පරීක්‍ෂානොකොටම සම්පාදනය කිරීමෙහි ඇලුනේද, ඒ පුරුෂ තෙම රාජභවනයෙහි වසන්නේයයි කියයි.

කරටකතෙමේ "තිසිකලෙක්හි නුසුදුසු කාලයෙහි සමීපයට යාම හෙතුකොටගෙණ ස්වාමිතෙම තට අනාදරකෙරෙ" යි කියයි. දමනකතෙම "එසේවේවා, ස්වාමියාගෙන් අගෞරව ලැබෙයි යන සැකයඇති කල්හිද සෙවකයා විසින් සමීපයෙහි සිටීම නියමයෙන් කටයුතුවෙයි.

4. යම්හෙයකින්—දෘෂයට හයින් කටයුතු ක්‍රියාවෙහි නොයදීම නිඝ්‍රිත් පුරුෂයාගේ ලක්‍ෂණයයි, එම්බා සහොදරවූ කරටකය! මේ ආහාරය පැසේද නැද්දැයි යනහයින් කවරක්හු විසින් ආහාරගැන්ම වළක්වනු ලැබේද.

5. බලව—ශාස්ත්‍ර නොදත්හෙයින් අඥනවූ [illegible]නකුලයෙහි උපන් සතුරුවූ හෝ හැමකල්හි සමීපයෙහි වසන් මනුෂ්‍යයකුට

---

1. අපරඤ්ච :—යස්‍ය යස්‍ය හි යො භාවස්තෙන තෙන හි තං නරම්,
අනුප්‍රවිශ්‍ය මෙධාවී ක්‍ෂිප්‍රමාත්මවශං නයෙත්.

2. අන්‍යච්ච :—කො 'ත්‍රෙත්‍යහමිති බ්‍රූයාත් සම්‍යගාදෙශයෙති ච,
ආඥමවිතථාං කුර්‍ය්‍යාත් යථාශක්ති මහීපතෙඃ.

3. කිඤ්ච :—අල්පෙච්ඡුර්ධෘතිමාන් ප්‍රාඥශ්ඡායෙවානුගතඃ සදා,
ආදිෂ්ටො න විකල්පෙත ස රාජවසතිං [illegible]සෙත්.

4. යතඃ :—දොෂභීතෙරනාරම්භඃ කාපුරුෂස්‍ය ලක්‍ෂණම්,
කෛරජීර්ණභයාද්භ්‍රාත භොජනං පරිහීයතෙ.

5. පශ්‍ය :—ආසන්නමෙව නෘපතිර්භජතෙ මනුෂ්‍යං
විද්‍යාවිහීනමකුලීනමසඞ්ගතං වා,
ප්‍රායෙණ භූමිපතයඃ ප්‍රමදා ලතාශ්ච
යඃ පාර්ශ්වතො වසති තං පරිවෙෂ්ටයන්ති.

රජතෙමේ අනුකම්පාකෙරේ, රජහුද, සත්‍රීහුද, වැල්ද සමීපයේ වසනායමක්හුම වැළඳගණී තිකියයි.

කරටකතෙමේ "එ[illegible]හිඑහි ගොස් තුමක්කියන්නෙහිදැ"? යි කියයි. දමනකතෙම "අසව ස්වාමීතෙමේ මාකෙරේ සතුටුද නොසතුටුද කිම්දැයි? පළමුකොට දන්නාලැබෙයි" කියයි. කරටකයා "ඒ සතුටු නොසතුටු දෙක දැනගන්නා ලකුණකෙසේද" යි කියයි. දමනකතෙම අසව,

1. දුරදිම ඇලුම්සහිතව බැලීමය, සිනාසීමය, ශුභකථාවක් දැනගන්නා කැමතිව ලත්වළුන්කල මහත් ආදරසහිතව ප්‍රකාශ කිරීමය, අසම්මුඛයෙහිද ගුණකීමය, සිත් ප්‍රියකරණ වස්තුවක් ලත්කල සිහිකිරීමය.

2. ඒ සෙවකයාකෙරේ අනුකූලබවය, ධනාදියදීමය, සතොෂය වැඩීමය, දෝෂයක්ඇති කල්හිද ගුණයන්ගේ ගැන්මය යන මේ කරුණු ස්වාමිහුගේ සතුට ඇතිකල ලකුණුයි.

3. අනුග්‍රහය දක්වීමපිණිස කල්ඉක්මවීමය, ඔහුසම්බන්ධ කටයුත්ත නොකොට නිතර ආශාවන්ගේ වර්ධනය කිරීමය, කැමතිවනලද වස්තුවනොදී කඩකිරීමය යන මේ කරුණු නුව ණැති ජනතෙම ඇළුම්නැති ස්වාමිහුගේ ලකුණුයයි දන්නේය.

කියනලදමේ ලකුණු දැන යම් ප්‍රකාරයකින් මේ ස්වාමීතෙම මට අයිතිවූවෙක් වන්නේද එහෙයින් කියන්නෙමි.

4. ඒ මෙසේයී—පණ්ඩිත ජනයෝ නීතිශාස්ත්‍රයෙහි කියන ලද්දවූ නුසුදුසු ක්‍රියාවෙහි පැවැත්මෙන් උපන් විපතතිද, මනා ක්‍රියාවගැන්[illegible]න් උපන් කටයුතු සිදුවීමද, ඉදිරියෙහි පහළවන් නාක්මෙන් ප්‍රමාණකෙරෙත්.

---

1. දූරාදවෙක්ෂණං හාසඃ සංප්‍රශ්නෙ සාදරෙ භෘශම්,
   පරොක්ෂෙ 'පි ගුණශ්ලාඝා ස්මරණං ප්‍රියවස්තුෂු.

2. තත්සෙවකෙ 'නුරක්තිශ්ච දානං ප්‍රිතිවිවර්ධනම්,
   සුරක්තාශවරව්‍යසනානි දොෂෙ 'පි ගුණසංග්‍රහඃ.

3. කාලයාපනමාශානාං වර්ධනං ඵලඛණ්ඩනම්,
   විරක්තාශවරචිහ්නානි ජානීයානමතිමාන් නරඃ.

4. යථා:—අපායසන්දර්ශනජාං විපත්ති
   මුපායසන්දර්ශනජාං ච සිද්ධිම්,
   මෙධාවිනො නීතිවිධිප්‍රයුක්තාං
   පුරඃ ස්ඵුරන්තීමිව දර්ශයන්ති.

1. අනිකෙක්ද—ස්වාමියා සතුටුවූකල සෙවකයාගේ සියලු දොෂයෝ ගුණයෝවෙත්, ස්වාමියා නොසතුටුවූකල සියලුගුණයෝ දොෂයෝවෙත්, ස්වාමියා මේ දෙපක්ෂ[illegible] නොගොස් මධ්‍යස්ථවූ කල දොෂයෝ දොෂමවෙත්, ගුණයෝද ගුණමවෙතියි මෙසේ ස්වාමිහුගේ ගුණ තුන්ප්‍රකාර වෙතිසිකියයි.

කරටකතෙම “එසේදවුවත් කීමට සුදුසු කාලය නොපැමිණි කල කීම සුදුසු නොවන්නෙහිය.

2. යම්හෙයකින්--නුසුදුසු කාලයෙහි කථාකිරීමෙන් බෘහස්පති නමුදුඤුනාය කාරණකොටගෙණ අගෞරවයටද බොහෝකල් පවත්නා දොෂයටද පැමිණෙයි කියයි.

දමනකතෙම මිත්‍රය! භයනොවව මම පැමිණිකාලය නැති වචනයක් නොකියන්නෙමි.

3. යම්හෙයකින්—විපත්තිය එළඹ සිටිකලද, නොමගට පැමිණිකලද, කටයුත්තට සුදුසු කාලය ඉක්මයන කල්හිද ස්වාමියා විසින් නොවිචාරණ ලද්දවූද වැඩකැමති සෙවකයා විසින් හිතවූකාරණය කියයුතුවේ.

ඉදින් සුදුසු කාලය පැමිණියාවූ රහස මාවිසින් නොකිය යුතුද එසේකල්හි මාගේ අමාත්‍යභාවයම එලරහිතවෙයි.

4. යම්හෙයකින්—යම්ගුණයක් කාරණකොටගෙණ පැවැත්ම දන්නේද, යම් ගුණයක් කාරණකොටගෙණ ලොව පණ්ඩිතයන් විසින් ජනතෙමේ වර්ණිතා කරණුලැබේද ඒ තෙම ගුණයයි කියනලදී, ඒ කාරණයෙන්ද ගුණවත් ජනයාවිසින් ඒ ගුණය මහත් උත්සාහයෙන් රක්ෂාකටයුත්තේය, වර්ධනා[illegible]කටයුතුය.

එහෙයින් පින්වත! මම පිඞ්ගලයකයාගේ [illegible]පයට යෙමි මට අවසරදෙව” යි කියයි. කරටකතෙමේ “මඞ්ගල්‍යයෙක් වේවා කැමතිපරිද්දෙන් කරණුලැබේවා.

---

1. අපරඤ්ච :—දොෂා ගුණා ගුණා දොෂා දොෂා දොෂා ගුණා ගුණාඃ,
රක්තෙ විරක්තෙ මධ්‍යස්ථෙ ස්වාමිනි ත්‍රිවිධා ගුණාඃ.

2. යතඃ :—අප්‍රාප්තකාලවචනං බෘහස්පතිරපි බ්‍රුවන්,
ප්‍රාප්නුයාද්බුධ්‍යවඥනමපමානං ච ශාශ්වතම්.

3. යතඃ :—ආපද්‍යුන්මාර්ගගමනෙ කාර්‍ය්‍යකාලාත්‍යයෙෂු ච,
අපෘෂ්ටෙනාපි වක්තව්‍යං භෘත්‍යෙන හිතමිච්ඡතා.

4. යතඃ :—කල්පයති යෙන වෘත්තිං යෙන ච ලොකෙ ප්‍රශස්‍යතෙ සද්භිඃ.
ස ගුණස්තෙන ච ගුණිනා රක්ෂ්‍යඃ සංවර්ධනීයශ්ච.

1. ධනලාභය පිණිසද, ඓශ්වර්‍ය්‍යය පිණිසද, ජයගැණීම පිණිසද, සතුරුසෙනඟ පරාජයකිරීම පිණිසද, නැවත මෙම ස්ථානයටම ආපසු ඒම[illegible]ිසද, යනුලැබේව" සි කියයි.

ඉක්බිත්තෙන් දමනකතෙමේ විස්මයට පැමිණියක්හුමෙන් පිඞ්ගලකයාගේ සමීපයට ගියේය. එකල්හි දුරදීම රජහු විසින් දක්නාලද්දාවූ ආදරසහිතව සමීපයට කැඳවනලද දමනක තෙමේ ඒ සිංහයාට පොළවස්පර්‍ශවූ අවයව අටක් සහිතව වැඳ උන්නේය. රජතෙමේ "බොහෝ කාලයකටපසු දක්නාලද් දෙහි" යයි කියයි. දමනකතෙමේ "කිසිසේත් සෙවකවූ මා කරණකොටගෙණ ශ්‍රීමත්වූ ස්වාමිපාදයන්ට කිසිත් ප්‍රයොජන යෙක්නැත, එසේදවුවත් ලන්වසිටීමට යොග්‍ය කාලයෙහි සෙවකයා විසින් ලන්විය යුතුබව නියමයෙන් කටයුතුයයි සිතාඇම්.

2. මහරජ! දත උළුන්නාවූ කුරෙන්ද, කණකැසීම වළක්වන තණකුරෙන්ද, අධිපතින්ටපවා කටයුතු ප්‍රයොජනවෙයි, විකල නුවූ අවයවවත් වචනශක්තියෙන්ද යුක්තවූ අද්ද ඇති මනුෂ්‍යයා ගෙන් ප්‍රයොජනවත් කටයුතු ඇතිබව කියනුකිම?

ස්වාමීන් විසින් බොහෝ කාලයක් මුලුල්ලේ නිවස්ථානයෙහි තබා අගෞරව කරණලද මාගේ ඉදීත්බුද්ධිය හානිවූයේයයි සැකකෙරේද හෙළ නුවූයේය.

3. මාණික්‍යයෙක් පාද භරණයෙහි යොදූද, විදුරෙක් ඉසේ පළඳින ආ[illegible]ණයෙක්හි යොදනුලැබේද, එසේවීනමුදු මුදල් ගණුදෙනුකළයුතු වෙළඳාමක් ඇතිකල්හි විදුර තමාට සුදුසු අග යෙන්ද, මාණික්‍යය රත්නයට සුදුසු අගයෙන්ද ගන්නා ලැබේ.

---

1. ගම්‍යතාමර්ථලාභාය ක්ෂේමාය විජයාය ච,
ශත්‍රුපක්ෂවිනාශාය පුනරාගමනාය ච.

2. දන්තස්‍ය නිඝර්ෂණකෙන රාජන්!
කර්ණස්‍ය කණ්ඩූයනකෙන වා 'පි,
තෘණෙන කාර්‍ය්‍යං භවතීශ්වරාණාං
කිමඞ්ගවාක්පාණිමතා නරෙණ.

3. මණිර්ලුඨති පාදෙෂු කාචඃ ශිරසි ධාර්‍ය්‍යතෙ,
ක්‍රයවික්‍රයවෙලායාං කාචඃ කාචො මණිර්මණිඃ

1. අනිකෙක්ද—ස්වාමියා විසින් කරණලද අගෞරවය ඉවසන්නහුගේද බුද්ධිහානියවෙයි යන සැකයෙක් නැත්තේය. අධොභාගයෙන් කරණලද්දවූද ගිනි නැගි දැල්ල කිසිසේත් අධොභාගයකරා නොයේ.

දෙවයන්වහන්ස! ස්වාමියා විසින් විශෙෂ දැනීමෙන් යුක්ත වියයුතුය.

2. යම්හෙයකින්—යම් කලෙක්හි රජෙක් වෙනසක්නැතිව සියලුජනයා කෙරෙහි සමව පවත්නේද, එසඳ කටයුතු සම්පාදනය කිරීමෙහි දක්ෂවූවන්ගේ උත්සාහය පිරිහෙළනු ලැබේ.

3. තවද—මහරජ! උත්තමය, අධමය, මධ්‍යමයයි පුරුෂයෝ තුන්ප්‍රකාරවෙත්, එසේම උත්තම අධම මධ්‍යම බව පරීක්ෂාකිරීමෙන්ම මේ පුරුෂයන් උත්තම අධම මධ්‍යමය යන ත්‍රිවිධ ක්‍රියාවලම යොදවන්නේය.

4. යම්හෙයකින්—සෙවකයෝද, රත්නාදී ආභරණයෝද, නියමයෙන්ම සුදුසු ස්ථානයෙහි යොදන ලද්දහුම බබලත්, ඒ එසේමැයි, ඔටුන්න පාදයෙහිද, වළල්ල ඉසෙහිද පැළැන්දේ බබලන්නේ නොවෙයි.

5. නැවතද—රන් පලඳනාවෙහි යෙදීමට තරම්වූ මාණික්‍ය රත්නය ආභරණ කරන්නවුන් විසින් ඊයමෙහි ගළපනු ලැබේද, එසඳ ඒ මාණික්‍යය නොහඬයි, බබලන්නේද නොවේ, ඊයමෙහි ඔබ්බා ආභරණයකළ පුරුෂයා නින්දාකටයුත්තෙක්වේ.

---

1. අන්‍යච්ච :—කදර්පිතස්‍යාපි ච ධෛය්‍ර්‍යවෘත්තෙ
බුද්ධෙර්විනාශො න හි ශඞ්කනීයඃ,
අධඃ කෘතස්‍යාපි තනූනපාතො
නාධඃ ශිඛා යාති කදාචිදෙව.

2. යතඃ :—නිර්විශෙෂං යදා රාජා සමං සර්වෙෂු වර්ත්තතෙ,
තදොද්‍යමසමර්ථානාමුත්සාහඃ පරිහන්‍යතෙ.

3. කිඤ්ච :—ත්‍රිවිධාඃ පුරුෂා රාජන් උත්තමාධමමධ්‍යමාඃ,
නියොජයෙත් තථෛවෛතාංස්ත්‍රිවිධෙෂ්වෙව කර්මසු.

4. යතඃ :—ස්ථාන එව හි යුජ්‍යන්තෙ භෘත්‍යාශ්චාභරණානි ච,
න හි චූඩාමණිඃ පාදෙ නූපුරෙ න ච මූර්ධ්නි.

5. අපිච :—කනකභූෂණසංග්‍රහණොචිතො යදි මණිස්ත්‍රපුණි ප්‍රණිධීයතෙ.
න ස විරෞති න චාපි ස ශොභතෙ භවති යොජයිතුර්වචනීයතා.

1. අනිකෙක්ද—ඔටුන්නෙහි ඉදින්විදුරෙක් පිහිටුවනලද්දේවේද, පාදාභරණයෙහි ඉදින් මාණික්‍ය රත්නයෙක් නගණලද්දේවේද, එකල්හි මාණික්‍යයට නිඳාවක් නැත්තේය, එසේද යෙදූ තැනැත්තහුගේ අඥානබවවේ.

2. බලව—මේ ලෝකයෙහි මේ ජනතෙමේ නුවණැත්තේය, මේතෙම ස්වාමියා පිහිටකොට පවතී, මේතෙම කියනලද ගුණ දෙකින්ම යුක්තයයි මෙසේ ඇමතියන්ගේ ගුණ අගුණ පරීක්ෂා කිරීමට දක්ෂවූ රජතෙම නුවණැති අමාත්‍යයන් විසින් පිරිවරණු ලැබේ.

3. ඒ එසේමැයි—අශ්ව වාහනය, ආයුධය, සමෘත්‍යාදිශාස්ත්‍රය, වීණාය, වචනය, මනුෂ්‍යය, ස්ත්‍රීය යනමේ සත ගුණ ඇත්තාවූද ගුණ නැත්තාවූද ජනයන්ගේ ආශ්‍රයට පැමිණ කටයුත්තට යොග්‍යද අයොග්‍යදවෙත්.

4. අනිකෙක්ද—ස්වාමියාට ඇළුම්ඇති ශක්තිරහිතවූ ජනයාගෙන් ප්‍රයොජන නොවේ, ක්‍රියාසම්පාදනයෙහි දක්ෂවූ සතුරාගෙන්ද ප්‍රයොජන නොවේ, පින්වත් මහරජ! නුඹවහන්සේ ඇළුම්ඇත්තාවූ කටයුතු කිරීමෙහි දක්ෂදවූ මට අනාදර කරන්ට සුදුසු නොවන්නෙහ්ය.

5. යම්හෙයකින්—රජුගේ අගෞරවකිරීම හෙතුකොටගෙණ ඒ රජහු ආශ්‍රයට පැමිණි පිරිවර ජනයා පිරිහුනු නුවණින් යුක්තවේ, ඉන්පසු අඥානයන්හට ප්‍රධානත්වය ලැබීමෙන් නුවණැති ජනයෙක් සම්මුඛයෙහි නොසිටියි, රට පණ්ඩිතයන් විසින්

---

1. අන්‍යච්ච :—මුකුටෙ රොපිතඃ කාචශ්චරණාභරණෙ මණිඃ
න හි දොෂො මණෙරස්ති කින්තු සාධොරවිඥතා.

2. පශ්‍ය :—බුද්ධිමානනුරක්තො 'ය මිතොභයගුණො ජනඃ,
ඉති භෘත්‍යවිචාරඥො භෘත්‍යෛරාපූර්‍ය්‍යතෙ නෘපඃ.

3. තථාහි :—අශ්වඃ ශස්ත්‍රං ශාස්ත්‍රං වීණා වාණී නරශ්ච නාරී ච,
ප්‍රාප්‍ය මනුෂ්‍යවිශෙෂං භවන්ති යොග්‍යා අයොග්‍යාශ්ච.

4. අන්‍යච්ච :—කිං භක්තෙනාසමර්ථෙන කිං ශක්තෙනාපකාරිණා,
භක්තං ශක්තං ච මාං රාජන් නාවඥාතුං ත්වමර්හසි.

5. යතඃ—අවඥානාද්‍රාඥො භවති මතිහීනඃ පරිජන
ස්තතස්තත්ප්‍රාධාන්‍යාද්භවති න සමීපෙ බුධජනඃ,
බුධෛස්ත්‍යක්තෙ රාජ්‍යෙ න හි භවති නීතිර්ගුණවතී
විපන්නායාං නීතෞ සකලමවශං සීදති ජගත්.

හරිණලද කල්හි නිදෙෂවූ නීතියක් නැත්තේය, රාජනියමය පෙරළුනකල සියලූ ලොකය ගිලෙයි, විඩාවට පැමිණෙයි.

1. දෙවයන්වහන්ස! අනිකෙක්ද— ජනපද වාසී ජනයෝ රජහු විසින් සත්කාර කරණලද ජනයාට නිරන්තරයෙන් පුදත්‍, යම් ජනයෙක් වනාහි රජහු විසින් අගෞරව කරණලදද ඒ ජන්තෙමේ සියලු ලොකයාවිසින් ගර්හාකරණුලැබේ.

2. තවද—පණ්ඩිතයන් විසින් බාලයා කෙරෙන්ද යොග්‍යවූ වචනය ගතයුතුවෙයි, ඊට උපමාවක්නම්, සූර්‍ය්‍යයා උදනුවූකල ප්‍රදීපයාගේ බැබලීම නොවේද ” යි කියයි.

පිඞ්ගලකතෙම පින්වත් දමනකය! මේ කිමෙක්ද? තෝ අපගේ ප්‍රධාන අමාත්‍ය පුත්‍රවෙයි, පණ්ඩිතය මෙතෙක්කල් මාගේ ආශ්‍රයෙහි සිට කිසියම් දුර්ජනයක්හුගේ වචනයෙන් නොආ යෙහිද? දැන්කැමැත්තවූ නියාව කියවයි කියයි. දමනකතෙමේ දෙවයන්වහන්ස! විචාරම් මඳක් කියනුලැබේවා. පැන්බොනු කැමතිවූ ස්වාමීතෙම පැන්නොබී විස්මයට පැමිණියක්හු මෙන් කුමක්නිසා? සිටින්නේදැයි කියයි. පිඞ්ගලකතෙම “තාවිසින් යහප තක් කියනලද්දේය. එසේවීනමුදු මේ රහස කියාලන්ට අපට විශ්වාස කටයුතු කිසිවකුදුනැත. තෝවනාහි විශ්වාස කටයුත් තෙක එහෙයින් කියම් අසව. දැන් මේ වනයෙහි පෙරනුදුටු විරූනොඇසූ විරූසත්වයෙක් වෙසේ. එහෙයින් අපවිසින් මේ වනය හැරියයුතුය. එසේද තාවිසින්ද පෙරනොඇසූ විරූමහත් ශබ්දයෙක් අසනලද්දේද, ශබ්දයෙහි ආකාරයෙන්ද ඒ සත්වයා ගේ බලයද අතිශයින් මහත්විය යුතුය ” යි කීය. ඒ අසාදමනක තෙම “දෙවයන්වහන්ස! මේ මහත්වූ භයට කාරණයවූ ශබ්දය අපවිසිනුදු අසනලද්දේය. එසේද යමෙක් පළමුකොට මන්ත්‍ර ණය නොකිරීමෙන් රජ්ජුරුවන් හැරීම හෝ යුඬකිරීම පිණිස උත්සාහය හෝ දක්වන්නේද හෙතෙම කෙසේනම් අමාත්‍ය යෙක්වේද? දෙවයන්වහන්ස! අනික් කාරණයක්ද ඇසූව මැනව, මේ භයකාරණයෙහිදී කටයුත්තක් නියමකරණ සැකය ඇතිකල්හි සෙවකයන්ගේ කටයුතු සිදුකිරීමෙහි දක්ෂභාවය දතයුතුය.

---

1. අපූරඤ්ච දෙව :—ජනං ජනපදා නිත්‍යමර්චයන්ති නෘපාර්චිතම්,
නෘපෙණාවමතො යස්තු ස සර්වෛරවමන්‍යතෙ.

2. කිඤ්ච :—බාලාදපි ග්‍රහීතව්‍යං යුක්තමුක්තං මනීෂිභිඃ,
රවෙරවිෂයෙ කිං න ප්‍රදීපස්‍ය ප්‍රකාශනම්.

1. යම් හෙයකින්—මිත්‍රයෝය, ස්ත්‍රීහුය, සෙවකය යන මේ සමූහයාගේද, තමා පිළිබඳවූ ඥානශක්තියගේද බලයාගේද සාරභාවය විපත්ති නැමති උරගලෙහිගා පියා ජනතෙමේ දැන ගන්නේය" යි කියයි.

සිංහතෙම "පින්වත! මහත් සැකය මට පීඩාකෙරෙයි" කියයි. දමනකතෙමේ "අන් පරිද්දෙකින් රජසැපත හැරදමා අන්‍යස්ථානයකට යාම පිණිස කවරහෙයකින් මට කියනසේක්ද? දෙවයන්වහන්ස! මම ජීවත්වනතුරු භයනොකට යුතුය" යි තමන් අදහස ශබ්ද පවත්වා කියයි. එසේද කරටකාදීහුද අස්වැසිලි කළෝය. යම් හෙයකින් විපත්ති දුරලීම පිණිස මිත්‍රයන් ගේ සංග්‍රහය නොලැබිය හැකිද එහෙයින් රජු විසින් මහත් සොම්නසින් පුදනලද ඒ දමනක කරටක දෙදෙන භයට පිළියම් කිරීම පිණිස ගිවිස ගියෝය. කරටකතෙම යන තැනැත්තේ "මිත්‍රය! තිමෙත්ද මේ භය ඉපදීමට මුල්වූ කාරණය පිළියම්කොටලියහෙන එකක්ද නොහොත් පිළියම්කොට ලියනොහෙන එකක්දැයි නොදැන භය සන්සිඳවීමට ගිවිසකෙසේනම් මේ මහත් අනුග්‍රහය ඉවසනලද්දේද? යම් පරිද්දෙකින් උපකාර නොකරණ තැනැත්තේ කවරකුගේ නමුදු පඩුරු නොගන්නේය. රජහුගේ පඩුරු විශෙෂයෙන් නොගන්නේය.

2. බලව—යම් රජකුහුගේ සතුටඇතිකල ලක්‍ෂ්මිය වාසය කෙරේද, ශූර භාවය ඇතිකල්හි ජයලැබීමද, කිපුනුකල මරණයද සවිරද ඒ රජතෙම නියමයෙන් සියලු තෙජසින් යුක්තවෙයි.

3. ඒ එසේමැයි—ළදරුවූයේ නමුදු රජතෙමේ මනුෂ්‍යයෙක යන අදහසින් අනාදර නොකට යුතුය, මේ ප්‍රධාන දෙවතාතොමෝ මනුෂ්‍යවෙශයෙන් සිටිනිය" යි දමනකයාට කියයි.

දමනකයා සිනාසී "මිත්‍රය! කථානොකොට හිඳුව භය ඉපදීමට මුල්වූ කාරණය මාවිසින් දත්නාලද්දේය, ගොනකු විසින් ශබ්දකරණ ලද්දේය. ගවයෝද අපවිසින් කැයුතුවෙති, සිංහයා

---

1. යතඃ :—බන්ධුස්ත්‍රීභෘත්‍යවර්ගස්‍ය බුද්ධෙඃ සත්ත්වස්‍ය චාත්මනඃ,
ආපන්නිකෂපාෂාණෙ නරෙ ජානාති සාරතාම්.

2. යශ්‍ය :—යස්‍ය ප්‍රසාදෙ පද්මාස්තෙ විජයශ්ච පරාක්‍රමෙ,
මෘත්‍යුශ්ච වසති ක්‍රොධෙ සර්වතෙජොමයො හි සඃ,

3. තථාහි :—බාලො 'පි නාවමන්තව්‍යො මනුෂ්‍ය ඉති භූමිපඃ,
මහතී දෙවතා හ්‍යෙෂා නරරූපෙණ තිෂ්ඨති.

කැයුතුබව කියනු කිම්ද"සි? කියයි. ඒ අසා කරටකයා "ඉදින් එසේනම් එකල්හි ස්වාමීහුගේ භය එහිදීම තුමට පහනොකරණ ලද්දේද"සි? කියයි. දමනකයා "ඉදින් ස්වාමියාගේ භය දුරුකිරීමපිණිස එහිදී මෙසේ කියනුලැබේද, එසඳ අපට කෙසේ මහත් අනුග්‍රහ ලාභය වන්නේද?

1. අනිකෙක්ද—සෙවකයන් විසින් ස්වාමිතෙම කිසිකාලයෙක්හිද සෙවකයන්ගේ උපකාර කැමති නොවන්නෙක් නොකටයුතුය, සෙවකතෙමේ ස්වාමියා සෙවකයන්ගේ උපකාර නොසොයන්නකුට අධිකණ්නම් බළලාමෙන් වන්නේය" සි කියයි.

ඒ කෙසේදැයි? කරටකයා විචාරයි. දමනකයා කියයි.

උතුරුදිග අර්බුදශිඛරනම් පර්වතයෙහි මහාවික්‍රමනම් සිංහයෙක් ඇත. පර්වතයාගේ ගුහාවක සැතපෙනා ඒ සිංහයාගේ කඳෙහි ලොම එක්තරා මීයෙක් කපයි. ලොම සිඳිනා බව දැන කිපුනාවූ ඒ සිංහයා බිලයතුළ ඉන්නා මීයා මඩනට නොහැකිවූයේ මේ කාරණයෙහි තුමක් කටයුතුවේද? මෙසේ අසනුලැබේ.

2. "යමක්හට මූෂිකාදීන්මෙන් කුඩා සතුරෙක් වන්නේද වික්‍රමය හෙතුකොටගෙණ මඩනට නොහැකිද, ඒ සතුරා වශගකරන්ට ඔහුහා සමානවූ සෙනාවෙහි නියුක්තවූ පුරුෂයෙක් නියොගකටයුතු වෙයි" යනුසිතී.

මෙසේ සිතාපියා ඒ සිංහයාවිසින් ගමටගොස් අධිකණ් නම් බළලෙක් මාංසාදි ආහාරය කරණකොටගෙණ සතුටුකොට උත්සාහයෙන් ගෙණවුත් තමන් වසනා ගුහාවෙහි පොෂ්‍යය කරණලද්දේය. ඉක්බිත්තෙන් බළලාට භයින් මීයා පිටතට නොනික්මෙයි. එහෙයින් මේ සිංහයා ලොම් සිඳීමෙන් මිදුනුතැනැත්තේ සැපසේ නිදයි. යම් යම් දවසක මීයාගේ ශබ්දයඅසාද, ඒ ඒ දවස් වලදී ඒ බළලාට නොයෙක් පරිද්දෙන් මාංසාහාර දීමෙන් ආදර කෙරේ. ඉක්බිත්තෙන් එක් දවසෙක සායෙන් පීඩිතව පිටත ඇවිදිනා ඒ මීයා බළලා විසින් අල්වනලදුව මරාකනලද්දේය. ඉන්පසු ඒ සිංහයා කිසිම දවසක මීයාගේ ශබ්දය නොඇසීලූ. එකල්හි මීයාගේ ක්‍රීඩාව නැතිබැවින් ඒ බළලාට ආහාරදීමෙහි

---

1. අපරුක්‍ෂව :—නිරපෙක්‍ෂො න කර්තව්‍යො භෘත්‍යෛඃ ස්වාමී කදාචන, නිරපෙක්‍ෂං ප්‍රභුං කෘත්වා භෘත්‍යඃ ස්‍යාද්දධිකර්ණවත්.

2. ක්‍ෂුද්‍රශත්‍රුර්භවෙද්‍යස්‍ය වික්‍රමාන්නෛසව ලභ්‍යතෙ, තමාහන්තුං පුරස්කාර්‍ය්‍යඃ සදෘශස්තස්‍ය සෛනිකඃ.

ආදරනැතිවීද්‍ර. එහෙයින් මම සෙවකයන්ගේ උපකාර කැමති නොවන්නෙක් නොකටයුතුය යන මේ ආදීය" කියමි කියයි. පසුව දමනක කරටක දෙදෙන සඤ්ජීවකයා සමීපයට ගියෝය. ඒ ස්ථානයෙහිදී කරටකයා අහංකාරසහිතව ගසක්මුල උන්නේය. දමනකයා සඤ්ජීවකයා සමීපයට ගොස් "බොලගවය! පිඞ්ගලක රජ්ජුවිසින් මම වනය රක්නාපිණිස නියමකරණ ලද් දෙමි. කරටකතෙමේ සෙනාපතියයි ආඥකරණු ලැබෙයි. වහා මෙහි එව ඉදින් නැතහොත් මේ වනයෙහි නොසිට අන් තැන කටයව, නැතහොත් තට විපතෙක් වන්නේය. කිපියාවූ රජ තෙම කවරආඥවක් කරන්නේදැයි? නොදනිමි" කීය. ඉක්බිත් තෙන් දෙශයෙහි පැවැත්ම නොදත් සඤ්ජීවකයා භයසහිතව ලන්ව පොළොවෙහි සපශ්වූ අවයව අටක් සහිතව කරටකයාට වැන්දේය.

1. එසේද කියනලදී—ශරීරබලයට වඩා නුවණම අතිශයින් ශ්‍රෙෂ්ඨවන්නේය, යම් නුවණක් නැතිකල්හි ඇතුන්ගේ මේ අනුන්ට වශගව පැවැත්මක් වන්නේද, මෙසේ ඇත්ගොව්වා විසින් ගසනලද ශබ්දකරන්නාවූ ඩිණ්ඩිමනම් කුඩාබෙරය තෙම ඇතුන් ඝොෂාකරවන්නාක්මෙනි.

එකල්හි සඤ්ජීවකයා සැකසහිතව "පින්වත් සෙනාපතිය! කුමක් මාවිසින් කටයුතුද ඒ කියනු ලැබේව" යි කියයි. කරටක තෙම "එම්බල ගවය! මේ වනයෙහි සිටීමට යම් කැමැත්තක් පවත්නේද එකල්හි රජ්ජුරුවන් වහන්සේගේ පාපියුම සමීපයට ගොස් නමස්කාරකරව"යි කියයි. සඤ්ජීවකතෙම "එසේවිනම් අභය වචනය කිවමැනව එන්නෙමි" කීය. කරටකයා විසින් "බොල ගවය! අසව මේ සැකයෙන් කම්නැත.

2. යම්හෙයකින්—විෂ්ණුතෙමේ නින්දකරණු ලබන්නාවූචෙදී රට රජ්ජුට ප්‍රතිවචන නුදුන්නේය, සිංහයෙක් මෙඝනාදයට පසුව ගුංයන ශබ්දපවත්වයි, සිවල් සබ්දයට පසුව සබ්දනොකෙරෙ.

---

1. තථාචොක්තම් :—මතිරෙව බලාද්ගරීයසී
යදභාවෙ කරිණාමියං දශා,
ඉතිඝොෂයතිව ඩිණ්ඩිමඃ
කරිණො හස්තිපකාහතඃ ක්වණන්

2. යතඃ : – ප්‍රතිවාචමදත්ත කෙශවඃ ශපමානාය න චෛද්‍යභූභෘතෙ,
අනුහුඞ්කුරුතෙ ඝනධ්වනිං න හි ගොමායුරුතානි කෙශරී.

1. අනිකෙක්ද—මහත් වාතය සියලුලෙසින් නැමෙනලද උසස්ස්වභාවයක් නැති මොලොක්වූ තණ නොමුළුදුරයි, එසේද උස්වූ නුග ගස්ආදියටම පීඩාකෙරේ, එමෙන් උත්තමයෙක් උත්තමයන්හු කෙරෙහිම වික්‍රම කෙරෙයි කියනලදී.

ඉක්බිත්තෙන් ඒ කරටක දමනක දෙදෙන සඤ්ජීවකයා නුදුරු තැනක සිටුවා පිඞ්ගලකයා සමීපයට ගියෝය. එකල්හි රජුවිසින් ආදරසහිතව බලනලද ඔව්හු දෙදෙන වැඳ උන් නොය. රජතෙමේ "ඒ තෙමදක්නා ලද්දේදැ" යි අසයි. ඊට දමනකයා "දෙවයන්වහන්ස! දක්නාලද්දේය දෙවයන්වහන් සේ විසින් යමක්කියන ලදද ඒ එසේමය. මහත් ශක්තිසම්පන්නවූ මේතෙම දෙවයන්වහන්සේ දක්නාකැමැත්තේය. රාජයෝග්‍යවූ දක්වාගැන්මෙන් සැරසී කැඳවනුලැබේවා. එසේදවුවත් ශබ්දය පමණකින් භය නොවියයුතුය.

2. බස්නාජල වෙගය කාරණකොටගෙණ ඒදන්ඩ බිඳේ, එසේම රක්‍ෂානොකරණලද රහසද බිඳේ, කේලාම හෙතුකොට ගෙණ ප්‍රෙමය බිඳේ, භය සුලුතැනැත්තේ වචනවලින් බින්ද යුතුවේ.

3. එසේද කියනලදී—ශබ්දයට මුල්වූ කාරණය නියම නො කොට ශබ්දයපමනක් අසා භයනොවිය යුතුය, ශබ්දයට මුල්වූ කාරණයදැන දූතකම්කරණ කිසියම් මැහැල්ලක් ගෞරවයට පැමිණියා" යයි කියයි.

රජතෙමේ ඒ කෙසේදැ? යි අසයි. දමනකතෙමේ කියයි.

"ශ්‍රීපර්වත මධ්‍යයෙහි බ්‍රහ්මපූරනම් නුවරෙක්ඇත. ඒ නුවරට නුදුරුවූ කඳු මුදුනක ඝණ්ටාකර්ණනම් රාක්‍ෂසයෙක් වසන්නේයයි ලොකයාගේ ආරංචියෙක් අසනුලැබේ. එක්දිනෙක ඝණ්ටාවක් ගෙණ දිවන එක්තරා සොරෙක් ව්‍යාඝ්‍රයක්හු විසින් මරණලද් දේය. ඒ සොරුඅතින් වැටුනු ඝණ්ටාව වඳුරන් විසින්ලද්දීය.

---

1. අපරඤ්ච :—තෘණානි නොන්මූලයති ප්‍රභඤ්ජනො
මෘදූනි නීචෛඃ ප්‍රණතානි සර්වතඃ,
සමුච්ඡ්‍රිතානෙව තරූන් ප්‍රබාධතෙ
මහාන් මහත්‍යෙව කරොති වික්‍රමම්.

2. අම්භසා භිද්‍යතෙ සෙතුස්තථා මන්ත්‍රො'ප්‍යරක්ෂිතඃ,
පෛශුන්‍යාද්භිද්‍යතෙ ස්නෙහො වාග්භිර්භිද්‍යෙත කාතරඃ.

3. තථාචොක්තම් :—ශබ්දමාත්‍රාන්නභෙතව්‍යමඥාත්වා ශබ්දකාරණම්,
ශබ්දහෙතුං පරිඥාය කුට්ටිනී ගෞරවං ගතා.

වඳුරෝ ඒ ඝණ්ටාව නිතර ශබ්දකෙරෙත්. ඉක්බිත්තෙන් කණ ලද මිනිසෙක් නගරවාසී ජනයන් විසින් දක්නාලද්දේය, නිතර ඝණ්ටාවක් ගසන ශබ්දයෙක්ද අසනු ලැබෙයි. ඉන්පසු ඝණ්ටාකර්ණියා කිපුනේ මිනිසුන්කයි, ඝණ්ටාවක්ද ශබ්දකෙරෙයි, කියා සියලු ජනයෝ නුවරින් නික්ම ගියෝය. ඉක්බිත්තෙන් කරාලයා නම් දූතකර්මකාරණ මහලු ස්ත්‍රියවිමසා වඳුරෝ ඝණ්ටාව ශබ්ද කෙරෙත්යයි ඕතොමෝ දැන දෙවයන්වහන්ස! ඉදින්මඳවූ ධන වියදමක් කරනුලබන්නේ නම් එකල්හි මම මේ ඝණ්ටාකර්ණියා වශගකෙරෙම්යි රජුට දන්වනලද්දේය. ඉක්බිත්තෙන් සතුටුවූ රජුවිසින් ඈට ධන දෙනලද්දේය. දූතස්ත්‍රිය විසින්ද සෙනා වළල්ලක්කොට ඒ ස්ථානයෙහි ගණදෙවියා මුල්වූ දෙවියන්ටපූදා ඕතොමෝ වඳුරන්ට ප්‍රියවූ කෙසෙල් පලයන් ගෙණ වනයට වැද එල විසුරුවනලද්දෙය. ඉක්බිත්තෙන් ඝණ්ටාව හැරදමා වඳුරෝ කෙසෙල් පලවලට ඇලුනාහුලු. දූතස්ත්‍රියද ඝණ්ටාවගෙණ නුවරට ආතැනැත්තී සියලු ජනයාවිසින් පූදන ලද්දීය. එහෙයින් ශබ්දය පමණකින් භයනොවිය යුතුය” යි මම කියම්කීය. ඉක්බිත්තෙන් සඤ්ජීවකයා කැඳවා රජදැක්ම කරවූහ. ඉන්පසු ඒ වනයෙහිම බොහෝ කාලයක් මහත් ප්‍රිය භාවයෙන් වෙසෙයි. ඉක්බිත්තෙන් එක්දිනක් ඒ සිංහයාගේ සහොදරවූ ස්තබ්ධකර්ණ නම් සිංහයා ආයේය. ඕහට ආගන්තුක සත්කාරකොට හොවාපිඩගලකයා ඕහට ආහාරපිණ්ඩ සිව්පාවුන් මරන්ටගියේය. මේඅතුරෙහි සඤ්ජීවකයා “දෙවයන්වහන්ස! අද නසනලද මුවන්ගේ මාංස කොතැන්හිද” යි? අසයි. රජතෙමේ “දමනක කරටක දෙදෙන දනිති” කියයි. සඤ්ජීවකයා “ඈද්ද නැද්ද කින්දැ? යි දන්නාලැබේව” යි කියයි. සිංහයා සිනාසී “ඒ මාංස නැත්තේමය” යි කියයි. සඤ්ජීවකයා “මෙපමණ මාංස ඔවුන් දෙදෙනා විසින් කෙසේනම්? කනලද්දේදැ” යි කියයි. රජතෙමේ “කනලද්දේද, අනුන්ට දෙනලද්දේද, ඉවතදමන ලද්දේදවෙයි. හැමදවස්හි මේ නියමය” යි කියයි. සඤ්ජීවකයා කිමෙක්ද “ශ්‍රීමත් ස්වාමිපාදයන්ට ආහාර නැතිකරමින් මෙසේ කරණුලැබේදැ” යි කියයි. රජතෙම “මට අයිතිවූ ආහාර අනුභවයට පළමුවෙන්ම කරණුලැබෙයි” කියයි. සඤ්ජීවකයා “මේ තෙම සුදුසු නොවෙයි” කියයි.

1. එසේදකියනලදී—පෘථිවිපාලනය කරණ ස්වාමිහට නො දන්වා විපත්ති වැළැක්වීම හැර අන්කිසිත් කටයුත්තක් සෙවක යෙක් තමාම නොකරන්නේය.

2. අනිකෙක්ද—පින්වත් මහරජ! ඇමතිතෙම කමඬලාවක් වැනිවෙයි, ස්වල්පයක් දෙන්නේය, බොහෝදෙයක් රැස්කෙරෙයි, අඥනයා වියදම්කටයුතු කාලය නොදනී, දිළිඳු තැනැත්තේ බොල්ලකුමෙන් ගරුකොට සිතනු නොලැබේ.

3. යම් ඇමතියෙක් තුට්ටුවක්පමණ ඉතාසුළුවූ ධනයෙකින් නමුත් ධනගෘහය වර්ධනය කරන්නේද, ඒ අමාත්‍යයා හැමකල්හි ශ්‍රෙෂ්ඨයෙක්වෙයි, ධනවන්තයාට ධනය ප්‍රාණයෝවෙත්, රජහට ප්‍රාණයෝ ප්‍රාණයෝ නොවෙත්.

4. පුරුෂයෙක් ධනාදිය හැර අනික් කවරනම් කුලශීල වලින් පිදියයුතුබව ලබාද, ධනයෙන් පිරිහුනු තැනැත්තේ ස්වකීය භාර්‍ය්‍යාව විසින්ද දුරුකරණුලැබේ, අන්‍යයන් විසින් දුරු කරණ බව කියනුකිම.

මේ කියනු ලබනකාරණයද රාජ්‍යයෙහි ප්‍රධානවූ දූෂ්‍යකරණ කාරණයයි.

5. බලව—අධිකවූ වියදමද, ධන රැස්කිරීමට නොකමැති බවද, එසේම ධර්මය ඉක්මවා ධනය රැස්කිරීමද, සොරකම්කිරී මද, දුරුවූ ස්ථානයෙහි ධනය තබා රක්ෂාකිරීමද, මේ සියල්ල ධනගෘහයාගේ විපත්තියයි කියනුලැබේ.

6. යම්හෙයකින්—ධනයාගේ ඉපදීම පරීක්ෂා නොකොට තමා කැමැත්තෙන් වහා වියදම්කරන්නාවූ මේතෙම ප්‍රසිද්ධවූ

---

1. තථාචොක්තම් :—නානිවෙද්‍ය ප්‍රකුර්වීත භර්තුඃ කිඤ්චිදපි ස්වයම්,
කාය්‍යමාපත්ප්‍රතිකාරාදන්‍යත්‍ර ජගතීපතෙඃ.

2. අන්‍යච්ච :—කමණ්ඩලූපමො ‘මාත්‍යස්තනුත්‍යාගො බහුග්‍රහඃ,
නෘපතෙ කිඞ්කුණී මූකෛබා දරිද්‍රඃ කිං වරාටකඃ ?.

3. ස භ්‍යමාත්‍යඃ සදා ශ්‍රෙයාන් යඃ කාකිණ්‍යාපි වර්ධයෙත්,
කොෂඃ කොෂවතඃ ප්‍රාණං ප්‍රාණඃ ප්‍රාණා න භූපතෙඃ.

4. කිඤ්චාන්‍යෛඃ කුලාචාරෛඃ සෙව්‍යතාමෙති පූරුෂඃ,
ධනහීනඃ ස්වපත්න්‍යාපි ත්‍යජ්‍යතෙ කිම්පුනඃ පරෛඃ.

5. පශ්‍ය :—අතිව්‍යයො ‘නපෙක්ෂා ච තථාර්ජිනමධර්මතඃ,
මොෂණං දූරසංස්ථානං කොෂව්‍යසනමුච්‍යතෙ.

6. යතඃ :—ක්ෂිප්‍රමායමනාලොච්‍ය ව්‍යයමානඃ ස්වවාඤ්ඡයා,
ශ්‍රමණායත එවාසෞ ධනී වෛශ්‍රවණොපමඃ.

කවරෙක්නමුදු කුවෙරයාමෙන් ධනවත්වූයේද ශ්‍රමණයෙක්හු මෙන් ධනරහිතව හැසිරේ.

ඒ අසා සත්‍යබඩකර්‍ණීයා පින්වත් සහොදරය! අසව බොහෝ කාලයක් ආශ්‍රය කරණලද දමනක කරටකයන මොව්හු දෙදෙනා ගැලපීමය ඩබරය යන දෙක්හි භාරය උසුලන්නෝය. කටයුතු ක්‍රියාභාරය උසුලන තැනැත්තෝ ධනය රක්‍ෂාකිරීමේ ධූරයෙහි නියොගනොකටයුතුය.

අනිකෙක්ද කවර කටයුත්තෙක කෙබඳු අමාත්‍යයෙක් නියොගකටයුතුද යන මේ යෙදී මෙහි මා විසින් යම් කිසිවක් දන්නාලදද ඒ කියමි.

1. බ්‍රාහමණද, වීරපුරුෂද, නෑයෙක්ද, රාජ්‍යය පිළිබඳකට යුත්තෙහි භාරය නියොගකිරීම ප්‍රශංසාකරණු නොලැබේ, බ්‍රාහමණයා ලද්දාවූ ධනයද දුකින්ද නොදෙයි.

2. වීරපුරුෂයෙක් නියොගකරණ ලද්දේ ධනය වියදම්කට යුතුකල එකාන්තයෙන් රාජ්‍යය ගන්නාපිණිස භයදක්වන්නේය, නෑයා සියලු කටයුත්තෙහි වැද ඥාතියක්හුමෙන් සියලු සම්පත්තිය තමා අයත්කෙරේ.

3. පුරාණ කාලයෙහි සෙවකයා නියොගකිරීමෙහි නියුක්ත ඇමතියෙක්වූයේ අපරාධකරණකල්හිද භයනොවෙයි, වළක්වන්නෙක් නැත්තාවූ හෙතෙම ස්වාමියාට අගෞරවකොට හැසිරෙන්නේය.

4. ස්වාමියාහට උපකාරකළ තැනැත්තෙක් ප්‍රධානාමාත්‍යධූර යෙහි සිටියේනම් තමාගේ දෝෂයනොදනී, පළමුකළඅනුකූලබව ඉදිරියෙහිකොට සියලු දෝෂයම මකයි.

---

1. බ්‍රාහ්මණඃ ක්ෂත්‍රියො බන්ධුර්ණාධිකාරෙ ප්‍රශස්‍යතෙ,
බ්‍රාහ්මණඃ සිද්ධමප්‍යර්ථං කෘච්ඡ්‍රේණාපි න යච්ඡති.

2. නියුක්තඃ ක්ෂත්‍රියො ද්‍රව්‍යෙ ඛඩ්ගං දර්ශයතෙ ධ්‍රැවම්,
සර්වස්වං ග්‍රසතෙ බන්ධුරාක්‍රම්‍ය ඥාතිභාවතඃ.

3. අපරාධෙ ‘පි නිඃශඞ්කො නියොගී චිරසෙවකඃ,
ස ස්වාමිනමවඥාය චරෙච්ච නිරවග්‍රහඃ.

4. උපකර්තාධිකාරස්ථඃ ස්වාපරාධං න මන්‍යතෙ,
උපකාරං ධ්වජීකෘත්‍ය සර්වමෙව විලුම්පති.

1. සියලු රහස් ක්‍රීඩා දන්නාවූ ඇමතියෙක් යම් කාරණයෙකින් තෙමේ රජමෙන් හැසිරෙන්නේ සියලු කාරණයෙහි ස්වාමිභාවය දක්වාද ඔහුවිසින් හැමකල්හි පූරුද්ද හෙතුකොටගෙණ ඒකාන්තයෙන් රජුට අගෞරව කරණුලැබේ.

2. පින්වත් මහරජ දූෂ්‍යසිතින් යුක්තවූ ඉවසීමෙන් යුක්තව සම්මුඛයෙහිවැඩ කැමතිබව ප්‍රකාශකරණ ඇමතියා නියමයෙන් සියලු අවැඩකරන්නෙක් වෙයි, මේ කාරණයෙහි ශකුනිනම් දුර්‍යොධනරජහුගේ ඇමතිද, ශකටාරනම් නන්දරජහුගේ ඇමතිද උදාහරණවෙත්.

3. ධනයෙන් වැඩුනු සියලු ජනතෙම මතුකාලයෙහි හැම කල්හි මනාගුරූපදෙශ නොපිළිගන්නෙක් වන්නේය, ඓශ්වර්‍ය්‍යය සිතළඟු කරන්නේය, මේතෙම පණ්ඩිතයන්ගේ උපදෙශයවෙයි.

4. ලත්දන වියදම්නොකිරීමය, ධනාදියගෙණ රාජසන්තක ද්‍රව්‍යමාරුකිරීමය, අනුන්අදහස් අනුවපැවැත්මය, සියලු කටයුත්තෙහි ඉවසීමය, අනුවතබවය, ස්ත්‍රීසම්භොගය යන මේ සියල්ල ඇමතියාහට දූෂ්‍යකරණ කරුණුයි.

5. රජුගේ ධනය නැසීමය, රජ්ජුරුවන් ඇඑනේද නැද්දැයි අදහස දැනගන්නාපිණිස නිතර පරීක්ෂාකිරීමය, ප්‍රියවූ වස්තුන් අනුන්ටදීමය, එසේම කටයුතුක්‍රියාව වෙනස්කිරීමය යන මේ කරුණුද ඇමතියා දූෂ්‍යකරන්නාහුයි.

6. නියොගකරණ සෙවකයෝ පීඩාකරණ ලද්දාහු රජහුගේ සිත්හි පැවති රහස් සියලුතැන්හි ප්‍රකාශකෙරෙත්, බොහෝ සෙයින් දුෂ්ටව්‍රණයන්මෙන් වෙත්මැයි.

---

1. උපාංශුක්‍රීඩිතො ‘මාත්‍යඃ ස්වයං රාජායතෙ යතඃ,
අවඥා ක්‍රියතෙ තෙන සදා පරිචයාද්ධ්‍රුවම්.
2. අන්තර්දුෂ්ටඃ ක්ෂමාමාත්‍යක්තඃ සර්වානර්ථකරඃ කිල,
ශකුනිඃ ශකටාරශ්ච දෘෂ්ටාන්තාවත්‍ර භූපතෙ.
3. සදායත්‍යාමසාධ්‍යඃ ස්‍යාත් සමෘද්ධඃ සර්ව එව හි,
සිද්ධානාමයමාදෙශ ඍද්ධිශ්චිත්තවිකාරිණී.
4. ප්‍රාප්තාර්ථාග්‍රහණං ද්‍රව්‍යපරිවර්තනං නිරොධනම්,
උපෙක්ෂා බුද්ධිහීනත්වං භොගොමාත්‍යස්‍ය දූෂණම්.
5. නියොග්‍යාර්ථග්‍රහොපායො රාඥං නිත්‍යපරීක්ෂණම්,
ප්‍රතිපත්තිප්‍රදානං ච තථා කර්මවිපර්‍ය්‍යයඃ.
6. නිෂ්පීඩිතා වමන්ත්‍යුච්චෛරන්තඃසාරං මහීපතෙඃ,
දුෂ්ටව්‍රණා ඉව ප්‍රායො භවන්ති හි නියොගිනඃ.

1. සෙවකයාවිසින් රැස්කරණලද ධනයෝ රජහු විසින් නැවත නැවත පරීක්‍ෂා කටයුත්තාහුය, ස්නානය කරණකල අඳනාකඩ එක්වරක් මිරිකනලද්දේ කිමෙක්ද බොහෝවූ ජලය නිකුත්කෙරේද.

මේ සියල්ලදැන නීතියවූ පරිද්දෙන් පැවැත්විය යුතුවෙයි" කියයි. ඒ අසාපිඞ්ගලකතෙම "මේ කරුණු විද්‍යමානවෙයි, එසේද මේ දමනක කරටක දෙදෙන මාගේ වචන නොකෙරෙති" යි කියයි. ස්තබ්ධකර්‍ණයා මේතෙම සියලු පරිද්දෙන් නුසුදුසුවෙයි.

2. යම්හෙයකින්—රජතෙමේ අණ කඩකරන්නාවූ පුත්‍රයාටද ක්‍ෂමා නොකරන්නේය, පින්වත් සහොදරය! මෙසේකල්හි ජීවත්වන රජක්හුගේද සිතුයම්න්කළ රජරුවකගේද වෙනස කවරේද.

3. අනිකෙක්ද—අහංකාර යුක්තයාගේ කීර්තිය නසී, නියමවූ සිත් නැත්තාහුගේ මිත්‍රභාවය නසී, ඉන්ද්‍රියයන් වශගකිරීමෙහි නොයෙදුනාහුගේ වංශයද, ධනයෙහි ගිජුවූ තැනැත්තාගේ ධර්‍මයද නසී. විපත්තිවලට ඇළුනහුගේ ශාස්ත්‍රඵලයවූ හික්මීමද, වියදම්කිරීමෙහි අශූනවූවාහුගේසැපයද, පරීක්‍ෂාරහිත අමාත්‍යයන් විසින් පිරිවරණලද රජහුගේ රාජ්‍යයද නසී.

4. විශෙෂයෙන්ද—රජතෙමේ සොරුන්ගෙන්ද, විරුඩවූවන්ගෙන්ද, සතුරන්ගෙන්ද, රජුන්ට ප්‍රියව වසන ඇමතියන්ගෙන්ද, තමාගේ ලෝභයකෙරෙන්ද, පියාමෙන් ලොකයා පාලනයකරන්නේය.

පින්වත් සහොදරය! සියලුලෙසින් මාගේවචනය කරණු ලැබේවා. අද අපවිසින් ආහාරගැන්මද කරණ ලද්දේමය.

---

1. මුහුර්නියොගිනො බොධ්‍යා වසුධාරා මහීපතෙඃ,
සකෘත් කිං පීඩිතං ස්නානවස්ත්‍රං මුඤ්චෙද්බහූදකම්.

2. යතඃ :—ආඥාභඞ්ගකරාන් රාජා න ක්‍ෂමෙත සුතානපි,
විශෙෂඃ කො නු රාඥශ්ච රාඥශ්චිත්‍රගතස්‍ය ච.

3. අන්‍යච්ච :– ස්තබ්ධස්‍ය නශ්‍යති යශො, විෂමස්‍ය මෛත්‍රී
නෂ්ටෙන්ද්‍රියස්‍ය කුලම්, ඊපරස්‍ය ධර්මඃ,
විද්‍යාඵලං ව්‍යසනිනඃ කෘපණස්‍ය සෞඛ්‍යං
රාජ්‍යං ප්‍රමත්තසචිවස්‍ය නරාධිපස්‍ය.

4. විශෙෂතශ්ච :-තස්කරෙභ්‍යො වියුක්තෙභ්‍යඃ ශත්‍රුභ්‍යො නෘපවල්ලභාත්
නෘපතිර්නිජලොභාච්ච ප්‍රජා රක්‍ෂෙත් පිතෙව හි.

ගොයම්පල කන්නාවූ මේ සඤ්ජීවකයා ආහාරය පිළිබඳව ප්‍රධානත්වයෙහි යෙදිය යුතුය. මොහුගේ වචනයෙන් එසේකළ කල සියලු නෑයන්ගේ හැරීමෙන් මහත්ප්‍රේමයෙන් පිඞගලක සඤ්ජීවක දෙදෙනාගේ කාලය ඉක්මේ. ඉක්බිත්තෙන් සෙවකයන්ට පවා ආහාරදීමෙහි ආදරනැතිබව දක්නාබැවින් දමනක කරටක දෙදෙන ඔවුනොවුන් සඳහා සිතත් දමනකතෙමේ එහෙයින් මේ කාරණයෙහි කුමක් කටයුතුද? මේ දොෂය තමාවිසින්ම කරණලද්දේය. තමාවිසින් කරණලද දොෂය ඇතිකල තැවීමද සුදුසුනොවෙයි.

ඇසිල්ලක් විමසා පියාසබඳ! මොවුන් දෙදෙනාගේ මිත්‍රභාවය යම්සේ මාවිසින් වහාම කරවනලදද එසේම මිත්‍රභාවය නැතිකොට බිඳුවීමද කටයුතුය.

1. යම්හෙයකින්—සිතුයම්කිරීමෙහි උගත්තෝ සිතුයම්කොට සමතලා භූමියෙහි නදීපර්වතාදීන් දක්වන්නාක්මෙන් දක්‍ෂජනයෝ අසත්‍යයන්ද සත්‍යයන්කොට අවබොධ කරවත්.

කරටකතෙමේ "එසේවේවා, එසේවූවත්, මොවුන් දෙදෙනාගේ සවභාවයෙන් හටගත් මහත් සෙනහය කෙසේනම් බිඳිය හැකිදැයි" කියයි. දමනකතෙමේ අනිකෙක් සිතිය යුතුය. එසේද කියනලදී,

2. යම් කටයුත්තෙක් උපායෙන් සිදුකළහැකිද ඒ කටයුත්ත වික්‍රම දැක්වීමෙන් සිදුකළනොහෙයි. කැවිඩී රන්හුය පිළිබඳ උපාය කරණකොටගෙණ තියුණු විෂයෙන් යුක්තසර්පයා මැරවී යයි කියයි.

ඒ "කෙසේද"යි? කරටකතෙමේ විචාරයි. "දමනකතෙම කියයි. එක්තරා ගසෙක්හි කවුඩු අඹු සැමි දෙදෙනෙක් වසත්. ඔවුන් දෙදෙනාගේ දරුවෝ ගස්බිලයෙහි වසන සර්පයා විසින් කණලද්දාහු වෙති. ඉක්බිත්තෙන් නැවත දරිඇති කැවිඩී "ස්වාමිය! මේ ගස හරිණුලැබේවා, මේ ගසෙහි සර්පයා වසනතුරු අප දෙදෙනාගේ දරුවෙක් කිසිකාලයෙක්හිද ජීවත් නොවන්නේය.

---

1. යතඃ :—අතථ්‍යාන්‍යපි තථ්‍යානි දර්‍ශයන්ති හි පෙශලාඃ,
සමෙ නිම්නොන්නතානීව චිත්‍රකර්‍මවිදො ජනාඃ.

2. උපායෙන හි යච්ඡක්‍යං න තච්ඡක්‍යං පරාක්‍රමෛඃ,
කාකී කනකසූත්‍රෙණ කෘෂ්ණසර්පමඝාතයත්,

1. යම්හෙයකින්—සැමියා ඉක්මපවත්නා අඹුවද, කපට මිත්‍රයාද, නියොගකළ යමක් පිළිනොපැද උත්තරදෙන මෙහෙකරුද, සර්පයන්සහිත ගෙයි විසීමද, යන මේතෙම මරණයට කාරණයමය, සැකයෙක් නැත්තේය." යි කීය.

කවුඩුතෙම "සොඳුර! භයනොවිය යුතුය, විටින්විට මා විසින් මේ සර්පයාගේ මහත් අපරාධය ඉවසන ලද්දේය. දැන් නැවත නොසිවසියයුතුයයි" කියයි. කැව්ඩීතොමෝ "බලඇත්තාවූ මේ සර්පයාහා සමග පින්වත්තෙමේ කෙසේනම් ඩබරකිරීමට පොහොසත්දැයි? කියයි. එසඳ කවුඩුතෙම මේ කල්පනාවෙන් කම්නැත.

2. යම්හෙයකින්—යමක්හට බුද්ධියඇත්තීද, ඔහට වීර්‍යයය ඇත්තේය, බුද්ධියනැත්තාහට වූකලි වීර්‍යයෙක් කොයින්ද? මදයෙන් අහංකාරවූ සිංහතෙමේ සාවා විසින් නසනලද්දේය, මේ කියනුලබ[illegible] කථා[illegible]වන් බලව" යි කියයි.

ඒ කෙසේදැයි? කැව්ඩී අසයි. කව්ඩුතෙමේ කියයි.

මන්දරනම් පර්වතයෙහි දුර්දාන්තනම් සිංහයෙක්ඇත. ඒ සිංහතෙමේද හැමකල්හි සිව්පාවුන් මැරීමකරන්නේමහිදී. ඉක්බිත්තෙන් සියලු සිව්පාවුන් විසින් එක්සිත්ව දෙවයන්වහන්ස! "එකවර සියලු සිව්පාවුන්මැරීම කුමක්සඳහා කරණුලැබේද? නුඹවහන්සේගේ ආහාර පිණිස අපිම හැමදවස්හි එක්එක් සිව්පාවා සතුටු පඬුරක්කොට එවන්නම්හ" යි සිංහතෙමේ අවබොධකරවනලද්දේය. සිංහයා විසින් "ඉදින් මෙතෙම පින්වතුන්ගේ අභිප්‍රායනම් ඒ අභිප්‍රායවූකලි එසේවේවා" යි කියන ලද්දේය. එතැන්පටන් දවසක්පාසා පඬුරුකරණලද එක්එක් සිව්පාවා කමින්හිඳී. ඉක්බිත්තෙන් කිසිකලෙක්හි එක්තරා මහලු සාව කුට පිළිවෙළ නියමවූ එළඹසිටියේය. එකල්හි ඒ සාවාසිතනුයේ,

3. දිවිරැකගන්නා පිණිස මැරීමට උත්සාහ කරන්නාහට ජනයාවිසින් හික්මීමවූකලි දක්වනුලැබේ, ඉදින්මරණයට පැමි

---

1. යතඃ :—දුෂ්ටා භාර්‍ය්‍යා ශඨං මිත්‍රං භෘත්‍යශ්චොත්තරදායකඃ,
සසර්පෙ ච ගෘහෙ වාසො මෘත්‍යුරෙව න සංශයඃ."

2. යතඃ :—බුද්ධිර්‍යස්‍ය බලං තස්‍ය නිර්බුද්ධෙස්තු කුතො බලම්,
පශ්‍ය සිංහො මදොන්මත්තඃ ශශකෙන නිපාතිතඃ."

3. ත්‍රාසහෙතොර්විනීතිස්තු ක්‍රියතෙ ජීවිතාශයා,
පඤ්චත්වං චෙද්ගමිෂ්‍යාමි කිං සිංහානුනයෙන මෙ.

ණෙම් නම්එසේකල සිංහයාසමීපයේ හික්මීම දැක්වීමෙන් මට කිනම්වූ ඵලයෙක්ද.

එහෙයින් සෙමින්සෙමින් සමීපයට යන්නෙමැයි මෙසේසිති.

ඉන්පසු සායෙන් වෙහෙසුනු සිංහයාද කොපයෙන් "තෝ කවරහෙයකින් කල්පසුකොට ආයෙහිද"යි? ඒසාවාටකීය. සාවාද "මම අපරාධයක් නොකෙළෙමි, මාර්ගයෙහි අනික් සිංහයක්හු විසින් බලාත්කාරයෙන් අල්වාගන්නා ලද්දෙමි. ඒ සිංහයාගේ සමීපයට නැවත එනු පිණිස අවිරීමකොට ස්වාමිහට දැන්වීම පිණිස මෙතැනට ආවෙමැ" යි කීය. එවිට සිංහයා රැගැනිව "වහාගොස් මට දක්වව, ඒ දුර්ජනයා කොතන සිටින්නේද"? යි කීය. එකල්හි සාවා ඒ සිංහයාගෙණ ගැඹුරුළිඳක් සමීපයට ආය මෙහි අවුත් "ස්වාමීතෙමේ බැලුවමැනවැ"යි කියා ඒ ළිඳේ දියෙහි ඒ සිංහයාගේම ඡායාරූපය දැක්වූයේය. ඉක්බිත්තෙන් මේ සිංහතෙමේ අහංකාරයෙන් පිරුණේ ඒ ඡායාව මත්තේ පැන මියගියේය. බුද්ධිය යමක්හට ඇත්තේද යනාමේ ආදිය එහෙයින්මම කියම්යි කීය. එපවත්අසා කැවිඩී "මාවිසින් අසනලද්දේය කුමක් කට යුතුදැයි කියව" යි කියයි. කවුඩුතෙම. "සොඳුර! නුදුරුව තිබෙනවිලෙහි රාජපුත්‍රතෙම නිබඳඅවුත් ස්නානය කෙරෙයි. ඒ ස්නානයෙහි ගලමතුයෙහි ඒ රාජපුත්‍රයාගේ දෙහයෙන්මුදා තබන ලද රන්හුයතුඩින් උසුලාගෙණවුත් මේ ගස්බිලයෙහි තබන්නෙහිය" ඉක්බිත්තෙන් කිසිදිනයෙක රන්හුයගල මතුයෙහි තබා ජලස්නානය පිණිස රාජපුත්‍රයා විලටවත්කල කැවිඩිය විසින් රන්හුය ගෙණවුත් ගස් බිලයෙහි තබනලද්දේය. ඉක්බිත්තෙන් රන්හුය විමසනු පිණිස හාත්පසහැසිරෙණ රාජපුරුෂයන් විසින් ගස්බිලයෙහි දක්නාලද්දාවූ සර්පයා මරණලද්දේය. උපායෙන්වූකලි යමක්කළහැකිද යනාමේ ආදිය එහෙයින් මම කියම් කියයි. කරටකතෙම ඉදින් එසේවීනම් එසේකල්හියව, තුබට මාර්ගයෙහිදී විපත්තිරහිත වෙත්වයි කියයි. ඉක්බිත්තෙන් දමනකයා පිඞ්ගලකරජුගේ සමීපයට ගොස් නමස්කාරකෝට "දෙවයන්වහන්ස! විපත්ති යකැයි සිතන්නෙම් දන්වාලීමට ආයෙමි.

1. යම්හෙයකින්—විපත්තිකාලය එළඹසිටිකල්හිද, නුසුදුසු මගටබස්නා කල්හිද, කටයුත්තකිරීමට සුදුසු කාලය ඉක්මයන

1. යතඃ:—ආපද්‍යුන්මාර්ගගමනෙ කාර්‍ය්‍යකාලාත්‍යයෙෂු ච,
කල්‍යාණවචනං බ්‍රූයාදපෘෂ්ටොපි හිතො නරඃ.

කල්හිද, වැඩසොයන ජනතෙමේ නොවිචාරණ ලද්දේද ශුභවූ වැඩදායක වචනය කියන්නේය.

1. අනිකෙක්ද—රජතෙමේ මනාකොට අනුශාසනා කරණ ලද්දාවූ රාජ්‍යයෙන් ලැබියයුතු සුවයට ස්ථානවෙයි. ඇමතිතෙමේ ජනයන් සතුටුකිරීම ආදීවූ ක්‍රියාවට ස්ථානවෙයි. රටවැස්සන්ට අනුශාසනා කිරීමෙහි පසුබටවූ ඇමතිතෙමේ පාපය විසින් ස්පර්ශකරණුලැබේ.

මේතෙම අමාත්‍යයන්ගේ නියමයයි.

2. මරණය ශ්‍රෙෂ්ඨවන්නේය, ඉසසිඳීමද උතුම්වෙයි. ස්වාමීහූගේ රාජ්‍යපදවියට පැමිණීමයයි කියනලද පාපයට කැමැත්තාහට අනුශාසනා නොකිරීමවූකලි උතුම්නොවෙ" යි කීයේය.

පිඞ්ගලකරජතෙමේ "එසේකල පින්වත්තෙමේ කුමක්කියනු කැමැත්තේද" යි ? ආදරසහිතව කියයි. දමනකතෙම "මෙසඤ්ජීවකයා වනාහි නුඹවහන්සේ කෙරෙහි සෙවකයාගේ පැවැත්ම ඉක්මවා හැසිරෙන්නේයයි දක්නාලැබේ. එසේද අපගේ ඇස්හමුවෙහි ස්වාමීන්වහන්සේගේ තෙජසය උත්සාහය මන්ත්‍රණය යන ශක්තිත්‍රයට නින්දාකොට රාජ්‍යයට පැමිණීමටම ප්‍රාර්ථනා කෙරෙයි කියයි.

මෙපවත් අසා පිඞ්ගලකයා භයසහිතව විස්මපත්ව මුවෙණ් නොබැණසිටියේය. දමනකතෙම නැවත "දෙවයන්වහන්ස ! සියලු ඇමතියන්ට ආදරනොකොට නුඹවහන්සේ විසින්ම මේ තෙම ස්යලු කටයුතු ඉසිලීමපිණිස නියොගකරණ ලද්දේය. මේ ක්‍රියාවද බලවත්දෝෂයෙක.

3. යම්හෙයකින්—ඇමතියාද රජ්ජුරුවන්ද අතිශයින් වැඩුනු කල්හි ඓශ්වර්‍ය්‍යයයි කියනලද ශ්‍රීතොමෝ පාදයන්එල්බ සිටිනීය, ඕතොමෝ ස්ත්‍රීස්වභාවයෙන් යුක්තබැවින් ඔවුන් දෙදෙනාගේ බර ඉසිලිය නොහෙන්නී එකක්හු හරණීය.

---

1. අන්‍යච්ච :—භොගස්‍ය භාජනං රාජා මන්ත්‍රී කාර්‍ය්‍යස්‍ය භාජනම්,
රාජකාර්‍ය්‍යපරිධ්වංසී මන්ත්‍රී දෝෂෙණ ලිප්‍යතෙ.

2. වරං ප්‍රාණපරිත්‍යාගඃ ශිරසො වාපි කර්තනම්,
න තු ස්වාමිපදාවාප්තිපාතකෙච්ඡොරුපෙක්‍ෂණම්.

3. යතඃ :- අත්‍යුච්ඡ්‍රිතෙ මන්ත්‍රිණි පාර්ථිවෙ ච විෂ්ටභ්‍ය පාදාවුපතිෂ්ඨතෙ ශ්‍රීඃ
සා ස්ත්‍රීස්වභාවාදසහා භරස්‍ය තයොර්ද්වයොරෙකතරං ජහාති.

1. අනිකෙක්ද—රජතෙම එක් ඇමතියක්හු යම් කලෙක්හි රාජ්‍යයෙහි ප්‍රධානකෙරේද, ඒ ඇමතියා අහංකාරය හෙතුකොට ගෙණ උඩඟුබව ආශ්‍රයකෙරේ, ඒ ඇමතියාද මදයෙන් උපන්නාවූ වික්ෂිප්තභාවයෙන් රජුට විරුඬව භෙදයටපැමිණේ, විරුඬ භාවයට පැමිණි ඔහුගේ සිත්හි අනුන්ට යටත්නොව තමාප්‍රධානත්වයට ආශාව ස්ථානයක්කෙරේ, ඒ තමා ප්‍රධානවීමට කළකැමැත්තෙන් ඒ ඇමතිතෙමේ රජුගේ දිවිනැසීම කෙළවරකොට පවත්නා ද්‍රෝහයකෙරේ.

2. එසේදකියනලදී—විෂතැවරුණවූ බතද, මූලඉගිලී සෙල්වෙන්නාවූ දතද, කූරවූ ඇමතිද යනමොවුන්ගේ මුලින් උදුරා හැරීම සැපවෙයි.

3. තවද—යම් රජෙක් රජුගේ ඓශ්වර්‍ය්‍යය අමාත්‍යයාට අත්පත්කරන්නේද, ඒ රජතෙමේ ඒ ඇමතියාට මරණාදි විපත්තියක් ඇතිකල්හි සැරයටිය ගෙණයන්නවුන්ගෙන් තොරවූ අන්ධයෙක්හු මෙන් කලතිරීමට පැමිණෙන්නේය.

හේ තෙමේද සියලු කටයුත්තෙහි තමන් කැමැත්ත වශයෙන්පවතී. එහෙයින් ස්වාමිහට යමක් රුචිද ඒ රුචිවූවක් කරව මම මේ හෙතුවෙන්ද දනිමි.

4. යම් ජනයෙක් ඓශ්වර්‍ය්‍යය නොකමැතිවේද එබඳු පුරුෂයෙක් ලොවනැත්තේය. කවරනම් ජනයෙක් අන්‍යයාගේ සිත්කලුවූ භාර්‍ය්‍යාව ආශාසහිතව නොබලන්නේද,,.

සිංහතෙමේ ඇසිල්ලක්කල් විමසා පිණැත්ත! ඒ එසේවෙයි, එතකුදුවූවත් සඤ්ජීවකයා හා සමග මාගේ සෙනහය බලවත් වෙයි.

---

1. අපරඤ්ච:—එකං භූමිපතිඃ කරොති සචිවං රාජ්‍යෙ ප්‍රධානං යදා
තං මොහාච්ඡ්‍රයතෙ මදඃ ස ච මදාලස්‍යෙන නිර්ව්විද්‍යතෙ,
නිර්ව්විණ්ණස්‍ය පදං කරොති හෘදයෙ තස්‍ය ස්වතන්ත්‍රස්පෘහා
ස්වාතන්ත්‍ර්‍යස්පෘහයා තතඃ ස නෘපතෙඃ ප්‍රාණාන්තිකං ද්‍රුහ්‍යති.

2. විෂදිග්ධස්‍ය භක්තස්‍ය දන්තස්‍ය චලිතස්‍ය ච,
අමාත්‍යස්‍ය ච දුෂ්ටස්‍ය මූලාදුද්ධරණං සුඛම්.

3. යඃ කුර්‍ය්‍යාත් සචිවායත්තාං ශ්‍රියං තද්ව්‍යසනෙ සති,
සොන්ධවජ්ජගතීපාලඃ සීදෙත් සඤ්චාරකෛර්ව්විනා.

4. න සොස්ති පුරුෂො ලොකෙ යො න කාමයතෙ ශ්‍රියම්,
පරස්‍ය යුවතිං රම්‍යාං සාකාඞ්ක්‍ෂං වීක්‍ෂතෙ න කඃ.

1. බලව—අපරාධයන් කරන්නාවූද යම් ජනයෙක් ප්‍රීතියට ස්ථානද ඒ තෙමේම ස්වභාවයෙන් හටගත් මිත්‍රයෙක් වෙයි, නොයෙක් රෝගයෙන් දූෂ්‍යකරණලද්දාවූද ශරීරය කවරක්හට නම් ප්‍රියනොවන්නේද?

2. අනිකෙක්ද—අවැඩකරන්නාවූද යමෙක්තෙම ප්‍රීතිකරන්නේද ඒ තෙමේම ප්‍රියවෙයි, දවනලද ප්‍රධානවූ ගෙයින්යුක්තවූද ගින්නකෙරේ අගෞරවයෙක් කවරජනයක් හට වන්නේද? යි කියයි.

දමනකතෙමේ දෙවයන්වහන්ස! ඒ තෙමේ දෙෂමය.

3. යම්හෙයකින්—රජතෙමේ පුත්‍රද ඇමතිද සන්‍යාසිද යන යමක්හු කෙරෙහිම සෙනහසහිතව ඇසපිහිටුවාද, ඒ ජනතෙම ඓශ්වර්‍ය්‍යය විසින් සෙවනය කරණුලැබේ.

4. දෙවයන්වහන්ස! අසතුලැබේවා—ප්‍රියනුවූයේනමුදු හිතවූ ද්‍රව්‍යය අනුභවකළකල එයදීරාකෙළවර සැපදේ, යම් ස්ථානයෙක්හි මනාඅවවාදකරන්නෙක්ද මනාඅවවාද පිළිගන්නෙක්ද විද්‍යමානවේද ඔහුකෙරේ සම්සම්පත්තීහු ඇලීසිටිත්.

තුබවහන්සේ විසින්ද පුරාණ කාලයෙහි ඇමතියන්හැර පියා කුලයහා ස්වභාවද නොදැන මේ අලුත පැමිණි සෙවකයා ප්‍රධානත්වයෙන් සියලු කටයුත්තෙහි නියොගකරණලද වෙයි, ඒ ක්‍රියාවද තරම්නොවෙයි.

5. යම්හෙයකින්—පුරාණකාලයෙහි ඇමතියන්ට දෙෂාරෝපණයකොට නුපුරුදු ඇමතියන් නියොග නොකරන්නේය, යම් හෙයකින් මේ ඇමතියාට වඩනාඅතිශයින් රහස් ප්‍රකාශකිරීමෙන් රාජ්‍යය විනාශකරණ අන්‍යයෙක් නැත්තේද එහෙයිනැයි කියයි.

---

1. පශ්‍ය :—කුර්වනනපි ව්‍යලීකානි යඃ ප්‍රියඃ ප්‍රිය එව සඃ,
අශෙෂ දෙෂදුෂ්ටොපි කායඃ කස්‍ය න වල්ලභඃ?

2. අන්‍යච්ච :—අප්‍රියාණ්‍යපි කුර්වාණො යඃ ප්‍රියඃ ප්‍රිය එව සඃ,
දග්ධමන්දිරසාරෙපි කස්‍ය වහ්නාවනාදරඃ.

3. යතඃ :—යස්මින්නෙවාධිකං චක්ෂුරාරොපයති පාර්ථිවඃ,
සුතෙ 'මාත්‍යෙ 'ප්‍යුදාසීනෙ ස ලක්ෂ්ම්‍යාශ්‍රයතෙ ජනඃ.

4. අප්‍රියස්‍යාපි පථ්‍යස්‍ය පරිණාමඃ සුඛාවහඃ,
වක්තා ශ්‍රොතා ච යත්‍රාස්ති රමන්තෙ තත්‍ර සම්පදඃ.

5. යතඃ :—මූලභෘත්‍යාපරාධෙන නාගන්තූන් ප්‍රතිපාලයෙත්,
නාතඃ පරතරො 'ස්ත්‍යාස්ති රාජ්‍යභෙදකරො යතඃ,

සිංහතෙමේ මහත් ආශ්චර්‍ය්‍යවෙයි. යම්හෙයකින් මා විසින් මේ සඤ්ජීවකතෙම අභය වචනකියා වැඩීමට පමුණුවන ලදද එහෙයින් කෙසේ සතුරුව පවත්නේදැයි? කියයි. දමනකතෙම දෙවයන්වහන්ස!

1. දුර්ජනතෙම බොහෝකල් සතුටුකරණු ලබන්නේදතමන් ස්වභාවවූ දුර්ජනභාවය නොහරියි, කුමක්මෙන්දයත්, මැඩීමය, තෙල්ගැල්වීමය යන මේ උපායවලින් නැමීමවලක්වා සෘජුභාවයට පමුණුවනලද සුනඛවාලධියමෙනි.

2. අනිකෙක්ද—තවනලද්දවූද, තෙල් ගල්වා මඩනලද්දවූද, හුවලින් බඳනාලද්දවූද, දොළොස් අවුරුද්දකින් බන්ධනයෙන් මුදනලද බලුවල්ගය ස්වභාවවූ ඇදබවට පැමිණියේය.

3. අනිකෙක්ද—ආහාර වස්ත්‍රාදියෙන් පොෂ්‍යය කිරීමද, ගෞරවකිරීමද, ස්වභාවයෙන් දුර්ජනවූවන්ගේ සන්තොෂය පිණිස කවර හෙයකින්වන්නේද? විෂවෘක්ෂයෝ අමෘතයෙන් තෙමූ කල්හිද මධුරවූ මනාඵලයෝ නොමඋපදවත්.

4. එහෙයින්මම කියමි—යමක්හුගේ පරාජය නොකමැතිද නොමවිචාරණලද තැනැත්තේද ඒ ජනයාට වැඩෙනකාරණය දක්වන්නේය, මේතෙමේ සත්පුරුෂයන්ගේ ධර්මයම වෙයි, මෙයින් අන්පරිද්දෙකින්වූයේ අධර්මයයි.

5. එසේද කියනලදී—යමෙක් අශුභයෙන් වළකාද හෙතෙම ප්‍රේමඇත්තේවෙයි, යමෙක් දොෂරහිතද ඒ තෙමේම ක්‍රියාව වෙයි. යමක්තොමෝ ස්වාමිපුරුෂයාගේ කැමැත්තට අවිරුද්ධව

---

1. දුර්ජනඃ ප්‍රකෘතිං යාති සෙව්‍යමානො 'පි නිත්‍යශඃ,
ස්වෙදනාභ්‍යඤ්ජනොපායෛඃ ශ්වපුච්ඡමිව නාමිතම්.

2. අපරඤ්ච :—ස්වෙදිතො මර්දිතශ්චෛව රජ්ජුභිඃ පරිවෙෂ්ටිතඃ,
මුක්තො ද්වාදශභිර්වර්ෂෛඃ ශ්වපුච්ඡඃ ප්‍රකෘතිං ගතඃ.

3. අන්‍යච්ච :—වර්ධනං වාථ සම්මානං ඛලානාං ප්‍රීතයෙ කුතඃ,
ඵලන්ත්‍යමෘතසෙකෙපි න පථ්‍යානි විෂද්‍රුමාඃ

4. අතො 'හං බ්‍රවීමි :—අපෘෂ්ටො 'පි හිතං බ්‍රූයාත් යස්‍ය නෙච්ඡෙත් පරාභවම්.
එෂ එව සතාං ධර්මො විපරීතමතො 'න්‍යථා.

5. තථා චොක්තම් :—ස ස්නිග්ධො කුශලාන්නිවාරයති යස්තත්කර්ම යන්නිර්මලං
සා ස්ත්‍රී යානුවිධායිනී ස මතිමාන් යඃ සද්භිරභ්‍යර්ච්‍යතෙ,
සා ශ්‍රීර්යා න මදං කරොති ස සුඛී යස්තෘෂ්ණයා මුච්‍යතෙ
තන්මිත්‍රං යදකෘත්‍රිමං ස පුරුෂො යඃ ඛිද්‍යතෙ නෙන්ද්‍රියෛඃ.

හැසිරෙන්නිද ඕහොමෝ සත්‍රීවන්නිය, යම් ජනයෙක් තෙමේ පණ්ඩිතයන් විසින් පුදනුලැබේද හෙතෙම නුවණැත්තේවෙයි, යම් ඓශ්වය්‍යීයක් තොමෝ අහංකාරය නොකරන්නිද ඕහොමෝ ඓශ්වය්‍යීය නම්වන්නිය, යම් ජනයෙක් තලතිරුණුවූ ආශාව විසින් මැඩපවත්වනු නොලැබේද හෙතෙම සැපතින් යුක්තවූයේවේ, යමෙක්තෙම ස්වභාවයෙන් හටගත් මිත්‍රධර්‍මයෙන් යුක්තද හෙතෙම්මිත්‍රවේ, යම් තැනැත්තෙක් ඉන්ද්‍රියයන් විසින් වශගකරණු නොලැබේද හෙතෙම පුරුෂයෙක්වේ.

සඤ්ජීවකයාකෙරේ සෙනහයෙන් ඇළුනාවූ ස්වාමිතෙමේ මා විසින් දන්වනලද්දේ නමුදු ඉදින් සඤ්ජීවකයාකෙරේ විශ්වාසයෙන් වෙන්නොවේද එකල්හි සෙවකයාගේ දොෂයෙක් නැත්තේය.

1. එසේද කියනලදී—ධනාශාවෙන් ඇළුනාවූ රජතෙමේ කටයුතුක්‍රියාද වැඩදායක වචනයද පරීක්ෂානොකෙරෙයි, මදයෙන් මත්වූ ඇතක්හුමෙන් තමා කැමැත්තාට අනුවපවත්නේ කැමතික්‍රියාවක්ම කෙරේ, පසුව යම් කලෙක හෙතෙම අහංකාරයෙන් මිරිකුනේ පිළියම්කළ නොහෙන විපත්තියෙහි වැටේද එකල්හි සෙවකයාකෙරේ දොෂයන්නගයි, තමාගේ නොහික්මී පැවැත්ම නොදනී කියයි.

2. පිඬගලකතෙමේ සලකයි. අනුන්විසින් කරණලද දොෂය නගා අන්‍යයන්ට අඬුවම් නොකරන්නේය. තිමෙක්ද මේතෙම අසත්පුරුෂයෙක්ද සත්පුරුෂයෙක්දැයි තෙමේ පරීක්ෂාකොට දැන අඬුවම්කළ යුත්තාට අඬුවම්ද සත්කාරකටයුත්තාට සත්කාරද කරන්නේය.

3. එසේද කියනලදී—මේතෙමේ උපකාරකළ එකෙකැයි හෝ මේ තෙම අනුපකාරකළ එකෙකැයි මෙසේ ගුණදොෂදෙක

1. තථාච :— නෘපඃ කාමාසක්තො න ගණයති කාර්‍ය්‍යං න ච හිතං
යථෙෂ්ටං ස්වච්ඡන්දඃ ප්‍රවිචරති මත්තො ගජ ඉව
තතො මානධ්මාතඃ ස පතති යදා ශොකගහනෙ
තදා භෘත්‍යෙ දොෂාන් ක්ෂිපති න නිජං වෙත්ත්‍යවිනයම්

2. නපරස්‍යාපවාදෙන පරෙෂාං දණ්ඩමාචරෙත්
ආත්මනාවගමං කෘත්වා බධ්නීයාත් පූජයෙත වා

3. තථාචොක්තම් :— ගුණදොෂාවනිශ්චිත්‍ය විධිනාග්‍රහනිග්‍රහෞ
ස්වනාශාය යථාන්‍යස්තො දර්පාත් සර්පමුඛෙ කරඃ

නියමනොකොට සුදුසු පරිද්දෙන් සඞ්ග්‍රහ දඬුවම්දෙක අහංකාර යෙන් සජීයාගේ මුඛයෙහිලූ අතමෙන් තමාගේ විනාශය පිණිස වෙත්.

කිමෙක්ද එසේවීනම් සඤ්ජීවකයා දුරුකරන්නෙම්දැයි ශබ්ද පවත්වා කියයි. දමනකයා ඉක්මන්ව වෙගසහිතවූයේ "දෙව යන්වහන්ස! මෙසේවනාහි නොකිවමැනව නොකිවමැනව රහස්මන්ත්‍රණය ප්‍රකටවන්නේය" යි කියයි.

1. එසේද කියනලදී—අනුන්ඉදිරියේ ප්‍රකාශනොකොට යුතුවූ රහස්මන්ත්‍රණයයි කියනලද මේබීජය සියලු උත්සාහයෙන් රක්‍ෂා කටයුතුය, යම් ප්‍රකාරයෙකින් ස්වල්පයකුදු බිඳීම නොලබන් නේය, ප්‍රකාශකරණලද ඒ බීජය ගිරියහට නොගණී.

2. තවද—ගතයුත්තක්හුගේද දියයුත්තක්හුගේද, සම්පාද නයකටයුතු කටයුත්තක්හුගේද, යුහුවනොකරණු ලබන්නා හුගේ ඒ ඵලය ඉක්මයන කාලය තෙම බොන්නේය.

එබැවින් නියමයෙන් පටන්ගන්නාලද ක්‍රියාව මහත් උත් සාහයෙන් සම්පාදනය කටයුතුවෙයි.

3. තවද—බෙහෝකාලයක් එකාකාර සිටීමට අපොහොසත්ව චඤ්චලවූ ඇමතිතෙමේ යුඛයෙහි යෙදුනු පුරුෂයක්හුමෙන් වසනලද නොහොත් සන්නාහයෙන් වටකරණලද සියලු අව යවයන් ගෙන් යුක්තවූයේ සතුරන්ට ප්‍රකාශවන හයින් නො හොත් පරාජයට හයින් බොහෝකලක් සිටින්ට නොහැකිවෙයි.

ඉදින් මේතෙම දක්නාලද අපරාධඇත්තේද දෙෂයන් ඉවතලා මිතුරුවියයුතුවේද ඒ කාරණය අතිශයින් යුතුනොවෙයි.

4. යම්හෙයකින්—පින්වත! යම් ජනයෙක් එක්වරක් දක්නා ලද්දුවූ අපරාධඇති මිත්‍රයක්හු හාසමග නැවත මිතුරුවීමට

1. තථාචොක්තම් :—මන්ත්‍රබීජමිදං ගුප්තං රක්‍ෂණීයං තථා යථා
මනාගපි න භිද්‍යෙත තද්භින්නං න ප්‍රරොහති.

2, කිඤ්ච :—ආදෙයස්‍ය ප්‍රදෙයස්‍ය කර්තව්‍යස්‍යච කර්මණඃ
ක්‍ෂිප්‍රමක්‍රියමාණස්‍ය කාලඃ පිබති තද්‍රසම්.

3. කිඤ්ච :—මන්ත්‍රා යොධ ඉවාධීරඃ සර්වාඞ්ගෛඃ සංවෘතෛරපි
චිරං න සහතෙ ස්ථාතුං පරෙභ්‍යො භෙදශඞ්කයා.

4. යතඃ :—සකෘද්දුෂ්ටං යො නු මිත්‍රං පුනඃ සන්ධාතුමිච්ඡති,
ස මෘත්‍යුමෙව ගෘහ්ණාති ගර්භමශ්වතරී යථා.

කැමතිවේද, ඒ ජනතෙම ආකාශගාමී අජිතිය අශ්වපොතකයක් හූගේ මව්වූ අස්වෙළඹ ඇගේ පුත්‍රගර්භයමෙන් මරණයට පැමි ණේයයි කියයි.

සිංහතෙමේ මේ සඤ්ජීවකයා අපටතුමක් කිරීමට පොහො සද්ද යනුපළමුකොට සලකනුලැබේවයි කියයි. දමනකයා දෙව යන්වහන්ස!

1. ඔවුනොවුන්ගේ සම්බන්ධය නොසලකා තවරප්‍රකාරයකින් සමර්ථභාවය නියමකලහැකිද, එකමකැටකුරුල්ලා විසින් මහා සමුද්‍රය චඤ්චල කරණලද්දේය බලවයි කියයි.

සිංහතෙමේ ඒ කෙසේදැයි? විචාරයි. දමනකතෙම කියයි. සමුද්‍රතීරයෙහි කැටකුරුල්ලකුහා කැටකිරිළිදෙනක්ද යන අඹු සැමි දෙදෙනෙක් වෙසෙත්. ඉක්බිත්තෙන් කැටකිරිළිදෙන වදන කාලයලන්වූවිට තම හිමිහට කියන්නී ස්වාමිය! වැදීමට සුදුසුවූ ස්ථානයෙක් සොයනුලැබේවයි කියයි.

කැටකුරුල්ලා මේ ස්ථානයම වැදීමට යොග්‍යනොවේදැයි? කීය. කැටකිරිළි දෙනතොමෝ මේ ස්ථානය තෙම සාගරයෙහි ජලවෙගයෙන් ඉල්පවනුලැබෙයි කියයි. කැටකුරුලුතෙමේ සො. ඳුර! කිමෙක්ද? මාගේගෙයි තිබූනු බිජුවට සමුද්‍රය විසින් පහ නොකටයුතුකිරීමට මම බලනැත්තෙම්දැයි? කීය.

කැටකිරිල්ලි සිනාසී ස්වාමිය! තාගාමහා සමුද්‍රයඳ ප්‍රභෙදය මහත්වෙයි කියයි.

2. නොහොත්—තෙමේ මේ කටයුත්ත සම්පාදනය කිරීමට සමර්ථද නොහොත් නැද්දැයි නියමකිරීම දුක්මය, මෙබඳුවූ තමා බලා බලදෙක දැන්ම යම් ජනයක්හට ඇත්තේද, ඒ පුරුෂ තෙම විපත්තියක් ඇතිකල්හිද කලනොකිරේ.

3. නැවතද—සිදුකළ නොහෙන ක්‍රියාවගේ කිරීමට උත්සාහ ගැන්මද, ස්වකීයවූ නෑයන්හා සමග විරුඬවීමද, අතිශයින් බල

1. අඩගාඩගීභාවමඥාත්වා කථං සාමර්ථ්‍ය නිර්ණයඃ
පශ්‍ය ටිට්ටිභමාත්‍රෙණ සමුද්‍රො ව්‍යාකුලීකෘතඃ.

2. අථවා :—දුඃඛමාත්මා පරිච්ඡෙත්තුමෙව යොග්‍යො න වෙති වා,
අසතිදෘග්යස්‍ය විඥානං ස කෘච්ඡ්‍රෙපි න සීදති,

3. අපිච :—අනුචිත කර්මාරම්භඃ ස්වජනවිරොධො බලීයසා ස්පර්ධා
ප්‍රමදාජනවිශ්වාසො මෘත්‍යොර්ද්වාරාණි චත්වාරි.

යෙන් මහත්වූ එකක්හුහා සිනාසහිතව ගැහීකිරීමද, ස්ත්‍රීන් කෙරේ විශ්වාසයද යන මේ සතර මරණයට මුල්වෙත්.

ඉක්බිත්තෙන් සැමියාගේ වචනයෙන් ඒ ස්ථානයේම ඈ වැදීය.

මේ සියල්ල අසාසමුද්‍රය විසින්ද කැටකුරුල්ලාගේ බලය දැනගැන්මට කැමතිව කැටකිරිල්ලීගේ බිජුවට පහකරණලද්දාහුය. ඉක්බිත්තෙන් කැටකිරිල්ලී ශෝකදුකින් පීඩිතව ස්වාමිය! විපත්තිය එළඹසිටියාය, මාගේ බිජුවට පහකරණලද්දාහුයයි සැමියාටකීය. කැටකුරුලුතෙමේ සොඳුර! භයනොවවයි කීයේය. මෙසේකියා පක්ෂීන් රැස්කොටගෙණ පක්ෂීන්ටනායකවූ ගුරුළු රජවෙතට ගියාවූ කැටකුරුල්ලා තමන්ගේබිජුවට සමුද්‍රය විසින් පහකරණලදැයි දන්වයි. ඉක්බිත්තෙන් ඒ ගුරුළුවිසින් ඒවචනය අසා ඉපදීමය රක්ෂාකිරීමය නැසීමය යන මීටමුල්වූ පින්වත් ස්වාමිවූ විෂ්ණුට දන්වනලද්දේය. ඉක්බිත්තෙන් විෂ්ණුහුගේ අණමුදුනෙහි පිහිටුවා මහාසමුද්‍රය සමීපයට ගියේය. ඉක්බිත්තෙන් ඒ වචනය අසා සමුද්‍රය ඒ බිජුවටදුන්නේය. ඔවුනොවුන්ගේ සම්බන්ධය නොදැන, යන මේ ආදිය එහෙයින් මම කියමි. රජතෙමේ මේ සඤ්ජීවකතෙම සතුරුඅදහසට පැමිණියේයයි කෙසේදැනගත යුතුදැයි කියයි. දමනකතෙම යම්දිනයෙක්හි මේ සඤ්ජීවකතෙම අංදෙක්හි අගින් ඇණීමෙහි උත්සාහ ඇත්තේ චඤ්චලවූ එකක්හුමෙන් පැමිණේද එකල්හි ස්වාමි තෙම දැනගන්නේයයි කියයි. මෙසේකියා සඤ්ජීවකයාසමීපයට ගියේය. ඒ ස්ථානයටගිය තැනැත්තේද සෙමින් සෙමින් එළඹෙන්නේ විස්මයට පැමිණියක්හුමෙන් පෙණීසිටියේය. ඉක්බිත්තෙන් සඤ්ජීවකයා විසින් පින්වත් දමනකය! නුඹේසැපය කෙසේදැයි? ආදරසහිතව කියනලද්දේය. දමනකතෙමේ සෙවකව වසන්නවුන්ට කවරසැපයෙක්ද?

1. යම්හෙයකින්—යම් රාජසෙවකයෝවෙද්ද ඔවුන්ගේ ඓශ්වර්‍ය්‍යයෝ අනුන්සතුවෙත්, හැමකල්හි කවරවිටෙක රජතෙම කුමක් අණකරන්නේදැයි සිතීමෙන් කැලඹුනේවෙයි, ස්වකීයජීවිතයෙහිද විශ්වාසයෙක් නැත්තේය.

---

1. යතඃ;—සම්පත්තයඃ පරාධීනාඃ සදා, චිත්තමනිර්වෘතම්,
ස්වජීවිතෙ 'ප්‍යවිශ්වාස ස්තෙෂාං යෙ රාජසංශ්‍රයාඃ.

1. අනිකෙක්ද—ධනයලද්දාවූ කිනම් ජනයෙක් ඒ ධනය කරණකොටගෙණ මත්නොවේද, කවරනම් සත්‍වයක්හට විපත්තිහුනැත්තෝද, ලොකයෙහි කවරක්හුගේනම් සිතස්ත්‍රීන් විසින් විකලනොකරණලදද, රජුන්ටප්‍රියවූ කවරෙක්නම් ඇත්තේද, කවරනම්ජනයෙක් මරහුගේ අත් අතරට නොගියේද, යාචකවූ කවරෙක්නම් සත්කාරයට පැමිණියේද, කවරනම් පුරුෂයෙක් අසත්පුරුෂයන් විසින් යොදනලද කපට උපාය නැමති දැලෙහි වැටුනේ විපත්තිරහිතවීමෙන් මිදීගියේදැයි කියයි.

සඤ්ජීවකයා විසින් මිත්‍රය! මේ කුමක්දැයි කියවයි? කියන ලද්දේය. දමනකතෙමේ පින් නැත්තෙම් කුමක්කියම්ද,

2. බලව—සාගරයෙහි වැටුනුනැනැත්තෙක් සර්පයක්හු එල්බ ගැණීමක් ලැබ යම්[illegible] නොහරීද, නොමගණීද, එපරිද්දෙන් දැන්කුමක් කටයුතුදැයි මුලාවූ යෙම්වෙම්.

3. යම්හෙයකින්—එක්පක්‍ෂයෙක්හි රජහුගේ රහසද අනික් පක්‍ෂයෙහි තාවැනි මිත්‍රයෙක්ද විනාශයටයෙයි, මම කුමක් කෙරෙම්ද, කොතැන්හියෙම්ද, දුක්නැමති සාගරයෙහි ගිලූනෙම්සී කියයි.

මෙසේකියා දිඝීකොට සුසුම්ලාහූන්නේය. සඤ්ජීවකතෙම එසේවීනමුදු මිත්‍රය! සිත්හිපැවති අදහස අතිශයින් විස්තර[illegible]ට කියනුලැබේවයි කියයි. දමනකයා අතිශයින් රහස්වශයෙන් කිසිපරිද්දකිනුත් රජුගේ විශ්වාසය අනිකක්හට නොකියයුතු වෙයි, එසේදවූවත් පින්වත්තෙම අපපිළිබඳවූ කාරණය හෙතු කොටගෙණ ආයේද සිටියේදවෙයි. එහෙයින් පරලොකයෙහි මනාලත්පහාර්යක් කැමැත්තාවූ මාවිසින් එකාන්තයෙන් තට වැසිසිදුවීමට සුදුසු කරුණක්ම කියයුතුවෙයි.

අසව—මේ ස්වාමී තෙම තාකෙරෙහි පෙරලූනු අදහසින් යුක්තාවූයේ සඤ්ජීවකයාමම මරා සියපිරිවර පිණවන්නෙම්සී

---

1. අන්‍යච්ච :—කො'ර්ථාන් ප්‍රාප්‍ය න ගර්විතො විෂයිණඃ කස්‍යාපදො 'ස්තංගතාඃ
ස්ත්‍රීභිඃ කස්‍ය න ඛණ්ඩිතං භුවි මනඃ කො වාස්ති රාඥං ප්‍රියඃ,
කඃ කාලස්‍ය භුජාන්තරං න ච ගතඃ කො'ර්ථී ගතො ගෞරවං
කො වා දුර්ජනවාගුරාසු පතිතඃ ක්ෂෙමෙණ යාතඃ පුමාන්.

2. පථ්‍ය :—යථා සමුද්‍රෙ නිමග්නො ලබ්ධ්වා සර්පාවලම්බනම්,
න මුඤ්චති න චාධත්තෙ තථා මුග්ධොස්මි සම්ප්‍රති.

3. යතඃ :—එකත්‍ර රාජවිශ්වාසො නශ්‍යත්‍යන්‍යත්‍ර බාන්ධවඃ,
කිං කරොමි ක්ව ගච්ඡාමි පතිතො දුඃඛසාගරෙ.

රහස්තැනෙක්හිදී මේ වචනයකීයේය. ඒ අසා සඤ්ජීවකයා බලවත්වූ කලකිරීමට පැමිණියේය. දමනකතෙමේ කලකිරී මෙන්කම්නැත, කාලයට සුදුසුවූ කටයුත්ත කරණුලැබේවයි නැවතකියයි. සඤ්ජීවකතෙමේ ඇසිල්ලක් විමසා ඒකාන්ත යෙන් ප්‍රකටවූ මේ කාරණයතෙම කියනුලැබෙයි.

1. ස්ත්‍රීහු දුර්ජනයන් ලැබියයුතුවන්නාහුය, රජතෙමේ බාලයන් පොෂ්‍යය කරන්නේවෙයි, ධනයගිජුවූ තැනැත්තන්කරා පැමිණෙන්නේදවෙයි, මෙඝයපර්වතයෙහිද සාගරයෙහිද වස්නේදවෙයි.

2. එසේම—ලක්ෂ්මීතොමෝ හීන ජනයාකරා පැමිණෙන්නීය, සරස්වතී තොමෝ හීන කුලයෙහි උපන්ජනයාහා සමග සිටින්නීය, ස්ත්‍රීතොමෝ අසත්පුරුෂයකු ආශ්‍රය කරන්නීය, ශක්‍රයා පර්වතයෙහි වසියි.

මේ කිමෙක්ද මේ ක්‍රියාව තමන්අදහසද නැද්දැයි මේතෙම ව්‍යවහාරයෙන්ම නියමකරගන්ට නොහැකිවෙයි.

3. යම්හෙයකින්—කිසි අසත්පුරුෂයෙක් ගුණවතුන්ගේ ආශ්‍රය හෙතුකොට ගෙණ ස්ත්‍රියගේ ඇසෙහි ගල්වනලද අපිරිසිදු අඳුනක්මෙන් බැබලීම උසුලයි කියයි.

ඒ කාරණයෙහි පරීක්ෂාකොට මේ කවර දුකෙක්වැටුනේද,

4. යම්හෙයකින්—උත්සාහයෙන් සෙවනයකරණු ලබන්නාවූද රජතෙමේ ප්‍රීතියට නොපැමිණෙයි. මොහු කෙරෙහි කවර නම් ආශ්චර්‍ය්‍යයෙක්ද, යමෙක් ආශ්‍රයකරණු ලබන්නේ පසමිතුරු බවට පැමිණේද මේ වනාහි පෙර තුඩුවූවිරූ දිව්‍ය ප්‍රතිමා රූපයෙක් වෙයි.

එබැවින් මේ උත්සාහය තෙම ප්‍රයොජනයෙක් නැත්තේ වෙයි.

---

1. දුර්ජනගම්‍යා නාර්‍ය්‍යඃ ප්‍රායෙණාපාත්‍රභෘද්භවති රාජා,
කෘපණානුසාරි ච ධනං දෙවො ගිරිජලධිවර්ෂී ච.

2. තථා :—නීචමාශ්‍රයතෙ ලක්ෂ්මීරකුලෙන සරස්වතී,
අපාත්‍රං භජතෙ නාරී ගිරෞ වර්ෂති වාසවඃ.

3. යතඃ:—කශ්චිදාශ්‍රයසෞන්දර්‍ය්‍යාද්ධත්තෙ ශොභාමසජ්ජනඃ,
ප්‍රමදා ලොචනන්‍යස්තං මල්මසම්වාඤ්ජනම්.

4. යතඃ:—ආරාධ්‍යමානො නෘපතිඃ ප්‍රයත්නානන තොෂමායාති කිමත්‍ර චිත්‍රම්,
අයං ත්වපූර්වඃ ප්‍රතිමාවිශෙෂො යඃ සෙව්‍යමානො රිපුතාමුපෛති.

1. යම්හෙයකින්—නියමයෙන් යමෙක් කාරණයක් සලකා කිපෙන්නේවේද ඒ පුරුෂතෙම ඒ කාරණය නැතිකල නියම යෙන් සතුටුවෙයි. යමක්හුගේ වනාහි සිත කරුණක් නැතිව කොපයට පැමිණේද, පුරුෂයෙක් එබඳු තැනැත්තා කෙසේ නම් සතුටුකරවන්නේද.

මාවිසින් රජහට කවර අපරාධයෙක් කරණලද්දේද? නොහොත් රජහු කරුණක් නැතිව අපරාධ කරන්නාහුදැයි කියයි, දමනකතෙම මේ කාරණය එසේමය. අසව,

2. නුවණැති මිත්‍රයන් විසින් උපකාරකරණ ලද්දාවූද ඇතම් ජනයෙක් පසමිතුරුබවට පැමිණෙයි. සතුරන් විසින් ඇස්හමු යේ අනුපකාරකරණ ලද්දේද සතුටටම පැමිණේ. එක් අදහසක් නැත්තවූන්ගේ චරිතය කිනම් විස්මයෙක්ද 'ආශ්චර්‍ය්‍යවෙයි, අනිකක් කෙරේ සිත් නොඇලෙන්නවුන් විසින් පවා සිදුකලයුතු නුවූ රජුන්ගේ ආශ්‍රය අතිශයින් දුකින් කටයුතුවෙයි.

3. අනිකෙක්ද—අසත්පුරුෂයන් කෙරෙහි කරණලද සියගණින් උපකාර ඵලරහිතවූයේය, වැඩඅවැඩ පරීක්ෂාකිරීම් ආදිය නොදත් අඥානයා කෙරේ සියගණින් මනා ගුරූපදෙශද නැසූනේය, වැඩදැයක වචනයට අගෞරව කරන්නාකෙරේ වචන සියගණින් නැසුනේය, කල්පනානැති ජඩයාකෙරෙහි සියගණින් නුවණදීම නැසුනේය.

4. තවද—සඳුන්ගස්වල සර්පයෝවෙත්, ජලාස්ථානවල පියුම් වෙත්, එහිදකිඹුල්ලූ වෙසෙත්, රාජාදිවූ සුවවින්ද යුතුතැන්හි ගුණහානිකරණ දුර්ජනයෝදවෙත්, එහෙයින්ම සැපයෝද විපත්තිරහිතවූවාහු නොවෙත්.

---

1. යතඃ—නිමිත්තමුද්දිශ්‍ය හි යඃ ප්‍රකුප්‍යති ධ්‍රැවං ස තස්‍යාපගමෙ ප්‍රසීදති,
අකාරණද්වෙෂිමනස්තු යස්‍ය වෛ කථං ජනස්තං පරිතොෂයිෂ්‍යති.

2. විඥෛඃ ස්නිග්ධෛරුපකෘතමපි ද්වෙෂ්‍යතාමෙති කශ්චිත්
සාක්ෂාදන්‍යෛරපකෘතමපි ප්‍රීතිමෙවොපයාති,
චිත්‍රං චිත්‍රං කිමථ චරිතං නෛකභාවාශ්‍රයාණාං
සෙවාධර්මඃ පරමගහනො යොගිනාමප්‍යගම්‍යඃ.

3. අන්‍යච්ච :—කෘතශතමසත්සු නෂ්ටං සුභාෂිතශතං ච නෂ්ටමබුද්ධිෂු,
වචනශතමවචනකරෙ බුද්ධිශතමචෙතනෙ නෂ්ටම්.

4. කිඤ්ච :—චන්දනතරුෂු භුජඞ්ගා ජලෙෂු කමලානි තත්‍ර ච ග්‍රාහාඃ,
ගුණඝාතිනශ්ච පිශුනා භොගෙ න සුඛාන්‍යවිඝ්නානි

1. අනිකෙක්ද—අධොභාගය සර්පයන් විසින්ද, මල්බමරුන් විසින්ද, අතුවඳුරන් විසින්ද, ගස් මුදුන් හලලනම් ආයුධවැනි පත්‍රවලින්ද, මෙසේ චන්දනවෘක්ෂයාගේ යම්තැනක් අතිශයින් දුෂ්ටවූ සර්පාදිසත්වයන් විසින් නොමඩනාලද්දේද එබඳු තැනක් නැත්තේමයයිකීය.

දමනකතෙම මේ ස්වාමියා වනාහි මධුරවූ වචනයෙන් යුක්තය, ක්‍රූරවූ අදහස්ඇත්තේයයි මාවිසින් දන්නාලැබේ.

2. යම්හෙයකින්—දුරදීම ඔසවනලද අත්වලින් යුක්තවූ, සතුටුකඳුලෙන් කැලඹුනාවූ ඇස් ඇත්තාවූ, ඉදීමට අවකාශදී නැගුටුනාවූ ආසනයාගේ අඩියඇත්තාවූ, දැඩිකොට වැලඳගැන්මෙහි උත්සාහවත්වූ, ප්‍රියකථා ප්‍රශ්නයෙහි කරණලද ආදරයෙන් යුක්තවූ,සිත්හි අනුන්විසින්කියා ලියනොහෙනතරම් ක්‍රූරවිෂයෙන් යුක්තවූ පිටතම මධුරවචනඇති අතිශයින් වඤ්චාවෙහි දක්ෂවූදුර්ජනයන්විසින් යමක් ඉගෙණගත්නාලදද පෙරනුදුටු විරූ මේනාටක විධියතෙම කුමක්නම්වේද.

3. එතරවියනොහෙන මහාසමුද්‍රයෙන් එතර යාමෙහි නැවද, අන්ධකාරය ඇතිකල්හි පහනද, පවන් නැති තන්හි තල්වැටද, මදයෙන් අන්ධවූ ඇතාගේ මානය නැසීම පිණිස අකුස්සද, මෙසේ බ්‍රහ්මයා විසින් පිළියම්කටයුතුවූ යම් ස්ථානයෙක්හි විරුද්ධ විධානවූ උපාය කල්පනාව නොකරණ ලද්දේනම්, පොළෝතලයෙහි එබඳු කරුණු නැත්තේනම් බ්‍රහ්මයාද දුර්ජනයාගේ සිත ශුද්ධකිරීම් විධානයෙහි ඵලරහිත උත්සාහ ඇත්තේයයි සිතම් කියයි.

---

1. අන්‍යච්ච :—මූලං භුජඞ්ගෛඃ කුසුමානි භෘඞ්ගෛඃ
ශාඛාඃ ප්ලවඞ්ගෛඃ ශිඛරාණි භල්ලෛඃ,
නාස්ත්‍යෙව තච්චන්දනපාදපස්‍ය
යන්නාශ්‍රිතං දුෂ්ටතරෛඃ කුපඞ්ගෛඃ.

2. යතඃ :—දූරාදුච්ඡ්‍රිතපාණිරාර්ද්‍රනයනඃ ප්‍රොත්සාරිතාර්ධාසනො
ගාඪාලිඞ්ගනතත්පරඃ ප්‍රියකථාප්‍රශ්නෙෂු දත්තාදරඃ,
අන්තර්ගූඪවිෂො බහිර්මධුමයශ්චාතීව මායාපටුඃ
කො නාමායමපූර්වනාටකවිධිර්යඃ ශික්ෂිතො දුර්ජනෛඃ.

3. තථාහි:—පොතො දුස්තරවාරිරාශිතරණෙ දීපො'න්ධකාරාගමෙ
නිර්වාතෙ ව්‍යජනං මදාන්ධකරිණාං දර්පොපශාන්ත්‍යෛ සෘණිඃ,
ඉත්ථං තද්භුවි නාස්ති යස්‍ය විධිනා නොපායචින්තා කෘතා
මන්‍යෙ දුර්ජනචිත්තවෘත්තිහරණෙ ධාතාපි භග්නොද්‍යමඃ.

සඤ්ජීවකයා තමන් අදහස දක්වයි. පින්වත! දුක්වෙයි සශ්‍ය· අනුභවකරන්නාවූ මම කෙසේනම් සිංහයාවිසින් මැරියයුතුවේද.

1. යම්හෙයකින්—යම් දෙදෙනකුගේ ධනය සමානද, යම් දෙදෙනකුගේ ශක්තිය සමද, ඔවුන් දෙදෙනාගේ ඩබරය සිතිය යුතුය. උත්තම අධම දෙදෙනාගේ විවාදය කිසිතැනකද නොසිතිය යුතුය.

නැවත පරීක්ෂාකොට මේ රජතෙමේ කවරක්හු විසින් මා කෙරේ විරුඬයට පමුණුවන ලදද බිඳුනාවූ සෙනහය ඇති රජු කෙරෙන් හැම කල්හි භයවිය යුතුය.

2. යම්හෙයකින්—යම්කිසි ක්‍රියාවෙක්හි අමාත්‍යයා විසින් විරුඬකරවන ලද රජහුගේ සිත පළිඟුවෙන් කරණලද ආභරණයාගේ වළල්ලමෙන් කවරෙක්නම් ගළපාලීමට සමර්ථද.

3. අනිකෙක්ද—වජ්‍රායුධයද, රජහුගේ ආනුභාවයද යන මේ දෙකම භය එළවයි, මේ දෙකින් වජ්‍රායුධය එක් තැනෙක්හිම වැටෙයි, රාජතෙජස හැමතැන්හි වැටෙයි.

එබැවින් රජුහා සමග සටන ඇතිකල්හි මරණයම ආශ්‍රය කරණු ලැබේවා. දූත් ඒ රජුගේ අණට යටත්ව පැවතීම තරම් නොවෙයි.

4. යම්හෙයකින්—සටනෙහි මැරුණු තැනැත්තේ ස්වර්ගයට පැමිණේ. ජීවත්වූකල සතුරා නසා ජයලද සැපතට හෝ පැමිණේ, ශූරයන්ගේ ස්වර්ගයෙහි ඉපදීමද සැප ලැබීමද යන මේ ගුණ දෙකම දුකින් පැමිණිය යුතුවෙත්.

මේ තෙමේද යුඬකාලය වෙයි.

5. යම්කාලයෙක්හි සටන් නොකළ කල ජීවිතහානිය නියමද, යුඬය පටන්ගත්කල වනාහි දිවි නැසීම හෝ නොනැසීම අනුමානද, සටන්කිරීමට එම කාලයයි පණ්ඩිතයෝ කියති.

---

1. යතඃ :—වයොරෙව සමං විත්තං වයොරෙව සමං බලම්,
තයොර්විවාදො මන්තව්‍යො නොත්තමාධමයොඃ ක්වචිත්.

2. යතඃ :—මන්ත්‍රිණා පෘථිවීපාලචිත්තං විඝට්ටිතං ක්වචිත්,
වලයං ස්ඵටිකස්‍යෙව කො හි සන්ධාතුමීශ්වරඃ.

3. අන්‍යච්ච :—වජ්‍රඤ්ච රාජතෙජශ්ච ද්වයමෙවාති භීෂණම්,
එකමෙකත්‍ර පතති පතත්‍යන්‍යත් සමන්තතඃ.

4. යතඃ :—මෘතඃ ප්‍රාප්ස්‍යති වා ස්වර්ගං ශත්‍රුං හත්වා සුඛානි වා,
උභාවපි හි ශූරාණාං ගුණාවෙතෞ සුදුර්ලභෞ.

5. යත්‍රායුද්ධෙ ධ්‍රැවං නාශො යුද්ධෙ ජීවිතසංශයඃ,
තමෙව කාලං යුද්ධස්‍ය ප්‍රවදන්ති මනීෂිණඃ.

1. යම්හෙයකින්—යම්කලෙක්හි වනාහි නුවනැති තැනැත්තේ සටන් නොකළ කල මදකුදු තමාට සැපතක් නොදක්නේද, එකල්හි සතුරාහා සමග සටන්කරණු ලබන්නේ මරණයට පැමිණේ.

2. ජයලද කල්හිද සම්පත් ලබයි, මරණය කරණකොට ගෙණද දිව්‍යස්ත්‍රීන් ලබයි, ශරීරයෝ ඇසිල්ලෙකින් නස්නා ස්වභා ඇත්තෝය, එසේ ඇතිකල මරණයෙහි හෝ සටන් කිරීමෙහි කිනම් තැවීමෙක්දැයි.

මෙසේ සිතා සඤ්ජීවකයා පින්වත් මිත්‍රය! මේ සිංහතෙම මා මරණු කැමතිව සිටින්නේයයි මාවිසින් කෙසේ දතයුතුදැයි? විචාරයි. දමනක තෙම යම්විටෙක මේ සිංහතෙමේ දැඩිවූ නිශ්චලවූ කන්දෙක ඇත්තේ ඔසවනලද න[illegible]ට ඇතිව උඩුකුරුකරණලද පා ඇතිව මුව අයාගෙණ තා දක්නේද එකල්හි තෝද තාගේ වික්‍රමය දක්වන්නෙහිය.

3. යම්හෙයකින්—තෙජස්රහිතවූයේ නමුදු ශරීරබලයෙන් යුක්තතැනැත්තේ කිසියම් ජනයක්හට නමුදු පරාජයට පැමිණෙනතැනක් නැත්තේය, බලව, ජනයන් විසින් අලුගොඩෙහි සැකනැතිව පාදයතබනුලැබේද.

එසේද මේ සියල්ල අතිශයින් රහස්කොට එක්වන්තැබිය යුතුය. ඉදින් එසේ නොතබා ප්‍රකාශකළේනම් තෝද මමද දෙදෙනම නැත්තම්හයි කියා දමනකයා කරටකයාගේ සමීපයට ගියේය. කරටකයා විසින් කිමෙක්ද අදහස සිදුවූයේදැයි? කියන ලද්දේය. දමනකයා විසින් මොවුන් දෙදෙනා අතුරෙහි ඔවුනොවුන්ගේ බිඳීමහටගත්තේයයි කියනලද්දේය.

කරටකතෙම මේ කාරණයෙහි සැකයෙක් කොයින්ද.

4. යම්හෙයකින්—දුර්ජනයන්ට මිත්‍රයෙක් නම් කොයින්ද, නිරන්තරයෙන් ඉල්වනුලබන කවරෙක්නම් නොකිපෙන්නේද,

---

1. යතඃ :—අයුද්ධෙ හි යදා පශ්‍යෙන්න කිඤ්චිද්ධිතමාත්මනඃ,
යුධ්‍යමානස්තදා ප්‍රාඥො ම්‍රියතෙ රිපුණා සහ.

2. ජයෙ ච ලභතෙ ලක්ෂ්මීං මෘතෙනාපි සුරාඞ්ගනාම්,
ක්ෂණවිධ්වංසිනඃ කායාඃ කා චින්තා මරණෙ රණෙ.

3. යතඃ :—බලවානපි නිස්තෙජාඃ කස්‍ය නාභිභවාස්පදම්,
නිඃශඞ්කං දීයතෙ ලොකෛඃ පශ්‍ය භස්මචයෙ පදම්.

4. යතඃ :– බන්ධුඃ කො නාම දුෂ්ටානාං කුප්‍යෙත් කො නාතියාචිතඃ,
කො න දෘප්‍යති වෘත්තෙන කුකෘත්‍යෙ කො න පණ්ඩිතඃ.

ධනය කරණකොටගෙණ කවරනම් ජනයෙක් අහංකාර නොවේද, අනුන්ම හිංසාකිරීම ආදිකොට පවත්නා නින්දිතක්‍රියායෙහි කවරෙක්නම් පණ්ඩිතනොවේද.

1. අනිකෙක්ද—කෛරාටිකයන් විසින් තමාගේ විෂමඅදහස් දිවූනුකරණුපිණිස ධනවත් ජනතෙමේ දුරාචාර පැවතුම්ඇත්තෙක් කරණුලැබේ, අසත්පුරුෂයාගේ ආශ්‍රය තෙමේ ගින්නමෙන් කවර විනාශයෙක්නම් නොකරන්නේද, කෙරේමැයිනීය.

ඉක්බිත්තෙන් දමනකතෙම පිඞ්ගලකයා සමීපයට ගොස් දෙවයන්වහන්ස අරපවිටු අදහස්ඇති තැනැත්තේ ආයේය, එබැවින් සැරසීසිටිනු ලැබේවයිකියා නිශ්චලවූ කන්ඇතිබව ආදී ආකාරකරවූයේය. සඤ්ජීවකයාද අවුත් එබඳුවූ වෙනස්ආකාර ඇති සිංහයා දැක තමාට සුදුසුවූ වික්‍රමය කෙළේය. ඉක්බිත්තෙන් ඔවුන් දෙදෙනාගේ මහත් සටනපැවතුනුකල සඤ්ජීවක තෙමේ සිංහයාවිසින් මරණලද්දේය. ඉක්බිත්තෙන් පිඞ්ගලක තෙම සෙවකවූ සඤ්ජීවකයාමරා විඩාවටපැමිණියේ ශොකසහිත යක්හුමෙන් උත්නේ මාවිසින් කෲරවූ මේ ක්‍රියාව කුමටකරණ ලද්දේදැයි මෙසේදකියයි.

2. යම්හෙයකින්—රජතෙමේ ඇතා මැරීම හෙතුකොට ගෙණ සිංහයක්හුමෙන් හිංසා නොකිරීම මුල්කොට ඇති ධර්මය ඉක්මවීමෙන් තෙමේ හිංසා ක්‍රියාව ආදිවූ පාපයට ස්ථානවෙයි, දෙශය අනුශාසනා කිරීමෙන් උපන් සැපත අන්‍යවූ සෙවකයන් විසින් අනුභවකරණුලැබේ.

3. අනිකෙක්ද—දෙශයාගේ භාගයක් අන් රජක්හට අත් පත්වූ කල්හිද, පරීක්ෂාකාරීවූ සියලු ගුණයෙන් යුත් ඇමතියා මළ කලද, එබඳු ඇමතියක්හුගේ මරණය රජුන්ගේ මරණය වෙයි, කුමක්හෙයින්ද, අනුන්ට අත්පත්වූ භූමිභාගය වනාහි ලැබීම පාසුවිය, ඇමතියාගේ ලැබීම පාසුනොවේ.

---

1. අන්‍යච්ච :—දුර්වෘත්තඃ ක්‍රියතෙ ධූර්තෛඃ ශ්‍රීමානාත්මවිවෘද්ධයෙ,
කිං නාම ඛලසංසර්ගඃ කුරුතෙ නාශ්‍රයාශවත්.

2. යතඃ :—පරෛඃ සම්භුජ්‍යතෙ රාජ්‍යං ස්වයං පාපස්‍ය භාජනම්,
ධර්මාතික්‍රමතො රාජා සිංහො හස්තිබධාදිව.

3. අපරඤ්ච :—භූම්‍යෙකදෙශස්‍ය ගුණාන්විතස්‍ය
භෘත්‍යස්‍ය වා බුද්ධිමතඃ ප්‍රණාශෙ,
භෘත්‍යප්‍රණාශො මරණං නෘපාණාං
නෂ්ටාපි භූමිඃ සුලභා න භෘත්‍යාඃ.

දමනක තෙම ස්වාමිනි! යම්හෙයකින් නුඹවහන්සේ විසින් සතුරා මරා තැබීම කරණලැබේද, මේ අලුත්වූ පරීක්‍ෂාව කුමක්ද?

1. එසේද කියනලදී—සැප කැමති රජහු විසින් දිවි නැසීමට උත්සාහකරණ පියා හෝ නොහොත් සොහොවුරු හෝ පුත්‍රයා හෝ මිත්‍රයෙක් වූයේද යන මොවුහු මැරියයුතුවෙත්.

2. අනිකකුදු—හිංසා නොකිරීම් ආදියද, රැස්කිරීමය වැඩීමය, රක්‍ෂාකිරීමය යන මෙයින් යුක්තවූ ධනයද, විෂයරස අනුභවයෙහි ඇළීමද යන මොවුන්ගේ රහස් කටයුතු දත් ජනයෙක් ඒකාන්තයෙන් දයා බහුලවූවෙක් නොවන්නේය, එසේමැයි. අතිශයින් ඉවසන සවභා ඇති තැනැත්තේ අල්ලෙහිවූ වස්තුවද රක්නට පොහොසත් නොවේ.

3. තවද—සතුරාකෙරේද මිතුරාකෙරේද යන මොවුන් දෙදෙනා කෙරෙහිම ඉවසීම විෂයරස අනුභවයක්නැති තාපසවරුන්ටම සැරසීමවෙයි, අපරාධකළ සත්ත්වයන්කෙරේ ඒ ඉවසීමම රජුන්ට දූෂ්‍යයෙක්වෙයි.

4. අනිකෙක්ද—රාජ්‍යලබාගැන්මට අධිකආශාවෙන් යුත් අභිමානයෙන් රජුගේ පදවියට පැමිණෙනු කැමතිවූ ඇමතියාට ඒ පාපක්‍රියාව කෙරෙහි දිවිනැසීම මම එකම පව්මිදීමවෙයි, මෙයින් පිටත් අන්කිසිවකින් පව්මිදීමනොවේ.

5. අනිකෙක්ද—අතිශයින් කරුණාවන්තවූ රජද, අතිශයින් ලොභවූ බමුණුද, සිත්වූපරිද්දෙන් නොපවත්නා භාර්‍ය්‍යාද, නුසුදුසු පැවතුම්ඇති මිත්‍රද, විරුඬ උත්තරකියන්නාවූ දාසද, ප්‍රමාදව වසන නුවරරැකීමෙහි නියුක්ත පුරුෂයාද, කළඋපකාර නොදත් තැනැත්තේද යන මොව්හු දුරුකටයුත්තාහුවෙත්.

---

1. තථාසමුක්තම් :—පිතා වා යදි වා භ්‍රාතා පුත්‍රො වා යදි වා සුහෘත්,
ප්‍රාණච්ඡෙදකරා රාඥ හන්තව්‍යා භූතිමිච්ඡතා.

2. අපිච :—ධර්මාර්ථකාමතත්වඥො නෛකාන්තකරුණො භවෙත්,
න හි හස්තස්ථමප්‍යන්නං ක්‍ෂමාවාන් රක්‍ෂිතුං ක්‍ෂමඃ.

3. කිඤ්ච :—ක්‍ෂමා ශත්‍රෞ ච මිත්‍රෙ ච යතීනාමෙව භූෂණම්,
අපරාධිෂු සත්ත්වෙෂු නෘපාණාං සෛව දූෂණම්.

4. අපරඤ්ච :—රාජ්‍යලොභාදහඞ්කාරාදිච්ඡතඃ ස්වාමිනඃ පදම්,
ප්‍රායශ්චිත්තං හි තත්‍රෛකං ජීවොත්සර්ගො නචාපරම්.

5. අන්‍යච්ච :—රාජා ඝෘණී බ්‍රාහ්මණඃ සර්වභක්‍ෂඃ ස්ත්‍රී චාවශා දුෂ්ප්‍රකෘතිඃ සහායඃ,
ප්‍රෙෂ්‍යඃ ප්‍රතිපොධිකෘතඃ ප්‍රමාදී ත්‍යාජ්‍යා අමී යශ්ච කෘතං න වෙත්ති.

1. සත්‍යවචනද, බොරුදකියන්නාවූ, පරුෂද මධුරවචනද බණන්නාවූ, පීඩාහා අනුකූල පැවතුම්ඇති, ධන ලාභයෙහි ආශාහා දෙන්නාවූ ස්වභාවද ඇති, නිතර වියදම්කිරීමද බොහෝ රත්නහා ධනයන් ලැබීමදඇති වෛශ්‍ය ස්ත්‍රියක්මෙන් රාජ නීතිය නොයෙක් ආකාරරූප දරන්නීය.

මෙසේ දමනකයා විසින් කපට වචනයෙන් සතුටුකරණලද ස්වකීය ප්‍රකෘතියට පැමිණි පිඞ්ගලකයා සිංහාසනයෙහි උන්නේය. දමනකයා සතුටු සිත්ඇතිව මහරජ! ජයටපැමිණෙවයි රජ්ජුටකියයි. නැවතද සියලු ලොකයටද මඞ්ගල්‍යයෙක් වේවයි කියා සැපසේ විසුවේය. විෂ්ණුශර්මන්තෙමේ තොපවිසින් මිත්‍ර භෙදය අසනලද්දැයි කීයේය. අපි සැපයට පැමිණියම්හයි රාජ පුත්‍රයෝ කීවෝය. විෂ්ණුශර්මන්තෙමේ අතිකූදු මේ මඞ්ගල්‍ය යෙක්වේවා,

2. පින්වතුන්ගේ සතුරන් සන්තකවූගෘහයෙහි වනාහි මිත්‍රයා හා සමග විරුඩයට පැමිණීමවේවා, දුර්ජනතෙම මරණයට වශගවූයේ හැමදවස්හි විනාශයට පැමිණේවා, තොපගේ රාජ්‍යයෙහි ජනතෙම නිතරම සියලු සැපහා ඓශ්වර්‍ය්‍ය සම්පත්තිය ඇත්තෙක් වේවා, මේ ශාස්ත්‍රයෙහි සතුටු එළවන්නාවූ නීතිකථාවම උයනක් කොට පවත්නා මේ හිතොපදෙශ ග්‍රන්ථවිෂයෙහි නුවණ මඳ තැනැත්තේද නිරන්තරයෙන් කෙළිවසිකීයේය.

හිතොපදෙශයෙහි මිත්‍රභෙදනම් විතීය
කථාසංග්‍රහය මෙසේයි.

---

1. සත්‍යානෘතා ච පරුෂා ප්‍රියවාදිනී ච
හිංස්‍රා දයාලුරපි චාර්ථපරා වදාන්‍යා,
නිත්‍යව්‍යයා ප්‍රචුර රත්නධනාගමා ච
වාරාඞ්ගනෙව නෘපනීතිරනෙකරූපා.

2. සුහෘද්භෙදස්තාවද්භවතු භවතාං ශත්‍රුනිලයෙ
ඛලඃ කාලාකෘෂ්ටඃ ප්‍රලයමුපසර්පත්වහරහඃ,
ජනො නිත්‍යං භූයාත් සකලසුඛසම්පත්තිවසතිඃ
කථාරාමෙ රම්‍යෙ සතතමිහ බාලො 'පි රමතාම්.

# විග්‍රහය.

# වි ග්‍ර හ ය යි.

## නැවතද විග්‍රහනම් පරිච්ඡේදය කියනුලැබේ.

නැවත කථාරම්භකාලයෙහි රාජපුත්‍රයන් විසින් ස්වාමිය! අපි රාජපුත්‍රයෝවම්හ, එබැවින් ඩබරය ඇසීමට අපට කැමැත්ත ඇතැයි කියනලද්දේය. විෂ්ණුශර්මන්තෙම යමක්ම පින්වතුන්ට කැමතිද ඒ ඩබරය කියන්නෙමි, ඩබරය අසනුලැබේවා ඒ ඩබරයාගේ මේ මුල්ශ්ලෝකයයි.

1. සමවූ වික්‍රමඇති හංසයන්හා සමග මොනරුන්ගේ සටන ඇතිකල්හි කව්ඩන් විසින් සතුරන්ගේ කොටුවෙහි වාසයකොට හංසයන්ට විශ්වාසකරවා හංසයෝ පරදවන ලද්දාහුයයි කියයි.

ඒ කෙසේදැයි රාජපුත්‍රයෝ කීවෝය. විෂ්ණුශර්මන්තෙමේ කියයි. කර්පූරද්වීපයෙහි පද්මකෙළිනම් විලෙක්ඇත. ඒ විල්හි හිරණ්‍යගර්භනම් රාජහංසයෙක් වෙසෙයි. දියෙහි වසන සියලුම පක්ෂීන් විසින් රැස්ව ඒ හිරණ්‍යගර්භතෙමේද පක්ෂීන්ගේ රාජ්‍යයෙහි අභිෂෙක කරණලද්දේය.

2. යම්හෙයකින්—මේ පොළෝතලයෙහි මනාවූ අනුශාසනාකරණ නායකවූ රජෙක් ඉදින්නොවේද, එකල්හි ජනතෙමේ මහාසමුද්‍රයෙහි ගමන්කරවන්නක්හු නැති නැවමෙන් ගිලෙන්නේය.

3. අනිකෙක්ද—රජතෙමේ ජනයා පාලනයකෙරේ, ඒ ජනතෙමේ අයබදුදීමෙන් රජ්ජුරුවන් පොෂ්‍යයකෙරේ, පොෂ්‍යයකිරීමටවඩා පාලනයකිරීම ශ්‍රෙෂ්ඨවෙයි, පාලනය නැතිකල විද්‍යමානවූ සියල්ලද අවිද්‍යමානවෙයි.

එක්කලෙක්හි මේ රාජහංසයා අතිශයින් පුබුල්වූ පියුම් නැමති අස්නෙහි සැපසේ උන්නේසෙවකවූ පක්ෂීන් විසින් පිරි

---

1. හංසෛඃ සහ මයූරාණාං විග්‍රහෙ තුල්‍යවික්‍රමෙ,
   විශ්වාස්‍ය වඤ්චිතා හංසාඃ කාකෛඃ ස්ථිත්වාරිමන්දිරෙ.

2. යතඃ:—යදි න ස්‍යාන්නරපතිඃ සම්‍යඞ්නෙතා තතඃ ප්‍රජා,
   අකර්ණධාරා ජලධෞ විප්ලවෙතෙහ නෞරිව.

3. අපරඤ්ච:—ප්‍රජාං සංරක්ෂති නෘපඃ සාවර්ධයති පාර්ථිවම්,
   වර්ධනාද්‍රක්ෂණං ශ්‍රෙයස්තදභාවෙ සදප්‍යසත්.

වරණලද්දේසිටී. ඉක්බිත්තෙන් කිසියම් දෙශයකින් අවුත් දීඝීමුඛනම් කොකෙත් වැඳඋන්නේය. රජතෙමේ එම්බා දීඝීමුඛය! අන්‍ය දෙශයෙන් ආයෙහිය. කථාප්‍රවෘත්තිකියවයි කීයේය. ඒ දීඝීමුඛතෙම දෙවයන්වහන්ස! මහත්වූ කථාප්‍රවෘත්ති ඇත්තිය. එපවත්කියනු කැමැත්තේම මම යුහුව ආවෙමි අසනුලැබේවයි කියයි. දඹදිව වින්‍ධ්‍යනම් පර්වතයෙක්ඇත. ඒ පර්වතයෙහි චිත්‍රවර්ණනම් මොනරෙක් මයූරයන්ට රජවූයේ වෙසෙසි. ඒ රජහුගේ සෙවකයන් විසින් දතලද වනයකගේ මධ්‍යයෙහි ඇවිදිනාවූ මම දක්නාලද්දේ තෝ කවරෙක්ද කොතනසිට ආයේ දැයි? විචාරණ ලද්දේදවෙයි. ඉක්බිත්තෙන් මාවිසින් "මම කර්පූරද්වීපයේ හිරණ්‍යගර්භනම් රජුගේ සෙවකයෙක්මි සතුටුව්ම හෙතුකොටගෙණ අන්‍යදෙශ දක්මපිණිස ආවෙමැයි කියනලද්දේය. එපවත්අසා පක්ෂීන් විසින් එසේවීනම් මේ රටදෙකින්ද රජුන් දෙදෙනා අතුරෙන් කවරෙක් අතිශයින් ශොභනදැයි විචාරණලද්දේය. ඉක්බිත්තෙන් මාවිසින් විස්මයෙකකු මට මෙසේ කියනුලැබේද? රටදෙක්හිද රජුන්දෙදෙනාගේද ප්‍රභෙදය මහත්වෙයි. යම්හෙයකින් කර්පූරද්වීපය ස්වර්ගයෙහි එක්භාගයක්හා සමානද, රජතෙමේද දෙවෙනිවූ දෙවේන්‍ද්‍රද, එහෙයින් කෙසේනම් වර්ණනාකරන්ට හැකිවේද, මේ වැලිතලාවෙහි වැටුනු නොපි කුමක්කරව්ද? අපගේ දෙශයට එත්වයි කියනලද්දේය. ඉක්බිත්තෙන් ඒ වචනයඅසා පක්ෂීහු කොපසහිතවූවෝය.

1. එසේදකියනලදී—සර්පයන්ගේ කිරිපීම හුදෙක් විසවැඩීම කෙරෙයි. එසේමැයි. අවවාදය වැඩඅවැඩ දෙක වෙන්කර ගැන්මට අපොහොසතුන්ගේ කිපීමපිණිසවෙයි, අවබොධය පිණිස ප්‍රයොජනනොවේ.

2. අනිකෙක්ද—නුවණැති තැනැත්තේම වැඩෙන වචනයෙන් අනුශාසනා කටයුතුවෙයි, අඥනයාවූකලි කිසිකලකත් අනුශාසනා නොකටයුතුවෙයි, අඥනවූ වානරයන්ට අනුශාසනාකොට කඩනලද කැදලිවලින් යුක්තවූ පක්ෂීහුගියෝය" යි කීය.

රජතෙමේ ඒ කෙසේදැයි? අසයි. දීඝීමුඛතෙම කියයි.

---

1. තථාචොක්තම් :—පයඃ පානං භුජඞ්ගානාං කෙවලං විෂවර්ධනම්,
උපදෙශො හි මූර්ඛාණාං ප්‍රකොපාය න ශාන්තයෙ.

2. අන්‍යච්ච :—විද්වානෙවොපදෙෂ්ටව්‍යො නාවිද්වාංස්තු කදාචන,
වානරානුපදිශ්‍යාඥාන් ස්ථානභ්‍රෂ්ටා යයුඃ ඛගාඃ.

"නර්මදා නදියගේ ඉවුරෙහිවූ පර්වතයට ආසන්න භූමියෙහි මහත්වූ හිඹුල් රුකෙක්ඇත. ඒ ගස්හි කරණලද කැදැල්ලෙහි පක්ෂීහු සැපසේ වැසිකාලයෙහිද වසත්. ඉක්බිත්තෙන් නීල වර්ණවූ සඳරුස්වලින්මෙන් අහස්තලය මෙඝපටලයන් විසින් පැතිරෙණලද කල්හි ජලධාරාවන්ගේ වැටීමෙන් මහත් වර්ෂාවක් වීය. නැවත ශීතයෙන් බැගෑවූද වෙව්ලන්නාවූද ගස්මුල්හි උන් වඳුරන්බලා පියා පක්ෂීන් විසින් පින්වත් පින්වත් වානර යෙනි! අසනුලැබෙව්.

1. "අපවිසින් හොටපමණකින් ගෙණඑනලද තණවලින් ගෙවල් කරණලද්දාහුය, අත්පාආදි අවයව වලින් යුක්තවූ තොපි කුමට තැවෙව්ද"යි? කියනලද්දේය.

ඒ අසා උපන්නාවූ කිපුනු සිතින්යුත් වානරයන් විසින් "විසමයෙක පවත්නොවදිනා කැදලිවල වසන සැපතට පැමිණි පක්ෂීහු අපට නින්දාකෙරෙත්, එබැවින් වර්ෂාවගේ නැවැත්ම වනාහි වේවා"යි සිතනලද්දේය. ඉන්පසු වැසිනැවතුනු කල්හි ඒ වඳුරන් විසින් ගසටනැගී සියලු කැදලි සිඳිනලද්දාහුය.

ඒ පක්ෂීන්ගේ බිජුවටද බිමහෙලනලද්දේය. එබැවින් "පණ්ඩිතතෙමේම අනුශාසනාකළයුතුය" යනා මේ ආදිය මම කියමි. රජතෙමේ "එකල්හි පක්ෂීන් විසින් කුමක්කියනලද ද"යි? කීයේය. දීඝමුඛතෙමේ කියයි. "ඉක්බිත්තෙන් පක්ෂීන් විසින් ඒ රාජහංසතෙම කවරක්හු විසින් රජකරණ ලද්දේද" යි කොපයෙන් කියනලද්දේය.

ඉන්පසු මාවිසින්ද හටගත් කොපසිතින් "තාගේ මේ මයුර තෙමේ කවරක්හු විසින් රජකරණලද්දේද" යි කියන ලද්දේය. ඒ වචනය අසා ඒ පක්ෂීහු මා මරණුපිණිස උත්සාහකළෝය. ඉක්බිත්තෙන් මා විසින්ද මනාවූ වික්‍රමය දක්වන ලද්දේය.

2. යම්හෙයකින්—පුරුෂයාහට ඉවසීම තෙම ස්ත්‍රියගේ ලජ්ජාවමෙන් ඉවසියයුතු කාලයෙහිම සැරසීම මෙයි, රතික්‍රියා වෙහිදීලජ්ජා නැතිබවමෙන් පරාජය ඇතිකල්හි වික්‍රම දැක්වීම සැරසීමවෙයි.

---

1. අසමාභිර්නිර්මිතා නීඩාශ්චඤ්චුමාත්‍රාහෘතෛස්තෘණෛඃ,
හස්තපාදාදිසංයුක්තා යූයං කිමවසීදථ.

2. යතඃ:—අන්‍යදා භූෂණං පුංසඃ ක්ෂමා ලජ්ජෙව යොෂිතඃ.
පරාක්‍රමඃ පරිභවෙ වෛයාත්‍යං සුරතෙෂ්විව.

1. රජතෙමේ සිනාසී, යම් ජනයෙක් තමාගේද සතුරන්ගේද බලඇති බවද, බල නැති බවද, පරීක්‍ෂාකොට වෙනස නොදන්නේද, ඒ ජනතෙමේ සතුරන් විසින් අනාදරකරණු ලැබේ.

2. අනිකෙක්ද—කුඹුරෙක්හි බොහෝ දවසක් නිතර ධාන්‍ය අනුභවකරණ දිවිසමින් වසනලද නුවන නැති කොටලු තෙම ශබ්දය හෙතුකොටගෙණ මරණලද්දේය" යි කියයි.

කොකා ඒ කෙසේද? යි විචාරයි. රජතෙම කියයි.

"හසතිනා පුරයෙහි විලාසනම් රදවෙක් ඇත. ඒ රදවාගේ කොටලුවෙක් නිතර බර ඇදීමෙන් බල නැත්තේ මළ එකක්හු මෙන් වූයේය. ඉක්බිත්තෙන් ඒ රදවා විසින් මේ කොටලුවා දිවිසමකින් වසා වන සමීපයෙහිවූ ගොයම්කෙතෙක්හි මුදන ලද්දේය. ඉන්පසු දුරසිට බලා ව්‍යාඝ්‍රයෙක යන අදහසින් කුඹුර හිමියෝ එවිගස දිව යත්. ඉක්බිත්තෙන් කුඹුර රක්නාවූ එක්තරා පුරුෂයක්හු විසින් මදක් පඬුවන් සැට්ටයක් ලාගෙණ දුනු ඊ සරසා නැමුනාවූ ශරීරයෙන් යුක්තව හුදුරුව කුඹුරෙහි පැත්තක සිටියේය. ඉක්බිත්තෙන් ඒ කොටලුවාද දුරදී දැක පිපුනාවූ ශරීරයෙන් යුක්තවූයේ මේ තෙම කොටලුවෙකැයි සිතා නාදකරණුයේ ඒ පුරුෂයා ඉදිරියට දිව්වේය. ඉක්බිත්තෙන් ඒ කුඹුර රක්නා පුරුෂයා විසින් මේ තෙම ගවභා කොටලුවෙක් යයි දැන උත්සාහයක් නැතිවම මරණලද්දේය. එහෙයින් මම බොහෝකාලයක් නිතර ගොයම් කම්න් යන මේ ආදිය කියම් කියයි. දීඝීමුඛතෙම "පසුව ඒ පක්‍ෂීන් විසින් බොල පව්ටුවූ රළුවූ කොක! අපගේ භූමියෙහි ඇවිදින තැනැත්තේ අපගේ ස්වාමීන්වහන්සේට ගණිකරන්නෙහිද? එබැවින් දැන් තමා නොකටයුතුය" යි කියනලද්දේය. මෙසේ කියා සියලු පක්‍ෂීහු හොටවලින් ඇන කොප සහිතවූවාහු "බොල අඥනය! බලව තාගේ රජවූ ඒ හංසයා සියලු ලෙසින් මොලොක් වෙයි. ඔහුගේ රාජ්‍යාධිපතිභාවයෙක් නැත්තේය. යම්හෙයකින් ඒකාන්තයෙන් මොලොක්ද අල්ලෙහිවූ ධනය පවා රක්නට අපොහොසත්වෙයි. එබන්දෙක් කෙසේනම් පොළොව රක්නේද? ඔහුගේ

---

1. රාජාවිහස්‍යාහ :—"ආත්මනශ්ච පරෙෂාඤ්ච යඃ සමීක්ෂ්‍ය බලාබලම්,
අන්තරං නෛව ජානාති ස තිරස්ක්‍රියතෙ 'රිභිඃ.

2. අන්‍යච්ච :—සුචිරං හි චරන්නිත්‍යං ක්ෂෙත්‍රෙ ශස්‍යමබුද්ධිමාන්,
ද්වීපිචර්ම පරිච්ඡන්නො වාග්දොෂාද් ගර්දභො හතඃ.

ගේ රාජ්‍යය කෙරීම කෙසේද? තෝද ලිඳතුළ වසන මැඩියෙක් වැනිය ඒ කාරණයෙන් ඔහුගේ ආශ්‍රය වර්ණනාකරන්නෙහිය.

1. අසව—ඵලයෙන් හා ඡායාවෙන්ද යුක්තවූ මහත්වූ ගසෙක් සෙවනයකටයුතුය, කවරහෙයකින්දයත්, අභාග්‍යය හෙතුකොට ගෙණ ඉදින් පලනැත්තේ නමුදු සෙවනකුමකින් වළකනුලැබේද?

2. අනිකෙක්ද—නීචයන්ගේ ආශ්‍රය නොකටයුතුය. උතුමන් ගේ වැළඳගැන්ම කටයුතුය, රා විකුණන පුරුෂයාගේ අඹු අතෙහිවූ කිරිද රායයි කියනුලැබේ.

3. සිංහයා ආශ්‍රයකොට එළුවෙක් ව්‍යාඝ්‍රාදීන්ගේ භයරහිතව කැමතිපරිද්දෙන් වනයෙහි හැසිරෙයි, රාමරජුගේ ආශ්‍රයට පැමිණි විභීෂණයා ලක්දිව රාජ්‍යය ලද්දේය.

4. අනිකෙක්ද—මහත්විශාල ගුණයද ගුණනැත්තහු කෙරෙහි ස්වල්පබවට පැමිණේ, කුමක්මෙන්දයත්, උසුලන කැඩපතද එහි උසුලනුලබන ඇතාගේ ශරීරයද යන මේ දෙදෙනා ගේ සම්බන්ධභාවයෙන් කැඩපතෙහි ස්වල්පවශයෙන් දක්නා ලබන මහත් ඇතාමෙනි.

5. විශෙෂයෙන්ද—රජහු අතිශයින් බලඇතිකල්හි නාමය තී පමණකිනුදු ජයලැබීම වන්නේය, චන්ද්‍රයාගේ නාමය තීපමණින් සාවෝ සැපසේ වසත්ය" යි කියන ලද්දේය.

මා·විසින් ඒ කෙසේදැයි කියනලද්දේය? පක්ෂීහු කියත්.

"එක්කාලයෙක්හි වැසිකාලයවූයේද වැසිනැතිබැවින් පිපාසයෙන් පීඩිතවූ ඇත්සමූහය ඇත්රජහට "ස්වාමිය! අපහැමගේ

---

1. ශාඞ්ග :—සෙවිතව්‍යො මහාවෘක්ෂඃ ඵලච්ඡායාසමන්විතඃ,
යදි දෛවාත් ඵලං නාස්ති ඡායා කෙන නිවාර්‍ය්‍යතෙ?.

2. අන්‍යච්ච :—හීනසෙවා න කර්තව්‍යා කර්තව්‍යො මහදාශ්‍රයඃ,
පයො'පි ශෞණ්ඩිකීහස්තෙ වාරුණීත්‍යභිධීයතෙ.

3. අජාසිංහප්‍රසාදෙන වනෙ චරති නිර්භයම්,
රාමමාසාද්‍ය ලඞ්කායාං ලෙභෙ රාජ්‍යං විභීෂණඃ.

4. අන්‍යච්ච :—මහානප්‍යල්පතාං යාති නිර්ගුණෙ ගුණවිස්තරඃ,
ආධාරාධෙයභාවෙන ගජෙන්ද්‍ර ඉව දර්පණෙ.

5. විශෙෂතශ්ච :—ව්‍යපදෙශෙ'පි සිද්ධිඃ ස්‍යාදතිශක්තෙ නරාධිපෙ,
ශශිනො ව්‍යපදෙශෙන වසන්ති ශශකාඃ සුඛම්.

ජීවත්වීම පිණිස කිසියම් උපායෙක් නැත්තේය. කුඩාසතුන්ගේ ගිලීමට සුදුසුවූ ජලස්ථානයෙහි ගිලීම නොහැකිබැවින් අන්ධයන් මෙන් අපිකොතැන්හි යමුද කුමක්නම් කරමෝදැයි?" කියයි. ඉක්බිත්තෙන් හස්තිරාජයා නුදුරුතැනකට ගොස් පිරිසිදු ගැඹුරු ජලයක්දැක්වූයේය. ඉන්පසු ඒ ජලස්ථානයාගේ ඉවුරෙහිවසන සාවෝ ඇතුගේ පාවලින් මැඩීමකරණකොටගෙණ සුණු විසුණුවූවෝය. ඉන්පසු ශිලීමුඛනම් සාවෙක් "පිපාසයෙන් යුක්තවූමේඇත්රැලවිසින් නිරන්තරයෙන් මේස්ථානයකරාපැමිණිය යුතුය. එහෙයින් අපගේ ගොත්‍රය නාසනලද්දේයයිසිතී. ඉක්බිත්තෙන් විජයනම් මහලු සාවෙක් "පින්වත්නි තොපි නොතැවව් මා විසින් මේ පීඩාව වැළැක්වීම පිණිස ප්‍රතිකාර කටයුතුය" යි මෙසේ පොරොන්දුවී ගියේය. යන්නාවූ ඔහුවිසින්ද ඇත්රැලට නායකයාගේ ඉදිරියට ගොස් මා විසින් කුමක්කියයුතුද?

1. යම්හෙයකින්—ඇතෙක් යමක්හට තැවරුණු පමණින්ම නසයි, සර්පයෙක්නාසයෙන් නික්මවන වාතයපමණකින් නසයි, රජෙක්රක්නේද ජනයන් නසයි, දුර්ජනයා සිනාසෙන්නේද ජනයානසයි.

ඉක්බිත්තෙන් මම කඳුමුදුනකට නැගී ඇත්රජට වදිමි." මෙසේසිතන ලද්දේය. එසේ කළකල්හි ඇත්රජතෙමේ "තෝ කවරෙක්ද? කොතනසිට ආයේද" යි කීය. එකල්හි විජයතෙම "මම දූතයෙක්වෙමි භාග්‍යවත් චන්ද්‍රයා විසින් එවනලද්දෙමි" යි කියයි. ඇත්රජතෙමේ ඒ අසා "කටයුත්තකියනු ලැබේව" යි කියයි.

2. විජයතෙමේ—මරණුපිණිස ආයුධයන් එසවූකල්හිද දූතයෙක් අන්පරිද්දෙකින් වෙනස්කොට නොකියයි, නොමැරියයුතු බැවින් හැමකල්හි නියමකාරණයම කියයි.

එහෙයින් මම ඒ ස්වාමීහුගේ ආඥවෙන්කියමි. අසවයි කියයි. "යම්කාරණයෙකින් චන්ද්‍රයාගේ ශරීරය රක්නා මේ සාවෝ තාවිසින් පහකරවනලද්දාහුද ඒ නුසුදුස්සක් කරණලද්දේය. යම්කාරණයෙකින් රක්නාවූ ඒ සාවෝ මා සතුවූවෝද

---

1. යතඃ :—ස්පෘශන්නපි ගජෝ හන්ති ජිඝ්‍රන්නපි භුජඞ්ගමඃ,
පාලයන්නපි භූපාලඃ ප්‍රහසන්නපි දුර්ජනඃ.

2. උද්‍යතෙෂ්වපි ශස්ත්‍රෙෂු දූතො වදති නාන්‍යථා,
සදෛවාබධ්‍යභාවෙන යථාර්ථස්‍ය හි වාචකඃ.

එහෙයින්ම මට ශශාඞ්කයයි නම ප්‍රසිද්ධවූයේය " යි කියයි. දූතයා මෙසේකියනකල ඇත්රජතෙමේ හසින් " දෙවයන්වහන්ස! මේතෙම නොදැනීම හෙතුකොටගෙණ කරණලද්දේය. නැවත නොයන්නෙමි " යි මේ වචනයකියයි. ඒ අසා දූතතෙමේ " එසේ වීනම් මේ විල්හි රැඟැණීව වෙව්ලන පිණැති සඳට වැඳසතුටුද කොට යව " යි කීය. ඉක්බිත්තෙන් ඒ සාවා විසින් රාත්‍රියෙහි ඇතාගෙණගොස් ඒ ජලයෙහි චඤ්චලවන්නාවූ චන්ද්‍රමණ්ඩලයෙහි ඡායාවදක්වා ඒ ඇතාලවා වන්දවනලද්දේය. " දෙවයන්වහන්ස! මොහුවිසින් නොදැන්මෙන් අපරාධකරණ ලද්දේය ඒ සමාකරණුලැබේවයි " කියා ඒ සාවාවිසින් ඇත්රජ හරිණලද්දේය. බලසම්පන්න රජුගේනාමය කීකල්හිද ජයවන්නේය යන මේ ආදිය එහෙයින්මම කියමි " යි කියයි. ඉක්බිත්තෙන් මාවිසින් " අපගේ ස්වාමිවූ මහත් අනුභාවසම්පන්නාවූ ඒ රජහුම සමර්ථයයි ප්‍රසිද්ධය. ඒ ස්වාමියාකෙරේ තුන්ලොවටද ස්වාමිභාවය යෙදෙයි. රාජ්‍යයෙහි ස්වාමිභාවයකියනුම කවරේදැ " යි කියනලද්දේය. එකල්හි ඒ පක්ෂීන් විසින් බොල දුෂ්ටය! කෙසේ අපගේ භූමියෙහි හැසිරෙයිද? යි කියා මම චිත්‍රවර්ණරජහුගේ සමීපයට ගෙණයනලද්දෙම්වෙමි. ඉක්බිත්තෙන් රජහුගේ ඉදිරියෙහි මාදක්වා ඒ පක්ෂීන් විසින් වැඳ දෙවයන්වහන්ස! එකගසිතින්ඇසුවමැනව. " මේදුර්ජනාවූ කොකා අපගේ දෙශයෙහි හැසිරෙන්නේද ස්වාමිපාදයන්ට නින්දාකෙරෙයි. " කියනලද්දේය. රජතෙම මේතෙම කවරෙක්ද කොතනසිට ආයේදැ ? " යි කියයි. ඒ පක්ෂීහු " හිරණ්‍යගර්භනම් රාජහංසයාගේ අනුචරවූ කර්පූරද්වීපයෙන් ආ එකෙකැ " යි කීවෝය. ඉක්බිත්තෙන් ගෘධ්‍රනම් අමාත්‍යයා විසින් " ඒ කර්පූරද්වීපයෙහි ප්‍රධාන අමාත්‍යතෙමේ කවරෙක්දැ? යි මාවිචාරණ ලද්දෙම්වෙමි. එසඳමා විසින් සකල ශාස්ත්‍රතත්වය දත්තාවූ සර්වඥනම් චක්‍රවාකය " යි කියනලද්දේය. ගෘධ්‍රතෙම මේ තෙමේ ස්වකීයදෙශයෙහි උපන්නෙක්වෙයි.

1. යම්හෙයකින්—සියරටෙහි උපන්කුලපරම්පරාවෙන් ආවාවූ මනාපැවැත්ම ආශ්‍රයකොට පවත්නාවූ ධර්මාදියපරීක්ෂාකිරීමෙන් පමණකරණලද පිරිසිදු අදහස්ඇත්තාවූද ශාස්ත්‍රයදත් දූකෙළි

---

1. යතඃ:—ස්වදෙශජං කුලාචාරෙ විශුද්ධමුපධාශුචිම්,
ශාස්ත්‍රඥමව්‍යසනිනං ව්‍යභිචාරවිවර්ජිතම්.
අධීතව්‍යවහාරඥං ඛ්‍යාතං මෞලං විපශ්චිතම්,
අර්ථස්‍යොත්පාදකං සමෘද්ධිනිදධ්‍යාන්මන්ත්‍රිණං නෘපඃ.

මත් පැන්පිම්ආදියෙහි නොඇළුනාවූද පරදූරාදී දෝෂනැත්තාවූහෝ, හඳුරණලද විවාදශාස්ත්‍රයදත්තාවූ ලොකප්‍රසිද්ධ නාමයෙන් යුක්තාවූ ප්‍රසිද්ධ වංශයෙහි උපන් නීතිය නොඉක්මවා ධනය වැඩීම කරන්නාවූ පණ්ඩිතයක්හු රජතෙමේ ඇමතිබවට පමුණුවන්නේයයි කියයි.

මේ අවකාසයෙහි ගිරවා විසින් "දෙවයන්වහන්ස! කර්පූර වීපාදික්‍ෂුද්‍ර වීපයෝ දඹදිවටම ඇතුළත්වෙත්. ඒ කර්පූර වීපයෙහිද ස්වාමිපාදයන්වහන්සේගේ අධිපතිභාවයවෙයි" කියනලද්දේය. ඉක්බිත්තෙන් රජුවිසින්ද "එසේමය,

1. යම්හෙයකින්—රජද, උමතුනැනැත්තේද, ලදරුවෙක්ද, ස්ත්‍රීද, ධනයනිසා අහංකාරසිත්ඇති නැනැත්තේද නොලද හැක්කාවූ ද්‍රව්‍යද ලැබීමට පතත්, යමක් නිදුකින් ලදහැකිද ඊටපතනබව කියනුකිම්ද" යි කියනලද්දේය.

ඉක්බිත්තෙන් මාවිසින් "ඉදින් වචනයපමණින්ම ඒ කර්පූර වීපාදී ස්ථානයෙහිද ශ්‍රීමත් ස්වාමිපාදයන් වහන්සේගේ අධිපතිභාවයවන්නේනම්, එකල්හි ජම්බුවීපයෙහිද අපගේ ස්වාමීවූ හිරණ්‍යගර්භ රජුගේ අධිපතිභාවය ඇත්තේයයි කියනලද්දේය. ගිරාතෙම මේ කාරණයෙහි නියමය කෙසේදැයි? කීයේය. මා විසින් "සටන්කිරීමය" යි කියනලද්දේය. රජුවිසින් සිනාසී "ගොස්ස්වකීය ස්වාමියා සරසව" යි කියනලද්දේය. එකල්හි මාවිසින් "ස්වකීයදූතයෙක්ද පිටත්කරණුලැබේව" යි කියනලද්දේය. රජතෙමේ "දූතකර්මයෙන් කවරෙක් යන්නේද? යම්හෙයකින් මෙබන්දෙක් දූතයෙක් කටයුතුවේද,

2. රජුකෙරේ ඇළුම්ඇත්තාවූ, ගුණයෙන්යුක්තවූ, පිරිසිදු පැවතුම්ඇති, සිය කටයුතුකිරීමෙහි නිපුනවූ, කථාවෙහි දක්‍ෂවූ දූකෙළිගා මද්‍යපානාදියෙහි නොඇළුනු, ඉවසීම්ඇති, සතුරාගේ රහස්දත්තාවූ ප්‍රඥාවෙන් සමන්විතවූ බ්‍රාහ්මණයෙක් දූතයෙක් වන්නේය" යි කියයි.

ගෘධ්‍රතෙමේ "මෙබඳුවූවෝ බොහෝදෙනෙක් ඇත්තෝය, එසේවිනමුදු බ්‍රාහ්මණයෙක්ම දූතයෙක්කට යුතුය.

---

1. යතඃ :—රාජා මත්තඃ ශිශුශ්චෛව ප්‍රමදා ධනගර්විතඃ.
අප්‍රාප්‍යමපි වාඤ්ඡන්ති කිම්පුනර්ලභ්‍යමෙව යත්.

2. භක්තො ගුණී ශුචිර්දක්‍ෂඃ ප්‍රගල්භො 'ව්‍යසනී ක්‍ෂමී,
බ්‍රාහ්මණඃ පරමර්මඥො දූතඃ ස්‍යාත් ප්‍රතිභානවාන්.

1. යම්හෙයකින්—බ්‍රාහ්මණයාකෙරේ ස්වාමිහුගේ උසස්වූ තනතුරුදීම්ආදී අනුග්‍රහයද ඉසුරුවැඩීමද කෙරේ, උසස්කුලයෙන් යුක්තවූබව ඓශ්වර්‍ය්‍ය වර්ධනයනොකෙරේ, ඊශ්වරයාහා ගැළපීම හෙතුකොටගෙණම නොසීලයාගේ දූෂ්‍යබව දුරුනොවෙයි" කියයි.

රජතෙම "එසේවීනම් ගිරාඅතමේමයේවා, ගිරව! තෝම මොහුහා සමග ඒ ස්ථානයට ගොස් අපගේ කැමැත්තකියව" යි කියයි. ගිරාතෙම "දෙවයන්වහන්සේ ආඥාකරණ ක්‍රියාව එසේම කටයුතුය, එසේවූයේද මේ කොකා පවිටුඑකෙක්වෙයි. දුර්ජනයාහාසමග නොයමි.

2. එසේමකියනලදී—දුර්ජනතෙමේ නුසුදුසු පැවැත්මකෙරෙයි නිරපරාධවූ සත්පුරුෂයන් කෙරේ නියමයෙන් පලදෙයි, රාවණතෙමේ සීතාවපැහැරගෙණ ගියේය, නිරපරාධවූ සාඟරයාගේ බන්ධනයවූයේය.

3. අනිකෙක්ද—දුර්ජනයක්හුහා සමග කිසියම්තැනෙක්හිද යායුතුනොවේ, සිටියයුතුනොවේ, එසේමැයි, කවුඩාහා සමග ගැළපී එකතැනවිසූ හංසයා මරණලද්දේය, එක්වගිය වටුවාද මරණලද්දේය" යයිකීයේය.

රජතෙම ඒ කෙසේදැයි? ඇසුයේය. ගිරාතෙමේ කියයි.

"උදෙනි රට මාර්ගයෙහිවූ වනයෙහි මහත් පුලිල ගසෙක් ඇත. ඒ ගසෙහි හංස කවුඩු දෙදෙනෙක් විසූවෝය. එක්තරා ග්‍රීෂ්මකාලයෙක්හි වෙහෙසට පැමිණි එක් මගියෙක් ඒ පුලිල ගසමුල දුන්න හා ඊය තබා සැතපුනේය. ඉන්පසු ස්වල්පකාලයක් ඉක්ම ගියකල ඒ පුරුෂයාගේ මුඛයෙන් ගසෙහි සෙවනා පහව ගියේය. එකල්හි ඉරුරැසින් වැසුනාවූ ඒ පුරුෂයාගේ මුඛය දැක කරුණාවෙන් පිරිසිදු සිත් ඇති පාපයෙන් වෙන්වූ ඒ පුලිලගසෙහි විසූ හංසරාජයා විසින් පියාපත් දෙක විසුරුවා නැවත ඔහුගේ මුඛයෙහි සෙවනකරණ ලද්දේය. ඉක්බිත්

---

1. යතඃ :—ප්‍රසාදඃ කුරුතෙ පත්‍යුඃ සන්තතිං නාභිජාතතා,
කාලිමා කාලකූටස්‍ය නාපෛතීශ්වරසඞ්ගමාත්.

2. තථාහ්‍යුක්තම් :—ඛලඃ කරෝති දුර්වෘත්තං නූනං ඵලති සාධුෂු,
දශානනො 'හරත් සීතාං බන්ධනං ස්‍යාන්මහොදධෙඃ.

3. අපරඤ්ච ;—න ස්ථාතව්‍යං න ගන්තව්‍යං දුර්ජ්ජනෙන සමං ක්වචිත්,
කාකසඞ්ගාද්ධතො හංසස්තිෂ්ඨන් ගච්ඡංශ්ච වර්තකඃ.

තෙන් දැඩිකොට නිදන සැපතින් යුක්තවූ මාර්ගයෙහි ගමනින් පිරිහී විඩාවට පත්වූ මගියාවිසින් මුවවිදහාගැන්ම කරණ ලද්දේය. ඉන්පසු සවභාවයෙන් දුෂ්ටබැවින් අනුන්ගේ සැපත ඉවසීමට අපොහොසත්වූ ඒ කවුඩා ඒ මගියාගේ මුඛයෙහි මල නික්මවීමකොට ගියේය. ඉන් පසු මේ මගියා නැගිට උඩ බැලීය. එකල්හි ඔහුවිසින් දක්නාලද හංසතෙම ඊයෙන් මරණ ලද්දේය. එහෙයින් මම නොසිටිය යුතුය යන මේ ආදිය කියමි.

1. යම්හෙයකින්—දුර්ජනයන්ගේ ආශ්‍රය හැරුව, සත්පුරුෂයන්ගේ එක්වීමකරව, රෑ දවල් දෙක්හි සුචරිත කර්මය කරව, සංසාරයාගේ නිතර නොපැවැත්මනිරන්තරයෙන් සලකව.

දෙවයන් වහන්ස වටුවාගේ කථාවද කියමී. මේ එක් කථාවක් දුර්ජනයා හා සමග විසීමේ දෙෂයවෙයි. දෙවෙනි කථාව අසත්පුරුෂයා හා සමග ගමනෙහි දෙෂය වෙයි.

එක් කවුඩෙක් ගසක අත්තෙක්හි නිදයි. වටුවෙක්ද යට දීශාවේ බිම වෙසෙයි.

එක් දිනයෙක්හි සියලු පක්ෂීහු පිණැති ගුරුළාගේ ආශ්‍රය කිරීමෙන් යුක්තවූවාහු මුහුදුවෙරළට ගියෝය. එහි කවුඩකු හා සමග වටුවෙක් ගියේය. ඉක්බිත්තෙන් යන්නාවූ ගොපාල යක්හුගේ හිසෙහි තුබූ භාජනයෙන් ඒ කවුඩා විසින් වරින්වර දී කනුලබන්නේය. ඉක්බිත්තෙන් මේ ගොපොල්ලා දී භාජනය බිමතබා උඩ බලා කවුඩු වටු දෙදෙන දුටුයේය. ඉක්බිත්තෙන් ඔහුවිසින් දක්නාලද කවුඩා ගියේය. මඳ ගමන්ඇති වටු තෙමේ ගන්නාලද්දේ ඔහුවිසින් මරණලද්දේය. නොයායුතුය යන මේ ආදිය එහෙයින් මම කියමි " යි කියයි. ඉන්පසු මාවිසින් "සහොදරවූ ගිරව! මෙසේ කුමට කියන්නෙහිද? ශ්‍රීමත්වූ සඩාම්පාදයෝ මට යම්සේද පින්වත්හද එබඳුයයි කියනලද්දේය. එපවත් ඇසූ ගිරාතෙම "ඒ එසේ වේවා එසේවිනමුදු,

2. දුර්ජන සවභා ඇත්තවුන් විසින් කියනු ලබන සිනා මුල්වූ ප්‍රියවචනයෝද නියම නැති කාලයෙහි හටගත්මල්මෙන් මට භය උපදවයි.

1. යතඃ:—ත්‍යජ දුර්ජනසංසර්ගං භජ සාධුසමාගමම්,
කුරු පුණ්‍යමහොරාත්‍රං ස්මර නිත්‍යමනිත්‍යතාම්.

2. දුර්ජනෛරුච්‍යමානානි සස්මිතානි ප්‍රියාණ්‍යපි,
අකාලකුසුමානීව භයං සඤ්ජනයන්ති මෙ,

තාගේ දුර්ජන භාවයද කථාවෙන්ම ප්‍රමාණකරණ ලද්දේය. යම්හෙයකින් ඒ රජුන් දෙදෙනාගේ සටනෙහි පින්වත්හුගේ වචනයම මුල් කරුණුවූයේද එහෙයිනි.

බලව, නුවණැති ජනතෙම ඇස් හමුයෙහි අපරාධකළ කල්හිද කණට හා සිතට ප්‍රීති දායක අනුකූල කථාවෙන් සතුටුකෙරෙයි කියයි. ඉන්පසු ඒ රජුවිසින් දූතයක් හට සුදුසු සිරිත් පරිද්දෙන් මට පූජා පිටත්කරණ ලද්දෙමි. ගිරවාද මට පසුව ආයේය. මේ සියල්ල දැන සුදුසුලෙසක් සලකනු ලැබේව" යි කීය. චක්‍රවාක තෙම සිනාසී දෙවයන්වහන්ස! "කොකාවිසින් මෙතෙක් අන්‍යදෙශවල ඇවිද ශක්තිප්‍රමාණයෙන් රජුගේ කටයුතු කරණ ලද්දේය. එසේද අඥානයන්ගේ ස්වභාවයම වෙයි.

1. යම්හෙයකින්—සියයක් නමුදු බොහෝ තමන් සතුවූ ධන දෙන්නේය, විවාදයක් නොකොට ඉවසන්නේය යන මේ කාරණය පණ්ඩිතයන් විසින් මනායයි අනුශාසනා කරණ ලද්දේය. කරුණක් නැතිවද ඩබරය කටයුතුයයි කීම වැඩ අවැඩ දෙක නියම්කළ නොහෙන අඥානයාගේ ලක්‍ෂණය" යි කියයි.

රජතෙම "මේ අතීතකාලයෙහිවූ ශෝක දැක්වීමෙන් කම් නැත ලත්වූ ඩබරය සලකනුලැබේව" යි කියයි. චක්‍රවාකතෙම දෙවයන්වහන්ස! මිනිසුන් නැතිතැනෙක්හිදී කියමි.

2. යම්හෙයකින්—පණ්ඩිතයෝ මුඛවර්ණය සැපදුන් දෙකින් උපන්පිටතක්‍රියාවගේ ආකාරය ශබ්දය යන මෙයින්ද, නෙත්‍ර විකාර මුඛවිකාරය යන ඇස්බිදීම් මුවබිදීම්වලින්ද සිතද දැන ගණිති, එහෙයින් රහස්කටයුතු කථාව මිනිසුන්නැති තැනෙක්හිදී කරන්නේය" යි කියයි.

ඉන්පසු රජද ඇමතිද එතැනසිටියෝය. සෙසුජනයෝ අන්තැනකට ගියෝය. චක්‍රවාකතෙමෙ "දෙවයන්වහන්ස! මම මෙසේදනිමි. කිසියම්අපගේ අනුචරයක්හුගේ තැතිගැන්වීමෙන් කෝකාවිසින් මේ ඩබරය කරණලද්දේය.

---

1. යතඃ :—ශතං දද්‍යාන්නවිවදෙදිතිවිඥස්‍ය සම්මතම්,
විනාහෙතුමපි වනවම්ති මූර්ඛස්‍ය ලක්‍ෂණම්.

2. යතඃ :—වර්ණාකාරප්‍රතිධ්වානෛර්නෙත්‍රවක්ත්‍රවිකාරතඃ,
අප්‍යූහන්ති මනො ධීරාස්තස්මාද්‍රහසි මන්ත්‍රයෙත්.

1. යම්හෙයකින්—රොගයෙන් ආතුරතැනැත්තේ වෙදුන්ට මනාවෙයි, යම්රජෙක් දුකෙළිමත් පැන්පිම්ආදියෙහි ඇළුනේද හෙතෙම සෙවකයන්ට සැපඇතිකෙරේ. අඥනයා සඳහා නුවණැත්තෝ ජීවත්වෙති, කලහකරණ ජනයානිසා රජහුගේ ජීවත් වීමවෙයි" කියයි.

රජතෙම "එසේවේවා මෙහිකාරණය පසුවපරීක්ෂාකටයුතු වෙයි. දන්කටයුතුව තිබෙනයමක් කියව" යි කීයේය. චක්‍රවාකතෙම "දෙවයන්වහන්ස! පළමුකොට චරපුරුෂයෙක් ඒ ස්ථානයටයේවා. ඒගමනින් ඒ රජහුගේ ක්‍රියාවද බලඇතිනැති බවද දනුම්හ.

2. එසේමැයි—රජහටතමාගේ රටවලද අනුන්ගේ රටවලද කටයුතුනොකටයුතු බැලීමපිණිස අප්‍රසිද්ධවශයෙන් ඇවිදින තැනැත්තේ ඇසක්වැනිවෙයි, ඒ ඇස යම්රජක්හට නැත්තේද ඒ රජ අන්ධයෙක්මය.

ඒ චරපුරුෂයාද විශ්වාසකටයුතුවන දෙවෙනි පුරුෂයක්හු ගෙණ ඔහුහා සමගයේවා. මේ චරපුරුෂයා ඒ රටෙහිසිට දෙවෙනි තැනත්තා සතුරන්ගේ දෙශයෙහි රහස්කටයුතුකරුණු විවෙකව නියමකොට කියාපිටත්කරඑවාවා.

3. එසේදකියනලදී—තපස්වීන්ගේ වෙශයෙන්යුක්තවූ ස්වකීය චරපුරුෂයක්හුහා සමග තීර්ථය සන්‍යාසිආදීන් වසනතැනය දෙවාලය යන මේස්ථානවලදී ශාස්ත්‍රදැනගැන්මය යනකපට හෙතුවෙන් යුක්තවකියන්නේය.

අප්‍රසිද්ධව හැසිරෙණ තැනැත්තේද යමෙක් දියෙහිද ගොඩද හැසිරේද එබන්දෙක් වියයුතුය. එබැවින් මේ කොකාම ඒ චරපුරුෂත්වයට ගන්නාලැබේවා. මෙබඳුවූ එක්තරා කොකෙක් දෙවෙනියෙක්වයේවා. චරපුරුෂභාවයෙහි යෙදුනාහුගේ පිරිවර ජනයාද රජගෙය දොරටුවෙහි සිටීවා. එසේද, දෙවයන් වහන්ස! මේ කථාවද අතිශයින් රහස්කොට තැබියයුතුය.

---

1. යතඃ :– වෛද්‍යානාමාතුරඃ ශ්‍රෙයාන් ව්‍යසනී යො නියොගිනාම්,
විදුෂාං ජීවනං මූර්ඛඃ සවගෙතවා නෘපතෙර්ජනඃ.

2. තථාහි :– භවෙත් ස්වපරරාෂ්ට්‍රාණාං කාර්‍ය්‍යාකාර්‍ය්‍යාවලොකනෙ,
චාරශ්චක්ෂුර්මහීභර්තුර් යස්‍ය නාස්ත්‍යන්ධ එව සඃ.

3. තථාචොක්තම් :– තීර්ථාශ්‍රමසුරස්ථානෙ ශාස්ත්‍රවිඥානහෙතුනා,
තපස්විව්‍යඤ්ජනොපෙතෛඃ ස්වචරෛඃ සහ සංවදෙත්.

1. යම්හෙයකින්—කන් සයකින් අසනලද රහසද එසේම අනුන් විසින් කරණලද්දාවූ ක්‍රියාවගේ අදහස දැනගැන්මෙන් පැමිණි කාරණයද හෙදයට පැමිණෙන්නේයයි මේ කාරණ යෙන් තමා දෙවෙනිකොට රජහු විසින් ඇමතියාසමග රහස් මන්ත්‍රණය කටයුතුවේ.

2. අනිකෙක්ද—රජහට රහසප්‍රකාශවූකල යම්දොෂයෝ උප දීද්ද, ඒ දොෂයෝ ශුද්ධකළනොහෙත්යයි නීතිශාස්ත්‍රඥයන්ගේ අදහසවෙයි" කියයි.

රජතෙම පරීක්‍ෂාකොට මා විසින් චරපුරුෂයෙක් වනාහි ලද්දේයයිකීය. ඇමතිතෙමේ "දෙවයන්වහන්ස! සටන්කාල යෙහි ජයද ලදහැකිවෙයි" කියයි. මේ අතුරෙහි දොරටුපාලයා ප්‍රවිෂ්ටවවැද "දෙවයන්වහන්ස! ජම්බුද්වීපයෙන් ආවාවූ ගිරාතෙම දොරටුවෙහි සිටියි" කීය. රජතෙමේ චක්‍රවාකයාදෙස බලයි. චක්‍රවාකයා විසින් දඹදිවින් ආ දූතයන්ගේ විසීමපිණිස කරණ ලද ගෙටගොස් පළමුකොටවසාවා, "දෙවයන්වහන්සේ ආඥා කරණපරිද්දෙන්" පසුව අවුත් දැක්කයුතුයයි කියනලද්දේය. මෙසේකියා දොරටුපාලතෙම ගිරවා ගෙණගියේය. රජතෙම සටනවනාහි එළඹසිටියේයයි කියයි. චක්‍රවාකතෙම "දෙවයන් වහන්ස! එසේදමනාව පරීක්‍ෂානොකොටවහා සටනනොකට යුතුය.

3. යම්ජනයෙක් නොවිමසා පළමුකොටම රජ්ජුරුවන් සිය රට සතුරන්ට දීමනම්වූ ක්‍ෂුද්‍රදුසු පරිද්දෙන් පරීක්‍ෂානොකොට යොදනලද සටන්පිණිස උගන්වාද හෙතෙම නිඃජිත මිත්‍රයෙක් නොහොත් නිඃජිත අමාත්‍යයෙක්වෙයි.

4. අනිකෙක්ද—යම්කාරණයෙකින් සටන්කරණ දෙදෙනා ගේම ජයලැබීම නියමනුවූයේ දක්නාලැබේද, ඒ කාරණයෙන් කිසියම් කාලයෙක්හි සතුරන් සටනින් ජයගැන්මපිණිස උත් සාහ නොකරන්නේය.

---

1. යතඃ :—ෂට්කර්ණෝ භිද්‍යතෙ මන්ත්‍රස්තථා ප්‍රාප්තශ්ච වාර්තයා,
ඉත්‍යාත්මනා ද්විතීයෙන මන්ත්‍රඃ කාර්‍ය්‍යො මහීභෘතා.

2. අපරඤ්ච :—මන්ත්‍රභෙදෙ හි යෙ දොෂා භවන්ති පෘථිවීපතෙඃ,
න ශක්‍යාස්තෙ සමාධාතුමිති නීතිවිදාං මතම්.

3. සචිවඃ කිං ස මන්ත්‍රී වා ය ආදාවෙව භූපතිම්,
යුද්ධෝද්‍යොගං ස්වභූත්‍යාගං නිර්දිශත්‍යවිචාරිතම්.

4. අපරඤ්ච :—විජෙතුං ප්‍රයතෙතාරීන් න යුද්ධෙන කදාචන,
අනිත්‍යො විජයො යස්මාද් දෘශ්‍යතෙ යුධ්‍යමානයොඃ,

1. අනිකත්ද—තවත් කාරණයෙක්, සතුටුඑළවන වචනයෙන්ද, ධනාදිය දීමෙන්ද, මිත්‍රව වසනරටවාසීන් ඔවුනොවුන් හෙදකිරීමෙන්ද, යන මේ ක්‍රියාතුනෙන් හෝ එක් එක් ක්‍රියාවකින් සතුරන් ජයගැන්මට උත්සාහකරන්නේය, කිසිකලකද සටන්කිරීමෙන් සතුරන් ජයනොගන්නේය.

2. යම්හෙයකින්—පටන්නොගන්නාලද සටනින් යුක්තවූ සියලුජනතෙමේ ශූරවෙයි, සතුරන්ගේ ශක්තිය නොදක්නාලද කවරනම් ජනයෙක් අහංකාර නොවන්නේද?

3. තවද—ගලෙක් දඬුයෙන්කළාවූ යන්ත්‍රය කාරණකොටගෙණ යම්සේ ඔසවනුලැබේද එසේ සත්වයන් විසින් නොනගනුලැබෙයි, උපාය සවල්පකල්හිද ප්‍රයොජනලැබීම මහත්වෙයි, මේතෙම මන්ත්‍රණයෙහි මහත්ප්‍රයොජනයයි.

එසේද එළඹසිටි සටන පරීක්ෂාකොට බලාව්‍යවහාරකරණු ලැබේවා.

4. යම්හෙයකින්—සුදුසුකාලයෙහි කරණලද සීසෑම්ආදි උත්සාහය හෙතුකොටගෙණ ගොවියා ශස්‍යඵලය යම්සේ ලබන්නේවේද, දෙවයන්වහන්ස! එපරිද්දෙන් මේ රාජනීතිතොමෝ බොහෝකාලයකින් පලදෙන්නිය, එකෙණෙහි පලනොදෙන්නිය,

5. අනිකත්ද—භයකාරණය ලන්නුවූකල තුවණැත්තහුගේ භයට සැකයද, භයකාරණයලන්වූකල පරාක්‍රමය දැක්වීමද උතුම්වෙයි, ලොකයෙහි සපිරබුඩිමත්තැනැත්තේ විපත්තිය එළඹසිටිකල ධෛර්‍ය්‍යයට පැමිණේ.

---

1. අන්‍යච්ච :—සාමනා දානෙන භෙදෙන සමස්තෛරථවා පෘථක්,
සාධිතුං ප්‍රයතෙතාරීන් න යුද්ධෙන කදාචන.

2. යතඃ :—සර්ව එව ජනඃ ශූරො හ්‍යනාසාදිතවිග්‍රහඃ,
අදෘෂ්ටපරසාමර්ථ්‍යඃ සදර්පඃ කො භවෙන්නහි?

3. කිඤ්ච :—න තථොත්ථාප්‍යතෙ ග්‍රාවා ප්‍රාණිනා දාරුණා යථා,
අල්පොපායෙ මහාසිද්ධිරෙතන් මන්ත්‍රඵලං මහත්.

4. යතඃ :—යථා කාලකෘතොද්‍යොගාත් කෘෂිඃ ඵලවතී භවෙත්,
තද්වන්නීතිරියං දෙව චිරාත් ඵලති න ක්ෂණාත්.

5. අපරඤ්ච :—මහතො දූරෙ භීරුත්වමාසන්නෙ ශූරතා ගුණඃ,
විපත්තෞ හි මහාංල්ලොකෙ ධීරත්වමධිගච්ඡති.

1. අනිකෙක්දවෙයි—නොසිවසීම සිදුකළයුතුසියලු කාරණ යන්ට එකාන්තයෙන් අන්තරායවෙයි, කිමෙක්ද ඉතා ශීතවූද ජලය පොළෝතලය නොබිඳීද? බිඳීමැයි.

විශෙෂයෙන්ද, ඒ චිත්‍රවර්ණරජතෙම මහත් තෙජසින් යුක්ත යෙක්වෙයි.

2. යම්හෙයකින්—බලඇත්තාහා සමග සටන්කළයුතුය යන උදාහරණයෙක් නැත්තේය, මිනිසුන්ගේ සටන්කිරීමමෙන් හස්තියක්හු හාසමග සටන්කිරීම තරම්නොවෙයි.

3. අනිකෙක්ද—යමෙක් නුසුදුසු කාලයෙහි සතුරන් මඩනට උත්සාහකෙරේද හෙතෙම අඥානයෙක්වෙයි, මහත් බලවන්තයා හා සමග විරුඬය කුහුඹුවන්ට පියාපත් හටගැන්මමෙන් තමන්ගේ විනාශය පිණිසමවෙයි.

4. නවද—නීතිශාස්ත්‍රයදත් ජනතෙමේ ඉදිබුවාගේ හැකිලීම මෙන් මුඛය හැකිලීම ආශ්‍රයකොට අනුන්විසින් කරණලද පීඩා වද ඉවසන්නේය, එසේද වෛරය පිරිමැසීමට සුදුසුවූ ශක්ති යෙන් යුක්තවූයේ රළුවූ සර්පයක්හුමෙන් විරුඬක්‍රියාව පිණිස නැගීසිටින්නේය.

5. දෙවයන්වහන්ස ! ඇසුවමැනව—සාමාදී උපායදත් ජනතෙම නදියෙහි ජලවෙගය මහත් ගස්හා තණමුල් ඉදිරීමද නැසීමද කරන්නාමෙන් මහත් බලවත්වූද බලනැත්තාවූද සතුරන්ඇතිකල්හි මැඩීමට පොහොසත්වේ.

එබැවින් රාජදූතවූ මේ ගිරවා කොටුව තනනු ලබනතෙක් අස්වසා මේ නුවරම රක්නාලැබේවා.

---

1. අන්‍යච්ච :—ප්‍රත්‍යූහඃ සර්වසිද්ධීනාමුත්තාපඃ ප්‍රථමඃ කිල,
අතිශීතලමප්‍යම්භඃ කිං භිනත්ති න භූතලම්.

2. යතඃ :—බලිනා සහ යොද්ධව්‍යමිති නාස්ති නිදර්ශනම්,
න යුද්ධං හස්තිනාසාර්ධං නරාණාං පාදයුද්ධවත්,

3. අන්‍යච්ච :—ස මූර්ඛඃ කාලම්ප්‍රාප්‍ය යො ' පකර්තරි වර්තතෙ,
කලිර්බලවතාසාර්ධං කීටපක්‍ෂොද්‍යමො යථා.

4. කිඤ්ච :—කෞර්මං සඞ්කොචමාස්ථාය ප්‍රහාරමපි මර්ෂයෙත්,
ප්‍රාප්තකාලස්තු නීතිඥ උත්තිෂ්ඨෙත් ක්‍රූරසර්පවත්.

5. ශාඞ්ගදෙව :—මහත්‍යල්පො ' ප්‍යුපායඥඃ සමමෙව භවෙත් ක්‍ෂමඃ,
සමුන්මූලයිතුං වෘක්‍ෂාන් තෘණානීව නදීරයඃ.

1. යම්හෙයකින්—ප්‍රාකාරයක්තුළ සිටි සටන් කරන්නෙක් එකෙක්වූයේද සතුරුසෙනඟ සියයක්හා සටන්කෙරෙයි, ප්‍රාකාරයතුළවූ සියක්දෙනෙක්ද සදහසක් සතුරන්හා සටන්කෙරෙති එහෙසින් රජ්ජුවිසින් ප්‍රාකාරයෙක් කරණුලැබේ.

2. තවද—කොටුවක නොවසනරජතෙම මහත්බලඇත්තාවූද බලනැත්තාවූද කිසිසතුරකුගේ නිදුකින් පරාජයකිරීම හැකි නොවෙයි, කොටුවක නොවසන රජතෙම නැවකින් වැටුනු මිනිසක්හුමෙන් ගිලේ.

3. ගැඹුරු අගලින් වටකරණලද උස්වූ පවුරකින් යුක්තවූ ජලයන්ත්‍රය පිම්ඇදියට සුදුසුවූ ජලය පර්වතයනදියදිය නැත්තාවූ ස්ථානය වනය යනමෙයින් යුක්තවූ කොටුවක් කරන්නේය.

4. මහත්බවය, අතිශයින් උස්මිටිබවය, දිය, වී, දර, යනමොවුන්ගේ රැස්කිරීමය, ඇතුළතට වදින මාවද්ද, පිටතටනික්මෙනමාවද්දයන මොව්හු සද්දෙන කොටුවෙහි සම්පත්තීහුයයි කියයි.

රජතෙම කොටුවකිරීමපිණිස ස්ථාන පරීක්ෂාකිරීමෙහි කවරෙක් නියොගකරණු ලැබේදැයි කියයි.

5. චක්‍රවාකතෙමේ—යම්ජනයෙක් යම්කටයුත්තෙක්හි දක්ෂද ඒ ජනයා ඒ කටයුත්තෙහි නියොග කරන්නේය, යම් ජනයෙක් කටයුතුක්‍රියාවන්කෙරෙහි නොදන්නේද හෙතෙම ශාස්ත්‍රවන්තයෙක්වූයේද පමාවෙයිකියයි.

රජතෙම විල්ලිහිනියාබලා එම්බල විල්ලිහිනිය! තෝ වහා කොටුවක් පරීක්ෂා කරවසිනීය. විල්ලිහිනියාවැඳ "දෙවයන්

---

1. යතඃ :—එකඃ ශතං යොධයති ප්‍රාකාරස්ථො ධනුර්ධරඃ,
ශතං දශසහස්‍රාණි තස්මාද්දුර්ගං විධියතෙ.

2. කිඤ්ච :—අදුර්ගවිෂයඃ කස්‍ය නාරෙඃ පරිභවාස්පදම් ?
අදුර්ගොනාශ්‍රයො රාජා පොතච්‍යුතමනුෂ්‍යවත්.

3. දුර්ගං කුර්‍යාන්මහාඛාතමුච්චප්‍රාකාරසංයුතම්,
සයන්ත්‍රජලශෛලං හි සරින්මරුවනාශ්‍රයම්.

4. විස්තීර්ණතාතිවෛෂම්‍යං රසධාන්‍යෙධ්මසංග්‍රහඃ,
ප්‍රවෙශශ්චාප සාරශ්ච සප්තෛතා දුර්ගසම්පදඃ.

5. යො යත්‍ර කුශලඃ කාර්‍යෙ තං තත්‍ර විනියොජයෙත්,
කාර්‍යෙෂ්වදෘෂ්ටකර්මා යො ශාස්ත්‍රඥොපි විමුහ්‍යති.

වහන්ස ! පළමුකොට මේ මහත් විල්හිම බොහෝ කාලයකපටන් සලකනලද කොටුවඇත්තේය. එසේද මේ විලමැද දිපයට කැයුතුදුරුස්කරණුලැබේවා.

1. යම්හෙයකින්—මහරජ ! සියලුම ද්‍රව්‍යයන්ගේ රුස්කිරීමට වඩා වී, යව, ආදිවූ ධාන්‍ය රුස්කිරීමකට යුතුවෙයි, මුඛයතුළ තබනලද්දවූද රත්නයෙක් දිවිරැකීම නොකෙරෙයි.

2. තවද—සියලු රසයන්ටවඩා ලුණුරස උතුම්වෙයි, එහෙයින් ලූණුගන්නේය, ඒ ලූණු නැතිසියලුම ද්‍රව්‍ය ගොමමෙන් වෙනස්වූ රසයෙන් යුක්තවෙසිකිය.

රජතෙමේ "යුහුවගොස් සියල්ලපටන්ගණු ලැබේවයි" කියයි. නැවත වැඳ දෙරටුපාලතෙම "දෙවයන්වහන්ස ! සිංහල ද්විපයෙන් ආවාවූ මෙඝවණීනම් කවුඩු රජෙක් දොරටුවෙහි සිටී. පිරිවර ජනයාසහිතවූ ඒ රජතෙමේද නමස්කාරකෙරෙයි. ස්වාමි පාදයන්වහන්සේ දක්නට කැමතිවෙසිකියයි. රජතෙම "කවුඩා නුවණැත්තේද බොහෝදෙය දක්නේදවෙයි. එබැවින් ඒතෙම අපගේ පක්ෂයෙහි සංග්‍රහකටයුතුවෙයි" කියයි. චක්‍රවාකතෙමේ "දෙවයන්වහන්ස ! එසේවේවා එසේද කවුඩුතෙම අපට සතුරු වෙයි ගොඩහැසිරෙන්නෙක අපටසතුරු පිරිසෙහිවූ ඔහුවිසින් යොදනලද්දේ කෙසේනම් සංග්‍රහකරණුලැබේද ?

3. එසේදකියනලදී—යමෙක් ස්වකීය ජනයන් හැරීමෙන් සතුරුපිරිසකෙරෙහි ඇළුනේද ඒ අඥානතෙමේ නිලවණීයෙන් රඳනලද සිවලාමෙන් සතුරන් විසින් මරණුලැබෙයි" කියයි.

රජතෙම ඒ කෙසේදැයි විචාළේය, ඇමතිතෙමේ කියයි.

එක්තරා සිවලෙක් නුවරපෙදෙසක සියකැමැත්තෙන් ඇවිදිතේ නිලවණී යුෂයෙන් පූරවනලද්දවූ භාජනයෙක්හි වැටුනේය. පසුව එසින් නැගියන්ට නොහැකිවූයේ උදෑසන තමා මළඑක්හුමෙන් දක්වා සිටියේය. ඉක්බිත්තෙන් අවරිබඳන හිමියාවිසින් මේ සිවලා ඔසවා දුරුතැනකට ගෙණගොස් දමන

---

1. යතඃ :—ධාන්‍යානාං සංග්‍රහො රාජන් උත්තමඃ සර්වසංග්‍රහාත්,
නික්ෂිප්තං හි මුඛෙ රත්නං න කුර්‍ය්‍යාත් ප්‍රාණධාරණම්.

2. කිඤ්ච :—ඛ්‍යාතඃ සර්වරසානාං හි ලවණො රස උත්තමඃ,
ගෘහ්ණීයාත් තං විනා තෙන ව්‍යඤ්ජනං ගොමයායතෙ.

3. තථාචොක්තම් :—ආත්මපක්ෂපරිත්‍යාගාත් පරපක්ෂෙ ච යො රතඃ,
ස පරෛර්හන්‍යතෙ මූඪො නීලවර්ණශෘගාලවත්.

ලද්දේය. ඉන්පසු මේ සිවලා වනයටගොස් නීලවර්ණවූ තමාදැක "මමදැන් උතුම්වූ වර්ණවත්වෙමි එහෙයින් ස්වකීය ජාතියට තමාගේ උතුම්බව කුමක්නිසා සම්පාදනය නොකෙරෙම්ද" යි? සිතී. මෙසේසිතා සිවලුන් කැඳවා ඒ සිවලාවිසින් මම පිණැති වන දෙවතාවා විසින් පියඅතින් වනය පිළිබඳවූ රාජ්‍ය පදවියෙහි සියලු බෙහෙත් රසයෙන් අභිෂේක කරණලද්දේය. මාගේ නීල වර්ණය බලත්වා, මේ වර්ණයම මීටප්‍රමාණවෙයි. එබැවින් අද පටන් මාගේ ආඥාවෙන් මේ වනයෙහි පැවතීම කටයුතුය." යි කියනලද්දේය. සිවල්හුද උත්තමවර්ණයෙන්යුත් ඒ සිවලාදැක අවයව අටක් නැමීම් සහිතවවැඳ "දෙවයන්වහන්සේ යම්පරිද් දෙකින් ආඥාකෙරේද එපරිද්දෙන් හැසිරෙම්හයි කීවෝය. මෙසේ මේ නියමයෙන් වනයෙහි වසන සියල්ලවුන්කෙරේ ස්වාමිබව ඒ සිවලාහටවූයේය. ඉක්බිත්තෙන් සියනෑයන් විසින් පිරිවරණලද ඒ සිවලා විසින් උතුම්බව සිදුකරණ ලද්දේය. ඉන්පසු ඔහු විසින් සිංහව්‍යාඝ්‍රාදී උත්තමජාතිමත් අමාත්‍යාදීන්ලැබ සිවලුන් දැකලජ්ජාවන්නාහු විසින් අගෞරවකොට සියනෑයෝ දුරුකරණ ලද්දාහුය. ඉක්බිත්තෙන් දුකට පැමිණි සිවලුන් දැක මහලු සිවලෙක්හු විසින් "තෝපි නොතැවෙව් නීතිශාස්ත්‍රය නොදත් මොහුවිසින් මමීයන් දත්අපි ඉදින් ගහීකරණලද්දමෝද එබැවින් යම් පරිද්දෙකින් මේතෙම නස්නේද ඒ මරණය මා විසින් කටයුතුය. යම් කාරණයෙකින් මේ සිවලාකෙරේ ව්‍යාඝ්‍රයා මුල්වූ සත්වයෝ වර්ණයපමණකින් වශාකරණලද්දාහුද එහෙයින් සිවලායයි නොදැන මොහු රජුයයි සිතත්. එබැවින් යම්ක්‍රියාවෙකින් මේතෙම සිවලෙකැයි දන්නාලැබේද එබඳුක්‍රියාවක් කරව්. ඒ කාරණයෙහි මම යමක් කියම්ද එසේකටයුතුය. සවස් කාලයෙහි සියල්ලෝ ඔහුට නුදුරුතැනෙක්හිදී එක්වර මහත් ශබ්දකරන්නවු. නැවත ඒ ශබ්දය අසා ඔහුවිසින්ද ස්වභාවයෙන් ශබ්දකටයුතුය.

1. යම්හෙයකින්—යමක්හටවනාහි යම් ස්වභාවෙක් වන්නේද මේ තැනැත්තේ ඒ ස්වභාවය ඉක්මවියනොහේ, බල්ලා ඉදින් රජෙක්කරණුලැබේද කිමෙක්ද ඒ තෙමේ වහන්සගල නොකාද?

---

1. යතඃ :– යඃ ස්වභාවො හි යස්‍ය ස්‍යාත් තස්‍යාසෞ දුරතික්‍රමඃ,
ශ්වා යදි ක්‍රියතෙ රාජා ස කිං නාශ්නාත්‍යුපානහම්.

ඉක්බිත්තෙන් ශබ්දයෙන්දූනවාක්‍යයා විසින් මැරියයුතුයයි නියමකරණ ලද්දේය. එසේකළකල්හි ඒ නියමයවූයේය.

1. එසේහෙයින් කියනලදී—ස්වකීය ජාතියෙහිවූ සතුරුතෙම ධනාදීන්ගේ දුර්වලතාවයද මර්මස්ථානද බලයද යන සියල්ල දනී ලැව්ගින්න වියළිගසමෙන් ඇතුළතටගියේ දවයි.

එහෙයින් මම තමන් පක්ෂයහැරීමෙන් යනමේ ආදිය කියමි කීයේය. රජතෙමේ "ඒ වනාහි එසේය එතකුදුවූවත් ඒ තාක් දක්නාලැබේවා, මේතෙම දුරසිටආයේය. ඔහු අපගේ පක්ෂයට ගැණීමෙහි පරීක්ෂාකටයුතුවෙයි" කියයි. චක්‍රවාකතෙම "දෙව යන්වහන්ස! අනුචරතෙම හරිණලද්දේය. කොටුවද සම්පාදනය කරණලද්දේය. පසුව ගිරවාදබලා පිටත්කරණුලැබේවා.

2. තවද—චන්ද්‍රගුප්තරජ්ජුගේ ඇමතිවූ චාණක්‍ය තෙම දක්ෂවූ දූතඋපායෙන් නන්දරජ්ජුමැරීය, එහෙයින් සෙනාවට ප්‍රධාන අමාත්‍යයක්හුහා යුක්තවූයේ වෙදයදත්දූතයා රජහු සමීපයේ නොසිටවන්නේය" යි කියයි.

ඉක්බිත්තෙන් සභාවක්කොට ගිරවාද කවුඩාද කැඳවන ලද්දේය. ගිරවාමඳක් ඔසවනලද ඉසින්යුක්තව දෙනලදඅස් නෙහි හිඳපින්වත් මහාබ්‍රහ්මය! රාජාධිරාජවූ ශ්‍රීමත්චිත්‍රවර්ණ තෙම "ජීවිතයෙන් හෝ ඓශ්වර්‍ය්‍යයෙන් ඉදින් ප්‍රයොජනනම් එකල්හි වහාඅවුත් මාගේ පාදෙක වඳුව ඉදින් නොහැකිනම් විසීමට අන්තැනක් දැනගණුව" යි නුඹවහන්සේට ආඥකරණ සේකැයි කියයි. එපවත්අසා රජතෙම රැහැනිව ආඃ! අපගේ සභාවෙහි මුගේගෙළඅල්වා පිටත එළවීමට කිසිවෙක් නැත්තේ දැයි කියයි. ඉන්පසු මෙඝවර්ණයා නැගිට "දෙවයන්වහන්ස මට ආඥකළමැනව, මේ දුර්ජනවූ ගිරවා මම මරම්කියයි. අමාත්‍ය තෙම පින්වත! එතකලට මෙසේනොඅසව.

3. යම්තැනෙක්හි දක්ෂයෝනැද්ද ඒ ස්ථානය සභාවෙකැයි සැලකිය යුතුනොවන්නීය, යම්කෙනෙක් මනාක්‍රියාව නොදක්

---

1. තථාචොක්තම්:—ජිද්‍රං මර්ම්ම ච වීර්‍ය්‍යං ච සර්වං වෙත්ති නිජෙ රිපුඃ,
දහත්‍යන්තගීතශ්චෛව ශුෂ්කවෘක්ෂමිවානලඃ.

2. කිඤ්ච :—නන්දං ජඝාන චාණක්‍යස්තීක්ෂ්ණදූතප්‍රයොගතඃ,
තද්දූරාන්තරිතං දූතං පශ්‍යෙද්ධීරසමන්විතඃ.

3. න සා සභා යත්‍ර න සන්ති වෘද්ධා වෘද්ධා න තෙ යෙ න වදන්ති ධර්ම්මං,
ධර්ම්මඃ ස නො යත්‍ර න සත්‍යමස්ති සත්‍යං න තද් යද් භයමභ්‍යුපෛති.

වද්ද ඔව්හු දක්ෂයෝයයි සැලකියයුතු නොවෙත්, යම් කථාවෙක්හි ඇති ස්වභාවයනැද්ද ඒ බස ධර්මයෙක් නොවේ, යම් බසෙක් සැකයටපැමිණේද ඒ බස සත්‍යනොවේ.

1. දූතතෙමේ නීචකුලයෙහිවූ වෙක්හෝ බ්‍රාහ්මණයෙක්වූයේද හිංසානොකටයුතුය, රජතෙම යම් කාරණයෙකින් දූතළපායෙන් ප්‍රකාශකෙරේද එහෙයින් ආයුධ එසවූකල්හිද දූතයා වෙනස්කොට අන්පරිද්දෙකින් නොකියයි.

2. අනිකෙක්ද.—කවරෙක්නම් දූතයාගේ වචනය කරණකොටගෙණ තමාගේ හීනබවහෝ සතුරාගේ උසස්බව දන්නේද, හැමකල්හි හිංසා නොකටයුතු බැවින් දූතයා සියල්ලම ප්‍රකාශකෙරෙයි" කියයි.

ඉන්පසු රජද කවුඩාද පළමු ස්වභාවයට පැමිණියේය. ගිරවාද නැගිටගියේ. පසුව චක්‍රවාකයා විසින් ගෙණඅවුත් සතුටුකරවා රන්පලඳනා ආදියදී පිටත්කර හරිණලද්දේ සිය රටටගියේය. ඉක්බිත්තෙන් වින්ධ්‍යපර්වතයට ගොස් තමාගේ රජවූ චිත්‍රවර්ණයාට වැන්දේය. චිත්‍රවර්ණරජතෙම ඔහුදැක "ගිරව! ආරංචිකෙසේද? ඒ දෙශයකෙබඳුද" යි විචාරයි. ගිරාතෙමේ "දෙවයන්වහන්ස! සංක්ෂෙපයෙන් මේතෙම ආරංචිපිළිබඳවූ කථාය. දැන්සටනට පටන්ගැණීම කරණුලැබේවා. කර්පූරද්වීප නම් ඒ දෙශයස්වර්ගයාගේ භාගයක්හාසමය, කෙසේනම්වර්ණනා කරණුලැබේද" යි කියයි. රජතෙමේ සභාවට නියමවූ පණ්ඩිතයන්කැඳවා මන්ත්‍රණයකිරීම පිණිසඋන්නේය. ඒ සභාවෙහිවූවන්ට මෙකල්හි යමක් කටයුතුද ඒ කටයුතු හැමකියවූ, සටන වනාහිනියමයෙන් කටයුතුවෙයි.

3. එසේදකියනලදී—දිමෙන් ප්‍රසන්නනොවූ බ්‍රාහ්මණයෝ නටුවාහුය, අපරාධය ඉවසන රජද රටඅනුශාසනා කිරීමෙහි පොහොසත් නොවෙයි, ලජ්ජාසහිත වෙශ්‍යාද ප්‍රීතිදායක නොවන්නිය, කුලවත්ස්ත්‍රීද ලජ්ජානැත්තී නිඳිතවන්නිය" යිද කීයේය.

---

1. දූතො ම්ලෙච්ඡො 'ප්‍යවධ්‍යඃ ස්‍යාද්‍රාජා දූතමුඛො යතඃ,
උද්‍යතෙෂ්වපි ශස්ත්‍රෙෂු දූතො වදති නාන්‍යථා.

2. අන්‍යච්ච—ස්වාපකර්ෂං පරොත්කර්ෂං දූතොක්තෛර්මන්‍යතෙ තු කඃ,
සදෛවාවධ්‍යභාවෙන දූතඃ සර්වං හි ජල්පති.

3. තථාචොක්තම්—අසන්තුෂ්ටා ද්විජා නෂ්ටාඃ සන්තුෂ්ටාඃ පාර්ථිවාඃ සදා,
සලජ්ජා ගණිකා නෂ්ටා නිර්ලජ්ජා ච කුලාඞ්ගනා.

දුරදර්ශීනම් ගිජුලිහිනි ඇමතිතෙම "දෙවයන්වහන්ස! අධිකවූ සැකයට පැමිණීමෙන් සටන නොකටයුතුය.

1. යම්හෙයකින්—යම්කලෙක්හි මිත්‍රව වසනරජහුද ඇමතියෝද තමාට පක්ෂවූ ලොකයාද චඤ්චලනුවූ ආදරඇත්තාහුද, සතුරන්ගේ මිත්‍රාදීහු ස්ථිරවූ ආදර නැත්තෝද එකල්හි යුද්ධය කටයුතුය.

2. අනිකෙක්ද—රාජ්‍යයද මිත්‍රයන්ට සංග්‍රහකිරීමද රන්ද යන මේ තුණ සටනෙහි ප්‍රයොජනවෙත්, යම්කලෙක්හි මේ තුණ නියමයෙන් වන්නේද එකල්හි යුද්ධය කරන්නේය" යි කියයි.

රජතෙම "අමාත්‍යතෙමේ මාගේ සෙනඟ පළමුකොට බලාවා, එකල්හි මොවුන් කටයුතුවූ ක්‍රියාවෙහි ශක්තිය දන්නා ලැබේවා. එබැවින් නක්ෂත්‍රය දන්නෙක් කැඳවනුලැබේවා ගමන සඳහා ශුභලග්නයක් පරීක්ෂාකෙරේව" යි කියයි. ඇමතිතෙම "දෙවයන්වහන්ස! එසේද වහා ගමන්කිරීම තරම්නොවෙයි.

3. යම්හෙයකින්—යම්අඥානයෝ සතුරන්ගේ පක්ෂයෙහි බල පරීක්ෂානොකොට යුහුව සටනට වදිද්ද, ඔව්හු කඩුමුව වැළඳ ගැන්ම නියමයෙන් ලබත්" යයි කියයි.

රජතෙම "එම්බාඇමතිය මාගේ උත්සාහවැළැක්වීම සියලු ලෙසින් නොකරව. ජයකැමති තැනැත්තේ යම් පරිද්දෙකින් අන්රජුන්ගේ රාජ්‍ය මඩනේද එපරිද්දෙන් අනුශාසනාකරව" යි කියයි. ගිජුලිහිනිතෙම "දෙවයන්වහන්ස! ඒ අභිමත කාරණය කියමි. එසේවිනමුදු ඒ කාරණයපටන්ගන්නා ලද්දවූ ඵලයම දෙන්නේය.

4. එසේදකියනලදී—ඒ අනුවපවත්නාකාර්‍ය්‍යය සම්පාදනය නොකරණලදකල්හි ශාස්ත්‍රයමෙන් ඊට අනුවපවත්නා කාරණය

---

1. යථා :—මිත්‍රාමාත්‍යසහායාශ්ච යදා ස්‍යුර්දෘඪභක්තයඃ,
ශත්‍රූණාං විපරීතාශ්ච කර්තව්‍යො විග්‍රහස්තදා.

2. අන්‍යච්ච :—භූමිර්මිත්‍රං හිරණ්‍යඤ්ච විග්‍රහස්‍ය ඵලං ත්‍රයම්,
යදෛතන්නිශ්චිතං භාවි කර්තව්‍යො විග්‍රහස්තදා.

3. යථා :—විශන්ති සහසා මූඪා යෙ 'විචාර්‍ය්‍ය ද්විෂද්බලම්,
ඛඩ්ගධාරාපරිෂ්වඞ්ගං ලභන්තෙ තෙ සුනිශ්චිතම්.

4. තථාචොක්තම් :—කිං මන්ත්‍රෙණානනුෂ්ඨානෙ ශාස්ත්‍රවිත් පෘථිවීපතෙඃ,
නහ්‍යෞෂධපරිඥානාද්ව්‍යාධෙඃ ශාන්තිඃ ක්වචිද්භවෙත්.

නැතිකල්හි රජහුගේ මන්ත්‍රණයෙන් කවරප්‍රයොජනද, බෙහෙත්දැනීමෙන් පමණක් යෙදීමක්නැතිව රොගයාගේ ශමනයෙක් කිසිතැනෙක නැත්තේය.

රජුන්ගේ අනුශාසනාවද නොසික්ම වියයුතුයයි යම්පරිද්දෙකින් දන්නාලදද එසේ දන්වමි. දෙවයන්වහන්ස! ඇසුව මැනව.

1. නදීය පර්‍වතය, වනය, ඝෙනාව වසනතැනය යනමේ යම් යම් ස්ථානයෙක්හි පින්වත් මහරජ! බියඇත්තේද ඒ ඒ ස්ථානයෙහිදී සෙනාධිපතිතෙම රැස්කරණලද බලසෙනගින් යුක්තව යන්නේය.

2. සෙනාපතිතෙම ප්‍රධාන ශුරයන්ගෙන් යුක්තවූයේ ඉදිරියෙහි යන්නේය. මධ්‍යභාගයෙහි ස්ත්‍රීජනයාද රජද, ධනයද, දුර්‍වලවූ සෙනගද, සෙනාවද යන්නේය.

3. වම් දකුණු දෙපැත්තෙන් අශ්වයෝද, අශ්වයන්ගේ දෙපැත්තෙන් රථද, රථයන්ගේ දෙපැත්තෙන් ඇත්තුද, ඇතුන්ගේ දෙපැත්තෙන් පාබලසෙනඟද යන්නේය.

4. සෙනාපතිතෙම පළමුකී සෙනාව අනුව දුකට පැමිණ උත්සාහනැති සෙනාවෙහිවූවන් අස්වැසිලිකරමින් සෙමින් සෙමින් පසුවයන්නේය, රජතෙමේ අමාත්‍යයන්ගෙන්ද දක්‍ෂවූ ශුරපුරුෂයන්ගෙන්ද යුක්තවූයේ සෙනඟ පිටත්කොට ගෙණයන්නේය.

5. උස්වූද පාත්වූද භූමිභාගයෙන් යුක්තවූ පර්‍වතසහිතවූ ජලබහුලවූතැන ඇතුන් කරණකොටගෙණ යන්නේය, සමවූ භූමිභාගය අසුන් කරණකොටගෙණද නැආදි ජලස්ථානය නැව්වලින්ද සියලු තැන්හි පාබල සෙනගගෙන් යුක්තව යන්නේය.

---

1. නද්‍යද්‍රිවනදුර්ගේෂු යත්‍ර යත්‍ර භයං නෘප,
තත්‍ර තත්‍ර ච සෙනානීර්‍යායාද්ව්‍යූහීකෘතෛර්බලෛඃ.
2. බලාධ්‍යක්‍ෂඃ පුරො යායාත් ප්‍රවීරපුරුෂාන්විතඃ,
මධ්‍යෙ කලත්‍රං ස්වාමී ච කොෂඃ ඵල්ගු ච යද්බලම්.
3. පාර්‍ශ්වයොරුභයොරශ්වා අශ්වානාං පාර්‍ශ්වතො රථාඃ,
රථානාං පාර්‍ශ්වතො නාගා නාගානාඤ්ච පදාතයඃ.
4. පශ්චාත් සෙනාපතිර්‍යායාත් ඛින්නානාශ්වාසයන් ශනෛඃ,
මන්ත්‍රිභිඃ සුභටෛර්‍යුක්තඃ ප්‍රතිගෘහ්‍ය බලං නෘපඃ.
5. සමෙයාද්විෂමං නාගෛර්ජලාඪ්‍යං සමහීධරම්,
සමමශ්වෛර්ජලං නෞභිඃ සර්‍වත්‍රෛව පදාතිභිඃ.

1. වැසිකල්හි ඇතුන්ගෙන් සටනට යාම මනායයි පණ්ඩිතයන් විසින් කියනලද්දේය, වැසිනැතිකල්හි අසුන්ගෙන්ද හැම කල්හිම පාබලසෙනගගෙන් යුක්තවද යන්නේය.

2. පින්වත් මහරජ! පර්වතයෙහිදීද යාමටදුෂ්කරමාර්ගයෙහිදීද රැකීම කටයුතුය, ස්වකීය යොධයන් විසින් රක්නාලද්දහුගේද නිතර ආත්මරක්ෂාව සිතීමෙන් මඳනින්දෙන් සැතපීම කටයුතුය.

3. කොටුවෙහිහා ආගන්තුක සෙනාව වසන කඳවුරෙහිද විසූ සෙනගට පීඩාකිරීමෙන් සතුරන් නසන්නේය, මැඩීමද කරන්නේය, සතුරන්ගේ රටට වැදීම පිණිස වනයෙහි හැසිරෙණ යොධයන් මගදක්වන්නවුන් කරන්නේය.

4. යම්තැනෙක්හි රජ වෙසේද ධනය ඒ ස්ථානයෙහිවෙයි, ධනය නැතිව රජබවක් නැත්තේය, එහෙයින් ස්වකීය යොධයන්ට ධනය දෙන්නේය, ධනයදෙන්නාට කවරෙක්නම් සටන් නොකරන්නේද.

5. යම්හෙයකින්—පින්වත් මහරජ! මනුෂ්‍යතෙමේ මනුෂ්‍යයක්හට අයිතිනොවෙයි, එසේවීනමුදු ධනයට අයිතිවෙයි, සත්කාරයහෝ ශ්‍රෙෂ්ඨභාවය බලනැතිබවද ධනයඇති නැතිබව මුල් කොටපවතී.

6. නොවෙනස්වූ සිතින් යුක්තව සටන්කරන්නේය, ඔවුනොවුන් රැකීමද කරන්නේය, බලනැති යම් කිසිසෙනඟක්වේද ඒ සෙනඟ සේනාසමූහයාගේ මධ්‍යභාගයෙහි කරවන්නේය.

---

1. හස්තිනාං ගමනං ප්‍රොක්තං ප්‍රශස්තං ජලදාගමෙ,
තදන්‍යත්‍ර තුරඞ්ගානාං පත්තීනාං සර්වදෛව හි.

2. ශෛලෙෂු දුර්ගමාර්ගෙෂු විධෙයං නෘපරක්ෂණම්,
ස්වයොධෛඃ රක්ෂිතස්‍යාපි ස්වපනං යොගනිද්‍රයා.

3. නාශයෙත් කර්ෂයෙච්ඡත්‍රූං දුර්ගකණ්ටකමර්දනෛඃ,
පරදෙශප්‍රවෙශෙ ච කුර්‍ය්‍යාදාටවිකාන් පුරඃ.

4. යත්‍ර රාජා තත්‍ර කොෂො විනා කොෂං න රාජතා,
ස්වභටෙභ්‍යස්තතො දද්‍යාත් කො හි දාතුර්න යුධ්‍යතෙ.

5. යතඃ :—න නරස්‍ය නරො දාසඃ කින්තු විත්තස්‍ය භූපතෙ,
ගෞරවං ලාඝවංචාපි ධනාධනනිබන්ධනම්.

6. අභෙදෙන ච යුධ්‍යෙත රක්ෂෙච්චෛව පරස්පරම්,
ඵල්ගුසෛන්‍යං ච යත්කිඤ්චිත් මධ්‍යෙ ව්‍යූහස්‍ය කාරයෙත්.

1. රජතෙමේ පාබලසෙනඟද රැස්වූ ඇත් අස් සෙනඟ ඉදිරියෙහි සිටුවන්නේය, සතුරා මැඩපවත්වා සිටිනේය සතුරාගේ රටවද පීඩාකරන්නේය.

2. රථවලින්ද අසුන්ගෙන්ද සමබිමෙහි යුධකරන්නේය, එසේම ජලබහුලතැන්හි නැව්වලින්ද ඇතුන්ගෙන්ද යුධකරන්නේය, ගස්හා වැල්වලින් වැසීගියතැන්හි දුනුවලින්ද ඉතිරි ගොඩබිමෙහි කඩුපළිස්යන මේ ආයුධයන් කරණකොටගෙණ යුධකරන්නේය.

3. මේ සතුරාගේ තණද අනුභව කටයුතුදෙයද, දියද, දරද නිතර දූෂ්‍යකරන්නේය, වැව්ද ප්‍රාකාරයන්ද එසේම අගල්ද බිඳිනේය.

4. රජහුගේ සෙනාව අතුරෙන් ඇතා පළමුවෙනිවෙයි, අශ්වාදී අන්‍යසෙනාව ඒ තරම් නොවන්නීය, තමාගේ ශරීරාවයවයන් කරණකොටගෙණම ඇතා ආයුධයන් අටකින් යුක්තයයි දන්නාලදී.

5. අශ්වසෙනාවද සෙනාවන් අතුරෙන් උතුම්වෙයි, අස්සෙනඟ ගමන්ගත්තාවූ ප්‍රාකාරයෙකැයි දන්නාලදී, එහෙයින් අශ්වයන් බහුලකොට ඇති රජෙක් ගොඩබිමෙහි සටනක් ඇතිකල්හි ජයලබන්නේය.

6. එහෙයින් කියනලදී—අසුන්නැගී සටන්කරන්නාවූ පුරුෂයන්ට දුරසිටි සතුරෝද සමීපයෙහි පවත්නාහුමෙන් වේද්ද එහෙයින් අසුන්නැගී සටන්කරණ පුරුෂයෝ දෙවියන්විසිනුදු ජය ගන්නා නොලැබෙත්.

---

1. පදාතිංශ්ච මහීපාලඃ පුරෙ ’ නීකස්‍ය යොජයෙත්,
උපරුධ්‍යාරිමාසීත රාෂ්ට්‍රං චාස්‍යොපපීඩයෙත්.

2. ස්‍යන්දනාශ්වෛඃ සමෙ යුධ්‍යෙදනූපෙ නෞද්විපෛස්තථා,
වෘක්ෂගුල්මාවෘතෙ චාපෛරසිචර්මායුධෛඃ ස්ථලෙ.

3. දූෂයෙද්වාස්‍ය සතතං යවසාන්නොදකෙන්ධනම්,
භින්ද්‍යාච්චෛව තඩාගානි ප්‍රාකාරාන් පරිඛාස්තථා.

4. බලෙෂු ප්‍රමුඛො හස්ති න තථා ’ න්‍යො මහීපතෙඃ,
නිජෛරවයවෛරෙව මාතඞ්ගො ’ ෂ්ටායුධඃ ස්මෘතඃ.

5. බලමශ්වශ්ච සෛන්‍යානාං ප්‍රාකාරො ජඞ්ගමො මතඃ,
තස්මාදශ්වාධිකො රාජා විජයී ස්ථලවිග්‍රහෙ.

6. තථාභ්‍යුක්තම් :—යුධ්‍යමානා හයාරූඪා දෙවානාමපි දුර්ජයාඃ,
අපි දූරස්ථිතා යෙෂාං වෛරිණො හස්තවර්තිනඃ.

1. ඇත් අස්ආදී සියලු සෙනඟ රැකීම සටන්කිරීමෙහි දක්‍ෂභාවයවෙයි, වදින්නාවූද නික්මෙන්නාවූද මාර්‍ගයන්ගේ වැළකීම් රහිතබව පාබළ සෙනඟගේ කටයුතුයයි කියත්.

2. ස්වභාවයෙන් වික්‍රමවත්වූ අවි යෙදීමෙහි දක්‍ෂවූ කටයුතුවූ ක්‍රියාවෙහි උත්සාහවත්වූ දුක් ඉවසියහැකිවූ ශූරභාවයෙන් ප්‍රසිද්ධ ක්‍ෂත්‍රියයන්වැනිවූ සෙනඟ අතිශයින් ප්‍රධානයයි දනිත්.

3. පින්වත් මහරජ! රජක්හු විසින් දෙනලද ගෞරවය මුල්කොට පවත්නා ධනය හෙතුකොටගෙණ ලොව මනුෂ්‍යයෝ යම්සේ උත්සාහයෙන් සටන්කෙරෙද්ද බොහෝදෙනෙක් විසින් දෙනලද ධනය කාරණකොටගෙණද එසේ සටන් නොකෙරෙත්.

4. බලයෙන්හා වික්‍රමයෙන් යුක්තවූ ස්වල්පවූ ගණනක් සෙනඟ උතුම, බොහෝ ගණනක් සෙනඟද සංග්‍රාමශීර්‍ෂයෙහි පඬුකිරිහිතවූ බොහෝ සෙනඟද උතුම්නොවේ, එසේමැයි, බල නැතිවූවන් පලායාමතෙම ප්‍රකටවූ බලසම්පන්න සෙනාවගේ උත්සාහභංගකිරීමද කරන්නේය.

5. ස්වකීය සෙනාවකෙරේ රජහුගේ ප්‍රසන්නය නැතිබවද තමාගේ ප්‍රධානත්වය ප්‍රකාශනොකරණ බවද දියයුතුවූ ධනය නොදීමද වැටුප්දීමෙහි කල් ඉක්මවීමද සෙනාව ඔවුනොවුන් විරුද්ධවූකල අනුශාසනා නොකිරීමද යනමේ සියල්ල ඒ සෙනාව කෙරේ නොඇලීමට කරුණුයි.

6. ස්වකීයසෙනාවට වෙහෙසනොදෙන ජයකැමති රජතෙමේ සතුරන් අභිමුඛයට සේනාවහා සමඟ යන්නේය, දීඝීවූ ගමනින් වෙහෙසුනු සතුරන්ගේ සෙනඟ සුවසේ පරාජය කළහැකිවෙයි.

---

1. ප්‍රථමං යුද්ධකාරිත්වං සමස්තබලපාලනම්,
දිඞ්මාර්‍ගාණාං විශොධත්වං පත්තිකර්ම ප්‍රචක්‍ෂතෙ.

2. ස්වභාවශූරමස්ත්‍රඥමවිරක්තං ජිතශ්‍රමම්,
ප්‍රසිද්ධක්‍ෂත්‍රියප්‍රායං බලං ශ්‍රෙෂ්ඨතමං විදුඃ.

3. යථා ප්‍රභුකෘතාන්මානාද්‍යුධ්‍යන්තෙ භුවි මානවාඃ,
න තථා බහුභිර්දත්තෛර්ද්‍රවිණෛරපි භූපතෙ.

4. වරමල්පබලං සාරං න බහ්වී මුණ්ඩමණ්ඩලී,
කුර්‍යාදසාරභඞ්ගො හි සාරභඞ්ගමපි ස්ඵුටම්.

5. අප්‍රසාදො ‘නධිෂ්ඨානං දෙයාංශහරණං ච යත්,
කාලයාපො ‘ ප්‍රතිකාරස්තත්‍ර වෛරාග්‍යකාරණම්.

6. අපීඩයන් බලං ශත්‍රූන් ජිගීෂුරභිෂෙණයෙත්,
සුඛසාධ්‍යං ද්විෂාං සෛන්‍යං දීර්ඝප්‍රයාණපීඩිතම්.

1. ඥාතියක්හට වඩාසතුරු සෙනාග බිඳුවීමකරණ අනික්ඇම තියෙක් නැත්තේය. එහෙයින් ඒ සතුරාගේ ඥාතියක්හු උත්සාහයෙන් බිඳුවන්නේය.

2. යුවරජ්ජුහා සමග නොහොත් ප්‍රධාන අමාත්‍යයාහා සමග මිත්‍රව චඤ්චලනොවූ සිතින් යුක්තවූ සතුරාගේ ඇතුල් කුවර කැලඹීම කරන්නේය.

3. සටනක් ඇතිකල්හි කපටවූ පැවතුම්ඇති බිඳුවියහැකි මිත්‍රයක්හු යොදා මිත්‍රභාවයට පැමිණි රජ්ජුරුවන් නසන්නේය. නොහොත් ගවයන්ගැණීම සම්වූ ඇදීමෙන් හෝ ඒ සතුරුරජ්ජුගේ මිත්‍රවූ රජක්හු බන්ධනයෙන් හානිකරන්නේය.

4. ජය කැමති රජතෙම සතුරු රජුන්ගේ දෙශයෙහි ජනයා ගෙණවුත් සියරටෙහි වාසය කරවන්නේය, නොහොත් ධනදානය ආදරය යන මේ හිරීමෙන් වාසයකරවන්නේය, මිනිසුන් බහුලවූ ඒ රට ධනලාභය කෙරෙසි තීයේය.

රජතෙම ආඃ බොහෝකොට තීමෙන් ප්‍රයොජන නොවෙසි තියයි.

5. තමාගේ වැඩීමද සතුරාගේ හානිකිරීමද යන මේ දෙක පමණක් නියමයවන්නේය, ඒ නීතිය පණ්ඩිතයන විසින් අසිති කොට වාක්පටුත්වය කරණුලැබේ.

අමාත්‍යයා විසින් සිතාසී 'මේ සියල්ල සත්‍යවෙයි, එසේද,

6. ශාස්ත්‍රයෙහි නියමයඉක්මවා තමාගේ කැමැත්තට එකඟව පවත්නා සබ්බයා අන්‍යප්‍රකාරවේයි, නීතිශාස්ත්‍රයට අනුකූලව

---

1. ඥාතෙදපරො මන්ත්‍රී නාස්තිභෙදකරො විශාම්,
තස්මාදුත්ථාපයෙද්‍යත්නාද්ඥාතං තස්‍ය විද්විෂඃ.

2. සන්ධායයුවරාජෙන යදි වා මුඛ්‍යමන්ත්‍රිණා,
අන්තඃ ප්‍රකොපණං කාය්‍යර් මභියොක්තුඃ ස්ථිරාත්මනඃ.

3. ක්‍රූරං මිත්‍රං රණෙ චාපි හඩ්ගං දත්වාභිඝාතයෙත්,
අථ වා ගොග්‍රහාකෘෂ්ට්‍යා තන්මුඛ්‍යාශ්‍රිතබන්ධනාත්.

4. ස්වරාෂ්ට්‍රං වාසයෙද්‍රාජා පරදෙශාපහාරණාත්,
අථවා දානමානාභ්‍යාං වාසිතං ධනදං හි තත්.

5. ආත්මොදයඃ පරජ්‍යානිර්වයං නීතිරිතීයතී.
තදූරීකෘත්‍ය කෘතිභිර්වාචස්පත්‍යං ප්‍රතායතෙ.

6. අන්‍යද්‍රුච්ඡෘඞ්ඛලං සත්වමන්‍යච්ඡාස්ත්‍රනියන්ත්‍රිතම්,
සමානාධිකරණ්‍යං හි තෙජස්තිමිරයොඃ කුතඃ?.

පවත්නා සත්ත්වයා අන්‍යප්‍රකාරවෙයි, මේ පැවතුම්දෙක අතිශයින් දුරුවෙයි, එසේමැයි, ගින්නද අන්ධකාරයද යනමේ දෙදෙනාගේ සම බවෙක් කොයින්දැයි" කියනලද්දේය.

ඉන්පසු රජතෙම නැගිට නක්ෂත්‍ර පාඨකයා විසින් දන්වන ලද වෙලාවෙහි ගියේය. ඉක්බිත්තෙන් පිටත්කර අරිණලද චර පුරුෂයා හිරණ්‍යගර්භරජු සමීපයට අවුත්වැද "දෙවයන්වහන්ස! චිත්‍රවර්ණරජතෙමේ පැමිණියෙක් වැනිවෙයි, මෙකල්හි මලයපර්වතයට නුදුරුවූ භූමියෙහි පිහිටුවනලද සෙනඟින් යුතුව වෙසෙයි. නුවරතුළ සතුරන් විසින් විසීම නිරන්තරයෙන් නොකටයුතුය, යම්හෙයකින් ඒ ගෘධ්‍රනම් මහඇමතිවූයේද මේ සතුරු රජහු විසින් පළමුකොටම කවරෙක්නමුදු අපගේ කොටුවෙහි යම් හෙයකින් සිටුවන්ලදද ඒ රහස කිසිවක්හුහා සමඟ ඒ ගෘධ්‍රනම් අමාත්‍යයාගේ විශ්වාස කථාවෙහි යෙදීමෙන් මාවිසින් දන්නා ලද්දේය" යි කීය. චක්‍රවාකතෙම "දෙවයන්වහන්ස! මේතෙම කවුඩාමවෙයි" කියයි. රජතෙම "මේතෙම කිසිකලකත් නොවෙයි, ඉදින් එසේවීනම් එකල්හි ඒ කවුඩා විසින් ගිරවාගේ මැඩ පැවැත්වීම පිණිස කුමට උත්සාහ කරණලදද? අනිකෙකද ගිරවාගේ පැමිණීම හේතුකොටගෙණ කවුඩාගේ සටනට උත්සාහයවූයේය. ඒ කවුඩුද බොහෝකාලයක් මේ නුවර විසූයේය" යි කියයි. ඇමතිතෙම "එසේද අලුත ආ තැනැත්තේ සැක කටයුතුවෙයි" කියයි. රජතෙම "අලුත ආවෝද කළඋපකාරදැන පවතින්නෝ දක්නාලැබෙත්.

1. සතුරෙක්නමුදු වැඩ හැසිරෙන්නේනම් මිත්‍රයෙක්වේ, මිත්‍රයෙක්නමුදු අවැඩකරන්නේනම් සතුරෙක්වේ, ශරීරයේ උපදනා රොගය දුක්දෙයි, වනයෙහි උපදනාවූ ඖෂධය සැපඑළවයි.

2. අනිකෙක්ද—ශූද්‍රකනම් රජහට වීරවරනම් සේවකයෙක්වූයේය, ඒ සේවකතෙම මඳකලකින් තමාගේ පුත්‍රයා රජහුගෙ රට රැකීමපිණිස බිලිදුන්නේය" යි කියයි.

ඒ කෙසේදැයි? චක්‍රවාකතෙමේ විචාරයි. රජතෙම කියයි.

ශූද්‍රක රජහුගේ කෙළිවිල්හි කර්පූරකෙළිනම් රාජහංසයාගේ දූවූ කර්පූරමඤ්ජරියකොරෙ මම පෙරමහත් ඇලුම්ඇත්තෙම්

---

1. පරො 'පි හිතවාන් බන්ධුර්බන්ධුරප්‍යහිතඃ පරඃ,
අහිතො දෙහජො ව්‍යාධිර්හිතමාරණ්‍යමෞෂධම්.

2. ආසීද්වීරවරො නාම ශූද්‍රකස්‍ය මහීපතෙඃ,
සෙවකඃ ස්වල්පකාලෙන ස දදෞ සුතමාත්මනඃ.

වීම්. ඒ නුවරට වීරවරනම් රාජපුත්‍රයෙක් එක්තරා රටකින් අවුත් රාජභවනයාගේ දොරටුවෙහි දොරටුපාලයා කරා එළඹ "මම වැටුප්කැමැති රාජපුත්‍රයෙක්වෙමි, මටරජුගේ දැක්වීමකරව" යි කීය. ඉක්බිත්තෙන් දොරටුපාලයා විසින් රජහුගේ දැක්වීමකර වනලද ඒ වීරවරතෙම "දෙවයන්වහන්ස! සෙවකවූ මාගෙන් ඉදින්ප්‍රයොජන ඇත්තේනම් එකල්හි මටවැටුප්නියම කරණුලැබේව" යි කියයි. ශූද්‍රක රජතෙම "තට වැටුප් කොපමණද" යි? කීයේය. වීරවරයා විසින් "හැමදවස්හි සාරසියයක් රන්වියදම ලැබියයුතුය" යි කියනලද්දේය. රජතෙම "තට කටයුතුකිරීම පිණිස උපකරණ කවරේද" යි විචාරයි? වීරවරතෙමේ "අත් දෙකද තුන්වෙනිවූ කඩුවද උපකරණය" යි කියයි. රජතෙම "මේ වැටුප්නොදියහැකිය" යි කියයි. ඒ වචනය අසා වීරවර තෙමේ නමස්කාරකොට ගියේය. පසුව ඇමතියන් විසින් "දෙවයන්වහන්ස! දින සතරකට වැටුප්දීමේ රාජපුත්‍රතෙම සුදුසුවූයේ මෙතෙක් වැටුප් ගන්නේද නොහොත් නුසුදුසුවූයේ ගන්නේද කින්දැයි මොහුගේ පැවැත්ම දන්නාලැබේව" යි කියනලද්දේය. ඉක්බිත්තෙන් අමාත්‍යයන්ගේ වචනයෙන් කැඳවා බුලත් දී ඒ වැටුප් දුන්නේය.

1. යම්හෙයකින්—බුලත් තුළුරසහා තිත්තරස සහිතවූ මිහුරු රසදවෙයි, ලුණුරසයෙන් යුක්තවෙයි, කසට රසයෙන් යුක්තවෙයි, වාතයෙන් උපන්ලෙඩ සුවකෙරෙයි, සෙම්දොස් දුරුකෙරෙයි, පණුදොස්නසයි, දුගඳ නැතිකෙරෙයි, මුඛශොභාවකෙරෙයි, මල නසයි, අභිරමණයෙහි ආශාවඩනයද යනමේ බුලතෙහි ගුණ තෙළෙසක්වෙත්, එම්බා මන්ත්‍රිය! මේ බුලත්සවගීයෙහ්පවා නොලැබියහැකිවෙත්.

වැටුප් පිළිවෙළින් බෙදූ වියදම්කිරීමද රජුවිසින් රහස්ගතව සිට පරීක්ෂාකරණලද්දේය. ඒ වැටුප්වලින් භාගයෙක් වීරවර විසින් දෙවිවරුන්ටද බ්‍රාහ්මණයන්ටද දෙනලද්දේය. තුබූ කොටසින් අඩියක් දුකට පැමිණියවුන්ටදී එයිනුත් ඉතිරිවූ කොටස අනුභවකටයුතුවූ වියදම්න්ද සැරසීම් වියදම්න්ද යොදූ නිතර

1. යතඃ :—තාම්බූලං කටුතික්තමිශ්‍රමධුරං ක්ෂාරං කෂායාන්විතං
වාතඝ්නං කඵනාශනං කෘමිහරං දෞගීන්ධ්‍යදොෂාපහම්,
වක්ත්‍රස්‍යාභරණං මලාපහරණං කාමාග්නිසන්දීපනං
තාම්බූලස්‍ය සඛෙ ත්‍රයොදශගුණාඃ ස්වගේ 'පෑම් දුලීභාඃ.

කටයුතු මේ සියල්ලකොට රැ දවල් කඩුගත් අත් ඇතිව රජ
භවනය දොරටුවෙහි සේවය කෙරෙයි. යම් වේලෙක්හි රජතෙ
මේ තෙමේම ආඥාකෙරේද එකල්හි තමාගේ ගෙටමයෙයි. ඉක්
බිත්තෙන් කෘෂ්ණපක්ෂයෙහිවූ තුදුස්වක්ලත් රැ කරුණාසහිතවූ
හඬන්නාවූ ශබ්දයක් ඒ රජ තෙමේ ඇසීය. රජ ඒ ශබ්දයඅසා
"මේ දොරටුවෙහි කවරෙක් සිටිනේද" යි? කියයි. එකල්හි
ඔහු විසින් "දෙවයන්වහන්ස! මමවීරවරතෙමේ සිටිමි" යි කියන
ලද්දේය. රජතෙම "හැඬීමටඅනුව ගමන කරණුලැබේව" යි
කීයේය. වීරවරතෙමේ "දෙවයන්වහන්සේ යමක් ආඥාකෙරේද
ඒ කටයුතුය" යි කියාගියේය. රජුවිසින් "මාවිසින් මේ හූදකලාවූ
රාජපුත්‍රතෙම ඉතා ගණවූ ඇඳිරියෙහි හරිණලද්දේය, ඒ හැරීම
තරම්නොවෙයි එහෙයින් මමද ගොස් මේ කුමක්දැයි පරීක්ෂා
කෙරෙමි" යි සිතනලද්දේය. ඉක්බිත්තෙන් රජතෙමේද කඩුව
ගෙණ රාජපුත්‍රයා පසුපස්සේ නුවරදොරටුව කෙරෙන් පිටතට
ගියේය. ඉක්බිත්තෙන් වීරවර විසින් ගොස් රූපශෝභාවෙන්
හා තරුණවයසින්ද යුක්තවූ සර්වාභරණයෙන් සැරසුනාවූ එක්
ස්ත්‍රියක් අඬන්නී දක්නාලද්ද් "තීකවරක්ද කුමක් සඳහා හඬන්
නීදැ" යි විචාරණලද්දීය. ස්ත්‍රිය විසින් මම එක්තරා ශුද්‍රක රජෙක්
හුගේ ශ්‍රීකාන්තාවවෙමි, මේ රජහුගේ බාහුබලයෙන් බොහෝ
කාලයක් මහත් සැපතින් සැනසුනෙමි. බිසවගේ දොෂයෙන්
රජතෙම තුන්වෙනි දිනයෙහි මරණයට පැමිණෙන්නේය, මම
අසරණ වන්නෙමි. දැන්නොසිටිමි" යි හඬමි කියනලද්දේය.
වීරවරතෙම "පිණැත්තියගේ නැවතමේ රජුකෙරේ විසීමකෙසේ
වේදැයි? කියයි. එපවත්අසා ශ්‍රීකාන්තාතොමෝ "ඉදින්තෝ
මහාපුරුෂ ලක්ෂණයන් දෙතිසකින් යුක්තවූ ශක්තිධරනම්
තමන් පුත්‍රයාගේ ඉස සියඅතින් සිඳ පිණැත්තාවූ උමාදෙවියට
බිලිපුදන්නෙහිනම්, එකල්හි රජතෙමේදීර්ඝවූ ආයු ලබන්නේය
මමද සැපසේවසම්" යි කීය. මෙසේකියා නොපෙණී ගියාය.
ඉක්බිත්තෙන් වීරවරයා විසින් සියගෙටගොස් නින්දෙන් මැඩ
පවත්වනලද බිරින්දද පුතුද පුබුදුකරවන ලද්දීය. ඔව්හුදෙ
දෙන් නිදිමත දුරුකර උන්නෝය. වීරවරතෙම ශ්‍රීකාන්තාව
විසින් කියනලද ඒ සියලු පවත්කීයේය. එපවත්අසා ශක්තිධර
තෙම සතුටුව "මෙබඳුවූ රජක්හුගේ රාජ්‍යය රක්නා පිණිස
යමක්හට උපකරණ වන්නෙම්ද එහෙයින් මම පිණැත්තෙමි,
පියාතෙනි මෙබඳුවූ ක්‍රියාවෙහි වනාහි මේ ශරීරයාගේ යෙදීම
හැමකල්හිම යම්හෙයකින් පූජ්‍යවූයේද එහෙයින් දැන් පමාවනු

යේකින්ද" සි? කියයි. ශක්තිධරයාගේමවිද "අපගේ වංශයෙහි පූරුදුවූ මේ කටයුත්ත ඉදින් නොකටයුතුනම් එකල්හි ගන්නා ලද රජහු පිළිබඳ පඩිමිලයෙන් මිදීම කෙසේවන්නේද"සි? කියන්නීය. මෙසේ සියල්ලෝ උමාදෙවියගේ දෙවාලයට ගියෝය. ඒ දෙවාලයෙහිදී උමාදෙවියට පූදා වීරවරතෙම "පින්වත්වූ උමා දෙවිය සතුටුවව ශූද්‍රක මහරජතෙම ජයගණීවා. මේ බලිපූජාව පිළිගණුලැබේව" සි කියයි. මෙසේකියා පුත්‍රයාගේ ඉස සින්දේය. ඉක්බිත්තෙන් වීරවරතෙම "ගන්නාලද රජහු පිළිබඳ පඩිවියදමෙන් මිදීම කරණලද්දේය, දැන් පුත්‍රයානැතිව ජීවත්වීම පලනැතිවෙසි" සිතීය. මෙසේසිතා තමාගේ හිසසින්දේය. ඉක්බිත්තෙන් හිමියාගේද පුත්‍රයාගේද ශොකයෙන් මිරිකුනු ස්ත්‍රිය විසින්ද ඇගේඉස සිඳිනා ලද්දේය. මේ සියල්ල දැකද අසාද ශූද්‍රක රජතෙමේ විස්මව,

1. මාවැනිවූ සැහැල්ලුවූ අදහස්ඇති සත්වයෝ ජීවත්දවෙත්, මරණයටද පැමිණෙත්, මේ වීරවරරාජපුත්‍රයා වැනිවූ සත්වයෙක් ලොව පෙර විද්‍යමානනොවූයේය, මතුදනොවන්නේය.

මෙබඳුවූ මහා පුරුෂයක්හුගෙන් වෙන්වූ රාජ්‍යයෙන්ද ප්‍රයොජන නොවෙයි" යනුසිතීය. ඉක්බිත්තෙන් ශූද්‍රක රජු විසින්ද තමාගේ ඉසසිඳීම පිණිස කඩුව කොපුවෙන් නගා ගන්නා ලද්දේය. ඉක්බිත්තෙන් ඇස්හමුයෙහිවූ පිණැත්තාවූ උමාදෙවිය විසින් රජතෙමේ අතින් අල්වාගන්නා ලද්දේ. "එම්බාපුත්‍රය!" දරුණුවූ ක්‍රියාවෙන් ප්‍රයොජන නොවෙයි, දැන් තාගේ රාජ්‍යය නොනසී කියනලද්දේය. රජතෙම ශරීරයෙහි අටතැනක් නැමීම්සහිතව නමස්කාරකොට, "ස්වාමිවූ උමාදෙවිය! රාජ්‍යයෙන් හෝ ජීවිතයෙන්ද ඓශ්වර්‍ය්‍යයෙන්ද මට ප්‍රයොජනනොවෙයි, ඉදින් මට අනුකම්පාවක් කරණුලැබේද එකල්හි මාගේ ජීවත්වීමෙන්ද අඩුදරුවන් සහිතවූ මේ රාජපුත්‍රතෙමේ ජීවත්වේවා, එසේ නොලැබේනම් මම ඉසසිඳීම් උපායට පැමිණෙමි" කීය. ඒ අසා උමාදෙවීතොමෝ "තාගේ මේමහත් පූරුෂභාවය විසින්ද සෙවකයාකෙරේ පවත්නාවූ සෙනහය විසින්ද සියලුලෙසින් සතුටුකරණ ලද්දීවෙමි. යව අත්වූ ජය ඇත්තේවව පිරිවර සහිතවූ මේ රාජපුත්‍රතෙමේද ජීවත්වේව" සි

1. ජීවන්ති ච ම්‍රියන්තෙ ච මද්විධාඃ ක්ෂුද්‍රජන්තවඃ,
අනෙන සදෘශො ලොකෙ න භූතො න භවිෂ්‍යති.

කීය. ඉක්බිත්තෙන් අඹුදරුවන්සහිතවූ වීරවරතෙමේ දිවි ලද්දේ තමාගේ ගෙටම ගියේය. ඔවුන් විසින් නොදන්නාලද රජතෙම ප්‍රාසාදයාගේ මතුමාලටගොස් එසේම සැතපුනේය. ඉක්බිත්තෙන් රජුවිසින් රජගෙය දොරටුවෙහි සිටියාවූ වීරවර තෙමේ නැවත දක්නාලදුයේ "දෙවයන්වහන්ස! හඬන්නාවූ ඒ ස්ත්‍රීමාදක නොපෙණීගියාය. අන්කිසි පුවතක්නැතැ" සි කීයේය. ඒ වචනයඅසා සතුටුවූ රජතෙම විස්මසහිතව "මේ ප්‍රශංසාකලයුතුවූ පිරිසිදු සිත්ඇතිබවද කෙසේද?

1. යම්හෙයකින්—දෙන සුලුවූයේ ප්‍රියවචන කියන්නේද, දක්ෂවූයේ තමාගේවර්ණනාව නොකියාද ලොභනුවූයේ සුදුසුවූ ස්ථානයෙහිද්දේ සුදුසුවූ කථාවෙන් යුක්තවූයේ පරුෂවචන නොකියන්නේද.

යන මේ මහත්වූ අදහස් ඇත්තහුගේ සියලු ලකුණු මොහු කෙරේ ඇත්තේයයි සිතී. ඉක්බිත්තෙන් ඒ රජතෙම උදාසන පණ්ඩිතසභාවක් රැස්කොට සියලුපවත් දන්වා ප්‍රසන්නතායහෙතු කොටගෙණ ඒ රාජපුත්‍රයාට කර්ණාටරාජ්‍යය දුන්නේය. "එහෙයින් අලුත පැමිණීනැතැත්තේම කිමෙක්ද සතුරුවූයේද, ඒ අලුත පැමිණියවුන් අතුරෙහිද උත්තමාධමමධ්‍යම යන තුන් කොටසම ඇතිවෙත්" යයි කීය.

2. චක්‍රවාකතෙමේ, යම්පුරුෂයෙක් රජහුගේ කැමැත්තනියායෙන්නොකට යුතුවූ ක්‍රියාවක් කටයුත්තක්මෙන් දක්වාද ඒ තෙම නින්දාකටයුතු ඇමතියෙක්වෙයි, රජහුගේ අදහස් නියායෙන් කටයුතුකිරීමෙන් සිත්කැලඹීම උතුම්වෙයි, නොකටයුතුවූ ක්‍රියාවෙන් ඒ රජහුගේ නැසීම සුදුසුනොවේ.

3. වෙදද ධර්මානුශාසක ආචාර්‍ය්‍යද ඇමතිදයන මේ තුන්දෙන යම්රජක්හට තුසුදුසු කරුණද' රජුගේ සිත්ගැණීම පිණිස මනායයිකියද්ද ඒ රජතෙමේ දේහයද ධර්මයද. ධනයද යන මෙයින් වහාපිරිහෙයි.

දෙවයන්වහන්ස! ඇසූවමැනව.

---

1. යතඃ :—ප්‍රියං බ්‍රෑයාදකෘපණඃ ශූරඃ ස්‍යාදවිකත්ථනඃ,
දාතාසත්පාත්‍රවර්ෂීස්‍යාත් ප්‍රගල්භඃ ස්‍යාදනිෂ්ඨුරඃ.

2. යො 'කාර්‍ය්‍යං කාර්‍ය්‍යවච්ඡාස්ති ස කිං මන්ත්‍රී නෘපෙච්ඡයා,
වරං ස්වාමිමනොදුඃඛං තන්නාශො නත්වකාර්‍ය්‍යතඃ.

3. වෛද්‍යො ගුරුශ්ච මන්ත්‍රී ච යස්‍ය රාඥඃ ප්‍රියංවදඃ,
ශරීරධර්මකොශෙභ්‍යඃ ක්ෂිප්‍රං ස පරිහීයතෙ.

1. යම්ධනයෙක් එකක්හු විසින් සුචරිතය හෙතුකොටගෙණ ලබනලද්ද ඒ ධනය මටද වන්නේයයි මෙසේ නොසිතිය යුතුය යම්හෙයකින් ලොභයෙන් මුළාවූ එක්තරා කරනැවැමියෙක් නිධානයක් කැමැත්තේ භික්ෂුවක්හු මරා රාජපුරුෂයන් විසින් මරණලද්දේද" යි කියයි.

රජතෙම "ඒ කෙසේද" යි විචාරයි? ඇමතිතෙමේ කියයි.

"අයොධ්‍යාපුරයෙහි චූඩාකර්ණනම් ක්ෂත්‍රියයෙක්ඇත. ධනය කැමැත්තාවූ ඒ ක්ෂත්‍රියයා විසින් ශරීරය වෙහෙසීමෙන් යුක්තව පින්වත්වූ ඊශ්වරතෙම නැතක්කාලයෙකින් සතුටුකරණ ලද්දේය. ඉක්බිත්තෙන් පවින් මිදුනු මේතෙම ඊශ්වරයාගේ ප්‍රසන්නය හෙතුකොටගෙණ නිදනකල්හි දකීව ලැබ වෙස මුණුහු විසින් "තෝ අදඋදෑසනම රැවුල්කප්පවා පොල්ලක් ගත් අතින් යුක්තවූයේ තමාගේ ගෙය දොරටුවෙහි බැණ නොනැගීසිටුව. ඉක්බිත්තෙන් ආවාවූයම් භික්ෂුවක්හු මිදුලෙහි දී දක්නෙහිද ඒ භික්ෂුව දැඩිකොට පොලුපහරින් මරන්නෙහිය. ඉක්බිත්තෙන් ඒ භික්ෂුතෙමේ එම ඇසිල්ලෙන් රන්පිරුණුකලයෙක් වන්නේය. ඒ රනින් තෝ දිවිහිමියෙන් සැපයෙන් යුක්තවූයේ වන්නේහිය" යි කියනලද්දේය. ඉන්පසු එසේ කරණලද කල්හි එසේ සිදුවූයේය. ඉක්බිත්තෙන් රැවුල්කැපීම පිණිස කැඳවනලද කරනැවැමියා විසින් ඒ සියල්ලදැක "වියමයෙක ධනලාභයාගේ මේතෙම උපායෙක්වෙයි, එහෙයින් මමද තුමට මෙසේ නොකෙරෙම්ද"? යි සිතනලද්දේය. එතැන්පටන් ඒ කරනැවැමිතෙම හැමදවස්හි එබඳු පොල්ලක්ගත්තේ භික්ෂුවක්හුගේ ඊමබලයි. එක්දවසෙක ඒ කරනැවැමියා විසින් එසේ පැමිණි භික්ෂුවක්හු පොල්ලෙන් ගසාමරණලද්දේය. ඒ දොෂය කරණකොටගෙණ ඒකරනැවැමියාද රාජපුරුෂයන් විසින් තළනලද්දේ මරණයට පැමිණියේය. යම් ධනයෙක් එකක්හු විසින් ශුචරිතය හෙතුකොටගෙණ ලබනලද්දේද යනමේආදිය එහෙයින් මම කියමි" යි කීය.

2. රජතෙම, පළමු පැවති කථාවන් දැක්වීම්වලින් අලුත පැමිණිතැනැත්තේද ස්වභාවයෙන් හටගත් මිත්‍රයාද නොහොත්

---

1. ශාඞ්ගදෙව :—පුණ්‍යාල්ලබ්ධං යදෙකෙන තන්මමාපි භවිෂ්‍යති,
හත්වා භික්ෂුං යතො මොහාන්නිධ්‍යර්ථී නාපිතො මෘතඃ.

2. පූරාවෘත්තකථොද්ගාරෛඃ කථං නිර්ණීයතෙ පරඃ,
කිං ස්‍යාන්නිෂ්කාරණො බන්ධුඃ කිං වා විශ්වාසඝාතකඃ.

විශ්වාසය හානිකරන්නාවූ මිත්‍රයෙක් වන්නේයයි කියාහෝ කෙසේනම් නියම්කරණලැබේද.

යේවා යේවා, එළඹසිටිනුලැබේවා. චිත්‍රවර්ණනම්රජතෙමේ, මලයපර්වතය මුදුනෙහි සෙනාව රඳවනලද්දේ පවතී. එහෙයින් දැන් කුමක්කටයුතුදැ" යි? කියයි. ඇමතිතෙම දෙවයන් වහන්ස! ගෘධ්‍රමහ ඇමතියාගේ ගුරූපදෙශය කෙරෙහි චිත්‍රවර්ණ රජුවිසින් අගෞරවකරණලදැයි ආවාවූ අනුචරයාගේ වචනයෙන් යම්හෙයකින් අසනලදද එහෙයින් අඥනවූමේතෙම ජය ගන්ට හැකිවනු ලැබෙයි.

1. එසේද කියනලදී—ලොභයට වශගවූ කපටයාද ඉන්ද්‍රියයන් ජයනොගත් තැනැත්තේද බොරුකියන තැනැත්තේද ඒකාගවූ සිත්නැති තැනැත්තේද භය සවභාවයෙන් යුක්තතැනැත්තේද නියම්කරණලද කල්පනානැති තැනැත්තේද නුවණ මඳ තැනැත්තේද සෙවකයන්ට අගෞරවකරණ තැනැත්තේද යන මෙබඳු සතුරුතෙම සුවසේ පරාජයකළහැකියයි දන්නාලදී" යනු කියයි.

එබැවින් ඒ චිත්‍රවර්ණ භූපාලතෙම අපගේ කොට්ටුවහාත්පස ඇවිරීම යම්තාක් නොකෙරේද ඊටපළමුව නදීපර්වත වනමාර්ගවල ඒ රජහුගේ සෙනගනැසීම පිණිස විල්ලිහිනි ආදිවූ සෙනාපතිහු යොදනුලැබෙත්වා.

2. එසේද කියනලදී—දීර්ඝමාර්ගයෙහි ගමනින් වෙහෙසුනාවූ නදීපර්වත වන යනමෙයින් ගමන වළක්වනලද්දාවූ දරුණුගිනි බියෙන් අතිශයින් තැතිගත්තාවූ ක්‍ෂුධා පිපාසයෙන් උපන් විඩායෙන්යුක්තවූ.

3. මද්‍යපානාදියෙන් පහවූචෛතනාවෙන් යුක්තවූ ආහාරයෙන් වැළකුනාවූ රොගය ආහාරයන් නොලැබීමය යන මෙයින් කලානතවූ වසන තැන්නැත්තාවූ මඳගණනක්වූ වැසිසුලඟ දෙකින් මිරිකුනාවූ.

---

1. තථාචොක්තම් :—ලුබ්ධඃ ක්‍රූරො 'වශො ' සත්‍යඃ ප්‍රමාදී භීරුරස්ථිරඃ,
මූඪො යොධාවමන්තා ච සුඛච්ඡෙද්‍යො රිපුඃ ස්මෘතඃ.

2. තථාචොක්තම් :—දීර්ඝවර්ත්මපරිශ්‍රාන්තං නද්‍යද්‍රිවනසඞ්කුලම්,
ඝොරාග්නිභයසන්ත්‍රස්තං ක්‍ෂුත්පිපාසාහිතකලමම්,

3. ප්‍රමත්තං භොජනව්‍යග්‍රං ව්‍යාධිදුර්භික්‍ෂපීඩිතම්,
අසංස්ථිතමභූයිෂ්ඨං වෘෂ්ටිවාතසමාකුලම්.

1. මඩ දූවිලි දිය යන මෙයින් වැසුනාවූ විපත්තියෙන් තෑල ඛුනුසිතින් යුක්තාවූ චෞරාදී උපද්‍රවයෙන් යුක්තාවූවත්කොට රජතෙමේ සතුරුසෙනඟ නසන්නේය.

2. අනිකෙක්ද—රජතෙමේ මැඩීමට බියෙන් නිදිවැළකීමෙන් කලානාවූ දූවල් සයනය කළාවූ නිද්‍රාවෙන් දුකට පැමිණි සෙනඟ නිතරනසන්නේය.

එබැවින් " මනාකොට රක්‍ෂානොකරණලද ඒ රජහුගේ සෙනඟ විල්ලිහිනිඅදිහු ගොස් අවකාසලත් පරිද්දෙන් රාත්‍රියෙහිද දවල්ද නසත්ව " යි කියයි. එසේකල කල්හි චිත්‍රවර්ණ භූපාලයාගේ සෙනඟරක්නෝද බොහෝ සෙනාපතිහුද නසන ලද්දාහුය. ඉක්බිත්තෙන් කලකිරුණාවූ චිත්‍රවර්ණ භූපාලතෙමේ ශ්‍රුතවනාවූ සර්වඥීය ඇමතියාට "පින්වත් පියානනි! කිමෙක්ද තාවිසින් අපකෙරේ ඇළුම්නැතිබව කරණුලැබේද. කිමෙක්ද කවර කාරණයෙක්හි නම් තාකෙරේ අපගේ අගෞරව යෙක් ඇත්තේද " යි කියයි.

3. එසේද කියත දී—රාජ්‍යය ලද්දෙමැයි මෙසේ සිතා නුසුදුසුවූ ක්‍රියාවෙහි යම්කිසි පරිද්දෙකින් නොහැසිරිය යුතුය, කුමක්හෙයින්ද, අහංකාරභාවය මහලූබව උතුම්වූ රූපශෝභාවමෙන් සැපත හානිකෙරෙයි.

4. අනිකෙක්ද—කටයුතුවූ ක්‍රියාවෙහි දක්‍ෂවූ ජනතෙම සම්පත්තියට පැමිණෙයි, හිතවූ ආහාර අනුභව කරණතැනැත්තේ නිරෝගී බවටද, නිරෝගී තැනැත්තේ සැපතටද, උත්සාහ කරණතැනැත්තේ සකල ශාස්ත්‍රයන්ගේ පරතීරයටද, හික්මුනු තැනැත්තේ සුචරිතය ධනය කීර්තිය යන මීටද පැමිණේ.

ගෘධ්‍රතෙමේ "දෙවයන්වහන්ස! අසනු ලැබේවා."

---

1. පඞ්කපාංශුජලාච්ඡන්නං ක්‍ෂුව්‍යස්තං දස්‍යුවිද්‍රුතම්,
එවම්භූතං මහීපාලඃ පරසෛන්‍යං විඝාතයෙත්.

2. අන්‍යච්ච :—අවස්කන්දභයාද්‍රාජා ප්‍රජාගරකෘතශ්‍රමම්,
දිවාසුප්තං සදා හන්‍යාන්නිද්‍රාව්‍යාකුලසෛනිකම්.

3. තථාචොක්තම් :—න රාජ්‍යං ප්‍රාප්තමිත්‍යෙවං වර්තිතව්‍යමසාම්ප්‍රතම්,
ශ්‍රියං හ්‍යවිනයො හන්ති ජරාරූපමිවොත්තමම්.

4. අන්‍යච්ච :—දක්‍ෂඃ ශ්‍රියමධිගච්ඡති පථ්‍යාශී කල්‍යතාං සුඛමරොගී,
උද්‍යොගී විද්‍යාන්තං ධර්මාර්ථයශාංසි ච විනීතඃ.

1. ශාස්ත්‍රඥානය නැත්තාවූද රජතෙමේ ශාස්ත්‍රවන්තයන්ගේ අනුශාසනාවන් ලැබීමෙන් ජලස්ථානයට ආසන්නවූ ගසක්මෙන් උතුම්වූ ඓශ්වර්‍ය්‍යයට පැමිණේ.

2. අතිකෙක්ද—මද්‍යපානයද අනුන්ගේ අඹුවන්කෙරේ ඇළීමද සිවුපාඊන් මැරීමද දූකෙළියද නීතියට විරුඬව අනුන්ගේ ධනය ගැණීමද, නින්දාකිරීම හා දඬුවම් කිරීමද පරුෂ කථාද යන මොහු රජුන්ට විපත්ති වෙත්.

3. ගුණදෝෂ දෙක පරීක්ෂානොකොට කටයුතු පටන් ගැන්මම ප්‍රධානවූ අදහසක්කොට නොපවත්නාහු විසින් නොහොත් උපායෙන් මඩනාලද සිත්ඇත්තාහු විසින් බලවත්වූ ඓශ්වර්‍ය්‍යයට පැමිණීමට හැකිවනු ලැබෙයි, නීතියෙහිද නීතිය මුල්කොට පැත්නා වික්‍රමයෙහිද සම්පත්තීහු වෙසෙත්,

තා විසින් ස්වකීයවූ බලයහා උත්සාහයද නොබලා බිය නැති බවම වැළඳගත් මාවිසින් දක්වනලද මන්ත්‍රණ කථාවන් ඇතිකල්හිද පරීක්ෂා නොකිරීමද වචනයෙන් අගෞරවද කරණ ලද්දේය. එහෙයින් නීතිය හළ කල්හි සෙනඟ නැසීම කියනලද මේ ඵලය විඳිනුලැබේ.

4. එසේද කියනලදී—නීතියට අනදර කිරීමේ දොෂයෝ කවරනම් දුෂ්ට අමාත්‍යයක්හු කරා නොපැමිණෙද්ද? නැවත හිත නුවූ අහර වලඳන කවරක්හුනම් රෙගයෝ නොතවද්ද? ඓශ්වර්‍ය්‍යය කවරක්හුනම් අහංකාර නොකරන්නේද? මරුතෙම කවරක්හුනම් නොනසාද? ස්ත්‍රීන්විසින් කරණලද නුසුදුසුවූ ක්‍රියාවෝ කවරනම් ජනයක්හු නොතවද්ද?

---

1. අවිවානපි භූපාලො විද්‍යාවෘද්ධොපසෙවයා
පරාංශ්‍රියමවාපෙනාති ජලාසන්නතරුයථා.

2. අන්‍යච්ච :—පානං ස්ත්‍රී මෘගයා ද්‍යූතමර්ථදූෂණමෙව ච,
වාග්දණ්ඩයොශ්ච පාරුෂ්‍යං ව්‍යසනානි මහීභුජාම්.

3. කිඤ්ච :—න සාහසෛකාන්තරසානුවර්තිනා
න චාපයුපායොපහතාන්තරාත්මනා
විභූතයඃ ශක්‍යමවාප්තුමූර්ජිතා
නයෙ ච ශෞර්යෙ ච වසන්ති සම්පදඃ.

4. කථාචොක්තම් :—දුර්මන්ත්‍රිණං කමුපයාන්ති න නීතිදොෂාඃ ?
සන්තාපයන්ති කමපථ්‍යභුජං න රොගාඃ, ?
කං ශ්‍රීර්න දර්පයති ? කං න නිහන්ති මෘත්‍යුඃ ?
කං ස්ත්‍රීකෘතා න විෂයාඃ පරිතාපයන්ති ?

1. දුකතෙම සතුටද හිමසෘතුව තෙම ශරත්කාලයද හිරු තෙම අඳුරද කළ උපකාර නොසලකන බව සුචරිතයද ප්‍රියවූ කාරණයට පැමිණීම ශොකයද නීතිය විපත්තිද නීතිය වරදවා පැවැත්ම වැඩුනාවූද ඓශ්වර්‍ය්‍යය නසා.

ඉක්බිත්තෙන් මා විසින්ද මේ තෙම පරීක්‍ෂා රහිතවෙයි, ඉදින් එසේ නුවූයේනම් නීති ශාස්ත්‍රය පිළිබඳවූ කථාවයයි කියනලද්දවූ චන්ද්‍රකාන්තිය වචන නැමැති දුම්දැල්ලෙන් කෙසේනම් වසාද?

2. යම්හෙයකින්—යම් ජනයක්හට තමාගේ බුද්ධිය නැත්තීද ශාස්ත්‍රය තෙම ඕහට කුමක්නම් කරන්නේද? ඇස්දෙක නැත්තාහට කැඩපත කුමක්නම් කරන්නේද?යි සිතනලද්දේය.

එහෙයින් "මමද බැණනොනැඟී සිටියෙමි" යි කියයි. ඉක්බිත්තෙන් රජතෙමේ ඇඳිලිබැඳ "පියානනි! මාගේ මේ මහත් අපරාධය ඇත්තේවෙයි. දැන් මම ඉතිරිවූ සෙනඟහා සමඟ ආපසු හැරී වින්ධ්‍ය පර්වතයට යෙමි එපරිද්දෙන් සමුදෙව" යි කියයි. ගෘධ්‍ර තෙමේ "මේ කාලයෙහි පිළියම් කටයුතුවෙ" යි.

3. යම්හෙයකින්—"දෙවතාවන් කෙරේද ආචාරීන් කෙරේද ගවයන් කෙරේද රජුන් කෙරේද බමුණන් කෙරේද ළදරුය මහලුය, රොගාතුරය යන මොවුන් කෙරේද කොපය හැමකල්හි වැළැක්විය යුතුය" යි තමා පිළිබඳවූ පැවතීම සිතයි.

දෙවයන් වහන්ස! භය නොගතමැනව මනාව සන්තුටුවුව මැනවැයි යනුද සිතාසී කියයි.

දෙවයන් වහන්ස ඇසුව මැනව.

4. සතුරාගේ අදහස දැනීමෙහි අමාත්‍යයන්ගේද වාත පිත්ත ශ්ලෙෂ්මා යයි කියන ත්‍රිදොෂ කොපයෙන්වූ රොගයෙහි වෛද්‍යන්

---

1. මුදං විෂාදඃ ශරදං හිමාගමඃ තමො විවස්වාන් සුකෘතං කෘතඝ්නතා,
ප්‍රියොපපත්තිඃ ශුචමාපදං නයඃ ශ්‍රියං සමෘද්ධාමපි හන්ති දුර්ණයඃ.

2. යතඃ :—යස්‍ය නාස්ති ස්වයං ප්‍රඥා ශාස්ත්‍රං තස්‍ය කරොති කිම්,
ලොචනාභ්‍යාං විහීනස්‍ය දර්පණඃ කිං කරිෂ්‍යති.

3. යතඃ :—දෙවතාසු ගුරෞ ගොෂු රාජසු බ්‍රාහ්මණෙෂු ච,
නියන්තව්‍යඃ සදා කොපො බාලවෘද්ධාතුරෙෂු ච.

4. මන්ත්‍රිණාං භින්නසන්ධානෙ භිෂජාං සාන්නිපාතිකෙ,
කර්මණි ව්‍යජ්‍යතෙ ප්‍රඥා සුස්ථෙ කො වා න පණ්ඩිතඃ.

ගේද සෙස්සවුන්ගේ කටයුතුවූ ක්‍රියාවෙන්ද ප්‍රශූතොමෝ ප්‍රකාශ කරණු ලබයි, ශූන ශක්තියගේ දක්‍ෂභාවය ප්‍රයොජන නැති කල්හි කවරෙක්නම් පණ්ඩිත නොවේද?

1. අතිකෙක්ද—නුවණ මඳ ජනයෝ සවල්ප ක්‍රියාවක්ම පටන්ගණිත්, ඒ සවල්පවූ කටයුත්ත සඳහා ඒකාන්තයෙන් කැලඹුනාහූ වෙති, නුවණැත්තෝ මහත්වූ කටයුත්තක් සඳහා පවත්නාහූද නොකැලඹුනාහූ නිශ්චලව සිටිත්..

දෙවයන් වහන්ස! නුඹවහන්සේගේ තෙජානුභාවයෙන්ම කොටුව බිඳ කීර්ති වික්‍රමයෙන් යුක්තවූ නුඹවහන්සේ නැතක් කාලයකින්ම වින්ධ්‍ය පර්වතය තරා පමුණුවන්නෙමි" යනුද කියයි. රජතෙම "සවල්ප සෙනාවෙන් යුක්තව ඒ ජය ලැබීම දැන් කෙසේනම් සිද්ධකරණු ලැබේදැ"යි කියයි. ගෘධ්‍ර අමාත්‍ය තෙම "දෙවයන්වහන්ස! සියල්ල වන්නේය. යම්හෙයකින් ජයකැමැත්තහුගේ පටන්ගන්නාලද ක්‍රියාව කල්නොගෙවන බව ජය ලාභය නියමයෙන් වේද එබැවින් අද කොෂ්ටයාගේ දොරටුව සෙනාවෙන් ආවරණයකරණු ලැබේව" යි කියයි. එකල්හි අනුචරවූ කොකාවිසින් අවුත් හිරණ්‍යගර්භ භූපාලයාට "දෙවයන්වහන්ස! සවල්පවූ සෙනාවගෙන් යුක්තවූ මේ චිත්‍රවර්ණ භූපාලතෙම ගෘධ්‍රනම් අමාත්‍යයාගේ අනුශාසනාවෙන් අවුත් කොටුදොරටුව වැළැක්වීම කරන්නේය" යි කියන ලද්දේය. රාජහංස තෙමේ පින්වත් සර්වඥය, දැන් කුමක් කටයුතුදැ" යි කියයි. චක්‍රවාකතෙම සවකීය සෙනාවගේ බල ඇතිනැතිබව විමසීම කරණු ලැබේවා. ඒ කාරණයදැන රන්පිළිආදිවූ සුදුසු සතුටු එළවන දෙය අමඳ කරණුලැබේවා.

2. එසේද කියනලදී—යම් රජෙක් නුසුදුසුවූ ක්‍රමයට පැමිණි තුච්ඡවක්නමුදු රුපියල් සොළොස් දහසක්මෙන් නැවතනගා ගන්නේද එක්කලෙක්හි කෙළක්පමණ බොහෝවූ ධනයක් කෙරේ නමුදු අනමුඳද, ඒ රාජොත්තමයා ඓශ්වර්ය්‍යය නොහරී.

1. අපරඤ්ච :—ආරභන්තෙ ’ල්පමෙවාඥාඃ කාමං ව්‍යග්‍රා භවන්ති ච, මහාරම්භාඃ කෘතධියස්තිෂ්ඨන්ති ච නිරාකුලාඃ.

2. තථාචොක්තම් :—යඃ කාකිණීමප්‍යපථප්‍රපන්නාං
සමුද්ධරෙන්නිෂ්කසහස්‍රතුල්‍යාම්,
කාලෙපි කොටිෂ්වපි මුක්තහස්තස්තං
රාජසිංහං න ජහාති ලක්ෂ්මීඃ.

1. අනිකෙත්ද—යාගක්‍රියාවෙහිද විවාහක්‍රියාවෙහිද විපත්තියක් ඇතිකල්හිද සතුරන් නැසීමෙහිදීද කීර්තියලැබිය යුතුක්‍රියාවෙහිදීද මිත්‍රයන්ට සඞ්ග්‍රහකරණ කල්හිද ප්‍රියවූ අඹුවකෙරේද ධනහීනවූ නෑයන් කෙරේද යන මේ අටකාරණයෙහිදී වනාහි මහරජ! අධිකවූ වියදමෙක්නම් නැත්තේය.

2. යම්හෙයකින්—අඥාන පුරුෂතෙමේ මඳවියදමට භයින් සියල්ල නැතිකරන්නේය, එසේමැයි, රජුන්ට දියයුතු බදුම්ලයට අධිකභයින් කවරනම් නුවණැත්තෙක් භාණ්ඩයද රජුන්ටදේද?

රජතෙමේ "මේ කාලයෙහි අධිකවූ වියදම කෙසේනම් යුතුවනු ලැබේද කියනලද්දේද වෙයි.

"විපත්තියක් ඇතිකල ඒ දුරලීම පිණිස ධනය රැස්කරන්නේය" යි කියයි.

ඇමතිතෙමේ "ඓශ්වර්‍ය්‍යයෙන් යුක්තයාට විපත්තිහු කොසින්ද" යි කියයි.

3. රජතෙම "කිසිකලෙකත්හි ශ්‍රීතොමෝ ඉදින් නොසතුටුවන්නීද" යනුකියයි. නැවත අමාත්‍යතෙම. "දෙවයන්වහන්ස! එකල්හි රැස්කරණලද්දාවූ ධනයෙන් යුක්තවූ ජනතෙමේ නැසෙන්නේය" යි කියයි.

එහෙයින් දෙවයන්වහන්ස! ලොභය පහකොට සවිකීයවූ යුඬදක්‍ෂ පූරුෂයෝදීමය ආදරය යන මෙයින් සතුටු කරණු ලැබෙත්වා.

4. එසේදකියනලදී—ඔවුනොවුන්ට ඇළුම්ඇත්තාවූ පඬුරු ලැබීමෙන් ස්වාමියාකෙරේ සතුටුවූ ජීවිතයෙහිදු ඇළුම්නැතිව

---

1. අන්‍යච්ච:—ක්‍රතෞ විවාහෙ ව්‍යසනෙ රිපුක්‍ෂයෙ
යශස්කරෙ කර්ම්මණි මිත්‍රසඞ්ග්‍රහෙ,
ප්‍රියාසු නාරීෂ්වධනෙෂු බන්ධුෂු
ක්‍ෂතිව්‍යයො නාස්ති නරාධිපාෂ්ටසු.

2. යතඃ:—මූර්ඛඃ ස්වල්පව්‍යයත්‍රාසාත් සර්ව්වනාශං කරොති හි,
කඃ සුධීස්ත්‍යජෙත භාණ්ඩං ශුල්කස්‍යෛවාතිසාධ්වසාත්.

3. ආපදර්ථෙ ධනං රක්‍ෂෙත්
මනුර් බ්‍රූතෙ—ශ්‍රීමතාං කුත ආපදඃ,
රාජාහ—කදාචිත් කුපිතා ලක්‍ෂ්මීඃ
පුනර්මන්ත්‍රීබ්‍රූතෙ දෙව - සඤ්චිතාපි විනශ්‍යති.

4. තථාචොක්තම් :—පරස්පරඥඃ සංහෘෂ්ටාඃ ත්‍යක්තප්‍රාණාඃ සුනිශ්චිතාඃ,
කුලීනාඃ පූජිතාඃ සම්‍යග්විජයන්තෙ ද්විෂාං බලම්.

ස්වකීය ජයලාභය පිණිස නියමකරණ ලද්දාවූ ප්‍රසිද්ධ කුලයෙහි උපන්නාවූ උසස් තනතුරුදීම් ආදියෙන් පුදනලද්දාවූ ස්වකීය සේනාවෝ සතුරුසෙනග ජයගණිත්.

1. අනිකෙත්ද—පූජ්‍යකුලයෙහි උපන්නාවූ ඔවුනොවුන්ට මිත්‍රවූ ජීවිතහානිය වනකල ආපසු නොහැරෙම්හයි කරණලද නියමඇත්තාවූ පන්සියයක් නමුදු ශූරයෝ සතුරුවූ සිව්රඟ සෙනග නසන්නාහුවෙත්.

2. තවද—ස්වකීය පක්ෂයෙහි හා සතුරන්ගේ පක්ෂයෙහිය යන විශේෂය නොදැනීමෙන් මූඪවූ හැමකල්හි උඩගුවූ කළ උපකාර නොදන්නාවූ තමන්ගේ ප්‍රයොජනයෙහිම ඇළුනු ජන තෙමේ අඹුවවිසිනුදු දුරුකරණුලැබේ, අනික් පණ්ඩිතයන් විසින් හැරියයුතු බව කියනුකිම.

3. යම්හෙයකින්—සත්‍යවචනය ශූරභාවය සුදුස්සන්ට දීමය යන මේ තුණ රජහුගේ ගුණයෝවෙත්, මේගුණ තුණින් තොර කරණලද රජතෙමේ ඒකාන්තයෙන් නින්දා කටයුතු බවට පැමිණේ.

අමාත්‍යයෝ වනාහි පළමුකොටම නියමයෙන් සතුටුකළ යුතුවෙත්.

4. එසේදකියනලදී—යම්ජනයෙක් යමක්හුහා සමග ධනාදිවූ උපකාරයෙන් බැඳුනේවේද වියදම්කළ තැනැත්තේ ඔහුහා සමග වැඩුනේවෙයි, ප්‍රාණයන් රක්නාපිණිසද ධනය රක්නාපිණිසද මනාකොට විශ්වාසයට පැමිණි ජනතෙම යෙදියයුතු වෙයි.

5. යම්හෙයකින්—කෛරාටිකයෙක් හෝ ස්ත්‍රියක් හෝ ළදරුවෙක් හෝ යම්රජක්හට මන්ත්‍රණදායකවූ ඇමතියෝ වෙද්ද ඒ රජතෙම නුසුදුසුවූ නීතිනැමැති වාතයෙන් නෙරපියන ලද්දේ කටයුතුනැමැති මුහුදෙහිගිලෙයි.

---

1. අපරඤ්ච :—ප්‍රභටාඃ ශීලසම්පන්නාඃ සංහතාඃ කෘතනිශ්චයාඃ,
අපි පඤ්චශතං ශූරා මෘද්නන්ති රිපුවාහිනීඃ.

2. කිඤ්ච :—ශිෂ්ටෛරප්‍යවිශේෂඥ උග්‍රශ්ච කෘතනාශකඃ,
ත්‍යජ්‍යතෙ කිං පුනර්නාන්‍යෛඃ පත්න්‍යාප්‍යාත්මම්භරිර්නරඃ.

3. යතඃ :—සත්‍යං ශෞර්‍ය්‍යං තථා ත්‍යාගො නෘපස්‍යෛතෙ ත්‍රයො ගුණාඃ,
එතෛස්ත්‍යක්තො මහීපාලඃ ප්‍රාප්නොති ඛලු වාච්‍යතාම්.

4. තථාචොක්තම් :—යො යෙන ප්‍රතිබද්ධඃ ස්‍යාත් සහ තෙනොදයී ව්‍යයී,
සුවිශ්වස්තො නියොක්තව්‍යඃ ප්‍රාණෙෂු ච ධනෙෂු ච.

5. යතඃ :—ධූර්තඃ ස්ත්‍රී වා ශිශුර්‍යස්‍ය මන්ත්‍රිණඃ ස්‍යුර්මහීපතෙඃ,
අනීතිපවනක්ෂිප්තඃ කාර්‍ය්‍යාබ්ධෞ ස නිමජ්ජති.

1. දෙවයන්වහන්ස! බැලුවමැනව—යම්රජක්හු විසින් සැප ඇතිකල්හි සතුටද විපත්තියට පැමිණිකල්හි කලකිරීමද වළක් වනලද්දහුද මඳවියදමින් යුක්තවූධනය ඇත්තේද නිරන්තර යෙන් සෙවකයන්කෙරේ සමවූ ආදරයෙන් යුක්තද ඒ රජුගේ රාජ්‍යය ධනදායක කරන්නේය.

2. ඇමතියන්ගේ උසස්බවහා පාත්බව දෙක නියමයෙන් රජහුහා සමගවෙත්, නීතිශාස්ත්‍රයදත් රජතෙමේ කිසිත් කාරණ යෙක්හි ඇමතියන්ට අගෞරව නොකරන්නේය.

3. යම්හෙයකින්—අහංකාරයෙන් මෙසේකෙරෙමියි පරීක්‍ෂා රහිතවූ කටයුතුනැමැති මුහුදෙහි ගිලෙන්නාවූ රජහට මනා නුවණැත්තන් විසින්ම ඉවරකෙරෙන් අතදෙනු ලැබෙයි" කියයි.

ඉක්බිත්තෙන් මෙඝවර්ණතෙම අවුත් නමස්කාර කොට "දෙවයන්වහන්ස! මාදෙස බැලූවමැනව, සටන්කැමතිවූ මේ සතුරුතෙමේ දොරටුවෙහිසිටී. එබැවින් ස්වාමිපාදයන්ගේ අව සරයෙන් පිටතට නික්ම ස්වකීය වික්‍රමය දක්වන්නෙමි. එසින් දෙවයන්වහන්සේ විසින් කරණලද සංග්‍රහයාගේ නයම්දීමට පැමිණෙමැයි" කියයි. චක්‍රවාකතෙමේ "එසේ නොකරව ඉදින් පිටතට නික්ම සටන්කළ යුතුනම් එකල්හි කොටුව ආශ්‍රයකිරීම ප්‍රයොජනයෙක් නොවෙයි.

4. අනිකෙක්ද වෙයි—දරුණුවූද කිඹුල්තෙම දියෙන් පිට තට නික්මුනේ තමන් රැකගැන්මෙහිත් යම්සේ අපොහොසත් වේද සිංහයා පවා වනයෙන් පිටතට පැමිණියේ සිවලෙක්හු මෙන් පිරිහුනාවූ වික්‍රමවත්ද වෙයි, ඒද නියමය" යි කියයි.

කාවුඩුතෙම "තමාවිසින්ම ගොස් යුඩය දක්නා ලැබේවා.

---

1. පූජ්‍ය දෙව :—හර්ෂක්‍රොධෞ යතෞ යස්‍ය කොෂඃ ස්වල්පව්‍යයෙන ච, නිත්‍යං භෘත්‍යාන්වෙක්‍ෂා ච තස්‍ය ස්‍යාධනදා ධරා.

2. යෙෂාං රාඥා සහ ස්‍යාතාමුච්චයාපචයෞ ධ්‍රැවම්, අමාත්‍යාන් නීතිමාන් රාජා නාවමන්‍යෙත කර්හිචිත්.

3. යතඃ :—මහීභුජො මදාන්ධස්‍ය මජ්ජතඃ කාර්‍ය්‍යසාගරෙ, ස්ඛලතො හි කරාලම්බඃ සුශිෂ්ටෛරෙව දීයතෙ.

4. අපරඤ්ච :—විෂමො'පි යථා නක්‍රඃ සලිලාන්නිඃසෘතො'වශඃ, වනාත් තු ප්‍රච්‍යුතඃ සත්‍යං සිංහො'පි ස්‍යාච්ඡෘගාලවත්.

1. යම්හෙයකින්—රජතෙමේ සටන්බිමකරා එළඹ බලාසිටියේ සේනාඟ ඉදිරිකොට සටන්කරවන්නේය, තිමෙක ස්වාමියා විසින් පෙරටුකරණලද බල්ලෙක් පවා ඒකාන්තයෙන් සිංහයක් හූමෙන් නොහැසිරේද" සි කියයි.

ඉන්පසු ඔව්හු සියල්ලෝ කොටුදොරකඩට ගොස් මහත් සටන් කලෝය. පසුවද චිත්‍රවර්ණ භූපාලතෙම ගෘධ්‍ර අමාත්‍යයාට "පියානනි! තමාවිසින් කරණලද්දාවූ ප්‍රතිඥාව දැන් කරණු ලැබේව" සි කියයි. ගෘධ්‍ර අමාත්‍යතෙමේ "පළමුකොට ඇසුව මැනව.

2. කාලයක් ඉවසිය නොහීමෙන් ස්ථිරනොවන බවද, ප්‍රසිද්ධවූ ශාස්ත්‍රඥනායක් නැත්තාවූ මද්‍යපානාදියෙන් විපතට පැමිණි සෙනා නායකයන්ගෙන් යුක්ත බවද, නොරක්නා ලද බවද, යොධයන්ගේ භය සහිත බවද යන මේතෙම කොටුවෙහි විපත්තියයි කියනුලැබේ.

ඒ ව්‍යසන මේවනතෙක් මේ කොටුවෙහි නැත්තේය.

3. කොටුවතුළ වසන සෙනාඟ අතුරෙහි ඔවුනොවුන් බිඳීමය, නික්මීම හා කොටුවට ප්‍රවේශය බොහෝ වේලාවක් නොවැලැක්වීමය, බලයෙන් මැඩීමය, අතිශයින් රළුබව දැක්වීමය යන මේ සතර කොටුවතුළට පිණීමට උපායයෝයයි කියන ලද්දාහුය.

මෙහිද් ශක්තිය නොඉක්මවා උත්සාහ කරණුලැබෙයි" කියයි. චිත්‍රවර්ණ භූපාලතෙමේ එසේයයි කියයි. ඉන්පසු ඉරු උදාවට පළමු උදෑසන කාලයෙහි දොරටු සතරෙහිම යුද්ධය පටන් ගත් කල්හි කොටුවතුළ ගෙයක් ගෙයක් පාසා කවුඩන් විසින් එක්විට ගිනිලන ලද්දේය. ඉක්බිත්තෙන් කොටුව ගන්නා ලද්දේය. යනමේ කෝලාහලය අසා නොයෙක් ගෙවල්වල දල්වනලද ගින්නද ප්‍රත්‍යක්ෂයෙන් දැක රාජහංසයාගේ කොටුව තුළ වසන බොහෝ සෙනාඟවහා ශැඹුරුදියට වන්නෝය.

---

1. යතඃ :—පුරස්කෘත්‍ය බලං රාජා යොධයේදවලෝකයන්,
ස්වාමිනා'ධිෂ්ඨිතඃ ශ්වා'පි කිං න සිංහායතේ ධ්‍රුවම්.

2. අකාල සහ මත්‍යල්පං මූර්ඛව්‍යසනිනායකම්,
අගුප්තං භීරුයොධං ච දුර්ගව්‍යසනමුච්‍යතෙ.

3. උපජාපශ්චිරාරෝධෝ 'වස්කන්දස්තීව්‍ර පෞරුෂම්,
දුර්ගස්‍ය ලඞ්ඝනෝපායාශ්චත්වාරඃ කථිතා ඉමෙ.

1. යම් හෙයකින්—සුදුසු කාලයෙහි මනාවූ මන්ත්‍රණයද මනාවූ වික්‍රමයද බලපමණින් මනාකොට සටන්කිරීමද එසේම මනාකොට පලායාමද කරන්නේය, පරීක්ෂාකරමින් කල් නො ඉක්මවන්නේය.

ස්වභාවයෙන් මඳගමනින් යුක්තවූ විල්ලිහිනියා දෙවෙනිව යන්නාවූ රාජහංසතෙමේද චිත්‍රවර්ණ භූපාලයාගේ සේනාපතිවූ කුකුළා විසින් අවුත් වළක්වන ලද්දේය. හිරණ්‍යගර්භ භූපාල තෙමේ "එම්බා විල්ලිහිනි සේනාපතිය! මට ගෞරව කිරීමෙන් තා නොනසන්නෙහිය, මම දැන් යන්ට අපොහොසත් වෙමි. තෝ දැනුදු යන්ට හැකිවෙයි, එහෙයින් ගොස් ජලයට වදුව. චූඩාමණිනම්වූ මාගේ පුත්‍රයා සර්වඥඅමාත්‍යයාගේ නියමයෙන් රජ්ජුරුවන්කරන්නෙහිය" යි කියයි. ● විල්ලිහිනි තෙම "දෙව යන්වහන්ස! මෙබඳු ඉවසිය නොහෙන වචනයෙක් නොකිය යුතුය. හිර සඳ දෙක පවත්නාතුරු දෙවයන්වහන්සේ ජය ගන්නා සේක්වා. දෙවයන්වහන්ස! මම කොටුව රක්නා ඇමති වෙමි. එහෙයින් මාගේ ලේහා මාංසයෙන් තවරණ ලද දොරටු මගින් වනාහි සතුරෝ වදිත්වා.

2. දෙවයන්වහන්ස! අනිකෙක්ද වෙයි—ඉවසීමෙන් යුක්තවූ දෙන සුලුවූ ආදරවත්වූ ස්වාමී තෙම වාසනාවෙන් ලබනු ලැබෙයි" කියයි.

රජතෙම එසේවේවා එසේද—පිරිසිදුවූ දක්ෂවූ අලූනාවූ ඇමතියෙක් ඒකාන්තයෙන් ලැබිය නොහෙයි" කියයි.

සාරස ඇමතිතෙම "දෙවයන්වහන්ස! ඇසුව මැනව.

3. ඉදින් සටන හැරදමා ගියකල මරහට බියෙක් නැතැයි දක්නේද එකල්හි මේ සටන් බිමින් අන් තැනකට පලායාම සුදුසුවෙයි, ඉදින් ජනයාහට මරණය නියමවූයේනම් එකල්හි පලනැති කාරණයෙන් කීර්තිය කුමට කිලුටුකරණු ලබන්නේද.?

---

1. යතඃ—සුමන්ත්‍රිතං සුවික්‍රාන්තං සුයුද්ධං සුපලායිතම්,
ප්‍රාප්තකාලෙ යථාශක්ති කුර්‍ය්‍යාන්න තු විචාරයෙත්.

2. අපරඤ්ච දෙව:— ක්ෂමී දාතා ගුණග්‍රාහී ස්වාමී භාග්‍යෙන ලභ්‍යතෙ,
රාජාහඅස්ත්‍යෙවං කිඤ්ච :—" ශුචිර්දක්ෂො 'නුරක්තශ්ච භෘත්‍යඃ ඛලුසුදුර්ලභඃ.

3. යදි සමරමපාස්‍ය නාස්ති මෘත්‍යොර්
භයමිති යුක්තමිතො න්‍යතඃ ප්‍රයාතුම්,
අථමරණමවශ්‍යමෙව ජන්තොඃ
කිමිති මුධා මලිනං යශඃ ක්‍රියෙත.

1. අනිකෙක්ද—වාතයෙන් කම්පාකරණලද්දාවූ තරඞ්ගයන්ගේ ලීලාවමෙන් ඇසිල්ලෙකින් නැසෙන සුලුවූ මේ ඉපදීම ඇතිකල්හි අනුන්ට උපකාරපිණිස ජීවිතය පරිත්‍යාග කිරීම පුණ්‍යබලයෙන් ලැබෙයි.

දෙවයන්වහන්ස! ස්වාමිවූ නුඹවහන්සේ හැමකල්හි රැක්කයුතුවෙයි.

2. යම්හෙයකින්—රජහු විසින් හරණලද ජනතෙමේ සියලු ඉසුරෙන් යුක්තවූයේද නොපවතී, ආයු පිරිහුනු තැනැත්තා කෙරේ ධන්වන්තරී වෛද්‍යතෙමේද කුමක්නම් කෙරේද?

3. අනිකෙක්ද—රජ්ජුරුවන් නැසුනු කල්හි මේ ලොව ජනතෙමේද නසියි, ඉරු නැගෙණ කල පියුම්විල පුබුදුවන්නාක් මෙන් රජ්ජුරුවන් පහළවූ කල්හි ජනයාද වැඩෙයි.

4. නැවතද—රජය ඇමතිය රාජ්‍යය සෙනග වසනතැනය දන ගබඩාවය සෙනාවය මිත්‍රභාවයට පැමිණි රජහුය ජනයෝය නුවර වැසි සෙනගද යන මොව්හු රාජ්‍යයෙහි අවයවයෝයි.

මෙහිද ප්‍රධානවූ අවයවය රජවෙයි කියයි" ඉක්බිත්තෙන් කුකකුට අමාත්‍යයාවිසින් අවුත් රජහංසයාගේ සිරුරෙහි තියුණු නියෙන් ගසනලද්දේය. ඉක්බිත්තෙන් සාරස අමාත්‍යයාවිසින් යුහුව අවුත් රජතෙම තමාගේ ශරීරයෙන් වසනලද්දේය. ඉන්පසු කුකකුට අමාත්‍යයාවිසින් නියවලින් හා තුඩින්ද කොටනලද විල්ලිඟිනියා විසින් තමාගේ ශරීරයෙන් වසා රජතෙමේ දියෙහි හෙලනලද්දේය. සෙනාපතිවූ විල්ලිඟිනියා විසින් තමාගේ හොටයෙන් ගැසීම කරණකොටගෙණ කුකුලාද මරණලද්දේය. ඉන්පසු විල්ලිඟිනියාද බොහෝ පක්ෂීන් විසින් රැස්ව මරණ ලද්දේය. ඉක්බිත්තෙන් චිත්‍රවර්ණ භූපාලතෙම කොටුව තුළට වැද කොටුවතුළ තුබූ දෙය ගෙන්වාගෙණ ස්තුතිපාඨකයන්විසින් ජයප්‍රකාශිත වාක්‍යවලින් සතුටුකරණලද්දේ ගියේය.

---

1. අන්‍යච්ච :—භවෙ ‘ස්මිං පවනොද්භ්‍රාන්තවීචිවිභ්‍රමභඞ්ගුරෙ,
ජායතෙ පුණ්‍යයොගෙන පරාර්ථෙ ජීවිතව්‍යයඃ.

2. යතඃ :—ප්‍රකෘතිඃ ස්වාමිනා ත්‍යක්තා සමෘද්ධාපි න ජීවති,
අපි ධන්වන්තරිර්වෛද්‍යඃ කිං කරොති ගතායුෂි.?

3. අපරඤ්ච :—නරෙශෙ ජීවලොකො ‘යං නිමීලති නිමීලති,
උදෙත්‍යුදීයමානෙ ච රවාවිව සරොරුහම්.

4. අපිච :—ස්වාම්‍යමාත්‍යශ්ච රාෂ්ට්‍රං ච දුර්ගං කොශො බලං සුහෘත්,
රාජ්‍යාඞ්ගානි ප්‍රකෘතයඃ පෞරාණාං ශ්‍රෙණයො ‘පි ච.

රාජපුත්‍රයන් විසින් "ඒ රාජහංසයාගේ පිරිස් අතුරෙහි යමෙක්හු විසින් තමාගේ ශරීරය දීමෙන් ස්වාමියා රක්නා ලදද ඒ විද්‍යුල්ලි හිනි තෙමේම පිනැතිවෙයි.

1. යම්හෙයකින්—ගවදෙන්හු ගවයන්ගේ රූපාකාරයෙන් යුක්තවූ සියලු වස්සන්ම උපදවන්නීහු වෙත්. ඒ ගවයන් අතුරෙන් අංදෙකින් තවරණලද පිටදෙපැත්ත ඇති ගවරැලගේ ස්වාමීවූ එකම ගවයෙක්හු උපදවන්නිය" යි කියනලද්දේය.

විෂ්ණුශර්මන් විසින් ඒ පූජ්‍ය සත්වයා වනාහි විද්‍යාධරීන් විසින් පිරිවරණ ලද්දේ ශූරභාවයෙන් යුක්තවූයේ නිත්‍ය ස්ථාන යන් අනුභව කෙරේවා.

2. එසේද කියන ලදී—යම් ජනයෝ සටන්කිරීමෙහි දක්ෂ යෝද රජ්ජුරුවන් රැකගැණීම පිණිස තමන් දිවි හරණලද්දාහුද රජ්ජුරුවන් කෙරේ ආදර ඇත්තාහුද කළ උපකාරදන්නාහුද ඒ ජනයෝ ස්වර්ගයෙහි උපදනාහු වෙත්.

3. කිසියම් දෙශයකදී සතුරන් විසින් පිරිවරණලද තැනැත්තේ පසුබටව ඉදිත් දක්ෂ පූරුෂභාවය නොහරීද ඒ ශූර තෙමේ මරණ ලද්දේනමුදු නොනස්නාවූ ආත්මයන් ලබා.

පින්වත් කුමාරවරුන් විසින් දබරය අසන ලද්දේය" යි කියන ලද්දේය. රාජපුත්‍රයන් විසින් "අපිඅසා සැපතට පැමිණියම්හ" යි කියනලද්දේය. විෂ්ණුශර්මන්තෙමේ නැවතද මෙසේ වේවයි කියනලද්දේය.

4. රජුන්ගේ ඇත් අශ් රථ පාබළයන මේ සිව්රඟ සෙනඟගෙන් කිසිකලෙක්හි අපට යුද්ධයෙක්වේද එකල්හි රාජනීතිහා මන්ත්‍රණයද යනමේ වාතයන් විසින් පහරණලද සතුරෝ ගල් ගුහාවලට වදීත්වා.

හිතොපදෙශයෙහි විග්‍රහනම් තුන්වෙනිවූ
කථාසංග්‍රහය මෙසේයි.

---

1. යතඃ :—ජනයන්ති සුතාං ගාවඃ සර්වානෙව ගවාකෘතීන්,
විෂාණොල්ලිඛිතස්කන්ධං කඤ්චිදෙව ගවාම්පතිම්.

2. තථාචොක්තම් :—ආහවෙෂු ච යෙ ශූරාඃ ස්වාම්‍යර්ථං ත්‍යක්තජීවිතාඃ,
භර්තෘභක්තාඃ කෘතඥශ්ච තෙ නරාඃ ස්වර්ගගාමිනඃ.

3. යත්‍ර තත්‍ර හතඃ ශූරඃ ශත්‍රුභිඃ පරිවෙෂ්ටිතඃ,
අක්ෂයාන් ලභතෙ ලොකාන් යදි ක්ලෛබ්‍යං න ගච්ඡති.

4. විග්‍රහඃ කරිතුරඞ්ගපත්තිභිර්නො කදාපි භවතාං මහීභෘතාම්,
නීතිමන්ත්‍රපවනෛඃ සමාහතාඃ සංශ්‍රයන්තු ගිරිගහ්වරං විෂඃ.

# ස න්ධි ය යි.

# සන්ධිය හෙවත් මිතුරුකිරීම.

## සන්ධිනම් පරිච්ඡේදය කියනුලැබේ.

නැවතද කථාව පටන්ගන්නාකල්හි රාජපුත්‍රයන් විසින් ස්වාමිය! අපවිසින් සටන අසනලදී, දැන් ගැළපීම කියනුලැබේ වයි කියනලදී. විෂ්ණුශර්මන් විසින් ගැළපීමද අසනුලැබේවා, මම කියමි, ඒ ගැළපීමෙහි මේමුල් ශ්ලෝකයවෙයි.

1. නටුවාවූ සෙනාභින් යුක්තවූ රජුන්දෙදෙනාගේ මහත් යුද්ධය පවත්නාකල්හි සටන නියමකරන්නාවූ ගෘධ්‍රයචක්‍රවාකය යන ඇමතියන් දෙදෙනාවිසින් ඇසිල්ලෙකින් ගැළපීම කරණලද්දේයයි කියනලදී.

රාජපුත්‍රයෝ ඒ කෙසේදැයි විචාළෝය. විෂ්ණුශර්මන්තෙමේ කියයි. ඉක්බිත්තෙන් ඒ රාජහංසයා විසින් "කවරක්හු විසින් අපගේ කොටුවෙහි ගිනිලනලද්දේද? කිමෙක්ද සතුරුසෙනාහ විසින් ගිනිලනලදද නොහොත් සතුරන්විසින් යොදවනලද අපගේ කොටුවෙහි වසන කිසිවෙක්හු විසින් ගිනිලනලද්දැයි"? කියනලදී. චක්‍රවාකතෙම "දේවයන්වහන්ස! ස්වාමීන්වහන්සේගේ පලනැත්තාවූ මිතුරුපිරිවරසහිත මේ මේඝවර්ණතෙමේ මේ ස්ථානයෙහි නොදක්නාලැබෙයි මේ ක්‍රියාව ඔහුවිසින් කරණලදැයි සිතමි කියයි. රජතෙම ඇසිල්ලක් කල්විමසා මාගේ මෙබඳුවූමේ පිත්නැතිබවෙක් වනාහි ඇත්තේය.

2. එසේදකියනලදී—උත්සාහයෙන් මනාකොට ගළපනලද කටයුත්ත භාග්‍යය පිරිහීම හෙතුකොටගෙණ නසී, ඒ දෝෂය භාග්‍යයෙහිවෙයි, නැවතමේතෙම ඇමතියන්ගේ දෝෂයෙක් නොවෙයි" කියයි.

---

1. වෘතෙන මහති සඞ්ග්‍රාමෙ රාඥෝර්නිහතසේනයොඃ,
ස්ථෙයාභ්‍යාං ගෘධ්‍රචක්‍රාභ්‍යාං වාචා සන්ධිඃ කෘතඃ ක්ෂණාත්.

2. තථාචොක්තම් :—අපරාධඃ ස දෛවස්‍ය න පුනර්මන්ත්‍රිණාමයම්,
කාර්‍යං සුඝටිතං යත්නාත් දෛවයෝගා විනශ්‍යති.

1. අමාත්‍යතෙමේ පෙරපණ්ඩිතයන් විසින් මේකාරණය කියනලද්දේය. දුක්බහුල කාලයට පැමිණි මනුෂ්‍යතෙම භාග්‍යයට ගර්හාකෙරෙයි. අඥනයා තමන් පිළිබඳවූ ක්‍රියාවගේ දෝෂයවූ කලි නොදන්නේමය.

2. අහිතෙක්ද—යමෙක් වැඩසොයන මිතුරන්ගේ වචනය නොකෙරේද ඒ අඥනතෙමේ දණ්ඩෙන් වැටුනු ඉදිබුවාමෙන් නැසෙයි" කියයි.

රජතෙමේ ඒ කෙසේදැයි? විචාරයි. ඇමතිතෙමේ කියයි.

"මගධදේශයෙහි ඵුල්ලෝත්පල නම් විලෙක්ඇත. ඒවිලෙහි සංකටය විකටය යන නම් ඇති හංසයෝ දෙදෙනෙක් බොහෝ කල් විසූවෝය. ඒ හංසයන් දෙදෙනාට මිත්‍රවූ කම්බුග්‍රීවනම් ඉදිබුවෙක්ද ඒ විල්හි වෙසෙයි. ඉක්බිත්තෙන් එක්දිනක් කෙවුලන් විසින් ඒ විලකරා අවුත් "අපවිසින් අදමෙහි වාසයකොට උදෑසන මත්ස්‍යයෝද ඉදිබුවෝද යන මේ ආදීහු මැරියයුත්තාහු" යයි කියනලද්දේය. ඒ කථාවඅසා ඉදිබුතෙම "මිත්‍රවරුණි! මේ කෙවුලන්ගේ කථාව අසනලදද? මාවිසින් දැන් කුමක් කටයුතුදැ"යි? හංසයන්ට කියයි. ඒ අසා හංසයෝ "ඒ කථාව වනාහි අසනලද්දීය, පසුව සුදුස්සක් කටයුතුය" යි කීවෝය. ඉදිබුතෙම "යම්හෙයකින් මම මේ විල්හි දක්නාලද විපත්තිඇත්තෙම්ද එහෙයින් එසේ නොකෙරේවා.

3. එසේදකියනලදී—අනාගතවිධාතෘනම් මත්ස්‍යද එසේම ප්‍රත්‍යුත්පන්නමතිනම් මත්ස්‍යදැයි යන මොව්හු දෙදෙන සුවයට පැමිණෙත්, යද්භවිෂ්‍යනම් මත්ස්‍යතෙමේ නසින්නේය" යි කියයි.

ඒ කෙසේදැයි හංසයෝ දෙදෙන විචාළෝය. ඉදිබුතෙමේ කියයි.

පුරාතනකාලයෙහි මේ විල්හිම මෙබඳුවූම කෙවුලන් එළඹ සිටිකල්හි මසුන් තුන්දෙනකු විසින් දක්නාලද්දේය. එහි අනාගත විධාතෘනම් එක්මත්ස්‍යයෙක්වෙයි, ඔහු විසින් මම පළමු

---

1. විෂමාං හි දශාං ප්‍රාප්‍ය දෛවං ගර්හයතෙ නරඃ,
ආත්මනඃ කර්මදෝෂාංස්තු නෛව ජානාත්‍යපණ්ඩිත

2. අපරඤ්ච :—සුහෘදාං හිතකාමානාං යො වාක්‍යං නාභිනන්දති,
ස කූර්ම ඉව දුර්බුද්ධිඃ කාෂ්ඨාද්භ්‍රෂ්ටො විනශ්‍යති.

3. තථාචොක්තම් :—අනාගතවිධාතා ච ප්‍රත්‍යුත්පන්නමතිස්තථා,
ද්වාවෙතෞ සුඛමෙධෙතෙ යද්භවිෂ්‍යො විනශ්‍යති.

කොට අන්‍යජලස්ථානයක් කරයෙමි" යි කියන ලද්දේය. මෙසේකියා ඒ මත්ස්‍යතෙම ගැඹුරු දිය ඇතිතැනකට ගියේය. අන්‍යවූ ප්‍රත්‍යුත්පන්නමතිනම් මත්ස්‍යයා විසින් "මතුවන්නාවූ කාරණයාගේ ප්‍රමාණය නියමකළ නොහෙන බැවින් මා විසින් කොතැන්හි යායුතුද, එබැවින් කාරණය සිදුවූකල්හි සුදුසු ලෙසක් කටයුතුය" යි කියනලද්දේය. ඉක්බිත්තෙන් යද්භවිෂ්‍යනම් මත්ස්‍යයා විසින්.

1. යම් කාරණයෙක් නියමයෙන් නොවන්නේද ඒ කාරණය නොවන්නේය, යමෙක් නියමයෙන් වන්නේද ඒ කාරණය අන්‍ය ප්‍රකාරයෙකින් නොවන්නේය, මෙසේ සිතීමෙන් උපන් ඉවසිය නොහෙන දුක්නසන මේ බෙහෙද කවරහෙයකින් පානය කරණුනොලැබේද" යි කියනලද්දේය.

ඉක්බිත්තෙන් උදෑසන දැලෙන් බඳනාලද්දාවූ ප්‍රත්‍යුත්පන්නමතිනම් මත්ස්‍යතෙමේ මළඑකක්හුමෙන් තමා ප්‍රකාශකොට සිටියේය. ඉක්බිත්තෙන් දැලෙන් පහකරණලද්දේ ගොඩින් පැන ගැඹුරුදියට වන්නේය. යද්භාවිෂ්‍යනම් මත්ස්‍යතෙමේ කෙවුලන් විසින් අල්වාගන්නා ලද්දේ මරණලද්දේය. අනාගතවිධාතා—යනා මේ ආදිය එහෙයින් මම කියමි" කියයි. එබැවින් මම යම් පරිද්දෙකින් අනික් ගැඹුරුවූ ජලස්ථානයක් කරා පැමිණෙම්ද එබන්දක් අද දවස්හි කරණුලැබේවයි කියයි. හංසයෝ ඒ අසා "ජලස්ථානය තුළට පැමිණිකල තට දුකෙක් නැත්තේය, ගොඩබිමෙහි තාගේගමනට උපාය කෙසේද" යි කීවෝය. ඉදිබුතෙම මම පින්වතුන් දෙදෙනාහා සමග යම් පරිද්දෙකින් අහසින්යෙම්ද ඒ උපායතෙම කරණුලැබේව" යි කියයි. හංසයෝදෙදෙන "ඒ උපාය කෙසේවේද" යි කියත්. ඉදිබුතෙම නුබලාදෙදෙනා විසින් හොටවලින් අල්වාගන්නා ලද්දාවූ එක් දණ්ඩක් මා විසින් මුඛයෙන් එල්බ ගතයුතුය, පසුව පින්වතුන් දෙදෙනාගේ පියාපත්වල උපකාරයෙන් මා විසින්ද සැපයෙන් යුක්තව යායුතුය" යි කියයි. හංසයෝදෙදෙන මේ උපාය ලැබෙයි, එසේවේවා.

2. එසේවූවත්—නුවණැති ජනතෙමේ උපායක්වූකලි සල

---

1. යදභාවි න තද් භාවි භාවි චෙන්න තදන්‍යථා,
ඉති චින්තා විෂඝ්නො ‘යමගදඃ කිං න පීයතෙ ?.

2. කිඤ්ච :—උපායං චින්තයන් ප්‍රාඥස්‍යාපායමපි චින්තයෙත්,
පශ්‍යතො වකමූර්ඛස්‍ය නකුලෛර්භක්ෂිතාඃ සුතාඃ.

කතුයේ විපත්තියටද සැක කරන්නේය, බලාසිටිනා කොක් මොඩයා නොතකා මුගටින් විසින් පුත්‍රයෝ කනලද්දාහුය" යි කියත්.

ඉදිබුතෙම ඒ කෙසේදැයි විචාරයි? හංසයෝදෙදෙන කියත්.

උත්තරාපථයෙහි ගෘධ්‍රකූට නම් පර්වතයෙක් ඇත්තේය. එහිම නර්මදා නදී ඉවුරෙහි නුග ගසෙක කොක්කු වසත්. ඒ නුග ගසෙහි පාතින්වූ බිලයෙහි සර්පයෙක් වෙසෙසි. ඒ සර්පතෙමේද කොකුන්ගේ ළදරු පුතුන් කයි. ඉක්බිත්තෙන් ශෝකදුකින් පීඩිතවූ කොකුන්ගේ වෙළපීම අසා එක්තරා මහළු කොකෙකු විසින් "පින්වත්නි! තොපි මෙසේ කරවූ මසුන්ගෙණවුත් මුගටියා වසන බිලයපටන් සර්පයාවසන සිදුරදක්වා පිළිවෙළින් එක එකා බැගින් මසුන් විසුරුවා රකිව්. ඉක්බිත්තෙන් ඒ ආහාර මාර්ගයෙන් මුගටියාවිසින් අවුත් දක්කයුතුවූ සර්පතෙම ස්වභාවයෙන් පවත්නා ක්‍රෝධයෙන් මැරියයුතුය" යි කියන ලද්දේය. එසේකළකල්හි සර්පයාගේ මරණයවූයේය. එකල්හි මුගටින් විසින් ගසමත්තේ පක්ෂිපොතකයන්ගේ ශබ්දය අසනලද්දෙය. පසුව ඒ මුගටියා විසින් කොක්පැටව් කනලද්දාහුය. එබැවින් අපිළිපාය සලකන්නේ, යන මේ ආදිය කියම්හ. අප දෙදෙනා විසින් ගෙණයනු ලබන්නාවූ තාදෑක මිනිසුන් විසින් යමක් කිය යුතුමය. ඒ අසා තෝ ඉදින් උත්තරදෙන්නෙහිනම් එකල්හි තාගේ මරණය වන්නේය. එබැවින් සියලුලෙසින් මෙහිම විසිය යුතුයයි කියසි. ඉදිබුතෙම "ඒ කුමක්ද මම අඥානයෙක්ද? මා විසින් කිසිවකුත් නොකියයුතුය" යි කියයි. ඉන්පසු එසේකළකල්හි ආකාශයෙහි ගෙණයනුලබන ඒ ඉදිබුවා දැක ගවපාලයෝ සියල්ල පසුපස්සේ දිවත්. "අහෝ මහත් විස්මයෙක පක්ෂීන් විසින් ඉදිබුවෙක් ඔසවාගෙණ යනුලැබෙයි" යනුද කියත්. එහ්කිසිවෙක් "ඉදින්මේ ඉදිබුවා වැටේද, එකල්හි මෙහිදීම පුළුස්සා කෑයුතුය" යිද කියයි කිසිවෙක් "ගෙටගෙණ යායුතුය" යි කියයි. තවඅැතම් එකෙක් "විලක්සමීපයේදී පුලුස්සාකෑයුතුය" යි කියයි. ඒ රළුවචනඅසා රැගැනිව මා විසින් කිසිවක් නොකියයුතුයයි කරණලද නියමය සැලකිය නොහැක්කේ "තොපවිසින් අලු කෑයුතුය" යි කියන්නේම දන්ඩෙන් වැටුනේ ගවපාලකයන් විසින් මරණලද්දේය. වැඩකැමතිවූ මිත්‍රයන්ගේ යන මේ ආදිය එහෙයින් මම කියමි" කියයි. ඉක්බිත්තෙන් අනුචරවූ කොක්තෙම ඒ ස්ථානයට අවුත් දෙවයන් වහන්ස! "නුවරතුළ පිටතින් පැමිණි ආගන්තුකයන් ඉන්ද.

නොදී නිතර පිටත්කළ යුතුයයි මා විසින් පළමුකොටම දන්වන ලද්දේය. ඒ කාරණයද නුබවහන්සේ විසින් නොකරණලද්දේය. එබැවින් වචනය පරීක්‍ෂා නොකිරීමෙහි මේ පලය අනුභව කරණලද්දේය. මේ නුවර දැවීමද ගෘධ්‍රඅමාත්‍යයා විසින් යොදවනලද්දාවූ මෙඝවර්‍ණ නම් කවුඩා විසින් කරණලද්දේය” යි කීය.

1. රජතෙමේ සුසුම්ලා, මිත්‍රභාවය හෙතුකොටගෙණ හෝ කරණලද උපකාරයක් හෙතුකොටගෙණ හෝ යමෙක් සතුරන් කෙරේ විශ්වාසකෙරේද ඒ ජනතෙම සයනයකළාවූ ගස්මුදුනකින් වැටුනු එකක්හුමෙන් විපත්තියට පැමිණ කාරණය අවබොධ කෙරෙයි” කියයි.

ඉක්බිත්තෙන් අනුචරතෙමේ කීයේය. නුවර දැවීමකොට මෙ ස්ථානයෙන් මෙඝවර්‍ණතෙමේ යම් දිනයෙක්හි ගියේද එකල්හි සතුටුවූ චිත්‍රවර්‍ණභූපාලයා විසින් මේ මෙඝවර්‍ණතෙම මේ කර්පූර ද්වීප රාජ්‍යයෙහි අභිෂෙක කරණු ලැබේවා.

2. එසේද කියනලදී—සිදුකරණලද කටයුතුඇති සෙවකයාහට ඔහු විසින් සම්පාදනය කරණලද්දාවූ ක්‍රියාව නොසතුට දැක්වීමෙන් පල නැතිනොකරන්නේය, සතුටු පඬුරුදීමෙන්ද සිත්හි සතුට දැක්වීමෙන්ද වචනයෙන්ද ප්‍රසන්නවූ බැලීමෙන්ද මොහු සතුටුකරවන්නේය” යි කියනලද්දේය.

චක්‍රවාකතෙමේ “දෙවයන්වහන්ස! යමක් අනුචර තෙමේ කියාද ඒ අසනලද්දේද” යි කියයි. රජතෙම නැවත කියයි. දූතතෙමේ නැවත කීයේය. “ඉක්බිත්තෙන් ප්‍රධාන අමාත්‍යවූ ගෘධ්‍ර විසින් “දෙවයන්වහන්ස! මේ රාජ්‍යය දීම සුදුසු නොවෙ” යී. අන්‍යවූ යම්කිසි සතුටුපඬුරු දීමෙක් කරණුලැබේවා.

3. යම්හෙයකින්—යම් ජනයෙක් අසුන් ගෙණයාම මුල්වූ රජුන්ගේ කටයුත්තකින් යෙදුනේද ඕහට තනතුරෙන් පහවී

---

1. ප්‍රණයාදුපකාරාද්වා යො විශ්වසිති ශත්‍රුෂු,
ස සුප්ත ඉව වෘක්ෂාග්‍රාත් පතිතඃ ප්‍රතිබුධ්‍යතෙ.

2. තථාචොක්තම් :—කෘතකෘත්‍යස්‍ය භෘත්‍යස්‍ය කෘතං නෛව ප්‍රණාශයෙත්,
ඵලෙන මනසා වාචා දෘෂ්ට්‍යා චෛනං ප්‍රහර්ෂයෙත්.

3. යතඃ :—අධිකාරෙණ යො යුක්තඃ කථං තස්‍යාස්ති ඛණ්ඩනම්,
නිමෙෂූපකෘතං රාජන් ! බාලුකාසච්ච මුද්‍රනම්.

මෙන් නැත්තේය, පින්වත් මහරජ! ලුහුඬු කල්පනා ඇති නීචයන්කෙරේ කරණලද උපකාරය වැලිමත්තෙහි කරණලද් දුවූ මුද්‍රලාඤ්ඡනයක් මෙන් කල් නොපවතී.

උතුමන්ගේ ස්ථානයෙහි නීචයෙක් කිසිකලකත් නොපිහිටු වියයුතුවෙයි.

1. එසේද කියනලදී—නීචතෙමේ උතුම් තනතුරට පැමිණ ස්වාමියා නසනුපිණිස කැමතිවෙයි, මීයා ව්‍යාඝ්‍රභාවයට පැමිණ ඍෂියා මැරීම පිණිස ගියාමෙනැ" යි කියන ලද්දේය

චිත්‍රවර්ණතෙමේ ඒ කෙසේදැයි? විචාරයි. ගෘධ්‍රතෙමේ කියයි.

"ගෞතමාරණ්‍යයෙහි මහා තපස්නම් ඍෂියෙක් ඇත. ඒ ඍෂිහු විසින් පන්සල සමීපයේ කවුඩන්හුගේ මුඛයෙන් වැටුනු මීපැටවෙක් දක්නා ලද්දේය. ඉක්බිත්තෙන් අනුකම්පාවෙන් යුක්තවූ ඒ ඍෂිහු විසින් ධාන්‍යයන්ගේ සුණුවලින් වඩනලද්දේය, ඒ මීයාද කණු පිණිස පසුව දිවන බළලෙක් ඍෂිහුවිසින් දක්නා ලද්දේය. ඉන්පසු තපස් ආනුභාවයෙන් ඒ ඍෂිහු විසින් මීයා බලසම්පන්නවූ බළලෙක් කරණලද්දේය. ඒ බළලා බල්ලාගෙන් බියගණී. ඉන්පසු ඒ බළලා බල්ලෙක් කරණ ලද්දේය. බල්ලාහට ව්‍යාඝ්‍රයාගෙන් මහත් බිය ඇතිවෙයි. ඉන්පසු ඒ බල්ලා ව්‍යාඝ්‍රයෙක් කරණලද්දේය. එකල්හි ඒ මීයාට නොවෙනස්වූ ව්‍යාඝ්‍රයාද ඍෂිතෙමේ දකී. ඉන්පසු එහි පැමිණි සියලු ජනයෝ ඒ ව්‍යාඝ්‍රයා දැක මේ ඍෂිහු විසින් මේ මීයා ව්‍යාඝ්‍රභාවයට පමුණුවනලද්දේයයි කියති. මේ කථාව අසා ඒව්‍යාඝ්‍රතෙමේ දුකට පැමිණියේ "යම්තාක්කල් මේ ඍෂිහුවිසින් ජීවත්වියයුතුද ඒතාක්කල්ම මාගේ ස්වභාවය මීයෙක යන මේ ගර්හා කථාව නැතිනොවන්නීය" යි සිතී. මෙසේ සිතා ඍෂියා මැරීම පිණිස පටන් ගත්තේය. ඍෂිතෙමේ ඔහුගේ අදහස දැන "නැවත මීයා වේවයි" කියා මීයාම කරණලද්දේය. නීචයා උතුම් තනතුරට පැමිණ යන මේ ආදිය එහෙයින් මම කියමි. දෙවයන්වහන්ස! අනිකෙක්ද ඇසුව මැනව. මේ තෙම සුවසේ කළහැකියයි නොසිතුව මැනව.

2. අසුවම්මැනව—කුඩාවූද මහත්වූද මධ්‍යමවූද මසුන්කා අධි

---

1. තථාචොක්තම් :—නීචඃ ශ්ලාඝ්‍යපදං ප්‍රාප්‍ය ස්වාමිනං ලොප්තුමිච්ඡති,
මූෂිකො ව්‍යාඝ්‍රතාං ප්‍රාප්‍ය මුනිං හන්තුං ගතො යථා.

2. ශෘණු :—භක්ෂයිත්වා බහූන් මත්ස්‍යානුත්තමාධමමධ්‍යමාන්,
අතිලෞල්‍යාද්බකො මූර්ඛො මෘතඃ කර්කටසඞ්ග්‍රහාත්.

කවූ හිජුබව හෙතුකොටගෙණ අඥනවූ කොක්තෙමේ කකුළුවා ඇල්වීමෙන් මරණ ලද්දේය" යි කියයි.

ඒ කෙසේදැයි චිත්‍රවර්ණ භූපාලතෙමේ විචාරයි. ඇමති තෙමේ කියයි.

"මාලවදෙශයෙහි පද්මගර්භනම් විලෙක් ඇත. ඒ විලෙහි එක් මහලු කොකෙක් බල නැත්තේ එසේවූ තමා කලකිරුණු එකත්හුමෙන් දක්වා සිටියේය. එසේ සිටි කොකාද එක් කකුළුවක්හු විසින් දුරදුම් පින්වත් තෙමේ ආහාර නොගෙණ මෙහි තුමක් සඳහා සිටීදැයි විචාරණ ලද්දේය. ඒ අසා කොකා විසින් මත්‍ස්‍යයෝ මාගේ ජීවත්වීමට හෙතුවෙත්. මේ විල්හි මත්‍ස්‍යයෝද නියමයෙන්ම කෙවුළන් විසින් මැරියයුතුවෙත්යයි [illegible]සේ නුවර සමීපයෙහි කෙවුළන් විසින් කරණලද ඔවුනොවුන්ගේ කථාව අසන ලද්දෙමි. එබැවින් මේ විලෙන් ජීවිකාව කිරීම නොලැබෙන බැවින් මාගේ මරණය එළඹ සිටියේයයි සිතා ආහාර ගැණීමටද ප්‍රියයෙක් නැත්තේයයි කියන ලද්දේය. ඉන් පසු සියලු මසුන්විසින් "මේ කාලයෙහි මේ කොකා වනාහි අපට උපකාර කරණ එකෙක්මයයි දක්නා ලැබෙයි, එහෙයින් කෙසේ කටයුතු වේදැයි මොහුම විචාරණු ලැබේව" යි සිතන ලද්දේය.

1. එසේද කියනලදී—උපකාරකරන්නාවූ සතුරා හා සමඟ මිත්‍රවිය යුතුය, අනුපකාර කරණ මිතුරාහා සමඟ නොගැළපිය යුතුය්, එසේමැයි, උපකාර අවැඩ දෙක සතුරු මිතුරුවූ මොවුන් දෙදෙනාගේ ඇඳිනියයුතුවූ ලකුණු වෙයි.

මත්‍ස්‍යයෝ "පින්වත් කොකානනි! අපගේ රක්‍ෂාකටයුතු උපාය කොතැන්හිද" යි? කීවෝය. කොක්තෙමේ රක්‍ෂාකිරීමට හෙතුවූ අන්‍ය ජලස්ථානයෙක් ඇත්තේය, මම තෙපි එක එකා බැගින් ඒ ස්ථානයට ගෙණයෙමි" යි කියයි, භය හෙතුකොට ගෙණ මසුන් විසිනුදු එසේ වේවයි කියන ලද්දේය. ඉත්පසු මේ දුෂ්ටවූ කොකා ඒ මසුන් එක එකා ගෙණ ගොස් එක් තැනෙක් හිඳී කා නැවත අවුත් "මාවිසින් ඔව්හු දිය නොසිඳෙන අන් තැනෙක්හි හිඳුවන ලද්දාහුය" යි කියයි. ඉත්පසු කකුළුතෙමේ "පින්වත් කොකානනි! මාද ඒ ජලස්ථානය කරා ගෙණයව" යි කීයේය. ඉක්බිත්තෙන් කොකාද පෙර නොකෑවිරූ කකුළුමස්

---

1. කථාමොකනම් :—උපකර්තා 'රිණා සඞ්ධිර් න මිත්‍රෙණාපකාරිණා, උපකාරාපකාරෞ හි ලක්‍ෂ්‍යං ලක්‍ෂණමෙතයොඃ.

කණ්ණකෑමැත්තේ ආදර සහිතව ඒ කකුළුවා ගෙණගොස් බිම තබාගත්තේය. කකුළුවාද මසුන්ගේ ඇටවලින් පිරී තිබෙන භූමිය දැක "විසමයෙක ! පින් නැත්තෙම් නටුයෙමි. වත්නාට දැන් එළඹසිටි පරිද්දෙන් කෙරෙමි.

1. යම්හෙයකින්—බිය එළවන කාරණය එළඹ සිටීමට පළමු භයකාරණය හෙතුකොටගෙණ භයවිය යුතුය, එසේද එළඹ සිටි බිය දැක බිය නැත්තක්හුමෙන් හැසිරිය යුතුය.

2. අතිකෙක්ද—නුවණැති ජනතෙමේ යම්කලෙක්හි මඩනා ලද්දේ තමහට මඳකුදු වැඩක් නොදක්නේද එකල්හි සතුරා හා සම්ඝ සටන්කරණුයේ මියයෙයි" යනු සිතන ලදී.

මෙසේ සිතා ඒ කකුළුවා කොකාගේ බොටුව සින්දේය. එකල්හි ඒ කොකා මියගියේය. බොහෝ මසුන් කා යන මේ ආදිය එහෙයින් මම කියමි" කියයි. ඉන්පසු නැවතද චිත්‍රවණී භූපාලතෙමේ "මහ ඇමතිය ! පළමුකොට අසව, මාවිසින් මේ කාරණය සිතනලදී. එබැවින් මෙහි සිටි මෙඝවණී භූපාලයා ලවා කර්පූර ද්වීපයෙහි ඇතිතාක් උතුම්වූ වස්තු අපවිසින් ගෙන් විය යුතුවෙත්. එහෙයින් මහත් ලීලාවෙන් යුක්තව අපවිසින් විඤ්ඣ්‍ය පර්වතයෙහි සිටියයුතුය"යි කීයේය. පණ්ඩිත තෙමේ සිනාසී දෙවයන්වහන්ස !

3. යම් ජනයෙක් වනාහි මතුකාලයෙහි සැපගෙණදීම පිළිබඳවූ සිතිවිලි කොට එපමණකින් සතුටුවේද, ඒ ජනතෙම බිඳුනු මැටි බඳුන් ඇති බමුණමෙන් දුකට පැමිණෙයි කියයි.

රජතෙම ඒ කෙසේදැයි ? කියයි. පණ්ඩිතතෙම කියයි.

දෙවකොට්ටනුවර දෙවශර්මන් නම් බ්‍රාහ්මණයෙක් ඇත්තේය ඒ බ්‍රාහ්මණයා විසින් ඉරු මෙෂ රාශියට පැමිණෙන සංක්‍රාන්ති දිනයෙහි විලඳ සුණු පුරණලද නැබ්ලියෙක් ලද්දේය. ඉක්බිත්තෙන් මේ දෙව ශර්මන්තෙමේ ඒ විලඳසුණු බඳුන ගෙණ මැටිබඳුන්පිරූ බඩහැලයක්හුගේ ගෘහයෙක්හි රෞද්‍රවූ සිතින්

1. යතඃ :– තාවද්භයාත් තු භෙතව්‍යං යාවද්භය මනාගතම්,
ආගතං තු භයං දෘෂ්ට්වා ප්‍රහර්තව්‍යමභීතවත්.

2. අපරඤ්ච :– අභියුක්තො යදා පශ්‍යෙත කිඤ්චිද්ගතිමාත්මනඃ,
යුධ්‍යමානස්තදා ප්‍රාඥෙ ම්‍රියතෙ රිපුනා සහ.

3. අනාගතවතීං චින්තාං කෘත්වා යස්තු ප්‍රහෘෂ්‍යති,
ස තිරස්කාරමාප්නොති භග්නභාණ්ඩො ද්විජො යථා.

නැලඹුනේ සැතපුනේය. ඉක්බිත්තෙන් විළඳසුණු රක්නා පිණිස දණ්ඩක් අතින්ගෙණ "ඉදින් මම මේ විළඳසුණු නැබිලි යවිකුණ බොල්ලත් දසයක් ලබන්නෙම්ද එකල්හි ඒ බොල්ලත් දසයෙන් මේ කාලයෙහි කල නැබිලි ආදියගෙණ නොයෙක් පරිද්දෙන් වැඩුනු ඒ ධනයෙන් නැවත නැවත පූවක් පිළිආදිය ගෙණ විකුණ වෙළඳාම්කොට ලක්‍ෂයක් දනයන් උපදවා සත්‍රීන් සතරදෙනකු පාවාගණිමි. ඉක්බිත්තෙන් ඒ අඹුවන්අතුරෙන් යම් අඹුවක් රූසිරිඇත්තී අතිශයින් තරුණද ඇකෙරේ වැඩියක් ඇළුම්කෙරෙමි. ඉන්පසු හටගත් නොඉව සිම් ඇති ඒ අඹුවෝ ඔවුනොවුන් යම් දවසෙක්හි කලහකෙරෙත් නම්එකල්හි මම කොපයෙන් මඩනාලද්දෙම් සියලු අඹුවන්ට පොල්ලෙන් තළන්නෙමි" මෙසේ කියා ඒ බමුණ විසින් පොල්ල දමනලද්දේ විළඳසුණු නැබිලිය සුණුකරණලද්දේය. භාජනයෝද බිඳිනාලද්දාහුය. ඉක්බිත්තෙන් බිඳිනලද්දාවූ භාජනයන්ගේ ශබ්දයෙන් අවුත් බඩහැලයා විසින් බොට්ටුව අල්වා ගෙන් පිටකරණ ලද්දේය. මතු කාලය පිළිබඳවූ සිතිවිලියන මේ ආදිය එහෙයින් මම කියමි" ඉක්බිත්තෙන් රජතෙම රහස්තැනෙක්හි "පියානනි! යමක්කටයුතුද එසේ අනුශාසනාකරව" යි ගෘධ්‍ර අමාත්‍යයා විචාළේය. ගෘධ්‍රඅමාත්‍යතෙමේ.

1. මදයෙන් මත්වූ හස්තියක්හටමෙන් අහංකාරයෙන් මත්වූ ඒ රජහට ඇත්ගොව්වෝ නොහොත් අමාත්‍යයෝ ඒකාන්තයෙන් නොමගයන්නාවූ ඇත්ගොව්වෝ නොහොත් නීතික්‍රමය ඉක්මපවත්නා ඇමතියෝ නින්දාකටයුතුබවට පැමිණෙත්.

දෙවයන්වහන්ස! පළමුකොට ඇසුවමැනව. කිමෙක්ද අපවිසින් සමච්භාවය වැළඳගෙණ කොට්ටුව බිඳිනලද්දේද? පින්වතුන්වහන්සේගේ හෝ අනුභාව විශෙෂයෙන් යුක්තවූ උපායකින් කොට්ටුවබිඳින ලද්දේද? යි කියයි. රජතෙමේ "පින්වතුන්ගේ උපායෙන් කොට්ටුව බිඳිනලද්දේය" යි කියයි. ගෘධ්‍ර අමාත්‍යතෙම "ඉදින් මාගේ වචනය කරණුලබන්නේනම් එසේකල්හි ස්වකීය දෙශයට යනුලැබේවා. එසේ නොවේනම් වැසිකල් එළඹසිටි කල්හි සමානවූ බලයඇති සතුරාහා සමග නැවත සටන ඇති කල්හි අන්‍ය රාජ්‍යයෙක්හි සිටි අපට සියරටට යාමද නොලැබියහැකි වන්නේය. සිත නිවීමද රටට පීඩා

1. මදොද්ධතස්‍ය නෘපතෙඃ ප්‍රකීර්ණස්‍යෙව දන්තිනඃ,
ගච්ඡන්ත්‍යුන්මාර්ගගා තස්‍ය නෙතාරඃ ඛලු වාච්‍යතාම්,

නැතිව ගෞරවයද යන මේ ප්‍රයොජන සඳහා යනු ලැබේවා. කොටුව බිඳිනාලද්දේය, කීර්තියද ලද්දීමය. මේ වනාහි මාගේ කැමැත්තවෙයි.

1. යම්හෙයකින්—යම් ඇමතියෙක් රජහුගේ කැමැත්ත හෝ නොකමැත්ත ඉවතලා කටයුතුකාරණය පටන්ගැණීමයයි කියන ලද්දාවූ ධර්මය මුල්කොට නුසුදුසුකාරණයන් සුදුසුයයි කියාද, එබඳු ඇමතියා විසින් රජතෙමේ යහලුවෙක් කරණලද්දේවෙයි.

2. අනිකෙක්ද—සමානවූ බලයෙන් යුක්තයා හා සමඟද මිත්‍රභාවය කැමතිවන්නේය, කුමක්හෙයින්ද යුද්ධයෙහිදී ජයගැණීම නියමනැත්තේය, සැක කරණලද කාරණය නොකරන්නේය යනු බෘහස්පති තෙමේ කීයේය.

3. අනිකෙක්ද—මිත්‍රවූ සෙනගද එසේම රාජ්‍යයද සර්වස්වය ආත්මයද කීර්තියද යන මේ සියල්ල අඥානවූ කවරෙක්නම් සටන් බිමෙහි සැකයෙන් චඤ්චලවීම්ඇතිවක් කෙරේද.

4. නැවතද—ඇතම්කලක සටනක් ඇතිකල සටන්කරණු ලබන්නාවූ උභයපක්ෂයෙහ්ම ජීවිතහානියවෙයි, කුමක්ද සමානවූ බලයෙන් යුක්තවූ සුන්දය උපසුන්දය යනමේ අසුරයන් දෙදෙන ඔවුනොවුන් නසනලද්දාහු නොවෙද්ද ? යි කියයි.

රජතෙමේ ඒ කෙසේදැයි කීයේය? ඇමතිතෙමේ කියයි.

"පූරාණකාලයෙහි සුන්දය උපසුන්දයයි නම් ලද්දාවූ සහෝදරවූ අසුරයෝ දෙදෙනෙක් බොහෝසෙයින් කාය වෙහෙසීමෙන් තුන්ලොවට නායකබව කැමතිව නැතක්කාලයකින් සතුටුකරණලද ඊශ්වරයා ඇතිවූවෝය. ඉක්බිත්තෙන් ඔවුන් දෙදෙනා හටසතුටුවූ ඊශ්වරතෙමේ "වරයක් ඉල්ලව්යයි" කීයේය. ඉන් ඔවුන් දෙදෙනා කෙරේ සරශ්වතී දෙවිය පිළිබඳවූ සමානවූ ආරූඪය ඇතිබැවින් අනිකක්කියනු කැමතිවූ ඔව්හුදෙදෙන "ඉඳින් අපදෙදෙනාකෙරේ ඊශ්වරතෙමේ සතුටුවූයේද එකල්හි

---

1. යතඃ:— යො හි ධර්මං පුරස්කෘත්‍ය හිත්වා භර්තුඃ ප්‍රියාප්‍රියම්,
අප්‍රියාණ්‍යාහ පථ්‍යානි තෙන රාජා සහායවාන්.

2. අපරඤ්ච:— සන්ධිමිච්ඡෙත් සමෙනාපි සන්දිග්ධො විජයො යුධි,
න හි සංශයිතං කුර්‍ය්‍යාත් ඉත්‍යුවාච බෘහස්පතිඃ.

3. අන්‍යච්ච:— සුහෘද්බලං තථා රාජ්‍යමාත්මානං කීර්ති මෙව ච,
යුධි සන්දෙහදොලස්ථං කො හි කුර්‍ය්‍යාදබාලිශඃ.

4. පරන්තු:— යුද්ධෙ විනාශො භවති කදාචිදුභයොරපි,
සුන්දොපසුන්දාවන්‍යො'න්‍යං සමවීර්‍ය්‍යෞ හතෞ න කිම්.

ඊශ්වරතෙම තමාගේ අඹුවූ උමාදෙවියදෙව" සි අනිකෙක් කි
ව්ය. එකල්හි කොපවූ ඊශ්වරයා විසින් වරදීම නියමය බැවින්ද
ක්‍රොධයෙන් මූළාවූ බැවින්ද උමාදෙවිය දෙනලද්දීය. ඉක්බිති
තෙන් ඒ උමාදෙවියගේ රූපශොභාවෙන් උපන්නාවූද ලොව
නැසීමකරන්නාවූද සිත්හි මහත් ආශාවලින් යුක්තවූද පාප
යෙන් අඈදිරියට පත්වූද මාගේයයි ඔවුනොවුන් කලහකරන්න
වුන්දෙදෙනා විසින් "විවාදය සංසිඳවීමට සුදුසුවූ එක්තරා
මධ්‍යස්ථ පුරුෂයෙක් විචාරණුලැබේව" සි කැමතිකරණලද
කල්හි ඊශ්වරතෙමේ මහලු බමුණුවෙසකින් අවුත් ඒ ස්ථානයට
එළඹසිටියේය. ඉන්පසු "අප දෙදෙනා විසින් මේ උමාදෙවී
තොමෝ ස්වකීය බලයෙන්ලද්දීය අපදෙදෙනා අතුරෙන් මෝ
තොමෝ කවරෙක්හට වන්නීද" සි බමුණා අතින් විචාළෝය.

1. බ්‍රාහ්මණතෙමේ ශාස්ත්‍රයෙන් ශ්‍රෙෂ්ඨවූයේ පිදියයුතුවෙයි, වික්‍රමයෙන් යුක්තවූ ක්‍ෂත්‍රියයාද පිදියයුතුවෙයි, සම්පත්තියෙන්හා විකිණියයුතුවූ ද්‍රව්‍යවලින් වැඩිවූ වෛශ්‍යයාද පිදියයුතුවෙයි, ශූද්‍රයාවනාහි බ්‍රාහ්මණයන්ගේ සෙවනයකිරීමෙන් පූජ්‍යවෙයි.

එබැවින් තොපිදෙදෙන ක්‍ෂත්‍රියවූ පැවතුම් ඇත්තෝය. තොපදෙදෙනාට යුඬය නියමය" සි කියයි. මෙසේ කීකල්හි මොහු විසින් යහපතක් කියන ලද්දේයයි සලකා ඔවුනොවුන් සමවූ ශක්තිමත්වූ ඔව්හු දෙදෙන එක්ව්ට ඔවුනොවුන් මැරීමෙන් විනාශයට පැමිණියෝය. සමවූබලයෙන් යුක්තවූවන්හු හා සමගද මිත්‍රභාවය කැමතිවන්නේය යන මේ ආදිය එබැවින් මමකියමි" යි කියයි. රජතෙමේ "එසේවීනම් මේකාරණය පළමුකොටම තුමටනොකියන ලද්දේද" සි කියයි. ඇමති තෙමේ "කිමෙක්ද එකල්හි මාගේ වචනය කෙළවරවනතෙක් ස්වාමීන්වහන්සේ විසින් අසනලද්දේද? එකල්හිද මාගේ කැමැත්තෙන් මේ කලහය පටන්නොගන්නා ලද්දේය. යම්හෙයකින් මේ හිරණ්‍යගර්භරජතෙම මිත්‍රයෙක් කිරීමට සුදුසුවූ ගුණ ඇත්තෙක්වේද එහෙයින් සටන්කළ යුත්තෙක් නොවේයි.

2. එසේදකියනලදී—සත්‍යවාදිය මනාපැවතුම් ඇත්තාය සුච රිතය පිහිටකොට ඇතිතැනැත්තාය දුෂ්ටස්වභාඇත්තාය ස්වකීය

1. "ඥානශ්‍රෙෂ්ඨො විජඃ පූජ්‍යඃ ක්‍ෂත්‍රියො බලවානපි,
ධනධාන්‍යාධිකො වෛශ්‍යඃ ශූද්‍රස්තු ද්විජසෙවයා.

2. තථාචොක්තම් :—සත්‍යායෙඹ්‍ය ධාර්මිකො 'නාශෛෂ්ට භ්‍රාතෘසඞ්ඝානවාන් බලී,
අනෙකයුඬවිජයී ස ශෞටීරයාඃ සප්ත කීර්තිතාඃ.

සහෝදරයන්හා ගැළපීවසන තැනැත්තාය මහත්බලසම්පන්න යාය බොහෝසටන් බිම්හි ජයලත් තැනැත්තාය යන මොව්හු සද්දෙන මිතුරුකටයුත්තෝයයි කියනලද්දෑහුයි.

1. සත්‍යවචනයෙන් යුක්තවූ තැනැත්තේ ඒ සත්‍යය එක්වන් රක්නේ මිත්‍රභාවයෙන් වෙනසකට නොයේ, මනාපැවතුම්ඇති තැනැත්තේ ජීවිතහානියක් දැකද ප්‍රසිද්ධවූ නුසුදුසු පැවැත්මකට නොපැමිණේ.

2. සතුරන් විසින් එළඹසිටිනාලද සුචරිතයෙහි හැසිරෙණ තැනැත්තහුට සියල්ලම අවිරුද්ධවෙයි, සුචරිතයෙහි පිහිටි රජ තෙමේ ජනයාට ඇළීම හෙතුකොටගෙණද සුචරිතය හෙතු කොටගෙණද පරාජයකළනොහේ.

3. ඔහු වැළඳනොගෙණ අන්කිසිවෙක් දිවිරැකීම නොකෙරේද, එබඳු විනාශයක් එළඹසිටිකල්හි නීචයාහා සමගද මිත්‍රභාවය කටයුතුවන්නේය.

4. ඝනවනයෙහිවූ හාත්පස කටුවලින් යුක්තවූ උණගසඑකාබද්ධව පවත්නාබැවින් යම්සේ සිඳ නොහේද සහෝදරයන් හා ගැළපී සිටිනාතැනත්තාද එබඳුවෙයි.

5. අධික්බලසම්පන්න සතුරාහා සමග සටන්කළ යුතුය යන උපමාවක් නැත්තීය, වැසිවලාපටලය උඩුසුළඟකරා කිසිකලකත් ගමන්නොකෙරේ.

6. ජමදග්නිඍෂිහුගේ පුත්‍රවූ පරසුරාමයාහටමෙන් බොහෝ සටන්වලින් ජයලත් රජහුගේ අනුභාවය හෙතුකොටගෙණම සැමතැන්හිද හැමකල්හිද සියල්ල අයති කරණුලැබේ.

---

1. සත්‍යා 'නුපාලයන් සත්‍යං සන්ධිතො නෛති වික්‍රියාම්,
ප්‍රාණබාධෙ 'පි සුව්‍යක්තමාර්‍ය්‍යො නායාත්‍යනාර්‍ය්‍යතාම්.

2. ධාර්මිකස්‍යාභියුක්තස්‍ය සර්‍ව එව හි යුජ්‍යතෙ,
ප්‍රජානුරාගාද්ධර්මාච්ච දුරුච්ඡෙද්‍යො හි ධාර්මිකඃ.

3. සන්ධිඃ කාර්‍ය්‍යො 'ප්‍යනාර්‍ය්‍යෙණ විනාශෙ සමුපස්ථිතෙ,
විනා තස්‍යාශ්‍රයෙණාර්‍ය්‍යඃ කුර්‍ය්‍යාන්න කාලයාපනම්.

4. සංහතත්වාද්‍යථා වෙණුර්නිබිඩඃ කණ්ටකෛර්‍වෘතඃ,
න ශක්‍යතෙ සමුච්ඡෙත්තුං භ්‍රාතෘසඞ්ඝාතවාංස්තථා.

5. බලිනා සහ යොද්ධව්‍යමිති නාස්ති නිදර්ශනම්,
ප්‍රතිවාතං න හි ඝනඃ කදාචිදුපසර්පති.

6. ජමදග්නෙඃ සුතස්‍යෙව සර්‍වඃ සර්‍වත්‍ර සර්‍වදා,
අනෙකයුද්ධජයිනඃ ප්‍රතාපාදෙව භුජ්‍යතෙ.

1. බොහෝ සටන්ජයගත් රජතෙමේ යම් අන්‍යරජක්හට මිත්‍ර භාවයට පැමිණේද ඒ සටන්ජයගත් රජුගේ තෙජස කරණකොට ගෙණ ඒ අනික්රජහටද සතුරෝවහා යටත්වෙත්.

එබැවින් බොහෝ ගුණවලින් යුක්තවූ මේ නුවර රාජහංස තෙමේ මිත්‍රකටයුත්තෙක්වෙයි. චක්‍රවාකතෙමේ "දූතය! සියල්ල දන්නාලද්දේද? යව නැවත එන්නෙහිය" යි කී යේය. ඉක්බිත්තෙන් හිරණ්‍යගර්භතෙමේ "පින්වත් ඇමතිය! මිතුරුනොවිය යුත්තෝ කෙතෙක්ද ඔවුන්දන්නා කැමැත්තෙමි" යි චක්‍රවාකයා අතින් විචාළේය. ඇමතිතෙමේ "දෙවයන්වහන්ස! කියමි.

2. ඇසුවමැනව—ළදරුද මහලුද බොහෝකල්ලෙඩින් පෙළෙන තැනැත්තේද එසේම නෑයන් විසින් තළා පිටකරණලද තැනැත්තේද තමා බියසුලුද භය ස්වභාවයෙන් යුක්තවූ අන්‍ය ජනයා පිරිවරකොට ඇත්තේද තමා ලොභ ස්වභාවයෙන් යුක්තද ලොභවූ අන්‍ය ජනයා පිරිවරකොට ඇත්තේද යන මොව්හු මිතුරු නොවිය යුත්තාහු වෙත්.

3. ස්වාමියාකෙරේ විරුද්ධවූ ජනයාඇති තැනැත්තේද භොගයන්කෙරේ අතිශයින් ඇළුනු තැනැත්තේද නොසගවනලද රහස්ඇති තැනැත්තේද දෙවියන්කෙරේ හා බමුණන්කෙරේ ආදරනැති තැනැත්තේද.

4. ඵලරහිතවූ සියලුම ක්‍රියාඇති තැනැත්තේද ක්‍රියාවක් නැතිවම භාග්‍යය සිතන තැනැත්තේද ආහාරපාන නොලැබීමෙන් පීඩාවට පැමිණි තැනැත්තේද සෙනගගේ යෙදීමෙන් කැලඹුනු තැනැත්තේද.

---

1. අනෙකයුද්ධවිජයී සන්ධානං යස්‍ය ගච්ඡති,
තත්ප්‍රතාපෙන තස්‍යාශු වශමායාන්ති ශත්‍රවඃ.

2. ශාණ්ඩ :—බාලො වෘද්ධො දීර්ඝරොගී තථා ඥාතිබහිෂ්කෘතඃ,
භීරුකො භීරුකජනො ලුබ්ධො ලුබ්ධජනස්තථා.

3. විරක්තප්‍රකෘතිශ්චෛව විෂයෙෂ්වතිසක්තිමාන්.
අනෙකචිත්තමන්ත්‍රශ්ච දෙවබ්‍රාහ්මණනින්දකඃ.

4. දෛවොපහතකශ්චෛව දෛවචින්තක එව ච,
දුර්භික්ෂව්‍යසනොපෙතො බලව්‍යසනසඞ්කුලඃ.

1. පිටරටක සිටිතැනැත්තේද බොහෝ පසමිතුරන්ඇති තැනැත්තේද සටනක් එළඹසිටිකල අවකාසනැති තැනැත්තේද සත්‍යවචනයෙන්හා සුචරිතයෙන්ද තොරවූ තැනැත්තේද යනමේ පුරුෂයෝ විසිදෙනයි.

2. මේ සතුරන් හා සමග මිත්‍රභාවය නොකරන්නේය හුදෙක් සටන්කරන්නේය, සටන්කරණු ලබන්නාවූ මොව්හු සතුරන්ට යටත්බවට වහාමයෙත්.

3. ළදරුවා තමාස්වල්ප අනුභාවඇති බැවින් ජනතෙමේ සටන්කිරීමට කැමතිනොවෙත්, නුවන මඳතැනැත්තේ සටන් කිරීමෙහිහෝ නොකිරීමෙහි ප්‍රයොජනය සලකා දැනගන්ට නොහැකිවෙයි.

4. මහල්ලාද එසේම බොහෝකල් ලෙඩින් පෙළෙනතැනැත්තේද යනමොව්හු දෙදෙනම උත්සාහය හා ශක්තියද නැතිබැවින් තමා විසින්ම සැකනැතිව පරදවනු ලැබේ.

5. සියලු නෑයන් විසින් පිටපත්කරණලද තැනැත්තා සුවසේ පරාජය කළයුතුවෙයි, ඒ නෑයෝම මොහුගේ ධනාදිය පැහැර ගෙණ මොහුනසත්.

6. තමා භයස්වභාඇති රජද සටනට පිටිපෑ බැවින් තෙමේම නසියි. එසේම බියසුලු පිරිස ඇතිරජද සටන්බිමෙහිදී ඒ පිරිස විසින් අත්හරිණුලැබේ.

7. සුදුසු පරිද්දෙන් ද්‍රව්‍යයන් නොදෙන බැවින් ලොභවූ රජහුගේ සෙවකයෝ සටන්නොකෙරෙත්, ධනයක් නොලද්දාවූ ධනයෙහි ලොභ සෙවකයන් විසින් ඒ රජතෙම මරණුලැබේ.

---

1. අදෙශසෙථා බහුරිපුර්යුක්තඃ කාලේන යශච න,
සත්‍යධර්ම්ව්‍යපෙතශච විංශතිඃ පුරුෂා අමී.

2. එතෛඃ සන්ධිං න කුර්වීත විගෘහ්ණීයාත් තු කෙවලම්,
එතෙ විගෘහ්‍යමාණා හි ක්ෂිප්‍රං යාන්ති රිපොර්වශම්.

3. බාලස්‍යාල්පප්‍රභාවත්වාන්න ලොකො යොද්ධුමිච්ඡති,
යුද්ධායුද්ධඵලං යස්මාත් ඥාතුං ශක්තො න බාලිශඃ.

4. උත්සාහශක්ති හීනත්වාද් වෘද්ධො දීර්ඝාමයස්තථා,
ස්වෛරෙව පරිභූයෙතෙ ද්වාවප්‍යෙතාවසංශයම්.

5. සුඛොච්ඡෙද්‍යශ්ච භවති සර්වඥාතිබහිෂ්කෘතඃ.
ත එවෛනං විනිඝ්නන්ති ඥාතයස්ත්වාත්මසාත්කෘතාඃ.

6. භීරුර්යුද්ධපරිත්‍යාගාත් ස්වයමෙව ප්‍රනශ්‍යති,
තථෛව භීරුකාජනඃ සංග්‍රාමෙ තෛර්විමුච්‍යතෙ.

7. ලුබ්ධස්‍යාසංවිභාගිත්වාන්න යුධ්‍යන්තෙ'නුජීවිනඃ
ලුබ්ධොනුජීවිකෛරෙෂ දානහීනෛර්නිහන්‍යතෙ.

1. නොඇළුණු ජනයාගෙන් යුත් රජතෙමේ සටනක් ඇති කල්හි ජනයා විසින් හරිණු ලැබේ, විෂය රසයෙහි අතිශයින් ඇළුණු රජතෙමේ සුවසේ ජයගත හැකිවෙයි.

2. බොහෝදෙනාවිසින් දන්නාලද මන්ත්‍රණයෙන් යුත් රජ තෙම අමාත්‍යයන් විසින් සතුරුවිය යුත්තෙක්වේ, නියම නො කරණලද කල්පනාවලින් යුත්බැවින් සටනක් පැමිණි කල්හි ඒ රජතෙමේ අමාත්‍යයන් විසින් හරිණු ලැබේ.

3. සුචරිතය බලයක්කොට පවත්නා බැවින් දෙවියන්ට හා බ්‍රාහ්මණයන්ට අගෞරව කරණ රජද, එසේම ප්‍රයොජන රහිතවූ සියලු කටයුතු ඇති රජද හැමකල්හි තෙමේම කල කිරේ.

4. සම්පත්තියටද විපත්තියටද භාග්‍යයම හෙතුවෙයි කියා මෙසේ සලකන්නාවූ භාග්‍යයම පිළිසරණකොට වසන රජ තෙමේ තමාද ක්‍රියාවෙහි නොයොදා පසුබට වන්නේය.

5. ආහාරපානයන්ගේ මඳබැවින් විපත්තියට පැමිණි රජද තෙමේම පසුබසී, විපත්තියට පැමිණි සෙනග ඇත්තාහට සටන් කිරීමට ශක්තියක් නැත්තේ වෙයි.

6. පිට රටක වසන ර[illegible]නාහි සතුරන් ස්වල්පදෙනකු විසින්ද නසනුලැබේ, මීට කාරණයෙක්නම් කුඩාවූද කිඹුලා ජලස්ථානයෙහිදී හස්තිරාජයකුහු නමුදු අදී.

---

1. සන්ත්‍යජ්‍යතෙ ප්‍රකෘතිභිර්විරක්තප්‍රකෘතිර්යුධි,
සුඛාභියොජ්‍යො භවති විෂයෙෂ්වති සක්තිමාන්.

2. අනෙකචිත්තමන්ත්‍රස්තු ද්වෙෂ්‍යො භවති මන්ත්‍රිණාම්,
අනවස්ථිතචිත්තත්වාත් කාර්යෙෂු තෛඃ ස උපෙක්ෂ්‍යතෙ.

3. සදා ධර්මබලීයස්ත්වාද්දෙවබ්‍රාහ්මණනින්දකඃ,
විශීර්යතෙ ස්වයං හ්‍යෙව දෛවොපහතකස්තථා.

4. සම්පත්තෙශ්ච විපත්තෙශ්ච දෛවමෙව හි කාරණම්,
ඉති දෛවපරො ධ්‍යායන් නාත්මානමපි චෙෂ්ටයෙත්.

5. දුර්භික්ෂව්‍යසනී චෛව ස්වයමෙවාවසීදති,
බලව්‍යසනයුක්තස්‍ය යොද්ධුං ශක්තිර්න ජායතෙ.

6. අදෙශස්ථො හි රිපුණා ස්වල්පකෙනාපි හන්‍යතෙ,
ග්‍රාහො 'ල්පීයාන පි ජලෙ ගජෙන්ද්‍රමපි කර්ෂති.

1. සතුරන් බොහෝකොට ඇති තැනැත්තේ වනාහි තැති ගත්තේ උකුස්සන්ගේ මධ්‍යයෙහිදී පරවියක්හු මෙන් යම් මාර්ගයෙක්හිම යේද ඒ මාර්ගයෙහිදීම මේ තෙම විපත්තියට පැමිණේ.

2. යුද්ධයට සුදුසු නුවූ වර්ෂාදීකාලයෙහි සේනාවෙන් යුක්තවූ රජවූකලී සුදුසු කාලයෙහි සටන්කරන්නාවූ සේවකයාවිසින් මරණු ලැබේ. කෙසේද, මධ්‍යම රාත්‍රියෙහි ඇසෙහි දක්නා බලය නැත්තාවූ කවුඩෙක් බකමූනාවිසින් මෙන් මරණු ලැබේ.

3. සත්‍යධර්මය ඉක්ම පවත්නාවූ රජක්හු හා සමග කිසිකලකත් මිතුරු නොවන්නේය, ගැළපෙනලද්දේවූද ඒ රජතෙම පවිටුබැවින් මඳ කලකින්ම සතුරුබවට පැමිණේ.

අනිකක්ද කියම්—මිත්‍රභාවයද, යුද්ධයද, කල්ගෙවීමද, ගමනද, ඈසුරුකිරීමද, කපටභාවයද යනමේගුණ සයවෙත්. ක්‍රියාවන්ගේ පටන්ගන්නා උපායද, පුරුෂ සම්පත්තියහා ද්‍රව්‍ය සම්පත්තියය, දේශවිභාගය කාලවිභාගය යන දෙකය, පසුබෑමට හෝ හානියට පිළියම් කිරීමය, කටයුතු සිද්ධකිරීමය, යන මේ කාරණ පසින් යුක්තවූයේ මන්ත්‍රණයයි. ප්‍රිය වචනාදියෙන් සතුරා වශඟකරණ උපායද, දීමය, බිඳුවීමය, දඬුවමය යන මොව්හු උපාය සතරවෙත්. උත්සාහශක්තිය, මන්ත්‍රශක්තිය, ස්වාමිශක්තිය යන මොව්හු ශක්තීහු තුණවෙත්.

මේ සියල්ල සලකා උත්තමයෝ නිරන්තරයෙන් ජයගන්නා කැමැත්තාහුවෙත්.

4. යම්හෙයකින්—යම් ශ්‍රීකාන්තාවක් වනාහි ජීවිත දානය මූල්කොට පවත්නා ක්‍රියාවකි නුවුලද නොහැක්කීද සපිරනුවූද ඒ ශ්‍රීකාන්තාතොමෝ නීතික්‍රමය නොඉක්ම පවත්නාවුන්ගේ ගෙයනිසා නොසෙල්වී සිටින්නීය.

---

1. බහුශත්‍රුස්තු සන්ත්‍රස්තඃ ශ්‍යෙනමධ්‍යෙ කපොතවත්,
යෙනෛව ගච්ඡති පථා තෙනෛවාශු විපද්‍යතෙ.

2. අකාලසෛන්‍ය යුක්තස්තු හන්‍යතෙ කාලයොධිනා,
කෞශිකෙන හතජ්‍යොතිර්නිශීථ ඉවවායසඃ.

3. සත්‍යධර්මව්‍යපෙතෙන න සන්දධ්‍යාත් කදාචන,
ස සංහිතො 'ප්‍ය සාධුත්වාද චිරාද්‍යාති වික්‍රියාම්.

4. යතඃ :— යා හි ප්‍රාණ පරිත්‍යාගමූල්‍යෙනාපි නලභ්‍යතෙ,
සා ශ්‍රීර්නීතිවිදං වෙශ්‍ම චඤ්චලාපි ප්‍රධාවති.

1. එසේද කියනලදී—යම් රජක්හුගේ ධනය යම් කලෙක්හි සෙවකයන්ට සමානව දෙනලදද අප්‍රසිද්ධව වසන දූතයන් ඇත්තේද මන්ත්‍රණය අනුන් ඉදිරියේ ප්‍රකාශ නොකෙරේද යම් සත්වයන්කෙරේ පරුෂ වචනයක් නොකියාද ඒ රජතෙම මුළු පොළොව පාලනයකෙරේ.

[3]දෙවයන්වහන්ස! එසේද ගෘධ්‍ර මහා අමාත්‍යයා විසින් යම් ගැළපීමෙක් දක්වනලදද එසේද ඒ රජහු හා සමග දූත් විද්‍යමානවූ ජය අහංකාරය ඇති බැවින් නොසිතිය යුතුය. එබැවින් මෙසේ කරණු ලැබේවා. සිංහල ද්වීපයෙහි මහාබලනම් විල්ලිඝිනි රජතෙම මට මිත්‍රවෙයි. හෙතෙම ජම්බුද්වීපයේ රජුන්කෙරේ කොපකෙරේවා.

2. යම්හෙයකින්—වික්‍රමාන්විත රජතෙමේ අතිශයින් රහස වැළඳගෙණ ඇළුනාවූ සෙනඟහා සමග සතුරන් මඬනේ තවන්නේය, පීඩාකරණ යමක්හු හා සමග සමව තවන ලද්දේ වන්නේය, කුමක් හෙයින්ද, තවනලද ලොහය තවනලද ලොහයක් හා සමගම ගැළපීමට යෙයි.

3. රජතෙම “මෙසේ වේවයි” කියයි. එසේ කියා විචිත්‍රනම් කොක්තෙමේ සඟවනලද ලියුම් පතක්දී සිංහල ද්වීපයට පිටත් කෙළේය. ඉක්බිත්තෙන් දූතතෙම නැවත අවුත් “දෙවයන්වහන්ස! එහි පැවැත්ත[illegible][1] කථා ප්‍රවෘත්තිය වනාහි අසනු ලැබේවා. එහි ගෘධ්‍ර අමාත්‍යයා විසින් “දෙවයන්වහන්ස! මෙඝවර්ණතෙම එහි බොහොකල් විසුයේය. කිමෙක්ද හිරණ්‍යගර්භ රජතෙම මිත්‍රකළයුතු ගුණවතෙක්ද නැද්දයන්නු ඒ ඇමතිතෙමේ දනී” යයි කියන ලද්දේය. ඉක්බිත්තෙන් ඒ මෙඝවර්ණතෙම චිත්‍රවර්ණ භූපාලයා විසින් කැඳවා “කවුඩ! කවුඩ! ඒ හිරණ්‍යගර්භ රජතෙම කෙබඳුද? චක්‍රවාක අමාත්‍යයා හෝ කෙබඳුදැ?” යි විචාරණ ලද්දේය. මෙඝවර්ණතෙම “දෙවයන්වහන්ස! ඒ

---

1. තථාචොක්තම් :—විත්තං යදා යස්‍ය සමං විභක්තං
ගූඪශ්චචාරො නිභෘතශ්ච මන්ත්‍රඃ,
න චාප්‍රියං ප්‍රාණිෂු යො බ්‍රවීති
ස සාගරාන්තාං පෘථිවීං ප්‍රශාස්ති.

2. යතඃ :—සුගුප්තිමාධාය සුසංහතෙන බලෙන වීරො විචරන්නරාතිම්,
සන්තාපයෙද්‍යෙන සමං සුතප්තස්තප්තෙන සන්ධාන මුපෛති තප්තඃ.

3. “දෙව! :—විශ්වාසප්‍රතිපන්නානාං වඤ්චනෙ කා විදග්ධතා,
අඞ්කමාරුහ්‍ය සුප්තං හි හත්වා කිං නාම පෞරුෂම්.

හිරණ්‍යගර්භ නම් රජතෙම යුධිෂ්ඨිර රජහුමෙන් මහත් ප්‍රීතියෙන් යුක්තවෙයි සත්‍යවාදීවෙයි. චතුර්වාක අමාත්‍යයා සමානවූවෙක් කිසියම් තැනකත් නොදක්නා ලැබෙයි" කියයි. රජතෙම "ඉදින් එසේ වීනම් එකල්හි තා විසින් ඒතෙම කෙසේ වඤ්චාකරණ ලද්දේද" යි කියයි. මෙඝවර්ණතෙම සිනාසී "දෙවයන්වහන්ස! බලවත් විශ්වාසයට පැමිණියවුන්ගේ වඤ්චාකිරීමෙහි කවර දක්‍ෂභාවයෙක්ද, ඇකයට නැගී සයනයකළ එකක්හු මරා කවරනම් පුරුෂ වික්‍රමයෙක්ද?.

දෙවයන්වහන්ස! ඇසුවමැනව "ඒ රජහු විසින් මම පළමු දැක්මෙහිදීම දන්නා ලද්දේය. එසේද මේ රජතෙම පූජ්‍යවූ අදහස් ඇත්තේය. එහෙයින් මා විසින් වඤ්චාකරණ ලද්දේය.

1. එසේද කියනලදී—යමෙක්තෙම අසත්පුරුෂයා තමා හා සමකිරීමෙන් සත්‍යවාදියෙකැයි දනීද, ඒ අසත්පුරුෂයා විසින් හෙතෙම එළුවා කෙරෙන් බමුණා රැවටුනාමෙන් රවටන ලද්දේය" යි කියයි.

රජතෙම ඒ කෙසේදැයි? අසයි. මෙඝවර්ණතෙම කියයි.

"ගෞතම නම් වනයෙහි පටන්ගන්නාලද යාගඇති එක්තරා බ්‍රාහ්මණයෙක් ඇතිවෙයි. හෙතෙම අනික් ගමකටගොස් එළුවකු මිලදී රැගෙණ කරපිට තබාගෙණ යන තැනැත්තේ කපටයන් තුන්දෙනකු විසින් දක්නා ලද්දේය. ඉක්බිත්තෙන් ඒ කපටයෝ "ඉදින් මේ එළුකයා යම්කිසි උපායකින් ලබනු ලැබේ නම්? එකල්හි බුද්ධිය ප්‍රශස්තවෙයි" යනු සිතා යන්නාවූ පෙරමග ගස්තුණක්මුල ඒ බ්‍රාහ්මණයාගේ මාර්ගයෙහි උන්නෝය. ඒතැන් හිදී එක් කපටයක්හු විසින් ඒ බමුණුට "පින්වත් බ්‍රාහ්මණය! තා විසින් බල්ලෙක් කරතබාගෙණ කුමට ගෙණයනු ලැබේද" යි කියනලද්දේය. බමුණා විසින් "මේ තෙම බල්ලෙක් නොවේ"යි මේ තෙම යාග එළුවෙකැයි කියන ලද්දේය. ඉන්පසු නැවත ක්‍රොශයක් පමණ දුරසිටි දෙවෙනි කපටයා විසින්ද ඒ වචනයම කියන ලද්දේය. ඒ වචනය අසා බමුණා එළුවා බිම තබා නැවත නැවතබලා නැවත කරපිට තබා චඤ්චලවූ සිතින් යුක්තව ගියේය.

---

1. තථාචොක්තම් :—ආත්මෞපම්‍යෙන යො වෙත්ති දුර්ජනං සත්‍යවාදිනම්, ස එව වඤ්චිතස්තෙන බ්‍රාහ්මණශ්ඡාගතො යථා.

1. යම්හෙයකින්—සත්පුරුෂයන්ගේ පවා සිත කපටයන්ගේ වචනවලින් ඒකාන්තයෙන් චඤ්චලවෙයි. ඒ කපටයන්විසින් විශ්වාසකරණලද මේ සත්පුරුෂතෙම චිත්‍රකර්ණයාමෙන් මියයි කියයි.

රජතෙම ඒ කෙසේදැයි අසයි? මෙසවර්ණතෙමකියයි.

එක්තරා වනයෙක්හි මදෙත්කට නම් සිංහයෙක්ඇත. කවුඩුය ව්‍යාඝ්‍රය සිවල්ය යන සෙවකයෝ තුන්දෙනෙක් ඒ සිංහයාටවූහ. ඉක්බිත්තෙන් ඇවිදිනාවූ ඔවුන් විසින් ප්‍රයොජනයෙන් තොරවූ ඔටුවෙක් දක්නාලද්දේ "පින්වත්තෙමේ කොතනකසිට එන්නේ දැයි"? විචාරණ ලද්දේය. හෙතෙමතමාගේ පැවැත්ම කීයේය. ඉක්බිත්තෙන් ඔවුන් විසින් ගෙණගොස් මේ තෙම සිංහයාට පාවාදෙන ලද්දේය. සිංහයා විසින්ද භයනොවවයි කියා චිත්‍රකර්ණයයි නමක්කොට සිටුවන ලද්දේය. මෙසේ කාලය ඉක්මයන කල්හි පසුව එක්කලෙක සිංහයාගේ ශරීරය විකලවූබැවින්ද මහත් වර්ෂාව හටගත්බැවින්ද ආහාරයක් නොලද්දාවූ ඔව්හු ක්ලාන්තයට පැමිණියාහුය. ඉක්බිත්තෙන් කවුඩුය ව්‍යාඝ්‍රය සිවල්ය යන මොවුන් විසින් "ස්වාමීතෙම යම් පරිද්දෙකින් චිත්‍රකර්ණයා මරාද එසේකරණු ලැබේවා, කටුබහුල තණ අනුභවකරණ මොහුගෙන් අපට කවරනම් ප්‍රයොජනයෙක්දැ"යි සිතනලද්දේය. ව්‍යාඝ්‍රතෙම ස්වාමියා විසින් අභයදීමේ ඔටුතෙම ගන්නාලද්දේය. මෙසේමැරීමට කෙසේ ලැබේදැ"යි? කියයි. කවුඩුතෙම මේකාලයෙහි පීඩාවට පැමිණි ස්වාමිතෙම පාපයක් නමුදු කරන්නේය.

2. යම්හෙයකින්—ක්ෂුධාවෙන් පීඩිතවූ ස්ත්‍රීද පුත්‍රයාහැරදමන්නීය, ක්ෂුධාවෙන් පීඩිතවූ සර්පධේනුවද ඇගේ බිජුවටකන්නීය, ආහාර නොලැබීමෙන් මිරිකුනු තැනැත්තේකිනම් පාපයක් නොකෙරේද, ආහාරයෙන් පීඩාවට පැමිණි ජනයෝ කරුණා නැත්තාහුවෙත්.

3. අනිකෙක්—විකාරවූ සිතින්යුක්ත තැනැත්තේද කටයුත්තෙහි නොපිහිටි තැනැත්තේද උමතුතැනැත්තේද පීඩාවට

---

1. යථා :—මතිර්දෝලායතෙ නූනං සත්‍යමපි ඛලොක්තිභිඃ,
තාභිර්විශ්වාසිතො යො 'සෞ ම්‍රියතෙ චිත්‍රකර්ණවත්.

2. යථා:—ත්‍යජෙත් ක්ෂුධාර්තා මහිලාපි පුත්‍රං
ඛාදෙත් ක්ෂුධාර්තා භුජගී ස්වමණ්ඩම්,
බුභුක්ෂිතඃ කිං න කරොති පාපං
ක්ෂීණා නරා නිෂ්කරුණා භවන්ති.

3. අන්‍යච්ච :—මත්තඃ ප්‍රමත්තශ්චොන්මත්තඃ ශ්‍රාන්තඃ ක්‍රුද්ධො බුභුක්ෂිතඃ,
ලුබ්ධො භීරුස්ත්වරායුක්තඃ කාමුකශ්ච න ධර්මවිත්.

පැමිණිතැනැත්තේද කිපෙනස්වභාවයෙන් යුක්තතැනැත්තේද ක්ෂුධාවෙන් ආතුර තැනැත්තේද ලොල් තැනැත්තේද පරීක්ෂාවෙන් ක්‍රියාවන් නොකරණ තැනැත්තේද ඉන්ද්‍රියයන්ට වශගවූ තැනැත්තේද ධාර්මිකනුවූ තැනැත්තේද යන මොව්හුද දයාරහිතයෝවෙත්.

මෙසේ නියමකොට සියල්ලෝ සිංහයාගේ සමීපයට ගියෝය. සිංහයා විසින් "ආහාරය සඳහා කිසිත් නොලද්දේද" යි අසන ලද්දේය. කවුඩුතෙම "දෙවයන් වහන්ස! උත්සාහයෙන්ද කිසිත් නොලද්දේය" යි කියයි. සිංහතෙම "මෙකල්හි ජීවත් වන උපාය කවරේද" යි? කීයේය. කවුඩුතෙමේ "තමාටඅයිති ආහාරය නොගැණීම හේතුකොටගෙණ මේ සියලු විනාශය එළඹසිටියේය" යි කියයි. සිංහයා විසින් "මේ ස්ථානයෙහි ආහාරය කුමක්ද? තමන්අයිතිවූයේ කිමෙක්ද" යි? කියනලද්දේය. කවුඩුතෙම "චිත්‍රකර්ණයාය" යි කණසමීපයේ සිටකියයි. සිංහතෙමේ බිමපහුරුගා "මාවිසින් මොහුට අභයවචනය දෙනලද්දේය. එබැවින් මේ කාරණය කෙසේ ලැබේද" යි? කන්දෙක අල්වයි.

1. ඒ එසේමැයි—මේ ලෝකයෙහි යම් පරිද්දෙකින් දෙනලද සියලුදේවල් අතුරෙහි අභයදීම මහත්වූ පින්පල උපදවනදීමයයි පණ්ඩිතයෝ කියද්ද 'එපරිද්දෙන් භූමිදානයද සුවර්ණදානයද ගවයන්දීමද ආහාරදීමද පින්පල උපදවන්නේයයි නොකියත්."

2. අනිකෙක්ද—සර්වප්‍රකාරවූ කැමතිවනලද්දාවූ ද්‍රව්‍යවලින් යුක්තවූ අශ්වමේධයාගයාගේ යම් පලයෙක්වේද පිහිටලැබීම සඳහා තමාකරා ආතැනැත්තා මනාකොට රක්ෂාකලකල්හි ඒ පලයලැබෙයි.

කවුඩුතෙමේ "මේ චිත්‍රකර්ණතෙමේ ස්වාමීහු විසින් නොමැරියයුතුවෙයි. එසේද යම් පරිද්දෙකින් මේ චිත්‍රකර්ණතෙම තමාගේ ශරීරය දීමට කැමතිබව කියාද එකල්හි අපවිසින්ම මැරියයුතුය" යි කියයි. ඒ අසා සිංහතෙමේ බැනනොනැගිහුන්නේය. ඉක්බිත්තෙන් මේ කවුඩුතෙමේ ලබනලද අවකාශයෙන් යුක්ත

---

1. තථාහි :—න භූප්‍රදානං න සුවර්ණදානං න ගොප්‍රදානං න තථාන්නදානම්,
යථා වදන්තීහ මහාප්‍රදානං සර්වප්‍රදානෙෂ්වභයප්‍රදානම්.

2 අන්‍යච්ච :—සර්වකාමසමෘද්ධස්‍ය අශ්වමෙධස්‍ය යත්ඵලම්,
තත් ඵලං ලභතෙ සම්‍යක් රක්ෂිතෙ ශරණාගතෙ.

වූයේ කපටභාවයකොට සියල්ලවුන්ගෙණ සිංහයාගේ සමීපයට ආයේය. ඉක්බිත්තෙන් කවුඩා විසින් දෙවයන්වහන්ස! උත්සාහයෙනුදු ආහාරයෙක් නොලද්දේය. ස්වාමිතෙමේ තිපදිනක් ආහාරනොලැබීමෙන් වෙහෙසටද පැමිණියේය. එබැවින් දැන් මාගේ ශරීරමාංශ අනුභවකරනු ලැබේවා.

1. යම් හෙයකින්—මේ සියලු ජනයෝ එකාන්තයෙන් ස්වාමියාම මුල්කොට ඇත්තාහු වෙති, වෘක්ෂය මුල් සහිතවූ කල්හිම මිනිසුන්ගේ රැකීමේ උත්සාහය පලසහිතවෙයි යනු කියන ලදී.

සිංහයා විසින් "පින්වත ජීවිතදානය උතුම්වෙයි එසේවූයේද මෙබඳුවූ ක්‍රියාවෙහි පැවැත්ම උතුම් නොවෙයි" කියනලද්දේය. හිවලා විසින්ද එසේම කියනලද්දේය. "එසේ නොවේව" යි සිංහයා විසින් කියනලද්දේය. ඉක්බිත්තෙන් ව්‍යාඝ්‍රතෙම "ස්වාමී තෙමේ මාගේ ශරීරය කරණකොටගෙණ ජීවත්වනසේක්ව" යි කීයේය. සිංහයා විසින් "එසේකිරීම කිසිකලකද නුසුදුසුය" යි කියන ලද්දේය. ඉක්බිත්තෙන් චිත්‍රකර්ණයාද කාකාදීන්ගේ වචනයෙහි කරණලද්දාවූ විශ්වාසයෙන් යුක්තවූයේ එසේම තමාගේ ශරීරය සිංහයාට දෙනබව කීයේය. ඒ වචනය කියන්නාවූම මේ චිත්‍රකර්ණතෙමේ දිවියා විසින් බඩපලා නසනලද්දේ සියල්ලවුන් විසින් කනලද්දේදවෙයි. එහෙයින් "බුද්ධිය එකාන්තයෙන් චඤ්චලවෙයි යන මේ ආදිය" මම කියමි.

ඉන්පසු තුන්වෙනිවූ ධූර්තයාගේ වචනයඅසා ඒ බ්‍රාහ්මණතෙම සිත්හි අනුමානය මුදා නියමකොට එළුවාහැරදමා ස්නානය කොට ගෙටගියේය. එළුවාද ගෙණවුත් ධූර්තයන් විසින් කන ලද්දේය. එහෙයින් "යමෙක්තමාහා උපමාකිරීමෙන් දන්නේද යන මේ ආදිය" මම කියමි. රජතෙමේ එම්බා මෙඝවර්ණය! තා විසින් කෙසේනම් සතුරන්ගේ මධ්‍යයෙහි බොහෝ කාලයක් මුලුල්ලෙහි වසන ලද්දේද කෙසේනම් ඔවුන්ගේ හික්මීමහෝ කරණ ලද්දේදැ" යි කියයි. මෙඝවර්ණ තෙමේ "දෙවයන්වහන්ස! ස්වාමිහුගේ කටයුතු කැමැත්තහු විසින් හෝ තමාගේ ප්‍රයෝජනය හෙතුකොටගෙණ හෝ කුමක් කුමක්නම් කරණු නොලැබේද.

---

1. යතඃ:—ස්වාමිමූලා භවන්ත්‍යෙතාඃ සර්වාඃ ප්‍රකෘතයඃ ඛලු,
සමූලෙෂු හි වෘක්ෂෙෂු ප්‍රයත්නඃ සඵලො නෘණාම්.

1. බලව—පින්වත් මහරජ! කිමෙක්ද දවනු පිණිස දර ඉසින් නොම උසුලාද නදීයෙහිවූ ජලවෙගය ගසෙහිමුල සෝදන්නේද ගස උපුරාහෙලයි..

2. එසේද කියනලදී—නුවණැති ජනතෙමේ තමාගේ කට යුතු සිඬකිරීමට පැමිණ පසමිතුරන් ශරීරයෙන්ද උසුලයි. යම් සේ මහලුවූ සර්පයා විසින් මැඬියෝ නසන ලද්දාහුද.

රජතෙමේ "ඒ කෙසේද" යි? විචාළේය. මෙඝවර්ණතෙමේ කියයි.

"ජීර්ණ උද්‍යානයෙහි මන්‍දවිසර්පනම් සර්පයෙක් ඇත්තේය. ඒ සර්පතෙම අතිශයින් දිරාගිය බැවින් තමාගේ ආහාරයපවා සොයාගැණීමට අපොහොසත්වූයේ විල්ඉව්රෙහි වැටීසිටියේය. ඉක්බිත්තෙන් දුරදීම එක්තරා මැඬියක්හු විසින් දක්නාලද්දේ "කිමෙක්ද පින්වත්තෙම ආහාර නොසොයන්නේදැ" යි? විචාරණ ලද්දේවෙයි. සර්පතෙමේ "පින්වත! පින්නැත්තාවූ මාගේ කථා ප්‍රවෘත්තිය විචාරීමෙන් තට කවරප්‍රයොජනද? යව" යි කියයි. ඉක්බිත්තෙන් හටගත්තාවූ විස්ම සිත්ඇති ඒ මැඬිතෙම සර්වප්‍රකාරයෙන් කියනුලැබේවයි ඒ සර්පයාට කියයි, සර්පතෙමේ "පින්වත! මේ බ්‍රහ්මපූරයෙහි කෞණ්ඩින්‍යනාම් වෙදහදාරණ බ්‍රාහ්මණයාගේ පුත්‍රවූ මදක් අඩුවූ විසිවයස්ඇති සියලු ගුණයෙන් යුක්තවූ පුත්‍රතෙම රෞද්‍ර භාවයෙන් යුක්තවූ මා විසින් අභාග්‍යය හෙතුකොටගෙණ දෂ්ටකරණ ලද්දේය. ඉක්බිත්තෙන් මළාවූ සුශීලනම්පුත්‍රයාදැක කෞණ්ඩින්‍ය බ්‍රාහ්මණතෙම ශොකය විසින් මූර්ජාකරණ ලද්දේ පොළෝතලයෙහි ඔබමොබ පෙරලුනේය. ඉන්පසු බ්‍රහ්මපූරවාසී ඔහුගේ සියලුනෑයෝ එහි අවුත් උන්නෝය.

3. එසේද කියනලදී—සටන්කාලයෙහිද විපත්තිකාලයෙහිද ආහාරපාන නොලැබියහැකි කාලයෙහිද සතුරන් විසින් මඩනා ලද කාලයෙහිද රජුන් විසින් පරීක්‍ෂාකරණලද කාලයෙහිද යමෙක් අනුකූලව සිටීද හෙතෙම ප්‍රකෘතිවූ නෑයෙක්වෙයි.

---

1. පශ්‍ය :—ලොකො වහති කිං රජන් න මූර්ධ්නා දග්ධුමින්ධනම්,
කූලාලයත්‍යපි වාඃ ක්‍ෂාඩිස්ත්‍රිං නදීවෙගො නිකෘන්තති.

2. තථාචොක්තම් :—ස්කන්ධෙනාපි වහෙච්ඡත්‍රූන් කාර්‍ය්‍යමාසාද්‍ය බුද්ධිමාන්,
යථා වෘද්ධෙන සර්පෙණ මණ්ඩූකා විනිපාතිතාඃ.

3. තථාචොක්තම් :—ආහවෙ ව්‍යසනෙ චෛව දුර්භික්‍ෂෙ ශත්‍රුවිග්‍රහෙ,
රාජද්වාරෙ ශ්මශානෙ ච යස්තිෂ්ඨති ස බාන්ධවඃ.

ඉක්බිත්තෙන් බ්‍රහ්මචර්‍ය්‍යාව කෙළවරකොට ගෘහස්ථභාවයට පැමිණියාවූ කපිල යන නම් ඇත්තෙක් බොලකෞණ්ඩින්‍යය ! යම් හෙයකින් මෙසේ විලාප කියන්නෙහිද එහෙයින් පරීක්ෂා රහිතවූ යෙහිය.

1. අසව—යම්කලෙක්හි නස්නා සුලුබව වන්නේද එහෙයින් පළමුකොට කිරිමව්ද පසුව වැදූමවදමෙන් උපන්නාවූ මනුෂ්‍යයා මරණය අසිති කරන්නේද නොහොත් ඇකයට නගන්නීද එසේකල්හි ශොකයාගේ කවර නියමයෙක්ද ?.

2. එසේද—සෙනාවගෙන්ද, බලයෙන්ද වාහනය යන මෙයින් යුක්තවූ රජහු මළාහුය. යම්රජුන්ගේ මියයාමෙහි සාක්ෂිවූ පෘථිවීතොමෝ දැනුදු පවත්නීය.

3. අනිකෙක්ද—මේ ශරීරයතෙම නිතර ගෙවීයාමට පැමිණෙන්නේද එහෙයින් ඒ ස්වභාවයෙන් දක්නා නොලැබෙයි. ජලයමධ්‍යයෙහි තබනලද්දවූ නුපුලුස්සනලද මැටි කලයක් මෙන් විසිරයාමට පැමිණියේ දක්නාලැබෙයි.

4. වදකරණ තැන්ට ගෙණයනුලබන්නාවූ වදකිරීමට සුදුස්සාට පියවරක් පියවරක්පාසා වදකරන්නාවූ ස්ථානය අතිශයින් ආසන්නභාවයට පැමිණෙන්නාක්මෙන් සත්වයාහට දවසක් දවසක්පාසා මරණයතෙම අතිශයින් ආසන්නභාවයට පැමිණෙයි.

5. යම්හෙයකින්—තරුණඅවස්ථාවද රූපයද ජීවිතයද ද්‍රව්‍යයන්ගේ රැස්කිරීමද සම්පත්තියද ප්‍රියජනයන්හා සමඟ එක්ව විසීමද ස්ථිරනොවෙයි, පණ්ඩිතජනතෙමේ ඒ කාරණයෙහිමුළා නොවන්නේය.

---

1. ශාඞ්ග :—ක්‍රොඩීකරොති ප්‍රථමං යදා ජාතමනිත්‍යතා,
ධාත්‍රීව ජනනී පශ්චාත් තදා ශොකස්‍ය කඃ ක්‍රමඃ.

2. තථාච :—ක්ව ගතාඃ පෘථිවීපාලාඃ සසෛන්‍යබලවාහනාඃ,
වියොගසාක්ෂිණී යෙෂාං භූමිරද්‍යාපි තිෂ්ඨති,

3. අපරඤ්ච :—ප්‍රතික්ෂණමයං කායඃ ක්ෂීයමාණො න ලක්ෂ්‍යතෙ,
ආමකුම්භ ඉවාම්භඃස්ථො විශීර්ණඃ සන් විභාව්‍යතෙ.

4. ආසන්නතරතාමෙති මෘත්‍යුර්ජන්තොර්දිනෙ දිනෙ,
ආඝාතං නීයමානස්‍ය බධ්‍යස්‍යෙව පදෙ පදෙ.

5. යතඃ :—අනිත්‍යං යෞවනං රූපං ජීවිතං ද්‍රව්‍යසඤ්චයඃ,
ඓශ්වර්‍ය්‍යං ප්‍රියසංවාසො මුහ්‍යෙත්තත්‍ර න පණ්ඩිතඃ.

1. යම්සේ මහාසමුද්‍රයෙහිදී දඬුදෙකක් ගැලපෙද්ද ගැලපීද නැවත වෙන්වෙද්ද පුත්‍රදාරාදීන් හාසමග එක්ව විසීම එබඳු වෙයි.

2. යම් කිසි මගියෙක් සෙවනක් ආශ්‍රයකොට විඩාසංසිඳුවාද එසේ විඩා සංසිඳවීමකොට නැවතයේද පුත්‍රදාරාදීන් සමග එක්ව විසීමද එබඳුවෙයි.

3. අනිකෙක්ද—පෘථිවි, ආපො, තෙජෝ, වායු, ආකාශයන මේ පසින් මවනලද්දාවූ ශරීරය ඇතිකල්හි මරණින් පසු නැවත ඒ පසබවට පැමිණ තමතමාගේ උත්පත්තිස්ථානයට ගියකල්හි ඒ කාරණයෙහි කවරනම් ඇඬීමෙක්ද.?

4. ජනතෙමේ යම්තාක් චිත්තයාගේ ප්‍රියවූ සෙනහ සම්බන්ධ යන්කෙරේද එපමණ මොහුගේ හෘදයෙහි ශොකනැමැති හුල් අනිනු ලැබෙත්.

5. යම් කිසිවක්හු විසින් සවකීය ශරීරයෙන්ද මෙබඳුවූ බොහෝකල් එක්වවිසීමෙක් ලබනු නොලැබේද, පින්වත් කෞණ්ඩින්‍යය! අන්‍යවූ පුත්‍රාදිවූ කිසිවක්හුහා සමග බොහෝකල් එක්ව විසීමෙක් කෙසේනම් ලැබේද.?

6. නැවත්ද—උත්පත්තිය තොමෝ ඉක්මවිය නොහැකි මරණයාගේ එළඹසිටීම මෙන් ගැළපී විසීමතෙම වෙන්වීමෙහි පහළ වීම ප්‍රකාශකෙරේ.

---

1. යථා කාෂ්ඨඤ්ච කාෂ්ඨඤ්ච සමෙයාතාං මහොදධෞ,
සමෙත්‍ය ච ව්‍යපෙයාතාං තද්වද්භූතසමාගමඃ.

2. යථා හි පථිකඃ කශ්චිච්ඡායාමාශ්‍රිත්‍ය තිෂ්ඨති,
විශ්‍රම්‍ය ච පුනර්ගච්ඡෙත් තද්වද්භූතසමාගමඃ.

3. අන්‍යච්ච :—පඤ්චභිර්නිර්මිතෙ දෙහෙ පඤ්චත්වං ච පුනර්ගතෙ,
ස්වාං ස්වාං යොනිමනුප්‍රාප්තෙ තත්‍ර කා පරිදෙවනා.?

4. යාවතඃ කුරුතෙ ජන්තුඃ සම්බන්ධාන් මනසඃ ප්‍රියාන්,
තාවන්තො' ස්‍ය නිඛන්‍යන්තෙ හෘදයෙ ශොකශඞ්කවඃ.

5. නායමත්‍යන්තසංවාසො ලභ්‍යතෙ යෙන කෙනචිත්,
අපි ස්වෙන ශරීරෙණ කිමුතාන්‍යෙන කෙනචිත්.

6. අපිච :—සංයොගො හි වියොගස්‍ය සංසූචයති සම්භවම්,
අනතික්‍රමණීයස්‍ය ජන්ම මෘත්‍යොරිවාගමම්.

1. හිතනුවූ අනුභව කටයුතුවූ ද්‍රව්‍යයන්ගේ මෙන් ඇසිල්ලෙක්හි ප්‍රීතියදෙන්නාවූ පුත්‍රාදී ප්‍රිය ජනයන්හා සමඟ ගැළපී වසන්නවුන්ගේ අවසානය තෙම දුක් උපදවන්නෝ වෙයි.

2. අනිකෙක්ද—යම්සේ නදීන්ගේ බැස යන්නාවූ ජලයෝ ගමන් කෙරෙද්ද ආපසු නොයෙද්ද එසේම හැමකල්හි දිවා රාත්‍රි දෙක දිවි ඇත්තවුන්ගේ ආයුසය ගෙණයන්නාහු නොනවත්නාහු වෙති.

3. පොළෝතලයෙහි යම්බඳුවූ සත්පුරුෂයන්ගේ එක්වීමෙක් වනාහි අතිශයින් සැපතට ස්ථානද, ඒ සත්පුරුෂයන්ගේ එක්වීම වනාහි වෙන්වීම කෙළවරකොට පවත්නා බැවින් දුක් සමූහයන්ගේ අග්‍රස්ථානයෙහි යෙදේ.

4. වෙන්වීම නැමැති කඩුවෙන් සිඳින ලද සිත් ඇත්තාහට යම්හෙයකින් ඖෂධයෙක් නැත්තේද ඒ කාරණයෙන්ම පණ්ඩිතයෝ සත්පුරුෂයන්ගේ සමාගමයෙහි කැමති නොවෙත්.

5. සගර රජ්ජුරුවන් ආදිකොට ඇති බලසම්පන්නවූ රජුන් විසින් අශ්වමෙධ යාගාදි ක්‍රියාවෝ කරණලද්දාහුද නැවත ඒ ක්‍රියාවෝද ඒ රජහුද විනාශයට ගියාහුය.

6. රළුවූ දඬුවම් ඇති මරණය නැවත නැවත සලකා නුවණැත්තාවූද මනුෂ්‍යයාගේ සියලු උත්සාහයෝ වර්ෂා ජලයෙන් තෙත්වූ සම්බැඳුම්මෙන් ලිහිල්වූවාහු මෙන් වෙත්.

---

1. ආපාතරමණීයානාං සංයොගානාං ප්‍රියෛඃ සහ,
අපථ්‍යානාමිවාන්නානාං පරිණාමො හි දාරුණඃ.

2. අපරඤ්ච:—ව්‍රජන්ති න නිවර්ත්තන්තෙ ස්‍රොතාංසි සරිතාං යථා,
ආයුරාදාය මර්ත්‍යානාං සදා රාත්‍ර්‍යහනී තථා.

3. සුඛාස්වාදපරො යස්තු සංසාරෙ සත්සමාගමඃ,
ස වියොගාවසානත්වාත් දුඃඛානාං ධූරි යුජ්‍යතෙ.

4. අතඑව හි නෙච්ඡන්ති සාධවඃ සත්සමාගමම්,
යද්වියොගාසිලූනස්‍ය මනසො නාස්ති භෙෂජම්,

5. සුකෘතාන්‍යපි කර්ම්මාණි රාජභිඃ සගරාදිභිඃ,
අථ තාන්‍යෙව කර්ම්මාණි තෙ චාපි ප්‍රලයං ගතාඃ.

6. සඤ්චින්ත්‍ය සඤ්චින්ත්‍ය තමුග්‍රදණ්ඩං මෘත්‍යුං මනුෂ්‍යස්‍ය විචක්ෂණස්‍ය,
වර්ෂාම්බුසික්තා ඉව චර්ම්මබන්ධාඃ සර්ව්වෙ ප්‍රයත්නාඃ ශිථිලී භවන්ති.

1. මිනිසුන් අතුරෙන් වීරපුරුෂයෙක් යම්බඳුවූ ප්‍රථම රාත්‍රියෙක්හි මාතෘගර්භයෙහි විසීමට පැමිණේද එතැන්පටන්ම ශීඝ්‍රවූ ගති ඇත්තේ හෙතෙම දවස්පතා මරහුගේ සමීපයට පැමිණෙයි.

එබැවින් සංසාරය පරීක්ෂාකරව මෙ ශොකය මූලාවෙහි පැතිරීම වෙයි.

2. බලව—වෙන්වීමම ඉදින් ශොකයට හෙතුවූයේනම් අශූ නභාවය ශොකයට හෙතු නුවූයේනම් ශොකයතෙමේ දවස් ඉක්ම යන කල්හි වැඩේවා, තුමූට ශොකය පහවන්නේද?

එබැවින් පින්වත! තමා සලකව ශොකයෙන් මිර්කීම දුරුකරව.

3. පෙර නොසිතුවිරූ දැඩිවූ ශොක ප්‍රහාර ඇති මර්මස්ථාන පලන්නාවූ ආයුධයෙහි සිහිනොකිරීමම මහත්වූ ඖෂධයෙකි.

ඉක්බිත්තෙන් ඒ වචනයඅසා සිහිලද්දක්හුමෙන් කෞණ්ඩින්‍යතෙම නැගීසිට “එබැවින් දැන් ගෙයනැමැති නරකයෙහි විසීමෙන් කම්නැත වනයටයෙමි” යි කීය. නැවත කපිලතෙම,

4. විෂයරසයෙහි ඇළුනවුන්ට වනයෙහිද දොෂයෝ උපදීත්, චක්ෂුරාදී පඤ්චෙන්ද්‍රියයන්ගේ නික්මවීමතෙම ගෘහස්ථ භූමියෙහි වසනකලද තපසවෙයි, යම්ජනයෙක් තෙම සුචරිත ක්‍රියාවෙහි පවතීද ඉන්ද්‍රියනිග්‍රහයෙහි යෙදුනාහට ගෘහස්ථ භූමියද තාපස භූමියක්වන්නීය.

5. යම්හෙයකින්—යම්කිසි ආශ්‍රමයෙක්හි ඇළුනු තැනැත්තේ සකලසත්වයන් කෙරෙහි සමානවූ පැවතුම් ඇත්තේද දුකට පැමිණියේනමුදු ධර්මයෙහි හැසිරෙන්නේය, බ්‍රහ්මචර්‍ය්‍යාශ්‍රමය ප්‍රකාශකරන්නාවූ ලකුණම ධර්මයට කාරණයෙක් නොවේ.

---

1. යාමෙව රාත්‍රිං ප්‍රථමාමුපෛති ගර්භෙ නිවාසං නරවීරලොකඃ,
තතඃ ප්‍රභෘත්‍යස්ඛලිතප්‍රයාණඃ ස ප්‍රත්‍යහං මෘත්‍යුසමීපමෙති.

2. පශ්‍ය :—අශ්‍රූණාං කාරණං න ස[illegible]වියොගො යදි කාරණම්,
ශොකො දිනෙෂු ගච්ඡත්සු වර්ධතාමපයාති කිම්.

3. යතඃ :—අකාණ්ඩපාතජාතානාමස්ත්‍රාණාං මර්මභෙදිනාම්,
ගාඪශොකප්‍රහාරාණාමචින්තනව මහෞෂධම්.

4. වනෙ 'පි දොෂාඃ ප්‍රභවන්ති රාගිණාං ගෘහෙ 'පි පඤ්චෙන්ද්‍රියනිග්‍රහස්තපඃ,
අකුත්සිතෙ කර්මණි යඃ ප්‍රවර්තතෙ නිවෘත්තරාගස්‍ය ගෘහං තපොවනම්.

5. යතඃ :—දුඃඛිතො 'පි චරෙද්ධර්මං යත්‍ර කුත්‍රාශ්‍රමෙ රතඃ,
සමඃ සර්වෙෂු භූතෙෂු න ලිඞ්ගං ධර්මකාරණම්.

1. කියනලද්දේදවෙයි—යම්කෙණකුන්ගේ ආහාරය ජීවිකාව පිණිස වන්නේද ස්ත්‍රීසම්භොගය දරුවන් පිණිස වන්නේද වචනය සත්‍යයපිණිස වන්නේද ඔව්හු ඉක්මයානොහැකි ස්ථාන යන්ද එතරවෙත්.

2. එසේමය—හික්මීමනැමැති පූණ්‍යතීර්ථයෙන් යුක්තවූ සත්‍ය වචනනැමැති ජලයෙන් යුක්තවූ ශීලනැමැති ඉව්රඇති කරුණා නැමැති රළයෙන් යුක්තවූ ආත්මයතෙම නදියක් සමාන වන්නේය. පාණ්ඩුපුත්‍රවූ මහරජ! ඒ නදියෙහි අභිෂෙකය කළ මැනව හුදෙක් දියෙන්ම පමණක් සිත ශුද්ධකරණු නොලැබෙයි.

3. විශෙෂයෙන්ද—ඉපදීමය මරණය ජරාවය රොගය වෙදනාය යන මෙසින් ගැවසී ගත්තාවූ අතිශයින් නිස්සාරවූ මේ සංසාරය හරින්නාහට සැප එළවන්නේවෙයි.

4. දුකම ඇත්තේය සැපතක්නම් නැත්තේය, යම්හෙයකින් ඒ දුකම අනුභවකරණු ලැබේද දුකින් පීඩිතයාගේ දුක් සංසිඳවීම ඇතිකල්හි සැපය යන නාමය කරණුලැබෙයි කියයි.

කෞණ්ඩින්‍යතෙම එසේමයයි කියයි. ඉක්බිත්තෙන් ශොකයෙන් තැලඹුනාවූ ඒ බ්‍රාහ්මණයා විසින් "අදපටන් මැඩියන්ගේ වාහන වන්නෙහිය" සී මම ශාපකරණලද්දෙමි. කපිලතෙම පින්වත්තෙමේ දැන්දුකින්තැවුන සිත්ඇතිබැවින් තාගේ හෘදය ශොකයෙන් යුක්තවූයේද. එසේද කටයුත්තක්අසව.

5. ඇලීම සර්වප්‍රකාරයෙන් දුරුකටයුතුවෙයි. ඉදින් ඒ ඇල්ම දුරුකරන්ට නොහැකිද ඒ ඇල්ම තෙම සත්පුරුෂයන් හා සමග කටයුතු වෙයි, එසේමය සත්පුරුෂයන්ගේ ඇලීම ඖෂධයෙක් වෙයි කියයි.

---

1. උක්තඤ්ච :—වෘත්‍යර්ථං භොජනං යෙෂාං සන්තානාර්ථඤ්ච මෛථුනම්,
වාක් සත්‍යවචනාර්ථඤ්ච දුර්ගාණ්‍යපි තරන්ති තෙ.

2. තථාහි :—ආත්මා නදී සංයමපුණ්‍යතීර්ථා සත්‍යොදකා ශීලතටා දයොර්මිඃ,
තත්‍රාභිෂෙකං කුරු පාණ්ඩුපුත්‍ර න වාරිණා ශුද්ධ්‍යති චාන්තරාත්මා.

3. විශෙෂතශ්ච :—ජන්මමෘත්‍යුජරාව්‍යාධිවෙදනාභිරභිප්ලුතම්,
සංසාරමිදමත්‍යන්තමසාරං ත්‍යජතඃ සුඛම්.

4. දුඃඛමෙවාස්ති න සුඛං යස්මාත් තදුපලක්ෂ්‍යතෙ,
දුඃඛාර්තස්‍ය ප්‍රතීකාරෙ සුඛසංඥා විධීයතෙ.

5. සඞ්ගඃ සර්වාත්මනා ත්‍යාජ්‍යඃ ස චෙත් ත්‍යක්තුං න ශක්‍යතෙ,
ස සද්භිඃ සහ කර්තව්‍යඃ සතාං සඞ්ගො හි භෙෂජම්.

1. අනිකෙක්ද—ආශාව සර්වප්‍රකාරයෙන් පුරුකටයුතුවෙයි, ඉදින් ඒ ආශාව නසන්ට නොහැකිනම් ස්වකීය භාර්‍ය්‍යාව කෙරෙහි කටයුතුවෙයි, එසේමය භාර්‍ය්‍යාව කෙරෙහි ඇල්මම ඕහට ඖෂධයක් සමානවෙයි.

ඒ අසා කෞණ්ඩින්‍යතෙම කපිලයාගේ අනුශාසනා නැමැති අමෘතයෙන් නිවනලද ශොක නැමති ගිනි ඇත්තේ විඩිවූ පරිද්දෙන් දණ්ඩග්‍රහණය කෙළේය. ඉක්බිත්තෙන් බ්‍රාහ්මණයාගේ ශාපය අනුභවය පිණිස මැඩියන් ඉසිලීමට මෙහි සිටිමි" යි කීය. ඉන්පසු ඒ මැඩියාවිසින් ගොස් ජලපාදනම් මණ්ඩුක නායකයාට එපවත් කියනලද්දේය. ඉක්බිත්තෙන් ඒ මඬුණ්ක නායක තෙම අවුත් සර්පයා ඉදිරියෙහි සිටියේය. ඒ සර්ප තෙමේ ඒමණ්ඩුකනායකයා පිටෙහි තබාගෙණ විසිතුරු ගමන ගියේය. පසු දිනයෙහි ගමන් කරන්ට නොහැක්කාවූ ඒ සර්පයාට මණ්ඩුක නායක තෙමේ "පින්වත් තෙමේ අද දවස්හි මඳගමනින් යුක්තවූයේ කිමෙක්ද" යි කීයේය. සර්පතෙමේ "ස්වාමිය! ආහාර වැළකීමෙන් දුර්වලවූයෙමි" කියයි. මණ්ඩුක නායක තෙමේ "අපගේ ආඥුවෙන් මැඩියන් කව" යි කීයේය. ඉක්බිත්තෙන් "මේ මහත්වූ සංග්‍රහය තෙම ගන්නාලද්දේය" යි කියා පිළිවෙළින් ඒ සර්පතෙමේ මැඩියන් කයි, පසුව මැඩියන් නැත්තාවූ විල දැක මණ්ඩුක නායක තෙමේද ඒ සර්පයා විසින් කනලද්දේය. එහෙයින් සතුරන් පිට තබාගෙණද උසුලන්නේයයි යන මේ ආදිය මම කියමි. දෙවයන් වහන්ස! දැන් පෙර පැවැත්තාවූ කථා කීම නවතිවා.

මේ හිරණ්‍යගර්භ භූපාල තෙමේ සර්වප්‍රකාරයෙන් මිත්‍රභාවයට සුදුස්සෙක් වෙයි, මිත්‍රකරණු ලැබේවයි මාගේ අදහස වෙයි. "රජතෙමේ පින්වත්හුගේ මේ නීතිය කුමක්ද? යම්හෙයකින් අපවිසින් මේ තෙම පළමුකොටම පරදවන ලදද එබැවින් අපගේ ආඥුවෙන් ඉදින් සෙවකභාවයෙහි පවතීද එකල්හි හින්ද යුතුවෙයි. ඉදින් එසේ නොවේනම් සටන්කරණු ලැබේව" යි කීයේය. මේ අතුරෙහි ජම්බුද්වීපයෙන් අවුත් ගිරා ඇමතියා විසින් "දෙවයන් වහන්ස! සිංහලද්වීපයෙහි සාරසනම් රජතෙම දැන් ජම්බුද්වීපය මැඩපවත්වා සිටිනේය" යි කියනලද්දේය. රජ තෙමේ කොප සහිතව "කිමෙක්ද කිමෙක්ද" යි ඕහට කියයි.

1. අන්‍යච්ච :— කාමඃ සර්වාත්මනා හෙයඃ ස චෙද්ධාතුං න ශක්‍යතෙ,
ස්වභාර්‍ය්‍යාං ප්‍රති කර්තව්‍යඃ සෛව තස්‍ය හි භෙෂජම්.

ගිරා ඇමති තෙම පළමුකොට කියනලද වචනය කියයි. ගෘද්‍ර අමාත්‍ය තෙම "පින්වත් චක්‍රවාක ම[illegible]ප්‍රිය! මනාවෙයි මනා වෙයි" තමාගේ අදහස කීයේය. රජ තෙමේ කොප සහිතව "මේ තෙම ඒනාක් ගිඳීවා, මම ගොස් ඔහු මුල් සහිතව උපුටන්නෙමි" යි කියයි. පණ්ඩිත තෙම සිනාසී.

1. ශරත්කාලයෙහි වැසිපටලමෙන් සිස්වූම ගැඹුරුවූ ගජ්නාව නොකටයුතුවෙයි, පූජ්‍යවූ ජන තෙමේ සතුරාගේ ඉෂ්ටය හෝ අනිෂ්ටය වචනමාත්‍රයෙන් ප්‍රකට නොකෙරෙයි.

2. අනිකෙක්ද—රජතෙමේ සතුරන් සමූහයක් එක්ව එක විට සටන් නොකරන්නේය, අහංකාරවූ සර්පතෙමේද බොහෝවූ කුහුඹුවන් විසින් එකාන්තයෙන් නසන ලද්දේය.

දෙවයන්වහන්ස ! අපවිසින් කොපය යම්හෙයකින් පසුව කටයුතුවේද එහෙයින් මිත්‍රභාවය හැර මෙතනින් කවර ගම නෙක් ඇත්තේද?

3. අනිකෙක්ද—යම් ජනයෙක් කාරණයාගේ සවභාවනො දැන ක්‍රොධයටම වශගවූයේද ඒ අඥානතෙම බමුණු මුගටියා හෙතුකොටගෙණ තැවූනාමෙන් තැවෙයි කියයි.

රජතෙමේ ඒ කෙසේදැයි? විචාරයි. පණ්ඩිතතෙමේ කියයි.

උදෙනිනුවර මාධවනම් බ්‍රාහ්මණයෙක් ඇත්තේය. ඔහුගේ අඹුතොමෝ පුත්‍රයක්හු ප්‍රසූතකළාය. ඕතොමෝ ලදරුවූ පුත්‍රයා රක්නා පිණිස බ්‍රාහ්මණයා සිටුවාසනානය පිණිස ගියාය. එකල්හි බමුණහට අමාවක්දිනපිත්‍රෘදානයක් දීමපිණිස රජහුගේ පුරුෂයෙක් ආයේය. ඔහුදුක බ්‍රාහ්මණතෙම සවභාවයෙන් දිළිඳු බැවින් "ඉදින්වහානොයෙම්ද එකල්හි අන්කිසිවෙක් පිත්‍රෘදානය ගන්නේය.

4. කියනලද්දේද වෙයි—වහානොකරණු ලබන්නාවූ ගත යුතුවූ ද්‍රව්‍යයාගේද දියයුතුවූ ද්‍රව්‍යයාගේද කටයුතුවූ ක්‍රියාවගේද ඒ රසය කාලයතෙමේ බොන්නේය.

---

1. න ශරන්මෙඝවත් කාර්‍ය්‍යං වෘථෛව ඝනගර්ජිතම්,
පරස්‍යාර්ථමනර්ථං වා ප්‍රකාශයති නො මහාන්,

2. අපරඤ්ච :—ඒකදා න විගෘහ්ණීයාත් බහූන් රාජා විවාදිනඃ,
සදර්පො 'ප්‍යුරගඃ කීටෛර්බහුභිර්නාශිතො ධ්‍රැවම්.

3. අපරඤ්ච :—යො 'ර්ථතත්ත්වමවිඥාය ක්‍රොධස්‍යෛව වශංගතඃ,
ස තථා තප්‍යතෙ මූඪො බ්‍රාහ්මණො නකුලාදිව.

4. උක්තඤ්ච :—ආදෙයස්‍ය ප්‍රදෙයස්‍ය කර්තව්‍යස්‍ය ච කර්මණඃ,
ක්ෂිප්‍රමක්‍රියමාණස්‍ය කාලඃ පිබති තද්‍රසම්.

ලදරුවාද රක්‍ෂාකරන්නාවූ කිසිවෙක් නැත්තේය එබැවින් කුමක් කෙරෙම්ද? [illegible]න්නාට බොහෝකාලයක් රත්නාලද පුත්‍රයක්හුමෙන් ස්නෙහයෙන් යුක්තවූ මේ මුගටියා ලදරුවා රැකීමපිණිස නියමකොටයෙමි" යි සිතුයේය. එසේකොටයේ. ඉක්බිත්තෙන් මූගටියා විසින් ඒ ස්ථානයෙහි නිශ්‍ශබ්දව ලදරුවා සමීපයට එන්නාවූ කෘෂ්ණසර්පතෙමේ මරණ ලද්දේ සිදිනලද්දේය. ඉක්බිත්තෙන් මේ මුගටිතෙමේ එන්නාවූ බ්‍රාහ්මණයා දැක ලේතැවරුණාවූ සකලශරීරයෙන් යුක්තවූයේ වහා එළඹ බ්‍රාහ්මණයාගේපාදදෙක්හි දැවටුනේය. ඉක්බිත්තෙන් මේ බ්‍රාහ්මණතෙම එසේවූ මුගටියාදැක මාගේ පුත්‍රතෙම මොහු විසින් කනලද්දේයයි පරීක්‍ෂා නොකොට ඒ මුගටියා මැරුයේය. ඉන්පසු . යම්තාක් සමීපයට එළඹ බ්‍රාහ්මණතෙමේ බලාද ඒතාක් සැපතින් යුක්තවූ ලදරුතෙම සයනය කෙරෙයි. සර්පයාවනාහි මරණලද්දේ සිටී. ඉක්බිත්තෙන් මේ බ්‍රාහ්මණතෙම පසුතැවිල්ලට පැමිණියේය. එබැවින් යම් ජනයෙක් කාරණයාගේ ඇති ස්වභාවය නොදැන යන මේ ආදිය මම කියමි.

1. අනිකෙක්ද—විෂය රසයෙහි ඇල්මද ක්‍රොධයද එසේම ලොභයද සන්තොෂයද මානයද එසේම අහංකාරයද යන මේ සයදුරුකරන්නේය, මේ සය පහකළ කල්හි සැපයෙන් යුක්තවන්නේය.

රජතෙමේ "පින්වත් ඇමතිය! මේ තෙමේ තාගේ නියමය වෙයි" කියයි. ඇමතිතෙමේ "එසේමය" යි කියයි.

2. යම්හෙයකින්—ධර්මයන්ගේ විද්‍යමාන ස්වභාවයෙහි පැවැත්මද, පරීක්‍ෂාබුද්ධියද ශූනයාගේ නියමයද, චඤ්චලනුවූ ප්‍රතිඥාඇති බවද, මන්ත්‍රණයාගේ සැඟවීමද, ඇමතියාගේ උතුම් ගුණවෙයි.

3. පරීක්‍ෂා නොකොට වහාම යම් ක්‍රියාවක් නොකරන්නේය, පරීක්‍ෂානොකිරීම විපත්තීන්ගේ ප්‍රධානස්ථානයවෙයි, ගුණපක්‍ෂයෙහි වැටෙන්නාවූ සම්පත්තීහු පරීක්‍ෂාකරන්නාහු තුමූම ප්‍රාර්ථනා කෙරෙත්.

---

1. අපරඤ්ච :—කාමඃ ක්‍රොධස්තථා ලොභො හර්‍ෂො මානො මදස්තථා,
ෂඩ් වර්ගමුත්සෘජෙදෙන මස්මිංස්ත්‍යක්තෙ සුඛී භවෙත්.

2. යතඃ :—සමෘතිශ්ච පරමාර්ථෙෂු විතර්කො ඥානනිශ්චයඃ,
දෘඪතා මන්ත්‍රගුප්තිශ්ච මන්ත්‍රිණඃ පරමො ගුණඃ.

3. තථාච :—සහසා විදධීත න ක්‍රියාමවිවෙකඃ පරමාපදාං පදම්,
වෘණුතෙ හි විමෘශ්‍යකාරිණං ගුණලුබ්ධාඃ ස්වයමෙව සම්පදඃ,

එබැවින් දෙවයන්වහන්ස! ඉදින් දැන් මාගේ වචනයකරණු ලැබේද එසේකල්හි මිත්‍රභාවය පිණිස යනු ලැබේවා.

1. යම්හෙයකින්—ඉෂ්ටවූ ක්‍රියාසිද්ධියෙහි සාමදානාදිවූ යම් යම් උපාය සතරෙක් දක්වනලද්දැහුද, එසේද ඒ උපාය යන්ගේ අධිකවූ ප්‍රමාණ ඵලයවූ කාරණයන්ගේ සිද්ධිය මිත්‍රභාවයෙහිම නියම කරණලද්දීය" සි කීයේය.

රජතෙමේ "එසේනම් මෙපරිද්දෙන් වහාම කරණුලැබේදැ" සි? කියයි. ඇමතිතෙමේ "දෙවයන්වහන්ස! වහාවන්නේය" සි කියයි.

2. යම්හෙයකින්—දුර්ජනතෙමේ මැටි කලයක්මෙන් මිත්‍රභාවයෙන් සුවසේ බිඳියයුතුවෙයි, නැවත මිත්‍රකිරීමද දුෂ්කරවෙයි, සත්පුරුෂයා වනාහි රන්කලයක්මෙන් බිඳිය නොහැකිවෙයි. වහා මිත්‍රද කළ හැකි වෙයි.

3. අනිකෙක්ද—අඥානතෙමේ සුවසේ සතුටුකළ හැකිවෙයි, විනිශ්චිතබුද්ධිමත් තැනැත්තේ අතිශයින් සුවසේ සතුටුකළයුතු වෙයි, ස්වල්පවූ ඥානයෙන් අහංකාරවූවක්හු බ්‍රහ්මයාපවා සතුටු කළ නොහෙයි.

විශෙෂයෙන්ද, ධර්මයදන්නාවූ මේ රජද සර්වඥවූ ඇමතිද මෙඝවර්ණයාගේ වචනය හෙතුකොටගෙණද මෙඝවර්ණයා විසින් කරණලද කටයුතු දැකීමෙන්ද මාවිසින් මේ කාරණය පළමු කොටම දන්නාලද්දේය.

4. යම්හෙයකින්—සමස්තදෙශයෙහි අසම්මුඛයෙහිදී ගුණ පැවතුම් ඵලයන් කරණකොටගෙණ දතයුතුවෙත්, එහෙයින් සැඟවුනාවූ ඇඟවීම්ඇති රාජාදීන්ගේ මන්ත්‍රණය අනුවපවත්නාවූ කටයුතුවලින් ක්‍රියාව සලකන්නේය" සි කියයි.

---

1. යතඃ:—යද්‍යප්‍යුපායාශ්චත්වාරො නිර්දිෂ්ටාඃ සාධ්‍යසාධනෙ,
සංඛ්‍යාමාත්‍රං ඵලං තෙෂාං සිද්ධිඃ සාමනි ව්‍යවස්ථිතා.

2. යතඃ:—මෘද්ඝටවත් සුඛභෙද්‍යො දුඃසන්ධානශ්ච දුර්ජනො භවති,
සුජනස්තු කනකඝටවත් දුර්භෙද්‍යශ්චාශු සන්ධෙයඃ.

3. අපරඤ්ච:—අඥඃ සුඛමාරාධ්‍යඃ සුඛතරමාරාධ්‍යතෙ විශෙෂඥඃ,
ඥානලවදුර්විදග්ධං බ්‍රහ්මාපි නරං න රඤ්ජයති.

4. යතඃ:—කර්මානුමෙයාඃ සර්වත්‍ර පරොක්ෂගුණවෘත්තයඃ,
තස්මාත් පරොක්ෂවෘත්තීනාං ඵලෛඃ කර්ම විභාවයෙත්.

රජතෙමේ "උත්තර ප්‍රත්‍යුත්තර කථාවෙන් ප්‍රයොජන නොවෙයි, කැමති පරිද්දෙකින් කරණුලැබේව" යි කියයි. මේ කථාව කියා ගෘධ්‍රනම්වූ මහා මන්ත්‍රිතෙමේ ඒ ස්ථානයෙහිදී [illegible]දුසු පරිද්දෙන් කටයුතුයයි කියා කොටුව තුළට ගියේය. ඉක්බිත්තෙන් චරපුරුෂවූ කොකා විසින් අවුත් හිරණ්‍ය ගර්භනෘපාලයා හට "දෙවයන්වහන්ස! මිත්‍රභාවය කිරීම පිණිස මහා මාත්‍යවූ ගෘධ්‍රතෙමේ අපගේ සමීපයට එයි" යනු දන්වන ලද්දේය. රාජහංසතෙමේ "පින්වත්මන්ත්‍රිය! නැවත ව්‍යාජයෙන් කිසිවක්හු විසින් මෙහි ආයුතු වන්නේය" යි කියයි. සර්වඥතෙමේ සිනාසී "දෙවයන්වහන්ස! මේතෙම සැකයට කාරණයෙක් නොවෙයි. යම් මේ පණ්ඩිතතෙමේ උතුම් අදහස් ඇත්තේද නොහොත් මෝ[illegible]ාමෝ නියමය වන්නිය. අඥානයන් විසින් කිසිතැනෙක්හි සැකයක් කරණු ලබන්නේම නොවෙයි. කිසිතැනෙක්හි සියලු කරුණුසඳහාම සැක කරණුලැබෙයි.

1. එසේමැයි—උපුල්දඬු සොයන්නාවූ නුවණැති හංසතෙමේ රාත්‍රිභාගයෙහි බොහෝසෙයින් විල්හි තාරකාවන්ගේ ඡායාව දැකීමෙන් එම ඡායාව කෙරෙහි උපුල්ය යන අදහසින් රැවටුනේ දවල්ද තාරකායයි සැකඇත්තේ නැවත ශ්වෙතවර්ණවූ උපුල් නොගණියි, කපටයා විසින් වඤ්චාකරණලද වඤ්චලබ්ධි ඇත්තාවූ ජනතෙමේ සත්‍යවූ කාරණයෙහිද අනිෂ්ටයයි සැකකෙරේ.

2. දුර්ජනයන් විසින් දූෂ්‍යකරණලද සිත්ඇති ජනතෙමේ සත්පුරුෂයන් කෙරෙහිද විශ්වාසයෙක් නැත්තේය, කිරිබතින් දවන ලද ළදරුතෙමේ දී පවා පූයනා අනුකරණ ශබ්දකරන්නේ අනුභවකරන්නේ නොවේද.

එබැවින් දෙවයන්වහන්ස! ශක්තිවූ පමණින් ඕහට පුදනු පිණිස රුවන්පඬුරු ආදීවූ ද්‍රව්‍ය සමූහය සරසනු ලැබේව" යි කියයි. එසේකළ කල්හි ඒ ගෘධ්‍ර අමාත්‍යතෙමේ කොටුදොරකඩින් චක්‍රවාකයා විසින් සත්කාරකොට ගෙණඅවුත් රජදැක්ම කරවන ලද්දේ දෙනලද අස්නෙහිද උන්නේය. චක්‍රවාක

---

1. තථාහි:—සරසි බහුශස්තාරච්ඡායෙක්ෂණාත් පරිවඤ්චිතඃ
කුමුදවිටපාන්වෙෂී හංසො නිශාස්‍ව විචක්ෂණඃ,
න දශති පුනස්තාරශඞ්කී දිවාපි සිතොත්පලං
කුහකචකිතො ලොකඃ සත්‍යෙ 'ප්‍යපායමපෙක්ෂතෙ.

2. දුර්ජනදූෂිතමනසඃ සුජනෙෂ්වපිනාස්ති විශ්වාසඃ,
බාලඃ පායසදග්ධො දධ්‍යපි ඵූත්කෘත්‍ය භුඞ්ක්තෙ.

තෙමේ "ප්‍රින්වත්ඇමතිය! මේ රාජ්‍යය නුඹ සන්තකය, සියල්ල සිය කැමැත්තෙන් අනුභව කරණු ලැබේව" යි කීයේය. රාජහංසතෙමේ "එසේමය" යි කියයි. පණ්ඩිතතෙම "ඒ කාරණය එසේමය" යි කියයි. එසේද දැන් බොහෝකොට කීමෙන් ප්‍රයෝජනයෙක් නොවෙයි.

1. යම්හෙයකින්—ලෝභවූ තැනැත්තා ධනයෙන්ද දැඩිවූ තැනැත්තා නමස්කාර කිරීමෙන්ද අඥානයා කැමැත්තට අනුව පැවතීමෙන්ද පණ්ඩිතයා විද්‍යමානවූ ස්වභාවයෙන්ද සිත්ගන්නේය.

2. අනිකෙක්ද—ප්‍රියභාවයෙන් මිත්‍රයාද, මනාවූ කථාවෙන් නෑයන්ද, දීමෙන්හා ආදරයෙන්ද අඹුවන්හා මෙහෙකරුවන්ද, සෙසුදෙනා අනුකූලභාවයෙන්ද සිත්ගන්නේය.

එබැවින් දැන් මිත්‍රභාවය පිණිස යනු ලැබේවා. චිත්‍රවර්ණරජතෙමේ මහත්වූ තේජස් ඇත්තේය" යි කියයි. චක්‍රවාකතෙමේ යම් පරිද්දෙකින් මිත්‍රභාවය කටයුතුද හෙද කියනු ලැබේවයි කියයි. රාජහංසතෙමේ "මිත්‍රභාවයන්ගේ කොපමණවූ ප්‍රකාරයෝලැබෙද්ද" යි? කියයි. ගෘධ්‍රඅමාත්‍යතෙමේ මම කියම් අසනු ලැබේවයි කියයි.

3. බලසම්පන්නවූ සතුරකුහා සමඟ සටනෙහි යෙදුනාවූ රජතෙමේ අනික් පිළියමක් නැත්තේ විපත්තියට පැමිණියේ කාලය ගෙවාගැණීම කරණුයේ මිත්‍රභාවයට කැමතිවන්නේය.

4. මිතුරුකිරීමෙහි හෙදකියනුලැබේ, කපාලය උපහාරය, සන්තානය, එසේම සංගතය, උපන්‍යාසය, ප්‍රතීකාරය සංයෝගය, පුරුෂාන්තරය.

5. අදෘෂ්ටනරය ආදිෂ්ටය, ආත්මාදිෂ්ටය, උපග්‍රහය, එසේම පරික්‍රය, එසේම උච්ඡින්නය පරභූෂණය.

---

1. යතඃ:—ලුබ්ධමර්ථෙන ගෘහ්ණීයාත් ස්තබ්ධමඤ්ජලිකර්මණා,
මූර්ඛං ඡන්දානුවෘත්තෙන යාථාතථ්‍යෙන පණ්ඩිතම්.

2. අන්‍යච්ච:—සද්භාවෙන හරෙන්මිත්‍රං සම්භ්‍රමෙණ තු බාන්ධවාන්,
ස්ත්‍රීභෘත්‍යාන් දානමානෛශ්ච දාක්ෂිණ්‍යෙනෙතරං ජනම්.

3. බලීයසාභියුක්තස්තු නෘපො'නන්‍යප්‍රතික්‍රියඃ,
විපන්නඃ සන්ධිමන්විච්ඡෙත් කුර්වාණඃ කාලයාපනම්.

4. කපාල උපහාරශ්ච සන්තානඃ සඞ්ගතස්තථා,
උපන්‍යාසඃ ප්‍රතීකාරඃ සංයොගඃ පුරුෂාන්තරඃ.

5. අදෘෂ්ටනර ආදිෂ්ට ආත්මාදිෂ්ට උපග්‍රහඃ,
පරික්‍රයස්තථොච්ඡින්නස්තථා ච පරභූෂණඃ.

1. සකන්ධොපනෙයය යනමේ සොළසවෙත්, මිත්‍රභාවයෙහි දක්ෂයෝ මෙසේ මිත්‍රභාවය සොළොස්ප්‍රකාරයයි කියත්.

2. එකම සමනාමයෙන් ප්‍රසිඬවූ මිත්‍රභාවය කපාලසන්ධියයි දතයුතුවෙයි. දීම හෙතුකොටගෙණ යම් මිත්‍රභාවයෙක් වේද හෙතෙම උපහාරසන්ධියයි කියනුලැබේ.

3. තන්‍යවන්දීම මුල්කොට පවත්නේ සන්තානසන්ධියයි දත යුතුවෙයි, පණ්ඩිතයන්හා සමග මෛත්‍රිය මුල්කොට පවත්නාවූ මිත්‍රභාවය සංගතසන්ධියයි කියනලදී.

4. ජීවිතය ඇතිතෙක් සමානවූ ධන ප්‍රයොජනයෙන් යුක්ත වූයේ සම්පත්තියෙහි හෝ විපත්තියෙහි හෝ කිසියම් හෙතුවකින් යම් මිත්‍රභාවයෙක් නොබිඳේද.

5. රණක්මෙන් උත්කෘෂ්ටභාවයෙන් යුක්තවූ මේ මිත්‍රභාවය තෙම සංගත සන්ධියමවෙයි, එසේම අන්‍යවූ මිත්‍රභාවයෙහි දක්ෂ යන් විසින් ඒ මිත්‍රභාවයතෙම කාඤ්චනයයි කියනලදී.

6. යම් මිත්‍රභාවයෙක් සම්පත්ය ශරීරය කටයුතුවූ ක්‍රියාය යන මොවුන්ගේ වැඩීම සලකා කරණුලැබේද ඒ මිත්‍රභාවය තෙම උපන්‍යාසයෙහි දක්ෂයන් විසින් උපන්‍යාස සන්ධියයි කියනලදී.

7. පළමුකොට මා විසින් මෝ හට උපකාරකරණලද්දේය. මේ තෙමේ මටද උපකාර කරන්නේයයි මෙසේ යම් මිත්‍රභාව යෙක් කරණුලැබේද ඒ මිත්‍රභාවය තෙම ප්‍රතිකාර සන්ධියයි කියනුලැබේ.

---

1. සකන්ධොපනෙයඃ සන්ධිශ්ච ෂොඩශෛතෙ ප්‍රකීර්තිතාඃ,
ඉති ෂොඩශකං ප්‍රාහුඃ සන්ධිං සන්ධිවිචක්ෂණාඃ,

2. කපාලසන්ධිර්විඥෙයඃ කෙවලං සමසංධිතඃ,
සම්ප්‍රදානාද්භවති ය උපහාරඃ ස උච්‍යතෙ.

3. සන්තානසන්ධිර්විඥෙයො දාරිකාදානපූර්වකඃ,
සද්භිස්තු සඞ්ගතඃ සන්ධිර්මෛත්‍රීපූර්ව උදාහෘතඃ.

4. යාවදායුඃ ප්‍රමාණස්තු සමානාර්ථප්‍රයොජනඃ,
සම්පත්තෞ වා විපත්තෞ වා කාරණෛර්යො න භිද්‍යතෙ.

5. සඞ්ගතඃ සන්ධිරෙවායං ප්‍රකෘෂ්ටත්වාත් සුවර්ණවත්,
තථාන්‍යෛඃ සන්ධිකුශලෛඃ කාඤ්චනඃ ස උදාහෘතඃ.

6. ද්‍රව්‍යාත්මකාය සිද්ධිං තු සමුද්දිශ්‍ය ක්‍රියෙත යඃ,
ස උපන්‍යාසකුශලෛ රූපන්‍යාස උදාහෘතඃ.

7. මයාස්‍යාප කෘතං පූර්වං මමාප්‍යෙෂ කරිෂ්‍යති,
ඉතියඃ ක්‍රියතෙ සන්ධිඃ ප්‍රතීකාරඃ ස උච්‍යතෙ.

1. මෝහට මම උපකාර කෙරෙමි මේ තෙමේ මටද උප කාර කරන්නේයයි රාම සුග්‍රීව දෙදෙනාගේ මෙන් යම් මිත්‍ර භාවයෙක් ඇද්ද, මේ තෙමේද ප්‍රතීකාර සන්ධියයි කියනුලැබේ.

2. යම් මිත්‍රභාවයෙක්හි එකම ප්‍රයොජනයක් ඇත්තාවූ ක්‍රියා වක් උදෙසා මිත්‍රභාවයට පැමිණේද, ඔවුනොවුන් මනාකොට ගැළපීමට කාරණවූයේද, ඒ මිත්‍රභාවයද සංයොග සන්ධියයි කියනලදී.

3. අප දෙදෙනාගේ ප්‍රධාන යොධයන් විසින් මාගේ කටයුතු සිඬකරණු ලැබේවයි මෙසේ යම් මිත්‍රභාවයෙකින් ප්‍රතිඥකරණු ලැබේද, ඒ මිත්‍රභාවය පුරුෂාන්තර සන්ධියයි කියනුලැබේ.

4. යම් මිත්‍රභාවයකින් හුදකළාවූ මට අයිතිවූ මේ ප්‍රයොජනය සිදුකළයුතුයයි සතුරාගේ අයිතිකිරීම කරන්නේද, ඒ මිත්‍රභාවය තෙම අදෘෂ්ටපුරුෂයයි කියනුලැබේ.

5. යම් මිත්‍රභාවයෙක්හි රාජ්‍යයාගේ එක් ප්‍රදෙශයක් අයිති කිරීමෙන් සතුරන් දුරුකරණලද්දේ මිත්‍රකරණු ලැබේද, මිත්‍ර භාවය දන්නවුන් විසින් ඒ මිත්‍රභාවය තෙම ආදිෂ්ටසන්ධියයි කියනලදී.

6. ස්වකීය සෙනාව හා සමඟ මිත්‍රකිරීම වනාහි ආත්මාදිෂ්ට සන්ධියයි කියනුලැබේ. ජීවිත රක්ෂාව පිණිස සියල්ල දීමෙන් යම් මිත්‍රභාවයෙක් කරණු ලැබේද, ඒ මිත්‍රභාවය තෙමේ උපග්‍රහ සන්ධියයි කියනුලැබේ.

---

1. උපකාරං කරොම්‍යස්‍ය මමාප්‍යෙෂ කරිෂ්‍යති,
අයං චාපි ප්‍රතීකාරො රාමසුග්‍රීවයොරිව.

2. ඒකාර්ථං සම්‍යගුද්දිශ්‍ය ක්‍රියාං යත්‍ර හි ගච්ඡති,
සුසංහිතප්‍රමාණස්තු ස ච සංයොග උච්‍යතෙ.

3. ආවයොර්යොධමුඛ්‍යෛස්තු මදර්ථඃ සාධ්‍යතාමිති,
යස්මින් පණස්තු ක්‍රියතෙ ස සන්ධිඃ පුරුෂාන්තරඃ.

4. ත්වයෛකෙන මදීයො'ර්ථඃ සම්ප්‍රසාධ්‍යස්ත්වසෞ විති,
යත්‍ර ශත්‍රුඃ පණං කුර්‍ය්‍යාත් සො 'දෘෂ්ටපුරුෂඃ ස්මෘතඃ.

5. යත්‍ර භූම්‍යෙකදෙශෙන පණෙන රිපුවර්ජිතඃ,
සන්ධීයතෙ සන්ධිවිද්භිඃ ආදිෂ්ටඃ ස උදාහෘතඃ.

6. ස්වසෛන්‍යෙන තු සන්ධානමාත්මාදිෂ්ට උදාහෘතඃ,
ක්‍රියතෙ ප්‍රාණරක්ෂාර්ථං සර්වදානාදුපග්‍රහඃ.

1. මදක් දනයදීමෙන් හෝ ධනගණියාගේ අඩියක් දීමෙන් හෝ සියලු දනදීමෙන් හෝ පණ්ඩිත අමාත්‍යයාගේ රැකීම පිණිස යම් මිත්‍රභාවයෙක් කරණුලැබේද, ඒ තෙමේ පරික්‍රය සන්ධියයි කියනුලැබේ.

2. සාරවත්වූ මනාවූ භූමිභාගයන්ගේ දීමෙන් යම් මිත්‍රභාව යෙක් කරණුලැබේද, ඒ තෙම උච්ජින්න සන්ධියයි කියනු ලැබේ. සමස්තභූමියෙහි උපන්නාවූ ශස්‍යඵල දීමෙන් කරණලද්දාවූ මිත්‍ර භාවය පරභූෂණ සන්ධියයි කියනුලැබේ.

3. යම් මිත්‍රභාවයෙක්හි කුඹුරුආදියෙන් ගතයුතුවූ ශස්‍ය ඵලය ගැලින්ගෙණවුත් දෙනුලැබේද, මිත්‍රභාවයෙහි දක්ෂයෝ ඒ මිත්‍රභාවය ස්කන්ධොපනෙය සන්ධියයි කියත්.

4. ඔවුනොවුන්ට උපකාරවත්වූ මෛත්‍රිසම්බන්ධවූද එසේම උපහාරසන්ධියද යන සන්ධි සතර දතයුතුවෙත්.

5. එකම උපහාර සන්ධිය මාවිසින් සම්මත කරණලදී, උපහාර සන්ධියෙන් වෙන්වූ සියලු සන්ධිහූ මෛත්‍රියෙන් තොරවූවාහුවෙත්.

6. අතිශයින් බලඇති බැවින් සටන් කරන්නාවූ සතුරු තෙමේ කිසියම්වූ ධනාදියක් නොලැබ නොනවත්නේද, ඒ කාරණයෙන් සංග්‍රහයක් නැතිව අන්‍ය මිත්‍රභාවයෙක් නැත්තේ යයි කියයි.

රජතෙමේ "පින්වත්හු මහා පණ්ඩිතයෝවෙත් එබැවින් මේ කාරණයෙහි අප විසින් යමක් කටයුතුද ඒ තෙමදක්වනු ලැබේව" යි කියයි. පණ්ඩිතතෙමේ විස්මයෙකතුමක් කියනු ලැබේද?

---

1. කොෂාංශෙනාර්ධකොශෙණ සර්වකොශෙණ වා පුනඃ,
ශිෂ්ටස්‍ය ප්‍රතිරක්ෂාර්ථං පරික්‍රය උදාහෘතඃ.
2. භුවාං සාරවතීනාං තු දානාදුච්ඡින්න උච්‍යතෙ,
භූම්‍යුත්ථඵලදානෙන සර්වේණ පරභූෂණඃ.
3. පරිච්ඡින්නං ඵලං යත්‍ර ප්‍රතිස්කන්ධෙන දීයතෙ,
ස්කන්ධොපනෙයං තං ප්‍රාහුඃ සන්ධිං සන්ධිවිචක්ෂණාඃ.
4. පරස්පරොපකාරස්තු මෛත්‍රී සම්බන්ධකස්තථා,
උපහාරශ්ච විඥෙයාශ්චත්වාරශ්චෛව සන්ධයඃ.
5. එක එවොපහාරස්තු සන්ධිරෙව මතො මම,
උපහාරවිභින්නාස්තු සර්වෙ මෛත්‍රවිවර්ජිතාඃ.
6. අභියොක්තා බලීයස්ත්වාදලබ්ධ්වා න නිවර්තතෙ,
උපහාරාදෘතෙ තස්මාත් සන්ධිරන්‍යො න විද්‍යතෙ,

1. චිත්තපීඩාවද රොගයද පුත්‍රාදීවූ ප්‍රියයන්ගේ වෙන්වීමෙන් අටයත් තැවීමද යනමේ දුක්වලින් යුක්තවූ අදහෝ සෙට නස් නාසුලුවූ ශරීරය සඳහා කවරනම් මනුෂ්‍යයෙක් දුශ්චරිතවූ ක්‍රියා වක්කරන්නේද?

2. සත්වයන්ගේ ජීවිතය ජලමධ්‍යයෙහිවූ චන්ද්‍රබිම්බයක් මෙන් ඒකාන්තයෙන් චඤ්චලයයි දැන නිරන්තරයෙන් සුචරිතයෙහි හැසිරෙන්නේය.

3. සංසාරය මිරිඟු දියමෙන් ක්ෂණයෙකින් නැසෙන සුලුයයි සලකා සුචරිතය පිණිසද සැපපිණිසද සත්පුරුෂයන් හා සමඟ මිත්‍රභාවය කරන්නේය.

එබැවින් මාගේ සම්මතයෙන් එකල්හි මෙසේ කරණු ලැබේවා.

4. අශ්වමෙධ යාග දහසක්ද සත්‍ය වචනයද තරාදියෙන් කිරණලද්දේ අශ්වමෙධ යාග දහසට වඩා සත්‍ය වචනයම අධිකවෙයි.

එබැවින් සත්‍යයයි කියනලද්දාවූ වචනය[illegible] අසිතිකිරීම මුල් කොට පවත්නා මේ රජුන් දෙදෙනාගේම කාඤ්චන යන නම් ඇති සන්ධිය කරණුලැබේවයි" කියයි. සර්වඥතෙමේ "එසේ වේව"යි කියයි. ඉක්බිත්තෙන් පිළි පඬුරු ආදියෙන් ඒ පණ්ඩිත අමාත්‍ය තෙමේ පුදනලද්දේ සතුටුසිත් ඇතිව චක්‍රවාක අමාත්‍යයා ගෙණ මයූර රජහුගේ සමීපයට ගියේය. ඉක්බිත්තෙන් චිත්‍රවර්ණ රජ විසින් ගෘධ්‍ර අමාත්‍යයාගේ වචනයෙන් සර්වඥතෙමේ මහත්වූ ආදරයද දීමද මුල්කොට ඇති ගෞරවකරණ ලද්දේය. එබඳුවූ මිත්‍රභාවය අසිතිකොට රාජ හංසයාගේ සමීපයට හරිණ ලද්දේය. පණ්ඩිතතෙමේ "දෙවයන්වහන්ස. අපගේ අභිමතාර්ථය සිදුවූයේය. දැන් ස්වකීය ස්ථානයවූ වින්ධ්‍ය පර්වතයටම

---

1. ආධිව්‍යාධිපරීතාපෛරද්‍ය ශ්වො වා විනාශිනෙ,
කො හි නාම ශරීරාය ධර්මාපෙතං සමාචරෙත්?

2. ජලාන්තශ්චන්ද්‍රචපලං ජීවිතං ඛලු දෙහිනාම්,
තථාවිධමිතිඥාත්වා ශශ්වත් කල්‍යාණමාචරෙත්.

3. මෘගතෘෂ්ණාසමං වීක්ෂ්‍ය සංසාරං ක්ෂණභඞ්ගුරම්,
සජ්ජනෛඃ සඞ්ගතං කුර්‍ය්‍යාත් ධර්මාය ච සුඛාය ච.

4. අශ්වමෙධසහස්‍රං ච සත්‍යං ච තුලයා ධෘතම්,
අශ්වමෙධසහස්‍රාද්ධි සත්‍යමෙවාතිරිච්‍යතෙ.

යනුලැබේව"සි කියයි. එකල්හි සියල්ලෝ ස්වකීය ස්ථානයට පැමිණ සිතින් කැමතිවන ලද්දාවූ ඵලය විඳිත්. විෂ්ණුශර්මන් විසින් "අනික් කුමක් කියම්ද ඒ තෙම කියනුලැබේව" සි කිය නලද්දේය. රාජපුත්‍රයෝ "ස්වාමිය! නුඹවහන්සේගේ ප්‍රසන්නයහෙතුකොටගෙණ සකල රාජනීතිය දත්නාලද්දේය, එබැවින් අපි සැපතට පැමිණියම්හ" සි කීවෝය. විෂ්ණුශර්මන් තෙමේ එසේවූයේ වෙයි. එසේද අනිකුදු මේ මඞ්ගල්‍යයෙක් වේවා.

1. ජයගත්නාසුලුවූ සියලු රජුන්ගේ මිත්‍රභාවය තෙම හැම කල්හි සතුටු එලවන්නේ වේවා. සත්පුරුෂ ජනයෝ විපත්ති රහිතවූවාහු සිටිත්වා, පණ්ඩිතයන්ගේ කීර්තිය නිරන්තරයෙන් වැඩේවා, නීතියතොමෝ වේශ්‍යා ස්ත්‍රියක්හු මෙන් හැමකල්හි මන්ත්‍රීන්ගේ ලයෙහි බබලාවා, මුඛයද සිඹීවා. හැම දවස්හි මහත්වූ සතුටද වේවයි කීයේය.

ශ්‍රී විෂ්ණුශර්මන් විසින් රචනාකරණලද හිතොපදෙශයෙහි සන්ධිනම්වූ සතරවන කථාසඞ්ග්‍රහය මෙසේයි.

හිතොපදෙශය නිමි.

---

1. සන්ධිඃ සර්වමහීභුජාං විජයිනාමස්තු ප්‍රමොදඃ සදා
සන්තඃ සන්තු නිරාපදඃ සුකෘතිනාං කීර්තිශ්චිරං වර්ධතාම්,
නීතිර්වාරවිලාසිනීව සතතං වක්ෂඃස්ථලෙ රාජතාං
වක්ත්‍රං චුම්බතු මන්ත්‍රිණාමහරහො භූයාන්මහානුත්සවඃ.

# GLOSSARY.

# ග්‍රන්ථිපදවිවරණය.

## අ.

අග්‍රස්ථානයෙහි, ප්‍රධානත්වයෙහි.

අජානීය, මවගේ නාසතියට හේතුවන අශ්වයෙක් නොහොත් අතිශයින් බලවත් සිව්පාවෙක්.

අතිශයින්, වැඩිතරමින්.

අධම, නීච.

අධිගෘහිත, වාසයකරණලද.

අධොභාගය, පාත්වූ දිශාව.

අනතුරු, පළමු කියනලද ක්‍රියාවට පසුව.

අනන්තනාගරජ්ජා, දිව් දෙදහසක් ඇතැයි ශිවාගමේ ජේෂ්ණ නාගයෙක්.

අනවරතයෙන්, නිරන්තරයෙන්.

අනාගත විධාතෘ, අනාගත, මතුකාලය. විධාතෘ, මවන්නා. මතු කාලය සඳහා සියල්ල මවන්නෙක්.

අනිෂ්ට, කැමති නොවනලද.

අනුකූලත්වය, එකඟබව, අවිරුඬත්වය.

අනුකූලභාවයෙන්, එකඟ විමෙන්, විරුඬ නොවීමෙන්.

අනුග්‍රහ, අනුකම්පා.

අනුචර, පසුපස්සේ හැසිරෙන්නෙක්.

අනුරූපව, සමානව. එකඟව.

අනුශාසනාකල, නියොග කරණ ලද, උපදේශ දෙනලද.

අභිමතාර්ථ, කැමතිවනලද කරුණ.

අභිමතාර්ථ සිඬි, කැමතිවූ වැඩසිදුවීම.

අභිරමණයෙහි, ස්ත්‍රීසම්භොගයෙහි.

අභිෂෙක, ඔටුනුපලඳවන මංගල්‍යයෙහිදී දක්‍ෂිණාසංඛයෙන් රජුගේ හා දෙවියගේ ඉසේ දියවත්කිරීම.

අමෘතයෙන්, දිව්‍යමය රසයෙන්.

අරුන්ධති, ඉතා සියුම් තාරකාවක්.

අර්බුදශිඛර, මුදුන් දසකෙළක් ඇති පර්වතයෙක්. අර්බුද, දසකෙළ. ශිඛර, මුදුන.

අවබොධකරණ ලද, දැනගන්නාලද.

අවරිබදන, අවරීයුෂ පිරූ භාජනය.

අශ්වමෙධ යාගය, අසුන්, ගවයන්, එළුවන් මරා කරණ යාගය.

අෂ්ටවිධ, අෂ්ටප්‍රකාර.

අසපුව, තාපසයන් වසන පන්සල.

අසම්මුඛයෙහි, ඉදිරියේනැතිකල්හි.

අස්තපර්වත, ඉරුබැසයන දිශාව.

අස්වැසිලි, සිත්හි භය දුරුකර සැපදීම.

අහඞ්කාර, අධිකමානය, මම උතුමයන උඩඟුබව.

ඇසිල්ලක්, ස්වල්පකාලයක්.

ඇසුරුකිරීම, ආශ්‍රයකිරීම.

ආකාශ, අහස.

ආකාශගාමී, අහස්හි ගමන්කරණ ස්වභාඇති.

ආගන්තුක, අමුත්තෙක්.

ආපො, වතුර, කිරි, තෙල්ආදි වැගිරෙණද්‍රව්‍ය.

ආසන්න, ළඟුදුරු.

## ඉ.

ඉක්බිති, කියනලද ක්‍රියාවට දෙවෙනි.

ඉන්ද්‍රියනිග්‍රහ, ඇසආදි ඉන්ද්‍රියයන්ට ගොචරවූ වස්තුන්කෙරේ ආශාකිරීම් ආදියෙන් වැලකීම.

ඉෂ්ට, කැමතිවනලද, සිදුකළ යුතුවන.

ඉසසිඳීම, ඉසකපා මැරීම.

ඊර්ෂ්‍යාවන්තයා, අනුන්ගේ සැපතටනොකැමැත්තා.

### උ.

උත්තරපථ, දඹදිව උතුරුදිග පිහිටි කොල, කාම්බොජ, ගන්ධාර, කිරාත, බර්බර යනාදි ජනපද.

උන්මත්තක, විකාරවූ සිත්ඇත්තෙක්.

උපසුන්ද, අසුරවිශෙෂයකනම.

උභය පක්‍ෂයෙහි, පක්‍ෂද්වයෙහි.

උමාදෙවිය, හිමාල පර්වතයාගේ දූවූ ස්කන්ද කුමාරයාගේ මව්වූ ඊශ්වරයාගේ භාර්‍ය්‍යාව.

උරගල, රත්රන්වල හොඳ නොහොඳ දැනගැණීම පිණිස ගා බලන ගල.

උපුලනයුනි, දරණඹහාඇති.

### ඍ.

ඍජුභාව, ඇදනැතිබව.

### ඓ.

ඓශ්වර්‍ය්‍යය, සම්පත්තියහෝ ධනධාන්‍ය පුත්‍රදාරාදිය.

### ඖ.

ඖසජ, උනුනී.

### ක

කකියනලද, කකාල, හෙවත් වැඩිතරම් උෂ්ණකරණලද.

කන්‍යා, පුරුෂයන්හා සම්භොගයටනොපැමිණි ස්ත්‍රිය හෝ දස හැවිරිදි ස්ත්‍රිය.

කඹුරන්ගේ, ලොහකම් කරන්නවුන්ගේ.

කමණ්ඩලාවක්, මැටිවලින් හෝ ලී ආදියෙන් කරණලද සන්‍යාසින්ගේ වතුරභාජනයක්.

කම්බුග්‍රීව, කම්බු, සක, ග්‍රීව, බෙල්ල, සකක්බඳු රෙඛාත්‍රයෙකින් යුත් බෙල්ලඇත්තෙක්.

කරටක, නිතදිතවූ ජීවිතය ඇත්තෙක්, එක්සිවලක්නුගේ නම.

කර්පූරකෙලි, කර්පූර, කපුරු, කෙලි, ක්‍රීඩා, කපුරුබඳු ක්‍රීඩාඇත්තෙක්,

කර්පූරගෞර, කර්පූර, කපුරු, ගෞර. සුදු, කපුරුමෙන්සුදු.

කර්පූරතිලක, කර්පූර, කපුරු, තිලක, නලල ආදියෙහි කරණලද ආලෙපය. කර්පූරතිලක ඇත්තෙක්.

කර්පූරපට, කර්පූර, කපුරු පට, වස්ත්‍ර. කපුරුවැනි වස්ත්‍රඇත්තෙක්. එක් රදවෙක්.

කර්පූරමඤ්ජරී, කර්පූර, කපුරු. මඤ්ජරී, වල්ල. කපුරුවල්ලක්බඳු එකියක්.

කරාලයා, සම්භූවූ දත්ඇත්තියක්.

කල්‍යාණකටක, කල්‍යාණ, මනොහර. කටක, පර්වතමධ්‍යගත භූමිය. මනාවූ පර්වතයන් මැද ඉඩම.

කසපැන් පල, දියමනා රසවත්තරම්වූ කාලයෙහි සිටි ලාපොල්පල.

කැඩපත, කන්නාඩියයි ව්‍යවහාරකරණු ලබන එනම් ද්‍රව්‍යය.

කැදුල්ලෙහි, පක්‍ෂින්වසන කූඩුවෙහි.

කාචමාණික්‍ය, පළිඟු.

කාඤ්චන, රන්බඳු.

කාමන්දකී, කාමන්දකගේ පුත්කාමන්දකී, මොහුගේනීතිය.

කාර්‍ය්‍යසිද්ධිය, කටයුතු සම්පාදනය.

කාලවිභාග, කුඩා මහත් කාලයන්ගේ විභාග.

කාශ්මීර, ප්‍රසිද්ධදෙශයකනම.

කුක්කුට, කුකුළු.

කුක්‍ෂිපාර්ශ්වය, ඉදිරිපිටවූ දිශාව.

කුක්‍ෂිය, කුස.

කුට්ටිනී, සොරසැමියන්කෙරේ ස්ත්‍රීන් යෙදවීම පිණිස දූතකම්කරණ කණවිස්ත්‍රියක්.

කුලස්ත්‍රී, මනාගොත්‍රයෙහිවූස්ත්‍රී.

කුවෙර, වෛශ්‍රවණ හෙවත් වෙසමුනු මහරජ, ධනයෙහි අධිපතිදෙවියා.

කුසතණ, කුස යන නම්ඇති මේතණ ස්නාන හොමදානහැඳරීම් පිත්‍රදානාදියෙහි පාපශුද්ධිය පිණිස අත්‍යග්‍ර කරණුලැබේ.

කුළුරස, ඉඟුරු මිරිස් වගපුල් කුරුඳු පොතු ආදී කටුකරසවත් ද්‍රව්‍ය.

කෘෂ්ණපක්‍ෂ, පසළොස්වකට අනතුරු පැළවියපටන් අමාවක දක්වා දින පසළොසට නම.

කෘෂ්ණසර්‍ප. නාගයෙක්.

කෛවර්‍ත්තක, වක්‍කවාකරන්නෙක්.

කෞණ්ඩින්‍ය, කුණ්ඩින්යන නම්ඇත්ත හුගෙ පුත්‍රයෙක්.

ක්‍රීඩාද්‍යූතාදිය, කෙළි, දූකෙළිආදිය.

ක්‍රොශයක්, බඹදෙදහසක් දුරුවූ මාර්‍ගයක්.

ක්‍ෂුද්‍ර, කුඩා.

ක්‍ෂුද්‍රබුද්ධි, කුඩා නුවණැත්තෙක්.

## ඛෙ.

ඛෙදයෙක, සිත්තැවීමෙක.

## ග.

ගර්‍ජ්ජනාව, ඝොෂාව.

ගර්‍හා, නින්‍දා.

ගැල, කරත්තයයි ව්‍යවහාරකරණ ලබනා බරගෙණයන ද්‍රව්‍යයෙක්.

ගැලපීම, සතුරුවසිටින්නවුන් මිතුරුකිරීම නොහොත් යම් යම් දේ එක්කොට යෙදීම.

ගිජුවූ, අතිශයින්ලොභවූ.

ගිහිගෙයි, ගෘහස්ථභූමියෙහි.

ගුරූපදෙශ, ගුරුවරුන්ගේ දනුමැතිකම්.

ගෘධ්‍ර, ගිජුලිහිනියෙක්, එක් ඇමතියෙක්.

ගෘධ්‍රකූට, ගෘධ්‍රයනු, ගිජුලිහිනියයි. කූට යනුපර්‍වතයයි. ගිජුලිහිනි වසන පර්‍වතයක්.

ගෘහස්ථභාවය, ගිහිබව.

ගොපොල්ලා, ගවපාලයා.

## ඝ.

ඝණ්ටා, ලොහවර්‍ගවලින් කරණලද ගැසීමෙන් ඝොෂාව උපදවන ද්‍රව්‍යයක්.

ඝණ්ටාකර්‍ණ, රාක්‍ෂසයෙක්හුගේ නාමය.

## ච.

චක්‍රවාක, සක්වා ලිහිනියෙක්.

චක්‍ෂුපථ, ඇසින් දක්කහැකි පමණ තැන.

චක්‍ෂුරාදි, ඇසමුල්කොටඇති.

චඤ්චල, සෙලවෙන.

චණ්ඩ, කෲර.

චතුරගුණ, දක්‍ෂභාවය.

චතුර්විධ, සතරවැදෑරුම්.

චන්‍ද්‍රගුප්තරජුගේ, ක්‍රිස්තුවර්‍ෂයෙන් 370 කින් ඉහත පාටලිපුත්‍රනුවර රාජ්‍යයට පැමිණි මහරජුගේ.

චන්‍ද්‍රබිම්බයක්, සඳමඬලක්.

චපලයෙක, ස්ථිරනුවූ එකෙක.

චම්පකාවති, චම්පකයනු සපුගස, මේගස්ඇති මහවනයක්.

චරපුරුෂ, අනුන්ගේ ස්වභාවදනගැණීමපිණිස කපටවෙශයෙන් ඇවිදිනා දූතයෙක්.

චාණ්ඩාලයා, මිශ්‍රජාතිඇත්තා.

චාන්ද්‍රායණව්‍රතය, අමාවකට දෙවෙනි පැළවියදිනයෙහි මොනරබිජු වටක් පමණ එක් බත්පිඬක් අනුභවකොට එතැන්පටන් පසළොස්වක දක්වා ක්‍රමයෙන් වැඩෙන සඳමඬලමෙන් එක එක බත්පිඬ වැඩිකොට අනුභවකරමින් අවුත් පසළොස්වක් දින පසළොසක් පිඬු අනුභවකොට එතැන්පටන් අමාවක දක්වා කලාක්‍රමයෙන් ඌනවන සඳමෙන් එක් එක් පිඬ අඩුකරමින් අවුත් අමාවක්දින නිරාහාරවඉඳ රක්නා තපසයි.

චාමර, සෙමරනම් මෘගවර්‍ගයාගේ වාලධියෙහි ලොම්වලින් කරණලද විජනි.

චිත්‍රකර්‍ණ, විසිතුරුකන් ඇත්තෙක්.

චිත්‍රග්‍රීව, විසිතුරුබෙල්ල ඇත්තෙක්.

චිත්‍රවන. විසිතුරු වනයක්.

චිත්‍රවර්‍ණ, විසිතුරු වර්‍ණයෙන් යුක්තයෙක්. එක් රජෙක්.

චිත්‍රාඞ්ග, චිත්‍ර විසිතුරු. අඞ්ග, අවයව විසිතුරු අවයවඇත්තෙක්.

චූඩාකර්ණ, චූඩා, ඉස්පලන්දින ආභරණයේ මාණික්‍යය. කර්ණ, කණ. එබඳු කන්ඇත්තෙක්.

චෞරාදීන්, සොරකම්කරන්නවුන් මුල්කොට ඇතිජනයන්.

## ඡා.

ඡායාරූපය, ප්‍රතිබිම්බය.

## ජ.

ජනපද, දෙශ.

ජමදග්නිඍෂි, පරශුරාමයාගේ පියවූ භෘගුවංශයෙහි උපන් ඍචීකඍෂිහුගේ පුත්‍රයෙක්.

ජයප්‍රකාශිත, දිනීමප්‍රකාශකරණලද.

ජරද්ගව, මහලු ගොනා. පක්‍ෂියකුගේ නාමයයි.

ජරා, වයස්ගතවීමෙන් වන ඉන්ද්‍රිය විකලය හා ශරීරයෙහිදිරීම.

ජාලපාද, මණ්ඩූකනායකයාගේනම.

ජීර්ණෝද්‍යාන, ජීර්ණ, දිරුවාවූ. උද්‍යාන, උයන, දිරූ උයන.

## ඤා.

ඤාතියක්, නෑකම්ඇත්තක්.

## ඩෙ.

ඩෙබර, කටුසහිත කුඩා ගස්වර්ගයක ගෙඩි.

## ත.

තණ්ඩුල, ගිනිදැල්වූ තණකොළ වැටිය හෝ පොල්කොළහුල.

තරඞ්ග, රළ.

තර්ක, නුවණින්විමසා කාරණයන්ගේ සත්‍යාසත්‍යභාවය නියමකරගැණීමට උපකාරවන ශාස්ත්‍රයට නමක්.

තිලක, ස්නානයෙන් පසු පවිත්‍රවීම පිණිස නලලආදි අවයවදෙළසෙක්හි සුදුසඳුන් රත්සඳුන් ගොරෝචන කස්තූරි ගොමආදි ද්‍රව්‍යයන්ගේ ආලෙපය.

තීර්ථය, ප්‍රයාගතීර්ථ, දාමොදරතීර්ථ, ‘සාලිග්‍රාමතීර්ථ, යනාදි පුණ්‍යභූමි.

තෘණාදිය, තණපත්ආදිය.

තෘප්තිය, සම්පූර්ණත්වය.

තෙජෙ, ගිනි.

තොපල, වචනය.

## ද.

දණ්ඩක, දඬුඇති, වනයකනමක්.

දධිකර්ණ, දධි, දී. කර්ණ, කණ. දීබඳු කන්ඇත්තෙක්. බළලෙක්.

දමනක, හික්මවීම කරන්නෙක්. එක් සිවලක්හුගේ නම.

දර්ශන ශාස්ත්‍රය, පරීක්‍ෂාව මුල්කොට විද්‍යමානස්වභාව නියමකිරීමටඋපකාරවන ශාස්ත්‍රය.

දහවෙය්‍යා, විවලපසකළ යුතුවතිබෙන සිවි.

දූරිඇති, දරුගැප්ලත්.

දීර්ඝකර්ණ, දික්කන්ඇත්තෙක්.

දීර්ඝමුඛ, දීර්ඝ, දික්වූ, මුඛ, මුඛය. දික්වූ මුඛ ඇත්තෙක්. කොකෙක්.

දීර්ඝරාව, දීර්ඝ ලුහුඬුනුවූ. රාව, නාදය. දීර්ඝවූ ශබ්දඇත්තා. හිවලකුගේ නම.

දුරාචාර, නුසුදුසු පැවැත්ම.

දුර්ගම, යාමට දුෂ්කරස්ථානයක්. වනයක නම.

දුර්දාන්ත, දමනයකළනොහැක්කෙක්.

දුර්භික්‍ෂකාලය, ආහාරපානයන් නොලදහැකිකාලය.

දුර්යොධන, ව්‍යාසඍෂිහුගේපුත්‍රවූ ධෘතරාෂ්ට්‍රරජුගේ පුත්‍රයෙක්. හස්තිනාපුරයේරජ.

දූකෙළි, පසඇටවලින් කරණලද්ක්‍රීඩා.

දූරදර්ශී, දූර, දුර. දර්ශී, ස්වභාවයෙන් දන්නෙක්. දුරදන්නෙක්. හෙවත් පණ්ඩිතයෙක්.

දූෂ්‍යකරණලද, කිලුටුකරණලද.

දෙවශර්මන්, දෙව, දෙවියෙක්. ශර්මන්, සැප. දෙවියන්ට බඳු සැප ඇත්තෙක්.

දෙවෙන්ද්‍ර, දෙවියන්ට නායක.

දෙශ විභාග, නානා දෙශයන්ගේ විභාග.

දෙහයෙහි, ශරීරයෙහි.

දොරටුපාලයා, වාසල්දොරටුව පාලනය කරන්නා. දොරටුව රැකවලටසිටින්නා.

## ධ.

ධනගර්භය, දනගබඩාව.

ධර්‍මශාස්ත්‍රය, මනුආදීන් විසින් කරණලද සමෘතිශාස්ත්‍රය.

ධර්මාරණ්‍ය, එක්තරා පිරිසිදුවනස්ථානයෙක්.

ධෛර්‍ය්‍ය, නොසෙල්වීම.

## න.

නදී, ගඟ.

නන්දක, වැඩෙන්නෙක්.

නන්දරජ, මහානන්දිහුගේ පුත්‍රවූ පාටලිපුත්‍රනම් නුවරමහරජ. මොහුරාජ්‍යයටපැමිණියේ ක්‍රිස්තු වර්ෂයෙන් 392 න් ඉහතයි.

නපුංසක, ස්ත්‍රීපුරුෂභාවරහිතපණ්ඩක.

නාටක, ගද්‍යපද්‍යමය කාව්‍යවලින් යුත් ශාස්ත්‍රයෙක්. නටන්නෙක්.

නානාවිධ, අනෙකප්‍රකාර.

නිරායාසයෙන්, නිදුකින්.

## ප.

පක්‍ෂිපොතකයන්, කුරුලු පැටවුන්.

පඤ්චතන්ත්‍ර, පරිච්ඡෙද පසකින්යුක්ත මෙම විෂ්ණුශර්මන් විසින් රචිත පොත.

පද්මගර්භ, පද්ම, නෙළුම්. ගර්භ, ගබඩාව· නෙළුම් ගබඩාවක්බඳු ස්ථානය.

පද්මරාග, මාණික්‍ය වර්ගයක නාමය.

පන්සාළිස්, හතළිස්පහක්.

පරසුරාම, ජමදග්නි සෘෂිහුගේ පුත්‍රයෙක්.

පරිත්‍යාග, දීම නොහොත් හැරීම.

පරිව්‍රාජක, ගිහිගෙයින් නික්ම හැසිරෙණ ශිවාගමේ සතරවන ආශ්‍රමයට අයිති සන්‍යාසිනම්වූ තාපස වර්ගය. පවුල්වශයෙන් සම්බන්ධයක් නැත්තාවූ මේවර්ගයේ තාපසිහුද දක්නාලැබෙත්.

පර්වතච්වර, ශෛලමය පර්වතයාගේ අතරක වෙන්ව තිබෙනතැන්.

පර්වරකින්, ප්‍රාකාරයෙකින්.

පශුවර්ගයාගේ, සතරපා ඇත්තාවූ වර්ගයාගේ.

පශ්චාත්තාප, පළමුකළදේ සලකා තැවීම.

පසබවට, පෘථිවි අප් තෙජස් වායු ආකාශ යනමේ ප්‍රකෘති ද්‍රව්‍ය පසබවට.

පසමිතුරන්, සතුරන්.

පළිස්, යුධභූමියෙහිදී ආයුධ ප්‍රහාර වැළැක්වීම පිණිස ව්‍යවහාර කරණලබන භාණ්ඩ.

පාණ්ඩු පුත්‍රවූ, ළදරු කාලයෙහිම පාණ්ඩුවර්ණවූ බැවින් ඒනමින් යුක්තවූ රජගේ පුත්‍රවූ.

පාබල, පාදයෙන් ගමන්කරන්නාවූ යුධසෙනඟ.

පිඞ්ගලක, නිල් රන්වන් යන දෙක මිශ්‍රවූ වර්ණඇත්තෙක්. සිංහයක්හුගේ නම.

පිතෘදානය, තමන් කුලයෙහි ම[illegible]වූ පියමුතුන් උදෙසා දියයුතු දානය.

පියුම, නෙළුම්මල.

පිරිහුණෙම්, අභාවයට පැමිණියෙම්.

පිළිසරණ, පිහිට.

පිළී, වස්ත්‍ර.

පුණ්‍යකර්ම, සුචරිත ක්‍රියා.

පුත්‍රදාරාදී, අඹුදරුදාසි දාසාදී.

පුරාණ, පණම් දහසයක් වටිනා රුපියල.

පුරුෂ සම්පත්ති, පුරුෂයන්ගේ සම්පත්තිය.

පූජ්‍යවූ, පිදියයුතුවූ හෝ ගෞරව කට යුතුවූ.

පූර්වජාතිය, මේ උත්පත්තිය කෙරෙන් පූර්වජාතිය.

පෘථිවි, ගල් පස් ලෝහො දඬු ආදි දෘඪද්‍රව්‍ය.

පෘථිවිගර්භය, පොළොවතුල.

පෘථිවිය, පොළොව.

ප්‍රකරණ, පොත.

ප්‍රකෘති, තමාගේ ඇතිගතිය.

ප්‍රතිකාර, පිළියම්.

ප්‍රතිඥාඇති, කටයුත්තෙහි නියමකිරීම් ඇති.

ප්‍රතිමා, පිළිම.

ප්‍රත්‍යක්ෂයෙන්, නොඅනුමානයෙන්.

ප්‍රත්‍යුත්තර, අනිකක්හුගේ වචනය පිළිබඳව කියයුතු වචන.

ප්‍රත්‍යුත්පන්නනාමති, ප්‍රත්‍යුත්පන්න, වර්තමානකාලය. මති, බුද්ධිය. වර්තමානකාලය පිළිබඳවූ බුද්ධිඇත්තෙක්.

ප්‍රදීප, පහණ

ප්‍රධානාමාත්‍යධුරයෙහි, පළමුවෙනිඇමතියාට අයිති රාජකෘත්‍යයෙහි.

ප්‍රවිෂ්ට, ප්‍රවේශකරණලද.

ප්‍රවේශකොට, ඇතුල්කොට.

ප්‍රශස්ත, ප්‍රශංසාකරණලද.

ප්‍රාණ, චක් ශ්‍රොත ඝ්‍රාණජිහ්වා කාය මනස්යන ඉන්ද්‍රියයෝ හෘදයතුල සිටිවාතය.

ප්‍රාසාද. රජ්ජුරුගේගෙය.

ඵ.

ඵුසන අනුකරණශබ්ද, ඵූ. යන මීට සමානවූශබ්ද

ඵුල්ලොත්පල, ඵුල්ල, පිපුනාවූ. උත්පල, හෙලඋපුල්. පිපුනු හෙල උපුල්ඇති.

බ.

බන්ධනාගාර, දඟගෙය.

බැගෑවූ, අතිශයින් දුකින් මලානිකවූ.

බිණීම, කථාකිරීම.

බිරින්දක්, අඹුවක්.

බෘහස්පති, දෙවියන්ගේ ගුරුහට කිය යුතුනම. හස්තිනාපුරයේ මහරජු වද මේ නම වෙයි.

බ්‍රහ්මචර්‍ය්‍ය, ස්ත්‍රී සම්භොගයෙන් වැළකී පැවතීම.

බ්‍රහ්මචර්‍ය්‍යාශ්‍රම, බ්‍රහ්මචාරීතාපස.

බ්‍රහ්මතෙමේ, ලොකය මැවීම කරණ තැනැත්තෙ.

භ.

භාග්‍ය, පූර්වජාතියේකළ සුචරිත දුශ්චරිත ක්‍රියාවෙන් උපන් කර්මනම්වූ නොපෙණෙන ගුණය.

භාග්‍යවත්, පින්වත්.

භාණ්ඩය, බඩුව.

භෛරව, භයානක. භයඑළවන්නෙක්.

ම.

මගධ, බාරාණසි—රාජග්‍රහ—ශ්‍රාවස්ති—කපිලවස්තු ආදිනුවරවල් අන්තර්ගතවූ දේශය.

මනොරථය, ප්‍රාර්ථනාව.

මන්ත්‍රණ, රටපාළනය යුද්ධකිරීම් ආදිය සඳහා රහස්වශයෙන් ඇමතියන් හා කථාකොට කටයුතුනියම.

මන්ත්‍රශක්ති, යුද්ධාදිකාලයෙහි අමාත්‍යමණ්ඩලයා හා රහස්කථාකොට කටයුතු නියමයන්ගේ බලය

මන්ථර, සෙමින් ගමන් කරන්නෙක්, ඉදුබුවක්හුගේ නාමය.

මන්දර, සමුද්‍රය අලඹූ—පර්වතයෙක්.

මන්දවිසර්ප, මන්ද, සවල්පවූ. විසර්ප, බුබුල්. මඳවූ බුබුල් ඇත්තෙක්.

මර්මස්ථාන, ලය, උගුර, කව්ය, දෙදන දෙවැලමිටි ආදි කැඩුම් බිඳුම්වී මෙන් මරඑළවන පුරුක් සන්ධස්ථාන.

මහාභාරත, කුරුපාණ්ඩවයන්ගේ යුද්ධාදිය ප්‍රකාශිත ව්‍යාසඍෂීන් විසින් රචිත ශ්ලොක ලක්ෂයකින්යුත්

ඉතිහාසය. ඉතා පුරාණකාලයෙහි නම් ප්‍රසිද්ධව පැවති අනේකදේශවල පිහිටි නගරයන්ගේ නාමයන් හා පටන්ගත් කාලද ඒ ඒ රටවල රජුන්ගේ නම්සහිත පරම්පර පිළිවෙළද රජවරුන්ගේ නොයෙක් අන්දම් සටන්හා දුශ්චරිතද යාග හෝම තපස්ආදි සුචරිත ක්‍රියාද යනමේ ආදි නොයෙක් අන්දම් පුරාණකාලය පිළිබඳවූ ජනයාගේද දේශවලද කථාව ප්‍රකාශිත ග්‍රන්ථය.

මහාවික්‍රම, මහත්වූ බල සම්පන්නයෙක්. සිංහයක්හුගේ නාමය.

මැලිබව, කම්මැලිකම.

මාතෘගර්භයෙහි, මවගේ කුසයෙහි.

මාලවදේශය, අවන්තිදේශයට කියන නාමයෙක්. උජ්ජයිනී හෙවත් උදේනි රටයි. දකුණුදිග රටක්.

මිත්‍රභේද, මිත්‍රයන්ගේ විරුද්ධකරවීම දක්වන පරිච්ඡේදය.

මිත්‍රලාභ, මිත්‍රයන් ලැබීමේ ප්‍රයෝජන ප්‍රකාශිත පරිච්ඡේදය.

මිත්‍රවාක්‍ය, මිත්‍රයා විසින් කියනලද වචන.

මිරිඟු, අවකාශවූ සමභූමිවල දුරබලන මුවන් විසින් දක්කයුතුව පවත්නා අවිද්‍යමාන ජලය.

මුද්‍රලාඤ්ජන, සුවර්ණරජතාදියෙන් කරණලද ලකුණුසහිතවූ මුද්‍රානම් ද්‍රව්‍යයෙන් ලකුණුකිරීම.

මුවවිදහා, කටදල්වා.

මූර්ඡා, කලාන්තව සිහිමුලාවීම.

මූෂිකාදීන්, මීයා මුල්කොට ඇත්තවුන්.

මෘගේන්ද්‍ර භාවය, සිව්පාවුන්ට ප්‍රධානත්වය.

මේඝගර්ජනාව, වැසිවලාවෙහි ශබ්දය.

මේඝවර්ණ, වැසිවලාවෙහි පැහැඇත්තෙක්.

මේෂරාශිය, ආකාශයෙහි පවත්නා තාරකා කොට්ඨාසයකින් යුක්තවූ රාශිදොළසින් පළමුවෙනි රාශිය.

මෙහෙයන, නියෝගකරණ.

මෛථුන, ස්ත්‍රී සම්භෝගය.

## ය.

යද්භවිෂ්‍ය, යමක් වියයුතුද ඒ නොවැළැක්විය හැක්කේය යන අදහස් ඇත්තෙක්.

යාගාදි, ගිනිපිදීම් ආදිය.

යුධිෂ්ඨිර, ව්‍යාසඍෂිහුගේ පුත් පාණ්ඩු රජුනිසා කුන්තියේ කුසඋපන් හස්තිනාපුරයෙහි රජ.

යුවරජු. උපරජු.

යූෂයෙන්, රසයෙන්.

යෝග්‍යස්ථාන, සුදුසුස්ථාන.

යොදුන, රියන් අටදහසෙක් ක්‍රෝශයයි ක්‍රෝශ සතරෙක් යොදුනයි.

## ර.

රන්හුය, සුවර්ණසූත්‍රය, රන්නූල.

රසදුන, ඇසට හිතවූ රසාංජනනම් ඖෂධ ද්‍රව්‍යය.

රැහැනිව, කොපව.

රාජනීති, රජුන් විසින් හා ඇමතියන් විසින් රට රක්නා පිණිස උගතයු මනා ශාස්ත්‍රය.

රාජපුත්‍රතෙම, රජහුගේ පුත්‍රතෙම.

රාජාධිරාජවූ, රජුන්ටවඩා ශ්‍රේෂ්ඨරජු

රාජ්‍යපදවිය, රජබව අයිතිවන තුර.

රාමරජුගේ, කෞශල්‍යාබිසව කෙරෙහි දශරථ රජහට පුත්‍රවඋපන් එනම් රජහුගේ.

රාවණ, රාමරජු විසින් යුද්ධයෙන් පරාජය කරණලැබූ ලක්දිව රාවණ රජ.

රුක්මාඞ්ගද, භයානක රාජපුත්‍රයෙක්.

රෝමකූප, රෝමජනිවිමුල.

රෝමෝද්ගත, කෙළින් සිටියාවූ ලොම් ඇති.

## ල.

ලක්ෂ්මී, ඓශ්වය්‍යීයෙහි හෝ රූපශෝභාවෙහි අධිගෘහිත දිව්‍යස්ත්‍රී.
ලඝුපතනක, වහා ගමන්කරන්නෙක්.
ලැව්ගින්න, වනමැද ගස් එකිනෙක ඉලීමෙන් හටගත් වනය දවන ගින්න.

## ව.

වජ්‍රායුධය, ශක්‍රයාගේ ආයුධය.
වණීාදි, පැහැය මුල්කොටඇති
වර්ධමාන, වැඩෙන්නෙක්. එක්තරා වෙළෙන්දකුගේ නාමය.
වශග, අයතියට පැමිණි, තමා කැමති සේ පවත්නා.
වහන්සහල, පතුල්දෙක රක්‍ෂාවීම පිණිස සම්න්කරණලද පාදුකා නම් ද්‍රව්‍යදෙකක්.
වැටුප්, වියදම.
වාක්පටුත්වය, සභාවට පැමිණියවුන් සිත්ගන්නා කථාවෙහි දක්‍ෂභාවය.
වායු, වාතය.
විකට, භයානක, භයානකයෙක්.
වික්‍රම, මහත්වූබල.
වික්‍ෂිප්තභාවයෙන්, සිත්කැලඹීමෙන්.
විග්‍රහ, යුඩප්‍රකාශිත පරිච්ඡේදය.
විජය, ජයගත්තෙක්. එක්සාවෙක්.
විඥාන ශාස්ත්‍ර, විතතවිභාග විනිශ්චිත විද්‍යා.
[illegible]ර, විදුරුව.
[illegible]මාන, ඇත්තාවූ. යුක්තාවූ
විද්‍යාධරීන්, පෘථිවිනිශ්‍රිත අමනුෂ්‍යවර්ගයක ස්ත්‍රීන්.
විධාන, නියොග.
විනිශ්චිතබුද්ධිමත්, විභාගකරණලද නුවනැති.
වින්ධ්‍යාවන, දඹදිව දකුණුදිශාවෙහිවූ වින්ධ්‍යපර්වත සමීපයෙහිවූවන.
විභීෂණයා, රාවණයාගේ සහෝදරවූ රාක්‍ෂසයා.
විලාස, බබලන්නෙක්. එක්තරා රදවකුගේනම.
විලිකුන්පල, ඉඳුහුගෙඩි.
විෂයරසය, ස්ත්‍රීසෙවනය.
වීණාකණී, වීණා, වීණාව. කණීණ, කණ. එබඳු කන්ඇත්තෙක්.
වීරවර, වීර, ශූරවූ. වර, උතුම්වූ. උත්තම ශූරයෙක්.
වෙද, බ්‍රහ්මයාගේ මුඛයෙන් නික්මුණු ධර්ම දැනගතයුතු ශාස්ත්‍ර.
වෙලපීම, විලාපකීම.
වෛද්‍යතෙමේ, වෛද්‍යශාස්ත්‍රයදන්නා තැනැත්තේ.
ව්‍යසන, විනාශ.
ව්‍යාඝ්‍ර, දිවියන්ගේ වර්ගයෙක්.
ව්‍යාජයෙන්, වැසීමෙන්, විද්‍යමානකාරණයට වෙනස්වූ ව්‍යවහාරයෙන්, කපටභාවයෙන්.

## ශ.

ශකුනි, දුයෙ‍්‍යාධන කුමාරයාගේ මයිලනුවූ පසඇට දැමීමෙහි දක්‍ෂකුමාරයෙක්.
ශක්‍රයා, වැසිවස්වන දෙවියා. දේදුන්නද ශක්‍රයාගේ දුන්නයයි ව්‍යවහාරයි. වැස්ස මොහුට අයිතියි.
ශමනයෙක්, සුවයෙක්.
ශරත්කාලයෙහි, ආකාශය ශුද්ධව පවත්නා වප් ඉල් දෙමාසයතුල කාලයෙහි.
ශස්‍ය, ධාන්‍යවර්ගයන්ගේ පැලසමූහය.
ශාප, දෙස්කීම.
ශාස්ත්‍රඥන, ශාස්ත්‍රඉගණීම කරණකොටගෙණලද නුවණ.
ශීඝ්‍ර, වහා.
ශුභ, නිර්භය.
ශුභදස්ත, කල්‍යාණදශනය කරන්නාවූ සමාගමනනම.
ශුභලග්නයක්, මනානකාත් වේලාවක්.
ශුද්‍රක, සතරවනජාති ඇත්තෙක්.
ශූර, අතිශයින් වීයඹුවක්.
ශ්‍රද්ධාව, විශ්වාසය.
ශ්‍රීමත්, ඓශ්වය්‍යීයෙන් යුක්තවූ.

ශ්‍රෙෂ්ඨභාවය. අතිශයින් ප්‍රශංසාකරණ ලද්දක්බවය.

ශ්වෙතවර්ණ, සුදුපැහැ.

## ස.

සංකට, විපත්ති, බාධාකරන්නෙක්.

සංක්‍රාන්ති, රාශියක ගමන්කොට නිමවා ඒලඟරාශියකට ඉරුගේගමන,

සංග්‍රාමශීර්ෂයෙහි, සටන් බිම පෙරමුනයෙහි.

සංසාරය, ජාතියෙන් ජාතියෙහි උපදිමින් මැරෙමින් පැවැත්මය.

සකල, සියලු.

සඛ්‍ය, මිත්‍රය.

සගර. ගර, විෂ. ස, සහිත. මව්කුසින් බිහිවනකල විෂයක්සමඟ උපන් බැවින් බාහුක රජුගේ පුත්‍රවූ මේ කුමාරයාට සගරනාමයවූයේය.

සඤ්ජීවක, මනාජීවිතය ඇත්තෙක්. එක්ගොනෙක්.

සන්ධි, විරුඬවූවන් මිතුරුකරවීම දක්වන පරිච්ඡේදය. මිතුරුකිරීම.

සන්නාහ, යුඬභූමියට යනකල ඇඳීමට සුදුසුවන සැරසීම.

සනිටුහන්, සලකා සිහින්නියම්කිරීම.

සන්න්‍යාසි, ගිහිගෙන් නික්ම තාපසභාවයකට පැමිණි හැසිරෙන්නෙක්.

සමතන්, ස්වාමිපුරුෂයන්.

සමස්තදෙශයෙහි; සියලුරටෙහි.

සම්පත්තියෙහි අධිගෘහිතදෙවී, ලක්ෂ්මී යන දිව්‍යස්ත්‍රියක් සම්පත්තියෙහි අධිගෘහිතයයි දක්නාලැබේ.

සරස්වතී, වචනයෙහි අධිගෘහිතදෙවී.

සාමාදි, ක්ෂමාකිරීම මුල්කොටඇති.

සායෙන්, ආහාර නොලැබීමෙන් උපන් කලාන්තයෙන්.

සිඳිනසුලු, නසන්නාවූ ස්වභාඇති.

සියලඟ, සකලශරීරය.

සිරුර, ශරීරය.

සිව්රඟසෙනඟ, ඇත්අස් රථ පාබලයන සතරකොටසට අන්තර්ගතසෙනඟ.

සීතා, ජනකරජුගේ දූවූ රාමරජුගේ බිසව.

සුග්‍රීව, රාමකුමාරයාහා මිත්‍රවූ කිෂ්කින්ධ්‍ය පර්වතයේ වානරයන්ට ප්‍රධානවූවානර.

සුචරිත, මනාක්‍රියාව.

සුදර්ශන, මනාදැකුම්ඇති.

සුන්ද, අසුරයක්හුගේනම.

සුබුඬි, මනානුවනැත්තෙක්.

සුවර්ණද්‍රුම, රන්දුම.

සුවර්ණවති, රන්ඇත්ති. එක්නුවරක නාමය.

සුශීල, මනාස්වභාව ඇත්තෙක්.

සේවකභාවය, දාසභාවය හෝ අනුචර භාවය

සෞම්නසින්, සතුටින්.

ස්තබ්ධකර්ණ, ස්තබ්ධ, දැඩිවූ. කර්ණ, කණ. දැඩිවූ කන්ඇත්තෙක්. එක් සිංහයෙක්.

ස්තුතිපාඨකයන්, ස්තුතිප්‍රකාශිත ගද්‍ය පද්‍යමය කාව්‍යබන්ධනයන් කියන්නවුන්.

ස්ථිර, චඤ්චලනුවූ.

ස්ථිරප්‍රෙමය, චඤ්චලනුවූ ප්‍රියභාවය.

ස්ථූල, මහත්.

ස්පර්ශ, ගැණීම.

ස්මෘත්‍යාදි, මන්වාදි ඍෂීන් විසින් කරණලද ධර්මශාස්ත්‍රාදිය.

ස්වකීය, තමන්ට අයිති.

ස්වකීය බාහුබලයෙන්, තමන්ගේ හස්තබලයෙන්.

ස්වාමිශක්තිය, අධිපති භාවයාගේ බලය. ස්වාමි, අධිපති. ශක්තිය, බලය.

## හ.

හදූරණ, පාඩම්කරණ.

හස්තිනාපුර, හස්තින්යන නම්ඇති රජු විසින් කරණලද බැවින් හස්තිනාපුරනම් උතුරු ඉන්දියාවේ පිහිටි මේ නුවර දැනට දිල්හියන නමින් ව්‍යවහාරයි.

හස්ත්‍යාදි, ඇතුන්ආදි.

හැදෑරීම, ඉගණීම.

හිරණ්‍යක, රන්රන්වැනිවූවෙක්. මී රජුගේ නාමය.

හුල්, උල්.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු